329 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 329 - இல. 07
Volume 329 - No. 07

2026 සැප්තැම්බර් 10 වන බ්‍රහස්පතින්දා
2026 செப்ரெம்பர் 10, வியாழக்கிழமை
Thursday, 10th September, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන් [තීරුව 1151]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1153]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1155-1189]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

එල් නිනෝ දේශගුණික සංසිද්ධියේ වත්මන් සහ අපේක්ෂිත බලපෑම [තීරුව 1191]

උඩප්පුව සහ අවට ගම්මානවල වෙරළ ඛාදනය වැළැක්වීම [තීරුව 1194]

**එල් නිනෝ සංසිද්ධියෙහි බලපෑම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර:**

පරිසර අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1199]

**එල් නිනෝ බලපෑම යටතේ ජල කළමනාකරණය:**

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1202]

**දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:**

කාලය දීර්ඝ කිරීම [තීරුව 1210]

**කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත:**

තීරණය [තීරු 1211-1320]

**කල් තැබීමේ යෝජනාව:**

විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා ආරක්ෂක ගම්මාන පිහිටුවීම [තීරු 1321-1332]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1332-1346]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள் [ப: 1151]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1153]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1155-1189]

**தனி அறிவித்தல் மூல வினா:**

எல் நினோ காலநிலை மாற்றத்தின் தற்போதைய மற்றும் எதிர்பார்க்கப்படும் தாக்கம் [ப: 1191]

உடப்பு மற்றும் அதன் அண்டிய கிராமங்களில் கடலரிப்பைத் தடுத்தல் [ப: 1194]

**எல் நினோவின் தாக்கத்தைத் தணிப்பதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள்:**

சுற்றாடல் அமைச்சரினது கூற்று [ப: 1199]

**எல் நினோ தாக்கத்தின்போது நீர் முகாமைத்துவம்:**

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரினது கூற்று [ப: 1202]

**தித்வா புயலை எதிர்கொள்வதற்காக முன்னாயத்தத்துடன் இருக்கவில்லை என்பது தொடர்பில் முழுமையாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:**

கால நீடிப்பு [ப: 1210]

**பெண்களின் வலுவூட்டல் சட்டம்:**

தீர்மானம் [ப: 1211-1320]

**ஒத்திவைப்புப் பிரேரணை:**

விசேட தேவையுடைய பிள்ளைகளுக்காக பாதுகாப்புடன் கூடிய கிராமங்களை நிறுவுதல் [ப: 1321-1332 ]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1332-1346 ]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Legislative Standing Committee: Additional Members [Col. 1151]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1153]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1155-1189]

QUESTION BY PRIVATE NOTICE:

Current and Projected Impact of El Niño Climate Phenomenon [Col. 1191]

Prevention of Coastal Erosion in Udappuwa and Nearby Villages [Col. 1194]

MEASURES TAKEN TO MITIGATE IMPACT OF EL NIÑO PHENOMENON:

Statement by Minister of Environment [Col. 1199]

WATER MANAGEMENT DURING EFFECTS OF EL NIÑO:

Statement by Minister of Housing, Construction and Water Supply [Col. 1202]

SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY ON THE LACK OF PREPAREDNESS TO FACE CYCLONE DITWAH AND REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD:

Extension of time [Col. 1210]

WOMEN EMPOWERMENT ACT:

Determination [Cols. 1211-1320]

ADJOURNMENT MOTION:

Establishment of Safety Villages for Children with Special Needs [Cols. 1321-1332]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1332-1346]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

**2026 සැප්තැම්බර් 10වන බ්‍රහස්පතින්දා**
*2026 செப்ரெம்பர் 10, வியாழக்கிழமை*
*Thursday, 10th September, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
### சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
### LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය )සංස්ථාගත කිරීමේ) "පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය



## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ තේරීම් කාරක සභාවේ රැස්වීම්
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டமும் தெரிவுக் குழுக் கூட்டமும்
### MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 සැප්තැම්බර් 10වන බ්‍රහස්පතින්දා, එනම් අද දින මධ්‍යාහ්න 12.00 ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් සහ එය අවසන් වූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක් කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, අදාළ රැස්වීම් සඳහා පැමිණ සහභාගි වන ලෙස සියලු සාමාජික මන්ත්‍රීවරයන්ට දැනුම්දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගම්පොල, අටබාගේ, දැලපිටිය, සෙවනක් ජනපදය, අංක 238/කිව්/5 යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී. කරුණාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාවනැල්ල, පිල්ලෑව, කොළඹ පාර වම, කොටස් අංක 04, අංක 221/50 එෆ් යන ලිපිනයෙහි පදිංචි එම්.බී.එම්. ඉක්බාල් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, තල්පොත, අංක 215/317 යන ලිපිනයෙහි පදිංචි බී.ඒ.එස්.කේ. ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) හාරිස්පත්තුව, මැදවල, පල්කුඹුර, හේනේගම, අංක 271/4 යන ලිපිනයෙහි පදිංචි බී.ඒ.එන්. ඉන්ද්‍රජිත් බමුණුආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දෙවලපොල, කමරගොඩ, පල්ලිය පාර, අංක 320 සී යන ලිපිනයෙහි පදිංචි ටී. ජූඩ් නෙල්සන් සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු කථානායකතුමනි, කුරුවිට, වළඳුර, යහලකොටුන්න, අංක 88/5 යන ලිපිනයෙහි පදිංචි එච්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -33/2024- (1), ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා.

**ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -140/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## නව තැපැල් කාර්යාල ගොඩනැඟිලි ඉදිකිරීම හෝ පවතින ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය: අයවැය ප්‍රතිපාදන
## புதிய அஞ்சல் அலுவலகக் கட்டடங்களை நிர்மாணித்தல் அல்லது இருக்கின்ற கட்டடங்களைப் புனரமைத்தல்: வரவுசெலவுத் திட்ட ஒதுக்கீடுகள்
## CONSTRUCTION OF NEW POST OFFICE BUILDINGS OR RENOVATION OF EXISTING BUILDINGS: BUDGET ALLOCATIONS

1413/2025

**3. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) නව තැපැල් කාර්යාල ගොඩනැඟිලි ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම වර්ෂයට අදාළව අය වැයෙන් වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) කිරාන් තැපැල් කාර්යාලය පෞද්ගලික ගොඩනැඟිල්ලක ක්‍රියාත්මක වන බව දන්නේද;

(iii) කිරාන් තැපැල් කාර්යාලය සඳහා නව තැපැල් කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර්පත්තු චෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාවඩිවේම්බු ප්‍රදේශයේ තැපැල් කාර්යාලයක් නොමැති වීමෙන් වැඩිහිටියන් සහ වැන්දඹු කාන්තාවන් චිත්තාන්ඩි උප තැපැල් කාර්යාලයෙන් ඔවුන්ගේ දීමනා ලබා ගන්නා බව දන්නේද;

(ii) මාවඩිවේම්බු ප්‍රදේශයේ නව තැපැල් කාර්යාලයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

(iii) උප තැපැල් කාර්යාලයක් තැපැල් කාර්යාලයක් බවට උත්ශ්‍රේණිගත කිරීමට අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புதிய அஞ்சல் அலுவலகக் கட்டடங்களை நிர்மாணிப்பதற்காக அல்லது புனரமைப்பதற்காக இவ்வாண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்டுள்ள நிதித் தொகை எவ்வளவு என்பதையும்;

(ii) கிரான் அஞ்சல் அலுவலகம் தனியார் கட்டடமொன்றில் இயங்குவதை அறிவாரா என்பதையும்;

(iii) கிரான் அஞ்சல் அலுவலகத்துக்கெனப் புதிய கட்டடமொன்றை நிர்மாணிக்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் ஏறாவூர்ப்பற்று செங்கலடிப் பிரதேச செயலாளர் பிரிவுக்குரிய மாவடிவேம்பு பிரதேசத்தில் அஞ்சல் அலுவலகமொன்று இல்லாத காரணத்தால் முதியோர்கள் மற்றும் விதவைகள் சித்தாண்டி உப அஞ்சல் அலுவலகத்திலிருந்தே அவர்களுடைய கொடுப்பனவுகளைப் பெறுகின்றனர் என்பதை அறிவாரா என்பதையும்;

(ii) மாவடிவேம்புப் பிரதேசத்தில் புதிய அஞ்சல் அலுவலகக் கட்டடமொன்றை நிர்மாணிக்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) உப அஞ்சல் அலுவலகமொன்றை அஞ்சல் அலுவலகமாகத் தரமுயர்த்துவதற்கு பின்பற்றப்படும் நடைமுறைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the amount of money that was allocated in the Budget for this year for the construction of new post office buildings or renovation of the existing buildings;

(ii) whether he is aware that the Kiran Post Office is housed in a private building; and

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(iii) whether actions will be taken to construct a new post office building for the Kiran Post Office?

(b) Will he also inform this House -

(i) whether he is aware that the elderly and widows receive their allowances from the Chitthandi Sub-Post Office due to the absence of a post office in the Mavadivembu area of the Eravurpattu Chenkalady Divisional Secretary's Division in the Batticaloa District;

(ii) whether actions will be taken to establish a new post office in the Mavadivembu area; and

(iii) the procedure that will be followed to upgrade a sub-post office to a post office?

(c) If not, why?

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**

(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නව ගොඩනැඟිලි ඉදිකිරීමට - රුපියල් මිලියන 400

ප්‍රතිසංස්කරණය කිරීමට - රුපියල් මිලියන 600

(ii) ඔව්.

(iii) නව කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව සතුව ඉඩමක් මෙම ප්‍රදේශයේ නොමැත.

(ආ) (i) ඔව්.

(ii) මෙම ප්‍රදේශයට කිලෝමීටර දෙකක වපසරිය තුළ පිහිටා ඇති චිත්තාන්ඩි සහ චන්දාරමුල්ලෙයි යන උප තැපැල් කාර්යාල දෙක හරහා ජනතාවගේ තැපැල් අවශ්‍යතා ඉටු කෙරේ.

(iii) උප තැපැල් කාර්යාලයක්, තැපැල් කාර්යාලයක් බවට උසස් කිරීමේදී,

i. අදාළ උප තැපැල් කාර්යාලයේ සිට ආසන්නතම පිහිටි ඉහළ ශ්‍රේණියේ තැපැල් කාර්යාලයකට ඇති දුර ප්‍රමාණය

ii. එම උප තැපැල් කාර්යාලය ආසන්නතම වර්ෂ 3ක් තුළ ආදායම් තත්ත්වයේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්වා තිබේ ද යන වග

iii. අදාළ ප්‍රදේශයේ ජන ඝනත්වය

iv. අදාළ ප්‍රදේශයට තැපැල් කාර්යාලයක අවශ්‍යතාව පිළිබඳව මහ ජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය

යන කරුණු පිළිබඳව මූලිකවම සලකා බලනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)

(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக கேள்வியை கேட்பதற்கு முதல், களுவாஞ்சிக்குடியில் நீண்டகாலத் தேவையாக இருந்த தபால் அலுவலகத்துக்கான புதிய கட்டடத்தை நிர்மாணித்துத் தந்ததற்காக கௌரவ அமைச்சர் அவர்களுக்கும் உங்களுக்கும் எனது நன்றிகளை தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் குறிப்பிட்டதுபோல, கிரான் தபால் நிலையத்துக்கு ஒரு கட்டடம் அமைப்பதற்கு, அந்தப் பிரதேசத்தில் Department of Postsக்குச் சொந்தமான காணி இல்லை என்பதுதான் பிரச்சினை என்றால், அதற்கான காணியை நாங்கள் பெற்றுத்தந்தால், நீங்கள் அதில் அந்தத் தபால் நிலையத்துக்கான கட்டடத்தை அமைப்பீர்களா? அங்கு மாத்திரமல்ல, ஏனைய பிரதேசங்களிலும் உப தபால் நிலையங்களை அமைக்கவேண்டி இருக்கின்றது. இப்போது நீங்கள் சித்தாண்டி உப தபால் நிலையத்தைப் பற்றி சொன்னீர்கள். சித்தாண்டி உப தபால் நிலையம் வியாழக்கிழமைகளில் மாத்திரம் 75,000 ரூபாய்க்கும் அதிகமான வருமானத்தை ஈட்டுகின்றது. ஒரு மாதத்துக்கு 250,000 ரூபாய்க்கு மேல் வருமானத்தை ஈட்டுகின்ற ஒரு தபால் நிலையம்தான் சித்தாண்டி உப தபால் நிலையம். சித்தாண்டி உப தபால் நிலையத்தைத்தான் மாவடிவேம்பு, ஈரளக்குளம், இலுக்குப்பொத்தானை போன்ற பிரதேசங்களில் இருக்கின்ற மக்கள் பயன்படுத்துகிறார்கள்.

அதேபோல, மட்டக்களப்பு மாவட்டத்தில் இன்னும் பல பிரதேசங்களிலுள்ள உப தபால் நிலையங்கள் மற்றும் தபால் நிலையங்கள் நல்ல வருமானத்தை ஈட்டக்கூடிய நிலையில் இருக்கின்றன. குறிப்பாக, ஆரையம்பதியில் இருக்கின்ற தபால் நிலையத்தை upgrade பண்ணுவது சம்பந்தமாகப் பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் ஒரு தீர்மானம் எடுக்கப்பட்டு அனுப்பப்பட்டு இருக்கின்றது. ஏனெனில், தற்பொழுது அது காத்தான்குடி தபால் நிலையத்துடன் இணைந்துதான் இயங்குகின்றது. இது எங்களுடைய கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்களுக்கும் அது தெரியும். இது பற்றி பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் பேசப்பட்டது. இவ்வாறாக புதிய தபால் நிலையங்களை உருவாக்குதல், உப தபால் நிலையங்களை தபால் நிலையங்களாகத் தரமுயர்த்துதல், புதிய உப தபால் நிலையங்களை உருவாக்குதல் எனப் பல்வேறுபட்ட தேவைகள் இருக்கின்றன.

நான் உதாரணத்துக்கு ஒரு விடயத்தைச் சொல்கின்றேன். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, கிண்ணையடி என்ற பிரதேசத்தில் புதியதோர் உப தபால் நிலையத்தை உருவாக்கினால், சுங்காக்கேணி, முறாவோடை, கொண்டயங்கேணி, முருக்கன்தீவு, பிரம்படித்தீவு போன்ற பிரதேசங்களில் இருக்கின்ற மக்களுக்கு அஞ்சல் சேவைகளைப் பெறுவது இலகுவாக இருக்கும். முதியோருக்கு வழங்கப்படுகின்ற 1,500 ரூபாய் கொடுப்பனவைப் பெறுவதற்காக மேற்குறிப்பிட்ட பிரதேசங்களிலிருந்து வாழைச்சேனைக்கு வந்துசெல்வதற்கு அதைவிட அதிகமான தொகையைச் செலவிடவேண்டி இருக்கின்றது. இந்த விடயங்கள் சம்பந்தமாக முழுமையானதோர் அறிக்கையை நாங்கள் தயார்படுத்த வேண்டும். பொருத்தமானதொரு நேரத்தை பெற்றுத்தந்தால், இந்த விடயத்தை எவ்வாறு செய்யலாம் என்று plan பண்ணி, முழுமையானதோர் அறிக்கையைத் தயாரிக்கலாம். நாங்கள் விரும்பியபடி அங்கொன்றும் இங்கொன்றுமாகச் செய்ய முடியாது என்பது எனக்கும் புரியும். எனவே, மேற்குறிப்பிட்டவாறு செய்வதற்கு வாய்ப்பு இருக்கின்றதா? எனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

එම ප්‍රශ්නය ඇසීම ගැන ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළ කාරණා දෙකක් සම්බන්ධව මම උත්තර දෙන්නම්. පළමුවන කාරණය තමයි, එම ප්‍රදේශයේ ඉඩමක් අත්පත් කර ගැනීමක් හෝ පැවරීමක් සිද්ධ වෙනවා නම් අපට යෝජනාවක් ඉදිරිපත් කරලා, එකී ස්ථානයේ තැපැල් කාර්යාලයක් ස්ථාපනය කිරීම සුදුසු ද කියලා මූලික සොයා බැලීමක් කරලා ඉදිකිරීමක් කරන පියවරට යන්න පුළුවන්. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා අපට දැනටමත් ලැබී තිබෙන එවැනි යෝජනා ගැන අපි සලකා බලමින් තිබෙනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

දෙවැනි කාරණය මේකයි. එම ප්‍රදේශය තැපැල් කාර්යාලයකට සුදුසු දැයි සලකා බැලීමට අදාළ කාරණා 4ක් මම කලින් කිව්වා, ගරු මන්ත්‍රීතුමනි. ජනතාවගේ ඉල්ලීම සහ එම කාර්යාලය උපයන ආදායම අනුව අනිවාර්යයෙන්ම ඒ ගැන වාර්තාවක් සකස් කරලා, මඩකලපුව දිස්ත්‍රික්කයට සම්බන්ධ අනෙකුත් මන්ත්‍රීවරුනුත් සම්බන්ධ කරගෙන සාකච්ඡාවක් ගන්න අපි ලැහැස්තියි. ඔබතුමා එම ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

நாங்கள் பேச்சுவார்த்தையில் ஈடுபட்டு, மட்டக்களப்பு மாவட்டத்துக்கான முழுமையானதொரு திட்டத்தைத் தயாரிக்கும் வரைக்கும் mobile postal serviceஐ இன்னும் கொஞ்சம் கூடுதலாகச் செய்யக்கூடிய ஒரு சூழல் இருக்கின்றதா என்று பார்க்க வேண்டும். ஏனென்றால், பாவற்கொடிச்சேனை, காஞ்சிரங்குடா போன்ற பிரதேசங்களுக்கான தபால் சேவை உன்னிச்சையிலிருந்தான் நடைபெறுகின்றது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, அந்த மாவட்டத்தின் நிலப்பரப்பு பற்றி எனக்குத் தெரிந்தளவுக்கு உங்களுக்குத் தெரியாது. ஆகையால், நான் விளங்கப்படுத்துகின்றேன். உதாரணத்துக்கு, பத்தரமுல்லையில் இருந்து மொரட்டுவை பிரதேசத்துக்கு தபால் சேவை இடம்பெறுவது போன்றுதான். இதன் காரணமாக, சில சந்தர்ப்பங்களில் இளைஞர், யுவதிகள் வேலைவாய்ப்புக்கு விண்ணப்பித்து, அவர்களுக்கு interviewக்கான கடிதம் வந்து சேரும்போது, அந்த interview date கடந்திருக்கும். அப்படியான சம்பவங்களும் நடந்திருக்கின்றன. கோரகல்லிமடு, வாகனேரி கிராமங்களில் தலா மூன்று நாட்கள் mobile postal service இடம்பெறுகின்றது. இப்படியான இடங்களில் தபால் சேவைக்கான தேவை இருப்பது உறுதிசெய்யப்பட்டு இருக்கிறது. நீண்டகாலமாக இந்தத் தேவை உணரப்பட்டிருக்கிறது. எனவே, இந்த இடங்களில் உப தபால் நிலையங்களை அமைக்கவேண்டிய தேவை இருக்கின்றது.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, பிரதேச மட்டத்தில் தபால் நிலையம் வேண்டும் என்று கேட்டால், எல்லா கிராமங்களிலும் ஒரு தபால் நிலையம் வேண்டும் என்று சொல்லக்கூடிய ஒரு சூழல்தான் இருக்கும். அதனால் நாங்கள் ஓர் அறிக்கையைத் தயார்படுத்தி, எந்தெந்தப் பிரதேசங்களிலுள்ள தபால் நிலையங்களைத் தரமுயர்த்துவது, எந்தெந்தப் பிரதேசங்களில் புதிய தபால் நிலையங்களை உருவாக்குவதென்ற தீர்மானத்தை எடுக்கும் வரைக்கும் mobile postal serviceஐ விரிவுபடுத்த வேண்டும். இதன்மூலம் தபால் சேவையை அதிகரிக்க முடிவதோடு, முதியோர் தங்களுக்கான 1,500 ரூபாய் கொடுப்பனவைப் பெறுவதிலுள்ள பிரச்சினையையும் குறைக்க முடியும். அப்படி இல்லாவிட்டால், அந்தக் கொடுப்பனவை Department of Posts ஊடாக வழங்காமல் வேறு வழியில் வழங்க வேண்டும். ஏனெனில், கொடுக்கப்படுகின்ற 1,500 ரூபாயால் பிரயோசனம் இருக்க வேண்டும். எனவே, இடைப்பட்ட காலத்தில் mobile postal serviceஐ விரிவுபடுத்துவதற்குச் சாத்தியம் இருக்கின்றதா? எனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

ගරු කථානායකතුමනි, ජංගම සේවයකදී අපි සලකා බලන්න ඕනෑ, එම ප්‍රදේශයේ ප්‍රමාණවත් ලෙස අදාළ කාර්ය මණ්ඩල ඉන්නවාද සහ අනෙකුත් පහසුකම් තිබෙනවාද කියන කාරණා. මම ඒ ගැන අදාළ නිලධාරින් සමඟ සාකච්ඡා කරලා, ගරු මන්ත්‍රීතුමාව දැනුවත් කරන්නම්.

## පයිලේකන්ද වැව ඉදිකිරීමේ ව්‍යාපෘතිය: ප්‍රගතිය
## பைலேகந்த குள கட்டுமான கருத்திட்டம்: முன்னேற்றம்
## PAILEKANDA TANK CONSTRUCTION PROJECT: PROGRESS

2096/2026

**4. ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පයිලේකන්ද වැවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම යෝජිත ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තුගත කර ඇති මුළු පිරිවැය කොපමණද;

(iii) ව්‍යාපෘතිය සඳහා රජය විසින් මේ වන විට මුදල් ප්‍රතිපාදන වැය කර තිබේද;

(iv) එසේ නම්, මේ වන විට වැය කර ඇති මුළු මුදල කොපමණද;

(v) ව්‍යාපෘතියේ සමස්ත ඉදිකිරීම් කටයුතුවලින් මේ වන විට අවසන් කර ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்தில், மடுல்ல பிரதேச செயலாளர் பிரிவின் கல்கமுவ கிராம அலுவலர் பிரிவில் அமைந்துள்ள பைலேகந்த குளத்தின் கட்டுமானப் பணிகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி உத்தேச கருத்திட்டத்தைப் பூர்த்திசெய்வதற்காக மதிப்பீடு செய்யப்பட்டுள்ள மொத்தச் செலவு எவ்வளவு என்பதையும்;

(iii) அரசாங்கத்தால் கருத்திட்டத்துக்கு ஏற்கனவே நிதி செலவிடப்பட்டுள்ளதா என்பதையும்;

[ගරු නීතිඥ සරත් කුමාර මහතා]

(iv) ஆமெனில், ஏற்கனவே செலவிடப்பட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(v) கருத்திட்டத்தின் ஒட்டுமொத்த கட்டுமானப் பணிகளில் தற்போது பூர்த்தி செய்யப்பட்டுள்ள அளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the date of commencement of the construction work of the Pailekanda Tank located in the Galgamuwa Grama Niladhari Division in the Madulla Divisional Secretary's Division in the Monaragala District;

(ii) the total estimated cost for the completion of the said proposed project;

(iii) whether the Government has spent any funds on the said project by now;

(iv) if so, the total amount that has been spent so far; and

(v) out of the total construction work of the project, the amount of work that has been completed by now?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2020 මැයි මස.

(ii) මුලින්ම ඇස්තමේන්තුවේ තිබෙන්නේ රුපියල් මිලියන 82.20ක්. පසුව ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවේ රුපියල් මිලියන 167.26ක් ලෙස සඳහන් වනවා.

(iii) රජයේ ප්‍රතිපාදන වැය කර තිබෙනවා.

(iv) මුළු මුදල ලෙස රුපියල් මිලියන 70.5ක් ඒ ව්‍යාපෘතිය සඳහා දැනට වියදම් කර තිබෙනවා.

(v) මේ වන විට ව්‍යාපෘතියේ සියයට 80ක ප්‍රමාණයක ඉදිකිරීම් අවසන් කරලා භෞතික ප්‍රගතිය විධියට ඉදිරිපත් කර තිබෙනවා.

ව්‍යාපෘතියේ එක් එක් වැඩ සඳහා ප්‍රගතිය විස්තරාත්මකව ගත්තාම, පිටවාන සියයට 95ක් ඉදිකර අවසන් කර තිබෙනවා, වම් සොරොව්ව සියයට 90ක් ඉදිකර අවසන් කර තිබෙනවා, දකුණු සොරොව්වේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නැහැ, වැව් බැම්ම සියයට 50ක් ඉදිකර අවසන් කර තිබෙනවා.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වැවේ ප්‍රතිලාභී ගොවි පවුල් දැඩි ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දෙන පිරිසක්. වසර හයක් පුරාවට මේ පිරිස පීඩාවට පත් වෙලා ඉන්නවා. ඒ වාගේම වැවේ ඉදිකිරීම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙන්නත් බැහැ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පිළිතුර අනුව මේ වන විටත් රුපියල් මිලියන 70.5ක් මේ වෙනුවෙන් වියදම් කරලා තිබෙනවා. නමුත් ඒ මුදලට සාපේක්ෂව සංවර්ධන කාර්යයක් සිදුවෙලා නොමැති බව තමයි අපට නිරීක්ෂණය වන්නේ. පූර්වගාමී රජයක රාජ්‍ය අමාත්‍යවරයෙක් මැදිහත් වෙලා තමයි මේ කටයුතු සිදු කළේ. හිටපු රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා නිධන් හෑරීම සඳහා මේ වැව් බැම්ම කඩා දැමූ බව තමයි ප්‍රදේශවාසීන්ගේ සහ ගොවි ජනතාවගේ අදහස. රුපියල් මිලියන 70.5ක මුදලින් මේක ඉදිකරපු බව සඳහන් කළත්, මේ මුදලට සාපේක්ෂව ඉදිකිරීම් සම්බන්ධයෙන් සෑහීමකට පත් වන්න බැරි බවට අදහසක් තිබෙන නිසා මේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර තිබෙනවාද කියලා දැනගන්න කැමැතියි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමා, මේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන්නේ 2020 වර්ෂයේදී. මෙහි වැඩ අවසන් කරන්න නියමිතව තිබුණේ 2022 වර්ෂයේදී. කොහොම නමුත්, 2022 වර්ෂයේ ඇති වෙච්ච ආර්ථික අර්බුදය පාවිච්චි කරලා තමයි මේ ව්‍යාපෘතිය අතරමඟ නතර කරලා තිබෙන්නේ. මේ ව්‍යාපෘතිය අවසන් කිරීමට පුළුවන්කමක් තිබුණත්, ඒ කාලවකවානුවල තිබුණු විවිධ ප්‍රශ්න සහ අකාර්යක්ෂමතා, තීන්දු තීරණ ගැනීමේ ගැටලු යන මේ සියල්ල එක්ක තමයි 2022දී මේ ව්‍යාපෘතිය අවසන් කර ගන්න බැරි වුණේ. එහෙම නැත්නම්, ආර්ථික අර්බුදයත් එක්ක 2022 වර්ෂය වනකොට මේ ව්‍යාපෘතියේ වැඩ අවසන් කරන්න පුළුවන්කම තිබුණා. ගරු මන්ත්‍රීතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නයෙන් අහන මේ කාරණය පිළිබඳව සොයා බලා නිලධාරින් එක්ක සාකච්ඡා කරලා ඔබතුමාව දැනුවත් කරන්න අපි බලාපොරොත්තු වනවා. මේ වන විට මේකට අදාළව පරීක්ෂණයක් කෙරෙන්නේ නැහැ. අපි සූදානම්, නිලධාරින් එක්ක කථා කරලා මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා කටයුතු කරන්න.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ පීඩාවට පත් වෙලා ඉන්න මේ ගොවීන්ගේ ප්‍රශ්නය විසඳන්න අමාත්‍යාංශය හැටියට මේ වනකොට අරගෙන තිබෙන පියවර මොකක්ද? ඒ වාගේම මේ වැඩකටයුතු ආරම්භ කරන්න පුළුවන් කිසියම් කාල රාමුවක් සඳහන් කරන්න පුළුවන්ද?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ව්‍යාපෘතිය පිළිබඳව යම් අධ්‍යයනයක් කරලා, දිස්ත්‍රික්කයේ දේශපාලන අධිකාරිය වාගේම නිලධාරින් එක්කත් සාකච්ඡාවක් ආරම්භ කර තිබෙනවා. මේ ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු පිළිබඳව යම් මූලාමය

තක්සේරුවක් කරලා, කර තිබෙන වැඩ පිළිබඳවත්, මූල්‍ය සහ භෞතික ප්‍රගතිය පිළිබඳවත් නැවත යම් අධ්‍යයනයක් කරලා, 2027 වර්ෂයේදී "වාරි මහිම - අපේ උරුමය" ව්‍යාපෘතිය හරහා මේ වැවේ ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්න අපි දැනට අදාළ රජයේ ආයතනය සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. නිශ්චිත දිනයක් අපට කියන්න බැරි වුණත්, ලබන වසර තුළ මේ වැවෙහි ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

## ජාතික ආරක්ෂක අරමුදල: විස්තර

### தேசிய பாதுகாப்பு நிதியம்: விபரம்

### NATIONAL DEFENCE FUND: DETAILS

2189/2026

**5. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'ජාතික ආරක්ෂක අරමුදල' පිහිටුවීමේ අරමුණු, නීතිමය පදනම සහ සංයුතිය කවරේද;

(ii) අරමුදලට සාමාජිකයින් පත් කර ගනු ලබන ආකාරය සහ අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iii) අරමුදලට මුදල් ලැබෙන ආකාරය සහ එහි වර්තමාන සාමාජිකයින් කවරේද;

(iv) නව සාමාජිකයින් පත් කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) පසුගිය දශකය තුළ ලබා දී ඇති සේවාවන් කවරේද;

(ii) අරමුදල අභ්‍යන්තර/රාජ්‍ය විගණනයකට ලක් වන්නේද;

(iii) 2025 වාර්ෂික වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේද;

(iv) නොඑසේ නම්, අවසාන වරට ඉදිරිපත් කර ඇති වර්ෂය කවරේද;

(v) වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදු වී තිබේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) 2026 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සහ ඒ සඳහා අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරියෙකු ස්ථිරව පත්කර තිබේද;

(ii) මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යා යුතු වන්නේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) ඒ පිළිබඳව ඉදිරිපත් කර ඇති යෝජනා සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'தேசிய பாதுகாப்பு நிதியம்' நிறுவப்பட்டதன் நோக்கங்கள், அதன் சட்டப் பின்னணி மற்றும் அமைப்புருவாக்கம் என்பன யாவை என்பதையும்;

(ii) மேற்படி நிதியத்துக்கு அங்கத்தவர்கள் நியமிக்கப்படும் முறையும் அதற்குத் தேவையான தகைமைகளும் யாவை என்பதையும்;

(iii) மேற்படி நிதியத்துக்கு நிதி கிடைக்கப்பெறும் முறை மற்றும் அதன் தற்போதைய அங்கத்தவர்கள் யாவர் என்பதையும்;

(iv) புதிய அங்கத்தவர்கள் நியமிக்கப்படும் முறை யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நிதியத்தால் கடந்த தசாப்தத்தில் வழங்கப்பட்ட சேவைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி நிதியம் உள்ளக/அரச கணக்காய்வுக்கு உட்படுத்தப்படுகின்றதா என்பதையும்;

(iii) 2025ஆம் ஆண்டுக்கான வருடாந்த அறிக்கை தயாரிக்கப்பட்டு, பாராளுமன்றத்துக்குச் சமர்ப்பிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) இன்றேல், இறுதியாகச் சமர்ப்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(v) வருடாந்த அறிக்கைகளை சமர்ப்பிப்பதில் தாமதங்கள் ஏற்பட்டிருப்பின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) 2026ஆம் ஆண்டுக்கான செயற்பாட்டுத் திட்டம் தயாரிக்கப்பட்டுள்ளதா? மற்றும் அதற்கென அமைச்சின் நிருவாக உத்தியோகத்தர் ஒருவர் நிரந்தரமாக நியமிக்கப்பட்டுள்ளாரா என்பதையும்;

(ii) மேற்படி நிதியத்தைத் தொடர்ந்தும் முன்னெடுத்துச் செல்ல வேண்டுமாயின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) அது தொடர்பாக முன்வைக்கப்பட்டுள்ள முன்மொழிவுகள் சம்பந்தமாக இதுவரை எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he state the -

(i) objectives of establishment, legal basis and composition of the National Defence Fund;

(ii) qualifications required and the procedure followed in appointing members to the said Fund;

(iii) sources of financial income of the said Fund and the names of its current members; and

(iv) manner in which new members are appointed?

(b) Will he also state -

(i) the services that have been provided during the last decade;

(ii) whether the said Fund is subject to an internal/government audit;

[ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා]

(iii) whether the Annual Report for the year 2025 has been prepared and presented to Parliament;

(iv) if not, the year in which it was last presented; and

(v) if delays have occurred in the presentation of Annual Reports, the reasons therefor?

(c) Will he further state -

(i) whether an Action Plan has been prepared for the year 2026 and whether an administrative officer of the Ministry has been permanently appointed for the said purpose;

(ii) if the said Fund is to be continued, the reasons therefor; and

(iii) the measures that have been taken thus far regarding the proposals submitted in that regard?

(d) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) <u>පිහිටුවීමේ අරමුණු</u>

ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 9වන වගන්තියට අනුව එකී අරමුදල පිහිටුවීමේ අරමුණ වන්නේ, තම රාජකාරි කටයුතු ඉටු කරන අතරතුරදී තුවාල ලද හෝ මියගිය, පොලිස් බලකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයෙකුගේ පවුල්වලට යම් ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට වඩාත්ම හේතු වන්නේ යැයි මණ්ඩලය අදහස් කරන ආකාරයට සහ කාර්යයන්ට, අරමුදලට අයත් මුදල් ජනාධිපතිවරයාගේ විධානවලට යටත්ව යොදා ගැනීමයි.

<u>නීතිමය පදනම</u>

1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත මඟින් ජාතික ආරක්ෂක අරමුදල සංස්ථාපනය කර ඇති අතර, 1991 අංක 10 දරන සංශෝධන පනත මඟින් සහ 2018 අංක 16 දරන සංශෝධන පනත මඟින් මෙම අරමුදලට අදාළ නෛතික ප්‍රතිපාදන සංශෝධනය කර ඇත.

<u>සංයුතිය</u>

අ. සභාපති - ජනරජයේ ජනාධිපති ලේකම්වරයා (ජනරජයේ ජනාධිපතිවරයා වශයෙන් පැවති සභාපති ධුරය 2018 අංක 16 සංශෝධන පනත මඟින් ජනරජයේ ජනාධිපති ලේකම්වරයා ලෙස සංශෝධනය කර ඇත.)

ආ. සාමාජික - ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා (ජාතික ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් පැවති සාමාජිකත්වය 2018 අංක 16 සංශෝධන පනත මඟින් ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් සංශෝධනය කර ඇත.)

ඇ. සාමාජික - ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු

(ii) අ. සභාපති - ජනරජයේ ජනාධිපති ලේකම්වරයා නිල බලයෙන් පත් වේ.

ආ. සාමාජික - ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් පත් වේ.

ඇ. සාමාජික - ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයා.

(iii) **අරමුදලට මුදල් ලැබෙන ආකාරය**

ස්ථාවර තැන්පත් පොලී ආදායම

ජාතික ආරක්ෂක අරමුදලට අයත් කොහුවල නිවාස 03ක කුලී ආදායම

**වර්තමාන සාමාජිකයන්**

සභාපති - ආචාර්ය එන්.එස්. කුමානායක මහතා

සාමාජික - එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) - (ආරක්ෂක ලේකම්)

සාමාජික - මහාචාර්ය පූජ්‍යපාද අත්තංගනේ රතනපාල ස්වාමීන් වහන්සේ

(iv) සභාපති - ජනරජයේ ජනාධිපති ලේකම්වරයා නිල බලයෙන් පත් වේ.

සාමාජික - ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් පත් වේ.

සාමාජික - ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයා.

(ආ) (i) **"විරුසිසු ප්‍රදීප" ශිෂ්‍යත්ව ලබා දීමේ ව්‍යාපෘතිය**

5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් රණවිරු දූ දරුවන් සඳහා ක්‍රියාත්මක "විරුසිසු ප්‍රදීප" ශිෂ්‍යත්ව ලබා දීමේ ව්‍යාපෘතිය. එක් ප්‍රතිලාභී දරුවෙක් සඳහා රුපියල් 25,000ක් ළමා ඉතිරි කිරීමේ ගිණුමක් මඟින් ප්‍රදානය කිරීම මේ යටතේ සිදු කරයි.

**"මෙත් සෙවණ" අර්ධ නිවාස ව්‍යාපෘතිය**

රණ විරුවන්ගේ අඩක් ඉදි කරගත් නිවාස සඳහා රුපියල් මිලියනයක උපරිමයකට යටත්ව පිරිනමන මූල්‍යාධාරයක් මත නිවසේ ඉදිකිරීම් සම්පූර්ණ කර දීම.

(ii) ඔව්.

(iii) නැත.

(iv) 2016 වර්ෂයේදී.

(v) මුදල් අමාත්‍යාංශය යටතේ පැවති ජාතික ආරක්ෂක අරමුදල 2018 අංක 16 දරන සංශෝධන පනත මඟින් ආරක්ෂක අමාත්‍යාංශය විෂය පථයට ඇතුළත් කිරීමෙන් පසු මුදල් අමාත්‍යාංශය යටතේ පැවති 2017 කාර්ය සාධන වාර්තාවද සමඟ මේ දක්වා කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරන ලෙස මුදල් අමාත්‍යාංශය මඟින් ලද උපදෙස් අනුව මේ වනවිට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) (i) 2026 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. අමාත්‍යාංශයේ පරිපාලන අංශය යටතේ විෂයයක් වශයෙන් අරමුදලේ පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

(ii) රාජකාරී කටයුතු ඉටු කරන අතරතුරදී තුවාල ලද හෝ මිය ගිය සන්නද්ධ හමුදාවල හෝ පොලිස් බලකායේ යම් සාමාජිකයෙකුට හෝ සාමාජිකයින්ගේ පවුල්වලට සුබසාධන ප්‍රතිලාභ ලබාදීම සහ ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම සුදුසු බව නිරීක්ෂණය කෙරේ.

(iii) ජාතික ආරක්ෂක අරමුදල සහ "අපි වෙනුවෙන් අපි" අරමුදල ඒකාබද්ධ කර තනි අරමුදලක් වශයෙන් පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව විද්වත් කමිටුවක් පත් කර සොයා බලන ලෙස ජාතික ආරක්ෂක අරමුදලේ 15 වන පාලක මණ්ඩල රැස්වීමේදී සිදු කරන ලද සාකච්ඡාවට අදාළව විද්වත් කමිටුවක් පත් කිරීම සහ ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

(ඈ) අදාළ නොවේ.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ජාතික ආරක්ෂක අරමුදල වැනි ඉතාම වැදගත් භාරකාර අරමුදලක, ඒ වාගේම ජනාධිපති ලේකම්වරයා විසින් සභාපති ධුරය දරන මෙවන් අරමුදලක වාර්ෂික වාර්තාවල ප්‍රමාදයක් සිදු වන බවක් පෙනුණා. 2016 සිට ගත් කල දශකයක් වැනි කාලයක සිට කාර්ය සාධක වාර්තා සකසා නැතිවීම පිළිබඳව යම් සොයා බැලීමක් හෝ එයට පාදක වූ හේතූන් සොයා නිසි විමර්ශන කටයුතු කළ යුතු බව ඔබතුමා මෙම සභාවට දන්වන්නේද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන පරිදි මෙය මුදල් අමාත්‍යාංශය යටතේ තමයි 2016ට කලින් තිබුණේ. 2016දී අරගෙන තිබෙනවා.

අපි බලයට පත් වෙලා මේ වැඩ කටයුතු භාර ගත්තාට පස්සේ ජාතික ආරක්ෂක අරමුදල පිළිබඳව විශේෂ විශ්ලේෂණයක් කළා, ඇයි මේ සම්බන්ධ වාර්තා පාර්ලිමේන්තුවට සභාගත කරලා නැත්තේ කියලා. තාක්ෂණික කරුණු රාශියක් එතැන තිබෙනවා. දැන් ඒවා නිරාකරණය කරමින් සිටිනවා. ඒ අනුව අපි සැලසුමක් හදලා තිබෙනවා, 2016 ඉඳලා 2025 වසර දක්වා වාර්තා ලබා දීම සඳහා. විගණනයක් කරලා, විශේෂ අවධානය යොමු කරලා, ඒ සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරින් ගෙන්වලා මේ ගැන කථා කරලා, මේ වාර්තා සකසා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා සාකච්ඡා කරලා දැනට වැඩ පිළිවෙළක් කරගෙන යනවා. බොහෝ දුරට අපිට ඉදිරි මාස කිහිපය ඇතුළත මේක ඉදිරිපත් කර ගන්න පුළුවන් වෙයි කියලා හිතෙනවා.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ජාතික ආරක්ෂක අරමුදල සහ "අපි වෙනුවෙන් අපි" අරමුදල්වලින් සිදු වෙන්නේ එකම කාර්යභාරයක් සහ එකම ප්‍රතිලාභ ලැබෙන ස්වභාවයක්. ඒ අනුව මෙවැනි අරමුදල් දෙකක් පවත්වාගෙන යාම පරිපාලනමය වශයෙන් සහ එහි කාර්යභාරය ද්විකරණයකට - duplicate වීමකට - ලක් වෙනවා. නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේදීත් සඳහන් කළ පරිදි, මේකට යම් කටයුත්තක් කරන බව පෙනෙනවා. අමාත්‍යාංශ මට්ටමෙන් මෙම අරමුදල් දෙක ඒකාබද්ධ ව්‍යුහයක් යටතේ ගෙන, පරිපාලනමය වශයෙන් කටයුතු කිරීම සඳහා යම් සැලසුමකට අනුව කටයුත්තක් වෙනවාද, සැලසුමක් තිබෙනවාද කියන එක දැන ගන්නට කැමතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, ජාතික ආරක්ෂක අරමුදලට හා "අපි වෙනුවෙන් අපි" අරමුදලට ව්‍යවස්ථා දෙකක් තිබෙනවා. ඒ අනුව ඒකේ කාර්යභාරයන් කිහිපයක් තිබෙනවා. පොදුවේ ගත්තාම එය ද්විකරණය වීමක් අපි දකිනවා. ඒ නිසා එහි අමතර පරිපාලනමය වැඩකටයුතු සිද්ධ වෙනවා කියලා අපිට දැනට අවබෝධ වෙලා තිබෙනවා. ඒ නිසා දැන් අපි පාලක මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා මේ සම්බන්ධව කමිටුවක් පත් කරන්න කියලා. ඒ කමිටුවේ නිර්දේශත් අපිට ඉදිරියේදී ලැබෙනවා. එම නිර්දේශත් ලැබුණාට පසුව ගරු ජනාධිපතිතුමාගෙනුත් උපදෙස් අරගෙන කැබිනට් මණ්ඩලයට යොමු කර මේ සම්බන්ධව කටයුතු කරනවා. එතකොට, ඒකෙන් සෑහෙන ප්‍රතිලාභ අපගේ රණ විරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ලබා දෙන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. මේ සම්බන්ධව අපි දැනටමත් විධිමත් සැලැස්මක් සකස් කරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -2192/2026- (1), ගරු රුවන් විජේවීර මහතා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා, න්‍යාය පත්‍ර සහ අනෙකුත් ලිපි ලේඛන: ඩිජිටල් ආකෘතියෙන් සැපයීම

பாராளுமன்ற ஹன்சாட் அறிக்கைகள், ஒழுங்குப் பத்திரங்கள் மற்றும் ஏனைய எழுத்தாவணங்கள்: டிஜிட்டல் வடிவில் வழங்கல்

HANSARDS, ORDER PAPERS AND OTHER DOCUMENTS OF PARLIAMENT: PROVISION IN DIGITAL FORMAT

2194/2026

**7. ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් වෙත පාර්ලිමේන්තු සභා ගර්භය තුළ භාවිතය සඳහා ලබාදෙන හැන්සාඩ් වාර්තා, න්‍යාය පත්‍ර සහ අනෙකුත් ලිපිලේඛන මුද්‍රණය කිරීම සඳහා වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

(ii) එම ලිපිලේඛන ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ලබාදීම මඟින් කඩදාසි භාවිතය අවම කිරීම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම වැඩපිළිවෙළ නිම කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பாராளுமன்ற உறுப்பினர்களுக்கும் அமைச்சர்களுக்கும் பாராளுமன்றத்தின் சபா மண்டபத்தில் உபயோகத்துக்காக வழங்கப்படுகின்ற ஹன்சாட் அறிக்கைகள், ஒழுங்குப் பத்திரங்கள் மற்றும் ஏனைய எழுத்தாவணங்களை அச்சிடுவதற்காக ஆண்டுதோறும் செலவாகும் தொகை யாது என்பதையும்;

(ii) அந்த ஆவணங்களை டிஜிட்டல் வடிவில் வழங்குவதன்மூலம் காகிதப் பயன்பாட்டைக் குறைப்பதற்கு அல்லது முற்றிலும் தவிர்ப்பதற்கு ஏதேனும் வேலைத்திட்டம் தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின், அந்த வேலைத்திட்டத்தை நடைமுறைப்படுத்த இன்றளவில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) அந்த வேலைத்திட்டத்தை நிறைவுசெய்யத் திட்டமிட்டுள்ள திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the annual expenditure incurred for printing Hansard Reports, Order Papers, and other documents provided to the Members of Parliament and Ministers for use within the Parliament Chamber;

(ii) whether a programme has been formulated to minimize or completely eliminate the use of paper by providing those documents in digital format;

(iii) if so, the measures that have been taken so far to implement the said programme; and

(iv) the expected date of completion of the said programme?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අමාත්‍යවරුන් වෙත පාර්ලිමේන්තු සභා ගර්භය තුළ භාවිතය සඳහා ලබා දෙන හැන්සාඩ් වාර්තා, න්‍යාය පුස්තක, න්‍යාය පත්‍ර සහ අනෙකුත් පාර්ලිමේන්තු මුද්‍රණ කටයුතු සඳහා 2023, 2024 හා 2025 වර්ෂවල වැය වූ මුළු මුදල පහත පරිදි වේ.

2023 වර්ෂය සඳහා - රුපියල් මිලියන 45.3

2024 වර්ෂය සඳහා - රුපියල් මිලියන 58.7

2025 වර්ෂය සඳහා - රුපියල් මිලියන 73.1

මෙම සියලුම මුද්‍රිතයන් පාර්ලිමේන්තුවේ ඉල්ලුම පරිදි සිදු කරනු ලැබ ඇත.

(ii) කඩදාසි භාවිතය අවම කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරමින් පවතී.

(iii) 2026.07.21 හා 2026.08.19 දිනැතිව භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පාර්ලිමේන්තු මහ ලේකම් වෙත යොමු කර ඇති ඉල්ලීම් ලිපි අනුව ඉදිරියේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා ඩිජිටල් ආකාරයෙන් පමණක් ඉදිරිපත් කිරීමේ හැකියාව පිළිබඳව පිළිවෙළින් 2026.07.24 හා 2026.08.20 දිනයන්හි පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සලකා බලන ලදුව ඒ සම්බන්ධයෙන් එක් එක් මන්ත්‍රීවරයාගේ කැමැත්ත විමසා බැලීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීමට තීරණය කර ඇත.

එම සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉදිරියේදී ඩිජිටල් ආකාරයෙන් එම ලිපි ලේඛන ලබා ගැනීමට කැමැත්තක් දක්වන මන්ත්‍රීවරුන්ට ඩිජිටල් ආකාරයෙන් ද, මුද්‍රිත පිටපත් - hard copies - ලබා ගැනීමට කැමැත්තක් දක්වන මන්ත්‍රීවරුන්ට hard copies ආකාරයෙන් ද අදාළ ලිපි ලේඛන ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(iv) පූර්වයෙන් සඳහන් කළ සමීක්ෂණය සිදු කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන දිනයකදී මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම කඩදාසි භාවිතය අවම කිරීම වාගේම, පාර්ලිමේන්තුව ප්ලාස්ටික් බෝතල්වලින් තොර කිරීම ගැන මම ගරු අගමැතිතුමියට, ගරු පාර්ලිමේන්තු කටයුතු ඇමතිතුමාට, ගරු කථානායකතුමා ඇතුළුව ඒකට සම්බන්ධ වුණු සියලු පාර්ශ්වවලට ස්තුතිවන්ත වෙනවා. ඒ සඳහා පියවර ගත්තා වාගේම රාජ්‍ය ආයතනවලත් කඩදාසි භාවිතය අවම කිරීමට සහ ප්ලාස්ටික් බෝතල් භාවිතය අවම කිරීමට ගෙන තිබෙන පියවර මොනවාද, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද කියා මම ගරු අගමැතිතුමියගෙන් අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඩිජිටල්කරණය තුළින් තමයි ඒ තත්ත්වය අවම කර ගන්න වෙන්නේ. ඒ සඳහා මේ වන කොට සියලුම අමාත්‍යාංශවල සහ රාජ්‍ය ආයතනවල කටයුතු කරමින් පවතිනවා. නමුත්, ඒ සඳහා යම් කාලයක් යනවා. උදාහරණයක් හැටියට, digital signature එක පිළිගන්න පුළුවන් කියන principle එක දැන් තිබෙනවා. ඒ principle එක අපි establish කරලායි තිබෙන්නේ. විශේෂයෙන්ම ලිපිගොනු හුවමාරු කිරීම වැනි කාරණා ගණනාවක් ඩිජිටල් පද්ධති හරහා කරන්න ඉදිරියට හැකියාව ලැබෙනවා. මම උදාහරණයක් කියන්නම්. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ පිටරට ගමන් පිළිබඳව leave application එක hard copy එකක් හැටියට තමයි ඉස්සර අමාත්‍යාංශයට ආවේ. නමුත් දැන් ඒ සම්පූර්ණ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කරලායි තිබෙන්නේ. ඒ leave application එක විශ්වවිද්‍යාලයේ ඉඳන්ම අමාත්‍යාංශය දක්වා එන්නේත්, approval එක UGC එක හරහා දෙන්නේත් ඩිජිටල් පද්ධතියක් හරහායි. ඉතින් හැම අමාත්‍යාංශයම මෙවැනි ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. අපි හිතනවා, ඩිජිටල්කරණය තවත් ස්ථාපිත වුණාම කඩදාසි භාවිතය බොහෝ දුරට අඩු කර ගන්න අපට පුළුවන් වෙයි කියලා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැන් වැඩ කටයුතු කරගෙන යමින් පවතින බව. ලබන වසරේ සිට එය වේගවත් වනවා කියා අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් මා යොමු කරන ප්‍රශ්නය වන්නේ මෙයයි. දරුවන්ගේ පොත් බෑගය ඉතාම බරයි. ඒ නිසා වන සෞඛ්‍ය ප්‍රශ්නත් තිබෙනවා. දරුවන්ගේ පොත් බෑගයේ බර වැඩි වීම සම්බන්ධව මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා අවධානය යොමු කර තිබෙනවාද, ඩිජිටල්කරණය හරහා හෝ වෙනත් යම්කිසි ක්‍රියාමාර්ගයක් හරහා ඒ සඳහා විසඳුමක් ලැබෙනවාද කියන ප්‍රශ්නය මම ගරු අගමැතිතුමියට යොමු කරනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ප්‍රාථමික පන්තිවල කොහොමටත් තිබෙන්නේ activity books හරහා සිදු වන ඉගෙනුම් ක්‍රියාවලියක්. එතකොට ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රියාවලියක් යන නිසා තවදුරටත් පොත් එහාට මෙහාට ගෙන යන්න අවශ්‍ය වන්නේ නැහැ. පොත තිබෙන්නේ පන්ති කාමරයේ. ළමයා ඒකත් එක්ක වැඩ කරනවා. වාර අවසානයේදී තමයි ඒ පොත ගෙදර ගෙන යන්නේ.

2027 වසරේ ඉඳලා අපි 6 වසරට හඳුන්වා දෙනවා මොඩියුල ක්‍රමය. මොඩියුල කියන්නේ, textbooks තරම් ලොකු පොත් නොවෙයි. ඒ විෂයය අනුව ඒ වාරයට අදාළ module එකක් තමයි දරුවන්ට ලබා දෙන්නේ. ඒක කොහොමටත් printed copy එකක් වෙන්න ඕනෑ. අපට සියලු දේම ඩිජිටල්කරණය කරන්න බැහැ. විශේෂයෙන්ම දරුවන්ට පොත් පත් ලබා දෙන සහ ඒවා සමඟ වැඩ කරන ක්‍රියාවලියක් ඇති කිරීම අවශ්‍ය වෙනවා. නමුත්, මොඩියුල ක්‍රමය තුළින් පොත් බෑගයේ බර නම් සෑහෙන දුරට අඩු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -2205/2026- (1), ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## බටහිර වෛද්‍යවරු සහ ආයුර්වේද වෛද්‍යවරු: බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටි, වැටුප් සහ වරප්‍රසාද
## மேலைத்தேய மற்றும் ஆயுர்வேத மருத்துவர்கள்: ஆட்சேர்ப்பு நடைமுறைகள், சம்பளம் மற்றும் சிறப்புரிமைகள்
## WESTERN AND AYURVEDIC MEDICAL PRACTITIONERS: RECRUITMENT PROCEEDURES, SALARIES AND PRIVILEGES

2247/2026

**9. ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බටහිර වෛද්‍යවරුන් සහ ආයුර්වේද වෛද්‍යවරුන් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන ක්‍රමය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් ප්‍රධාන අංශ කවරේද;

(iii) බටහිර වෛද්‍යවරුන්ට සහ ආයුර්වේද වෛද්‍යවරුන්ට ගෙවනු ලබන වැටුප්, දීමනා සහ වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බටහිර වෛද්‍යවරුන් සහ ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා ලබාදෙන වැටුප්, දීමනා සහ වරප්‍රසාද අතර විෂමතාවක් පවතින්නේද;

(v) එසේ නම්, එම විෂමතා අවම කිරීම සඳහා සහ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மேலைத்தேய மருத்துவர்களையும் ஆயுர்வேத மருத்துவர்களையும் பொதுச் சேவையில் சேர்த்துக்கொள்வதற்கான வழிமுறைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) சுதேச மருத்துவத்துறைக்குச் சொந்தமான முக்கிய பிரிவுகள் யாவை என்பதையும்;

(iii) மேலைத்தேய மருத்துவர்களுக்கும் ஆயுர்வேத மருத்துவர்களுக்கும் வழங்கப்படும் சம்பளம், கொடுப்பனவுகள் மற்றும் சிறப்புரிமைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

[ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා]

(iv) மேலைத்தேய மருத்துவர்களுக்கும் ஆயுர்வேத மருத்துவர்களுக்கும் வழங்கப்படும் சம்பளம், கொடுப்பனவுகள் மற்றும் சிறப்புரிமைகளுக்கு இடையே முரண்பாடுகள் காணப்படுகின்றனவா என்பதையும்;

(v) ஆமெனில், மேற்படி முரண்பாடுகளைக் குறைப்பதற்கும் சுதேச மருத்துவத்துறையை ஒழுங்குறுத்துவதற்கும் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the respective procedures that govern the recruitment of western medical practitioners and Ayurvedic medical practitioners into the Public Service;

(ii) the principal sectors that fall within the field of indigenous medicine;

(iii) the salaries, allowances and privileges provided to western and Ayurvedic medical practitioners, separately;

(iv) whether a disparity exists between the salaries, allowances and privileges provided to western medical practitioners and those that are provided to Ayurvedic medical practitioners; and

(v) if so, the measures that will be taken to minimize such disparities and to regulate the field of indigenous medicine?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බටහිර වෛද්‍යවරුන්

වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය සාර්ථක ලෙස අවසන් කරනු ලබන උපාධිධාරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල්වල වසරක සීමාවාසික පුහුණුවකට යොමු කරනු ලබන අතර, එම පුහුණුව නිසි පරිදි නිම කරන සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගන්නා ලද නිලධාරින් ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් ලෙස රජය විසින් පත්වීම් ලබා දෙනු ලබයි.

ආයුර්වේද වෛද්‍යවරුන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එක් එක් වර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන කුසලතා ලේඛනය පදනම් කර ගනිමින් සීමාවාසික වෛද්‍ය පුහුණුව සඳහා වෛද්‍ය සිසුන් ඇතුළත් කර ගනු ලැබේ. එය වසරක සීමාවාසික පුහුණු කාලසීමාවක් වේ. වසරක සීමාවාසික පුහුණුව සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචි සහතිකය ලබාදීම සිදු වේ. වෛද්‍ය ලියාපදිංචි සහතිකය ලබා ගැනීමෙන් අනතුරුව වෛද්‍ය වෘත්තියේ යෙදීම සඳහා නිලධාරින්ට හැකියාව පවතී.

ආයුර්වේද වෛද්‍ය නිලධාරින් රාජ්‍ය සේවයට බඳවා ගැනීම පවත්නා රජයන් විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත රඳා පවතින අතර, අංක 2199/10 දරන 2020.10.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව බඳවා ගැනීම් සිදු කරනු ලබයි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි උපාධිය ලත් උපාධිධාරින් අදාළ වර්ෂවල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන කුසලතා ලේඛනයේ අනුපිළිවෙළ පදනම් කරගෙන පවත්නා පුරප්පාඩු අනුව බඳවා ගනු ලැබේ. වසර කිහිපයකට අදාළ උපාධිධාරින් අයදුම්කරුවන් ලෙස ඉදිරිපත් වන අවස්ථාවකදී ඒ ඒ වර්ෂවල කුසලතා ලේඛනය පදනම් කර ගනිමින් එම කුසලතා ලේඛනයෙහි සඳහන් අනුපිළිවෙළට ප්‍රමුඛතාව දෙමින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ. ඒ අනුව අපි මෑතකදී 303දෙනෙකු බඳවා ගනු ලැබුවා.

(ii) ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය චිකිත්සා.

(iii) බටහිර වෛද්‍යවරුන්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා ගැන මන්ත්‍රීතුමා අහලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, බටහිර වෛද්‍යවරුන්ගේ Preliminary Grade එකේ, ඒ කියන්නේ internship එක අවසන් වෙලා රාජ්‍ය සේවයට පත් වීම ලබපු වෛද්‍යවරයෙකුට 2024.12.31වන කොට මූලික වැටුප ලෙස තිබුණේ රුපියල් 52,955යි. 2027 ජනවාරි 01වැනි දා වෙන කොට ඒ අයට මූලික වැටුප රුපියල් 91,750ක් ලැබෙනවා. ඊට අමතරව දීමනා හැටියට ජීවන වියදම් දීමනාව රුපියල් 17,800යි. Pensionable allowance එක රුපියල් 1,700යි. Non-pensionable allowance එක රුපියල් 2,125යි. DAT එක රුපියල් 70,000යි. Telephone allowance එක රුපියල් 3,000ක් හැටියට හම්බ වෙනවා.

Grade II වෛද්‍ය නිලධාරියෙකුට 2024.12.31 තිබුණේ මූලික වැටුප රුපියල් 58,305යි. 2027 ජනවාරි වෙන කොට ඒ අයට 101,370ක් ලැබෙනවා. ඊට අමතරව ජීවන වියදම් දීමනාව රුපියල් 17,800ක් ලැබෙනවා. Pensionable allowance එක රුපියල් 1,700ක් ලැබෙනවා. Non -pensionable allowance එක රුපියල් 1,700ක් ලැබෙනවා. DAT එක රුපියල් 70,000ක් සහ දුරකථන දීමනා රුපියල් 3,000ක් හැටියට දීමනා ලැබෙනවා.

Grade I වෛද්‍ය නිලධාරියෙකුට 2024.12.31වන දා වෙන කොට තිබුණේ මූලික වැටුප රුපියල් 71,805යි. ගරු මන්ත්‍රීතුමනි, ඒක අපි වැඩි කරලා 2027 ජනවාරි වෙන කොට රුපියල් 125,670 දක්වා ගෙනෙනවා. ඒ අයගේ ජීවන වියදම් දීමනාව රුපියල් 17,800යි. Pensionable allowance එක රුපියල් 3,400යි.

Non-pensionable allowance එක රුපියල් 400යි. DAT එක රුපියල් 70,000යි. දුරකථන දීමනාව රුපියල් 3,000යි. දීමනා හැටියට තමයි ඒවා ලැබෙන්නේ.

විශේෂඥ වෛද්‍යවරයෙකුට 2024.12.31වන දා වෙනකොට මූලික වැටුප තිබුණේ, රුපියල් 88,000යි. 2027 ජනවාරි 01වැනි දායින් පස්සේ ඒ අයට මූලික වැටුප හැටියට ලැබෙනවා රුපියල් 156,000ක්. ඊට අමතරව ජීවන වියදම් දීමනාව රුපියල් 17,800යි. Pensionable allowance එක රුපියල් 3,400ක්, NPA එක රුපියල් 400යි. DAT එක රුපියල් 70,000යි. දුරකථන දීමනාව ලෙස රුපියල් 6,000ක් ලැබෙනවා.

ඊට අමතරව අමතර රාජකාරි දීමනා හැටියට මෙන්න මෙහෙම වැඩි කළා. 2024.12.31ට ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍යවරයෙකුට පැයකට රුපියල් 687ක්ව තිබුණු අමතර රාජකාරි දීමනාව රුපියල් 795 දක්වා වැඩි කළා. Grade II වෛද්‍ය නිලධාරියෙකුට පැයකට රුපියල් 796ක්ව තිබුණු දීමනාව රුපියල් 967 දක්වා වැඩි කළා. Grade II Medical Officer කෙනෙකුට පැයකට ලැබුණු රුපියල් 1,101 දීමනාව රුපියල් 1,291ක් දක්වා වැඩි කළා. විශේෂඥ වෛද්‍යවරයෙකුට පැයකට රුපියල් 1,302ක්ව තිබුණු දීමනාව රුපියල් 1,542 දක්වා වැඩි කරලා තිබෙනවා.

Grade IIIවල SL 2 category එකේ ඉන්න ආයුර්වේද වෛද්‍යවරයෙකුගේ මූලික වැටුප රුපියල් 94,150යි. Grade IIවල SL 2 category එකේ ඉන්න වෛද්‍යවරයෙකුගේ මූලික වැටුප රුපියල් 101,370යි. මම මේ කියන්නේ මූලික වැටුප. Grade Iවල SL 2 category එකේ ඉන්න වෛද්‍යවරයෙකුගේ මූලික වැටුප රුපියල් 125,670යි. SL 3 category එකේ ඉන්න විශේෂඥ වෛද්‍යවරයෙකුගේ මූලික වැටුප රුපියල් 156,000යි. අපි 2027 ජනවාරි පළමුවැනි දා මූලික වැටුප් වැඩි කරනකොට ඒගොල්ලන්ගේ වැටුප් වැඩි කිරීමක් සිදු වෙනවා.

ඊට අමතරව ආයුර්වේද වෛද්‍යවරුන්ට විධායක දීමනාව හැටියට රුපියල් 25,000කුත්, Grade II සහ Grade IIIවලට දුරකථන දීමනාව හැටියට රුපියල් 3,000කුත්, Grade Iවලට රුපියල් 6,000කුත්, ජීවන වියදම් දීමනාව හැටියට රුපියල් 17,800කුත් ලැබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

(iv) බටහිර වෛද්‍යවරුන්ට සහ ආයුර්වේද වෛද්‍යවරුන්ට ලැබෙන මූලික වැටුප, ගෙවන දීමනා, වරප්‍රසාද බොහොමයක් සමාන වෙනවා. ඔබතුමාට ඒ විස්තර බලාගන්න පුළුවන්, මේ ඇමුණුම් මඟින්. **ඇමුණුම 01 සහ 02 මම සභාගත* කරනවා.**

(v) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා සතුටුදායක පිළිතුරක් ලබා දීම ගැන. පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, බොහොම ස්තුතිවන්ත වෙනවා ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමාට. එතුමා අහපු ප්‍රශ්නය යටතේ අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා වෛද්‍යවරයෙක් නිසා මේ ගැන හොඳටම දැනුවත් වෙලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, ඔබතුමා මේ ප්‍රශ්නයට උත්තරයක් දෙයි කියලා. විශේෂයෙන්ම හෝමියෝපති වෛද්‍යවරුන්ගේ ගැටලුව ගත්තාම, 15දෙනෙක් නිසා 120දෙනෙකුට ලියාපදිංචි වෙන්න බැරි වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ හෝමියෝපති වෛද්‍යවරු දිගින් දිගටම ඇවිල්ලා අපේ විපක්ෂ නායකතුමාත් හම්බ වුණා. මම හිතන හැටියට ඒ අය ඔබතුමාවත් හම්බ වෙලා තිබෙනවා. මේ වෛද්‍යවරු 120දෙනෙකුට ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා. ඒ අය ලියාපදිංචි කරලා නැහැ. ඒ අයගේ විභාගය දිනෙන් දින, දිනෙන් දින කල් යනවා. මේ 15දෙනාගේ ගැටලුව වෙන පැත්තකට දමලා,-

මෙතැන 120දෙනෙක් ඉන්නවා. මේ, අපේ රටේ ජනතාවට ප්‍රතිකාර කරන්න පුළුවන් වෛද්‍යවරු. ඉදිරියේදී මේ අය ලියාපදිංචි කිරීම සඳහා ඔබතුමාට මොනවා හරි වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

දැනට ප්‍රතිකාර කරන වෛද්‍යවරු සම්බන්ධයෙන් සහ මේ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය සම්බන්ධයෙන් පැමිණිලි කිහිපයක්ම අමාත්‍යාංශයට ලැබිලා තිබුණා. මම හෝමියෝපති වෛද්‍ය සභාව සහ ඒ පාර්ශ්ව ගෙනැල්ලා ඒ ගැන සාකච්ඡා කළා. පනත ප්‍රකාරව, දැනට විභාගයට ලියලා නැති කණ්ඩායමට තුන්වැනි අවස්ථාව ලබා දීම සඳහා අපි ඉක්මනට කරයුතු කරනවා. බොහෝ විට ඔක්තෝබර් මාසයට කලින් ඒ විභාගය පැවැත්වීමට අපි කටයුතු කරනවා. කඩිනමින් ඒ විභාගය අපි පවත්වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ධර්මසේන මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, 1961 අංක 31 දරන ආයුර්වේද පනත ගැන ඔබතුමා දන්නවා. 1941 අංක 17 දරන ස්වදේශීය වෛද්‍ය ආඥා පනතයි, ආයුර්වේද වෛද්‍ය සභා ආඥා පනතයි දෙක එකට එකතු

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

කරලා තමයි 1961දී මේ ආයුර්වේද පනත හදලා තිබෙන්නේ. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, පසුගිය ආණ්ඩුව කාලයේ ඔබතුමා පාර්ලිමේන්තුව නියෝජනය කළේ නැහැ. අපේ ගරු හරිනි අමරසූරිය මැතිනිය නම් ඒ කාලයේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. පසුගිය ආණ්ඩුව මේක ගේනකොට අපි ඒකට විශාල බලපෑමක් එල්ල කළා. මොකද, මේ ආයුර්වේද පනතේ විශාල ප්‍රශ්න ගණනාවක් තිබෙන නිසා, ගරු ඇමතිතුමනි. ඒ නිසා විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. අපි මේ කාරණයට විශාල විරෝධයක් දැක්වූවා. නමුත්, ඒ අය අපි කියපු දේවල් අහන්නේ නැතිව මේක ගෙනාවා. අපි මේ ගැන අදාළ කමිටුවලට ගිහිල්ලාත් කථා කළා. නමුත් කිසි දෙයක් වුණේ නැහැ.

ගරු ඇමතිතුමනි, මේ වන විට පාරම්පරික වෛද්‍යවරුන්ට විශාල අර්බුදයක් මතු වෙලා තිබෙන බව ඔබතුමා දන්නවා. එක කාරණයක් තමයි, විශේෂයෙන්ම අද වනතුරු පාරම්පරික වෛද්‍යවරුන්ගේ සංගණනයක් කරලා නැහැ. ඒ අයගේ ලැයිස්තුවක් නැහැ. අඩුම තරමින් ලංකාවේ පාරම්පරික වෛද්‍යවරු කී දෙනෙක් ඉන්නවා ද කියලා දන්නේ නැහැ. ඇත්තවශයෙන්ම ඒ අයගේ නම් ගම්, ලිපිනයන් කිසිම දෙයක් අද වන විටත් කිසිම ලේඛනයකට ඇතුළත් වෙලා නැහැ. ගරු අගමැතිතුමියනි, මේ නිසා දැන් විශාල අර්බුද ප්‍රමාණයක් මතු වෙලා තිබෙනවා. මේ කාරණා නිසා උපාධිධාරීන් සහ මේ අය අතර ප්‍රශ්න ගණනාවක් මතුවෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ආයුර්වේද පනතේ තිබෙන කාරණා එක්ක ගත්තොත්, ගුරු වෛද්‍යවරයෙකුට ලියාපදිංචිය සඳහා අත්සන් කරන්න පුළුවන් එක් අයෙකු වෙනුවෙන් පමණයි. ඒ කියන්නේ ඒ අය යටතේ ඉන්න සේවකයන්ගෙන් එක්කෙනෙකුට පමණයි. ඒ සේවකයන් නේ, පුරුදු වෙලා, පුරුදු වෙලා ඉදිරියට එන්නේ. ඒ අයගෙන් එක් අයෙක් වෙනුවෙන් පමණයි ලියාපදිංචිය සඳහා අත්සන් කරන්න පුළුවන්. එතකොට එවැනි කිහිප දෙනෙක් තියාගෙන උගන්වන්න බැහැ.

දෙවැනි කාරණය මේකයි. මේ අය ලියාපදිංචි කිරීමේදී අධ්‍යාපන සුදුසුකම් විධියට අ.පො.ස. උසස් පෙළ විභාගය ඉල්ලා සිටිනවා. ඇත්තටම සමහර වෙලාවට අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල තිබෙන ළමයෙක් ඇවිල්ලා පාරම්පරික වෛද්‍යවරයෙක් ළඟ තෙල් බෙහෙත් ගගා එතැනට වෙලා උදේ ඉඳන් රාත්‍රී වෙනකම් ඉන්නේ නැහැ. නමුත්, ඒ අයට අද විශාල අර්බුදයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. මේ අයට වෙනත් විකල්පයක් නැහැ. මේ අයට ආයුර්වේද වෛද්‍ය සභාවේත් නියෝජනයක් නැති තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගේ අහන්න කැමතියි, මේකට විසඳුමක් විධියට කළ හැක්කේ කුමක්ද කියලා. ඇත්තටම අපේ විපක්ෂ නායකතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමාත් සෑහෙන වතාවක් මේ අයත් එක්ක සාකච්ඡා කර තිබෙනවා. අපි මේ ගැන ඇති වෙනකම් කථා කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේකට අවශ්‍ය විසඳුම දෙන්න ඕනෑ ඔබතුමායි. ඒ නිසා, පාරම්පරික වෛද්‍ය සභාවක් ස්ථාපිත කරන්න බැරිද කියලා මම ඔබතුමාගේ විශේෂයෙන්ම අහන්න කැමැතියි. ලංකාවේ ඉන්න පාරම්පරික වෛද්‍යවරු වෙනුවෙන් අපට එවැනි දෙයක් කරන්න බැරිද? මොකද, මේ අය රැක ගත්තේ නැත්නම් ලොකු අර්බුදයක් මතු වෙනවා. උදාහරණයක් ගත්තොත්, ඔබතුමාම දන්නවා, මේ අයට ගිහිල්ලා ගහක කොළයක් කඩා ගන්න බැහැ. ඊළඟට, ඒ අයට වවන්න පුළුවන් බෙහෙත් ද්‍රව්‍ය තිබෙනවා. මා ළඟ ඒ සම්බන්ධ ලැයිස්තු තිබෙනවා. මම ඔබතුමාට ඒවා ඉදිරිපත් කරන්නම්.

ලංකාවේ පාරම්පරික වෛද්‍යවරු කොළ ටිකක් අරගෙන ගිහිල්ලා, එහෙම නේ බෙහෙත් කළේ. අපේ ජනාධිපතිතුමා කියන විධියට කොත්තමල්ලි ටිකක් බොන එකටත් වඩා, ඉස්සර අපේ අතක් තුවාල වුණොත් නිදිකුම්බා කොළ ටිකක් කොටලා තියනවා. ඒ වාගේ දෙයක්වත් කරන්න බැරි තැනකට අද මේ ක්ෂේත්‍රය තල්ලු වෙලා තිබෙනවා. පාවිච්චි කරන්න පුළුවන් බෙහෙත් පවා දාලා තිබෙනවා, මෙන්න මේවා තමයි දාන්න පුළුවන් කියලා. ගම්වල ඉන්න වෙද මහත්වරු ගමේ කොළ ටිකක් අරගෙන ගිහිල්ලා; ගහක කොළයක් කඩලා තමයි බෙහෙත් කළේ. දැන්, ඒකත් නතර කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ආයුර්වේද පනත කිසියම් විධියකට සංශෝධනය කරලා ඒ අයට සාධාරණයක් කරන්න යම්කිසි වැඩ පිළිවෙළක් කරනවාද කියලා ගරු ඇමතිතුමාගෙන් මා අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඒ හදපු රෙගුලාසි පාරම්පරික වෛද්‍යවරුන්ට, පාරම්පරික වෛද්‍ය ක්ෂේත්‍රයට තදබල ලෙස බාධා ඇති කරනවා. ඇත්ත, පාරම්පරික වෛද්‍ය ක්ෂේත්‍රය කියන්නේ වසර දහස් ගණනක් තිස්සේ ක්‍රමානුකූලව වර්ධනය වෙච්ච ක්ෂේත්‍රයක්. ගරු කථානායකතුමනි, ඒකට නීති හදනකොට අදාළ සියලු පාර්ශ්ව එක්ක කථා කරන්න ඕනෑ. නමුත් ඒ කිසිම කෙනෙක් එක්ක කථා කරලා නැහැ. ඔබතුමාත් ඒ ආණ්ඩුවේ හිටියාද මන්දා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම නැහැ. අපි ඒකට විරුද්ධවයි කථා කළේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒකේ විතරයි හිටියේ නැත්තේ, නේ. ගරු කථානායකතුමනි, ඒ රෙගුලාසි ගැන බැලුවාම -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කියන්න, ඒක වැරැදියි කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඒ රෙගුලාසි ගැන කිසි කෙනෙක් එක්ක කථා කරලා නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපි ඒවාට විරුද්ධව කථා කළා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ආයුර්වේද වෛද්‍යවරු එක්ක කථා කරලා නැහැ; ඖෂධ නිෂ්පාදකවරු එක්ක කථා කරලා නැහැ; ඖෂධ ශල්‍ය අංශ එක්ක

කථා කරලා නැහැ; ආනයනකරුවන් එක්ක කථා කරලා නැහැ. ඒ කවුරුවත් එක්ක කථා නොකර ගැසට් එකක් ගහලා තිබෙනවා. ඒකෙන් ක්ෂේත්‍රයේ ඉස්සරහට යන්න බැහැ. ඒ නිසා අපි නීතිපති දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කරලා අවශ්‍ය කටයුතු සිදුකර තිබෙනවා. අපි ඒකට සියලු පාර්ශ්ව සහභාගි කරවාගෙන තිබෙනවා. මොකද, මේ ගැටෙ ලිහාගන්න ඕනෑ. හිටපු රාජ්‍ය ඇමතිතුමා දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳව එළියේ ගොඩක් කථා කරලා, මේක සෑහෙන්න block කරලා තිබෙන්නේ. හොඳ වෙලාවට නීතිපති දෙපාර්තමේන්තුව අපට යම් ක්‍රමයක් පෙන්වලා දුන්නා, මෙතැනින් එළියට එන්න. ගරු මන්ත්‍රීතුමනි, එහෙම නැතිව ආයුර්වේද ඖෂධ සහ නිෂ්පාදන නියාමන සභාවට ඒ මත කටයුතු කරන්න සිද්ධ වුණා නම්, මේ රටේ අවුරුදු 100ක් විතර තිබුණු දේශීය ඖෂධ නිෂ්පාදනශාලාත් වැහෙනවා. ඒ අනතුර තිබුණා. අපි ඒවා ක්‍රමානුකූලව නිවැරදි කරගෙන යනවා.

ඒ වාගේම, ඔබතුමා කියපු විධියට කමිටු වාර්තාවක් ලැබිලා තිබෙනවා. නමුත් මම ඒකට අත්සන් කළේ නැහැ. මොකද, එක පැත්තකට බරවෙච්ච වාර්තාවක් තමයි ඇවිල්ලා තිබුණේ. කොහොම නමුත්, අපි පාරම්පරික වෛද්‍යවරුන්ගේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරනවා. මම කණ්ඩායම් කිහිපයක් මුණ ගැහුණා. මම ඒ හැමදෙනාටම කිව්වේ, ඒ අය අතරේ එකඟතාවෙන් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න ඕනෑ කියලායි. මොකද, එතැනත් අදහස්වල සංකූලතා තිබෙනවා; ගැටුම් තිබෙනවා. ඒ ක්ෂේත්‍රයෙන් අපට අදහසක් ලැබුණොත්, ඇත්ත පාරම්පරික වෛද්‍ය පවුල්වල - පරම්පරාවල - එකඟතාව ලැබුණොත් එතැනින් එහාට කටයුතු කරන්න අපට පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. මේ ප්‍රශ්නය මතු කළාට ඔබතුමාට බොහොම ස්තුතියි.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය: අඩු ආදායම්ලාභී පවුල් සඳහා 2025/2026 වර්ෂවල ඉදිකරන ලද නිවාස

## தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை: 2025/2026ஆம் ஆண்டுகளில் குறைந்த வருமானம் பெறும் குடும்பங்களுக்காக நிர்மாணிக்கப்பட்டுள்ள வீடுகள்

NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY: HOUSES CONSTRUCTED FOR LOW-INCOME FAMILIES IN 2025/ 2026

2269/2026

**10.** ගරු රුවන් මාපලගම මහතා
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා 2025 සහ 2026 වර්ෂවල ඉදිකර ඇති නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අඩු ආදායම්ලාභී පවුල් සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම දිස්ත්‍රික්කයේ 2027 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා කාලසීමාව තුළ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉදිකිරීමට සැලසුම් කර ඇති නිවාස ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම එක් නිවාස ඒකකයකට ලබාදෙන ආධාර මුදල කොපමණද;

(v) නිවාස සඳහා ආධාර ලබාදෙන ප්‍රතිලාභීන් තෝරාගනු ලබන නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை யால் குறைந்த வருமானம் பெறும் குடும்பங்களுக்காக 2025ஆம் மற்றும் 2026ஆம் ஆண்டுகளில் நிர்மாணிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) கம்பஹா மாவட்டத்தில் குறைந்த வருமானம் பெறும் குடும்பங்களுக்காக நிர்மாணிக்கப் பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி மாவட்டத்தில் 2027ஆம் ஆண்டு தொடக்கம் 2029ஆம் ஆண்டு வரையான காலப்பகுதிக்குள் குறைந்த வருமானம் பெறும் குடும்பங்களுக்காக நிர்மாணிக்கத் திட்டமிடப் பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) ஒவ்வொரு வீட்டு அலகுக்கும் வழங்கப்படும் உதவித் தொகை யாது என்பதையும்;

(v) வீட்டுக்கான உதவித் தொகையை வழங்குவ தற்குப் பயனாளிகளைத் தெரிவுசெய்யும் அளவுகோல்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House the -

(i) number of housing units constructed for low-income families by the National Housing Development Authority in the years 2025 and 2026, separately;

(ii) number of houses constructed for low-income families in the Gampaha District;

(iii) number of housing units planned to be constructed for low-income families in the said district during the period from 2027 to 2029;

(iv) amount of the grant provided for each such housing unit; and

(v) criteria adopted in selecting beneficiaries for housing grants?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් 2025 වර්ෂයේ ක්‍රියාත්මක වූ ආධාර වැඩසටහන යටතේ දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස 3,813ක් ඉදිකර ඇත. 2026 වර්ෂයේදී ද එම වැඩසටහන "නමන්ගේම තැනක්

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

- ලස්සන ජීවිතයක්" ආධාර වැඩසටහන නමින් ඉහත ආකාරයෙන්ම අඩු ආදායම්ලාභී පවුල් 3,419ක් තෝරාගෙන නිවාස ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

සෙවණ නිවාස ආධාර වැඩසටහන යටතේ 2025 වර්ෂයේ නිවාස 42ක් ඉදිකර ඇති අතර, 2026 වර්ෂයේ පවුල් 179ක් තෝරාගෙන නිවාස ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

(ii) ගම්පහ දිස්ත්‍රික්කයේ 2025 වර්ෂයේදී ක්‍රියාත්මක වූ ආධාර වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස 298ක් ඉදිකර ඇත.

එම වැඩසටහනම "තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක්" ආධාර වැඩසටහන නමින් 2026 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් 680ක් තෝරාගෙන නිවාස ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

2025 වර්ෂයේ සෙවණ නිවාස ආධාර වැඩසටහන යටතේ නිවාස 15ක් ගම්පහ දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති අතර, 2026 වර්ෂයේ පවුල් 12ක් තෝරාගෙන නිවාස ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

ඒ අනුව, 2025 අවුරුද්දේ දළ වශයෙන් නිවාස 315ක් වාගේම, 2026 වර්ෂයේ දළ වශයෙන් නිවාස 700ක් ගම්පහ දිස්ත්‍රික්කයේ ඉදිවෙමින් තිබෙනවා.

(iii) 2027-2029 දක්වා කාල සීමාවට අදාළව ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් පිළිබඳව පවතින දත්ත පදනම්කොටගෙන සැලසුම් සකස් කරමින් පවතී.

වාර්ෂිකව රාජ්‍ය අයවැය මඟින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන දිස්ත්‍රික්කයේ පවතින ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව හා නිවාස අවශ්‍යතාව සැලකිල්ලට ගෙන ඉදිකරනු ලබන නිවාස සංඛ්‍යාව තීරණය කරනු ලබයි.

(iv) 2025-2026 වර්ෂවල ආධාර වැඩසටහන් දෙකෙහිම නව නිවසක් ඉදිකිරීම සඳහා උපරිම ලක්ෂ 10ක ආධාර මුදලක් පිරිනමනු ලැබේ.

සෙවණ නිවාස ආධාර වැඩසටහන යටතේ පමණක් නිවාස වැඩිදියුණු කිරීම සඳහා උපරිම රුපියල් 750,000ක මුදලක් පිරිනමනු ලැබේ.

2027 වර්ෂයේදී වර්ග අඩි 55ක පමණ නව නිවසක් ඉදිකිරීමේදී උපරිමය ලක්ෂ 10ක මුදලක් ද, ජීවත් වන නිවසක් වැඩිදියුණු කිරීමේදී සෙවණ අරමුදලින් රුපියල් 750,000ක ආධාර මුදලක් ලබා දීමට සැලසුම් කර ඇත. 2028 වර්ෂයේ සිට ඉදිරි වර්ෂවලදී ඉදිකිරීමේ පිරිවැය සැලකිල්ලට ගෙන ලබාදෙන ආධාර/ණය මුදල වැඩි කිරීම සලකා බලනු ලැබේ.

(v) නිවාස සඳහා ආධාර ලබාදෙන ප්‍රතිලාභීන් තෝරාගනු ලබන නිර්ණායක පිළිබඳව සවිස්තරාත්මකව "තමන්ගේම තැනක්-ලස්සන ජීවිතයක්" නිවාස ආධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අත්වැලෙහි හා "සෙවණ ආධාර" වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අත්වැලෙහි දැක්වෙන අතර එය ඇමුණුම් මඟින් ඉදිරිපත් කර ඇත.

එමෙන්ම නිවාස සඳහා ආධාර ලබා දීමේදී ප්‍රතිලාභීන් වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය ද ඇමුණුමක් ලෙස මේ සමඟ ඉදිරිපත් කර ඇත.

**ඇමුණුම් සියල්ල මා සභාගත* කරනවා.**

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
ස්තුතියි, ගරු ඇමතිතුමනි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගම්පහ දිස්ත්‍රික්කයේ, නිට්ටඹුව, රන්පොකුණුගම නිවාස සංකීර්ණයේ අතුරු නිවාස ව්‍යාපෘතියක් විධියට 2018 වර්ෂයේදී ගුරු ගම්මානයක් ආරම්භ කර තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේ යටතේ, විවිධ ශාරීරික දුබලතා තිබෙන පාසල් ගුරුවරුන් විසිදෙනෙකුට ඉඩම් කැබලි 20ක් ලබා දී තිබෙනවා. ඔවුන්ට පොරොන්දු වෙලා තිබෙන්නේ ඉඩම සමඟ නිවසක අයිතිය ලබා දෙනවා කියලායි. හැබැයි, අද වෙනකොට ඒ නිවසත් භාගයට ඉදිවෙලා තිබෙන්නේ. ඒ වාගේම, ඉඩමෙහි අයිතිය ලබාගන්න ගියාම ඒක ණයක් බවට පත්වෙලා තිබෙනවා. මේ තත්ත්වය නිසා මේ පාසල් ගුරුවරු විශාල මානසික සහ ආර්ථික පීඩාවකට ලක්වෙලා තිබෙනවා. සමහර අයට ඉඩමේ අයිතිය ලබාගන්න රුපියල් ලක්ෂ 28ක්, 30ක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම, රන්පොකුණුගම නිවාස සංකීර්ණයේම තිබෙන රනිඳුගම, 2019 වර්ෂයේ ක්‍රියාත්මක තවත් නිවාස ව්‍යාපෘතියක්. එම නිවාස හිමිකම වෙනුවෙන් හිමිකම් ප්‍රදාන පත්‍රයක් ඔවුන්ට ලබා දී තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ ප්‍රදාන පත්‍රයේ සඳහන් වෙනවා "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ හා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මහ පෙන්වීමෙන් ක්‍රියාත්මක "සැමට සෙවණ" නිවාස ව්‍යාපෘතියේ රනිඳුගම ආදර්ශ ගම්මානයේ අංක 18 නිවසෙහි හිමිකාරිත්වය ප්‍රදානය කළ බව සතුටින් දැනුම් දෙමි" කියලා. මෙන්න මේ A4 කඩදාසිය පමණයි ඔවුන්ට තිබෙන්නේ. ඒ ඉඩමේ හිමිකම ලබා ගැනීමේ හැකියාවක් නැහැ. ගරු ඇමතිතුමනි, මේ ගුරු ගම්මානයේ සහ රනිඳුගම නිවාසවල නිවාස හිමියන් 50කට ආසන්න ප්‍රමාණයක් සිටිනවා. ඔවුන්ට එම ඉඩම්වල හිමිකම ලබා ගැනීමට යම්කිසි ක්‍රියාමාර්ගයක් සකස් කළ හැකිද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ඔය දීලා තිබෙන හිමිකම් පත්‍රයේ එවකට හිටපු ජනාධිපතිතුමාගේ නම තිබුණා, අගමැතිතුමාගේ නමත් තිබුණා. නිවාස විෂය භාරව හිටපු ඇමතිතුමාගේ නමත් තිබෙනවාද?

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
ජනාධිපතිතුමා ලෙස මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නම, අග්‍රාමාත්‍යවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නම, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා ලෙස ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නම සඳහන් වනවා, එම හිමිකම් පත්‍රයේ.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

2015-2019 කාලයේ නේද? ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා ඔබතුමාගේ යහළුවා නේද? මම දැකලා තිබෙනවා, ඔතැනින් එනකොට කථා බහ කරමින් ඉන්නවා. ඒ නිසා එතුමාගෙන් ඒ ගැන පොඩ්ඩක් අහලා බලන්න. මොකද දන්නවාද? එතුමන්ලා ඒ කාලයේ කරපු සමහර ඒවා අපටවත් තේරුම් ගන්න බැහැ. 2015-2019 කාලයේ ඇත්තටම නිවාස සංවර්ධන අධිකාරිය හරහා ගොඩක් දේවල් කරලා තිබෙනවා. ගොඩක් ඒවා අතරමඟ නවතා දමා තිබෙනවා. සමහර නිවාස ව්‍යාපෘති ගැන තේරුම් ගන්න බැහැ. හරිම සංකීර්ණයි. ඒවා විසඳන්න ගියාම ප්‍රශ්න තිබෙන බව පෙනෙනවා. ඇත්තටම සමහර පවුල්වලට ගොඩක් අසාධාරණකම් සිදු වෙලාත් තිබෙනවා. ඔවුන් අසරණ වෙලා තිබෙනවා. සමහර ඒවාට අපට උත්තරයක් දී ගන්නත් බැහැ. ගෙවල් දීලා තිබෙනවා, ණය දීලා තිබෙනවා, ආධාර දීලා තිබෙනවා. ඔය වාගේ ඉඩම් දෙනවා කියලා, ඉඩමේ හිමිකම දෙනවා කියලා කොළ කෑලි දීලා තිබෙනවා. ගොඩක් දේවල් කරලා තිබෙනවා. හරිම සංකීර්ණයි. දැන් ඉතින්, අපේ තේ ප්‍රශ්න. ඒ කියන්නේ, තමන්ගේ දේශපාලන සිහින සැබෑ කර ගන්නයි, ඡන්ද ගොඩ වැඩි කර ගන්නයි කැත විධියට පාවිච්චි කළ දේශපාලන මෙවලමක් තමයි, නිවාස සංවර්ධන අධිකාරිය. ඒ අධිකාරියත් විනාශ කරලා, ඒ වැඩකටයුතුත් විනාශ කරලා, මිනිසුන්වත් අමාරුවේ දාලා තිබෙන්නේ. අපි දැන් ඒවා විසඳන්න උත්සාහ දරමින් ඉන්නවා. ඒවා හරිම සංකීර්ණයි. ඇත්තටම සමහර ඒවා විසඳන්නත් බැරි වෙයි. මිනිසුන් බලාපොරොත්තු තබාගෙන ඉන්නවා. ඒ ජනතාවට අපි උපරිම සාධාරණයක් කරන්න බලාපොරොත්තු වනවා. ඒ ගැන අපි හොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
ගරු ඇමතිතුමනි, ස්තුතියි.

ඔබතුමා මගේ ප්‍රශ්නයේ (අ) (i) කොටසට පිළිතුර ලබා දීමේදී කිව්වා, "තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක්" කියන නව රජයේ නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස ආධාර ලබා දීම පිළිබඳව. නව රජය විසින්, පෙර පැවති රුපියල් ලක්ෂ 6ක මුදල, ලක්ෂ 10ක් බවට පත් කිරීම ගැන ඔබතුමා සඳහන් කළා. ගරු ඇමතිතුමනි, එම නිවාස ආධාර ලබා දෙන අය වාගේම දීර්ඝ කාලීනව කුලී නිවාසවල ජීවත් වන අඩු ආදායම්ලාභීන් විශාල පිරිසකුත් සිටිනවා. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මීළඟ වර්ෂවලදීවත් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කරද්දි දැනට ඉඩමක හිමිකමක් නැති, දීර්ඝ කාලයක් කුලී නිවාසවල ජීවත් වන එම අඩු ආදායම්ලාභී අපේ සහෝදර ජනතාව පිළිබඳවත් සලකා බැලීමක් කරන්න කියලා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, නිවාස ප්‍රශ්න විසඳිය යුතු කණ්ඩායම් කිහිපයක් ඉන්නවා. ඔවුන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා රජය විධියට අපි අත්වැලක් සපයන්න ඕනෑ. එලෙස සහයෝගයක් ලබා දෙන්න ඕනෑ කණ්ඩායම් කිහිපයක් ඉන්නවා. මේ අවුරුද්දේ අපේ නිවාස ආධාර වැඩසටහන්වල ප්‍රධානම ඉලක්කය වෙලා තිබෙන්නේ, ස්ථිර නිවාසයක් නැති, තාවකාලිකව නිවසක් හදාගෙන පදිංචි වෙලා ඉන්න ජනතාවට ස්ථිර නිවාසයක් හදා ගන්න ආධාර ලබා දීමයි. නමුත්, දැන් දිස්ත්‍රික්කවලට ලබා දුන් quota එක - නිවාස ප්‍රමාණය - සම්පූර්ණ කරන්න ගියාම බොහෝ දිස්ත්‍රික්කවල ස්ථිර නොවන නිවාස හොයා ගැනීමේ අපහසුතාවක් තිබෙනවා. ඒකෙන් පෙනී යනවා, සමහර දිස්ත්‍රික්කවල තමයි ස්ථිර නොවන නිවාස තිබෙන්නේ කියලා. ඒ නිසා ඇත්තටම අපි බලාපොරොත්තු වනවා, ඊළඟ අවුරුද්දේ ඒ ස්ථිර නොවන නිවාසවල, ඒ කියන්නේ කටුමැටි වෙන්න පුළුවන්, ෂීට් හේත්තු කළ නිවාස වෙන්න පුළුවන්, ලෑලි ගහගෙන ඉන්න නිවාස වෙන්න පුළුවන්, එවැනි ජීවත් වෙන්න නුසුදුසු නිවසක් තිබෙන පවුල් හරියටම හඳුනාගෙන ඔවුන්ගේ ප්‍රශ්නය විසඳන්න.

ඊළඟට, දීර්ඝ කාලයක් කුලී නිවාසවල ජීවත් වන කණ්ඩායමකුත් ඉන්නවා. සමහර අය ඉපදිලා තිබෙන්නේත් කුලී නිවාසවල. අවුරුදු 30ක්, 40ක් ගත වෙලාත් තවම ජීවත් වෙන්නේ කුලී නිවාසවල. ඔවුන්ට ඉඩමකුත් නැහැ, නිවසක් හදාගන්න වත්කමකුත් නැහැ. එවැනි ප්‍රජාවකුත් ඉන්නවා. ඒ වාගේම තව කණ්ඩායමක් ඉන්නවා. ඔවුන්ට සමහර විට නිවසක් ඉදිකර ගන්න යම් මුදල් ප්‍රමාණයක් තිබෙනවා, හැබැයි ඉඩමක් නැහැ. නාගරික ප්‍රදේශවල මේ තත්ත්වය ටිකක් බරපතළව තිබෙන බව පෙනෙනවා. ඇත්තටම නිවාස, ඉදිකිරීම් අමාත්‍යාංශය විධියට අපි හිතිල්ලා ඒ ඒ ප්‍රදේශවල ගම්මාන හදනවා වෙනුවට වඩාත් හොඳම දේ තමයි, ප්‍රාදේශීය වශයෙන් නිවාස අවශ්‍යතාව තෝරාගෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙන් අනුමත කරලා අපට ඒ නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් යෝජනාවක් එවන එක. එතකොට එම යෝජනාව අපට අය වැයට ඇතුළු කරලා ක්‍රියාත්මක කරන්න පුළුවන්. එම නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ඔබතුමා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති විධියට කටයුතු කරන ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල පවතින ගැටලු හඳුනාගෙන, ඉඩම් තිබෙනවා නම් ඒවාත් හඳුනාගෙන, ඒවා බෙදා දීම සඳහා යෝජනා සකස් කර නිවාස අවශ්‍යතාව සම්බන්ධයෙන් අපට යෝජනාවක් හදලා එවන්න කියලා. එතකොට අපට අමාත්‍යාංශය විධියට එය ඉටු කරන්න කටයුතු කරන්න පුළුවන්. ඔබතුමාට පිළිතුරක් විධියට මම කියන්න කැමැතියි, මේ හැම කණ්ඩායමක් දිහාම බලා ඔවුන්ගේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම සඳහා රජයක් විධියට මැදිහත් වෙන්න, විශේෂයෙන්ම ආධාර මුදල් ලබා දෙන්න අපට විශාල වුවමනාවක් තිබෙන බව. එම නිසා මෙතෙක් අපි කරපු වැඩසටහන්වලට එහා ගිය නිවාස ආධාර ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් 2027 අවුරුද්දේදී ක්‍රියාත්මක කිරීමේ බලාපොරොත්තුවෙන් තමයි අපි ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් සිදු කරන ලද ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ විගණන වාර්තාව: නිර්දේශ
## வ/ப இலங்கை நிலக்கரி (தனியார்) கம்பனியால் மேற்கொள்ளப்பட்ட பெறுகை நடவடிக்கைகள் குறித்த கணக்காய்வு அறிக்கை: **விதப்புரைகள்**
## AUDIT REPORT ON PROCUREMENT ACTIVITES CARRIED OUT BY LANKA COAL COMPANY (PVT.) LIMITED: RECOMMENDATIONS

140/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chaminda Wijesiri)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2022 සැප්තැම්බර් 30 දින සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම විසින් සිදු කරන ලද රුපියල් මිලියන 500ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් විශේෂ විගණන වාර්තාවක් නිකුත් කර ඇති බව දන්නේද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) එම ප්‍රසම්පාදනය යටතේ තෝරා ගන්නා ලද සමාගම කවරේද;

(iii) එම ප්‍රසම්පාදනය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) උක්ත විගණන වාර්තාවේ ඇතුළත් නිර්දේශ කවරේද;

(v) එම නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2022 செப்ரெம்பர் 30ஆம் திகதியன்று வரையறுக்கப்பட்ட இலங்கை நிலக்கரி (தனியார்) கம்பனியால் மேற்கொள்ளப்பட்ட 500 மில்லியன் ரூபாய் பெறுமதியான பெறுகை நடவடிக்கைகள் தொடர்பாக விசேட கணக்காய்வு அறிக்கையொன்று வெளியிடப் பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி பெறுகையின்கீழ் தெரிவு செய்யப்பட்ட நிறுவனம் யாது என்பதையும்;

(iii) மேற்படி பெறுகைக்காக ஒதுக்கப்பட்ட நிதி எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி கணக்காய்வு அறிக்கையில் உள்ளடக் கப்பட்டுள்ள விதப்புரைகள் யாவை என்பதை யும்;

(v) மேற்படி விதப்புரைகள் தொடர்பாக எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that a special audit report had been issued on 30th September, 2022 regarding procurement activities worth Rs. 500 million carried out by the Lanka Coal Company (Pvt.) Ltd.;

(ii) the name of the company which had been selected under the said procurement;

(iii) the amount of money allocated for the said procurement;

(iv) the recommendations contained in the said audit report; and

(v) the measures taken regarding the said recommendations?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

*** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්

(ii) ඉහත විගණන වාර්තාවට අදාළ කාලය තුළදී කැඳවන ලද ටෙන්ඩරයේ ඇති වූ ගැටලුකාරී තත්ත්වය නිසා අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත. ඉන් පසුව Coral Energy DMCC නැමැති සමාගමක් විසින් ඉදිරිපත් කළ යෝජනාවකට අනුව එම සමාගම වෙත ගල් අඟුරු සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත.

(iii) විගණන වාර්තාවේ සඳහන් කර ඇති ප්‍රසම්පාදනය අවලංගු කර ඇත. ඉන් පසුව Coral Energy DMCC නැමැති සමාගමෙන් මිලදී ගත් ගල් අඟුරු මෙට්‍රික් ටොන් 708,451ක් වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 146,307,016.15ක මුදලක් ගෙවා ඇත.

(iv) උක්ත විගණන වාර්තාවේ ඇතුළත් නිර්දේශ 08 ඇමුණුම 01හි දැක්වේ.

ඇමුණුම 01

LANKA COAL COMPANY (PVT) LTD
(Fully Government Owned Business Undertaking)

මගේ අංකය -LCC/COPE/01
ඔබේ අංක PWR/B/LCC/2023/Info/15

ජේ.එම්.අයි.කුමාරි මිය.
විගණන අධිකාරී,
ජාතික විගණන කාර්යාලය,
ලංකා විදුලිබල මණ්ඩලය,
කොළඹ 02.

**නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022–2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාවේ විගණකාධිපති නිර්දේශවල ක්‍රියාත්මක තත්ත්වය පිළිබඳ තොරතුරු කැඳවීම**

උක්ත කාරණාව සම්බන්ධ ඔබගේ 2024.09.27 දිනැති ලිපිය හා බැඳේ. ඒ අනුව උක්ත විගණන වාර්තාවේ නිර්දේශවල 2024 සැප්තැම්බර් 27 දිනට ක්‍රියාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පහත තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කරමි.

| අනු අංකය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතනය ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග | 2024 සැප්තැම්බර් 27 දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|
| 1 | ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියලු පාර්ශව රජයේ අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම නිවැරදිව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීම හා එම තත්ත්වයෙන් බැහැර වන පාර්ශවයන්ට එරෙහිව සුදුසු ඉදිරි පියවර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. | | 2023-2024 ප්‍රසම්පාදන කටයුතුවලදී මෙය හොඳින් නිරීක්ෂණය කොට ඇති අතර අනුව එය ක්‍රියාවේ යොදවා ඇත. |
| 2 | මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණුවලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය, පලපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැදීම් ඇතුලු මූලික අවශ්‍යතාවයන් ආරක්ෂා වන පරිදි ලංසුකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර තරගකාරීත්වය උපරිම කර ගැනීම පිළිබඳව අවධානය යොමු කල යුතුය. | | 2023 - 24 ගල් අඟුරු වාරවලදී ලංසු කැඳවීමේ ක්‍රියාවලියට පෙර අදාල ප්‍රසම්පාදන කමිටුව මගින් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය මූලික අවශ්‍යතාවයන් ආරක්ෂා වන පරිදි පිළිගත හැකි මට්ටමකට ලිහිල් කිරීමෙන් අනතුරුව ගල් අඟුරු සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සිදු කරගෙන යනු ලැබේ. |

No:51/3, Suranimala Place, Off-Dutugemunu Street, Kohuwala/Dehiwala, Sri Lanka. | Tel: +94 11 2 824 681/2 Fax: +94 11 2 824 689 | www.lankacoal.lk
A Subsidiary of Ceylon Electricity Board, Registration Number: PV 62636

| | | | |
|---|---|---|---|
| 3 | ලංසු ලේඛනයන්ට සංශෝධනයන් සිදු කිරීමේ දී අදාල තහවුරු කිරීම සහ බැදීම්වලට අගතියක් නොවන පරිදි එවැනි සංශෝධනයන් ගේ නීත්‍යානුකූලභාවය තහවුරු කරගැනීමෙන් පසුව එවැනි සංශෝධනයන් සිදුකල යුතු අතර, එම සංශෝධනයට ගැලපෙන පරිදි ලංසු ලේඛණයෙහි අනෙකුත් වගන්ති හා ගිවිසුම් සංශෝධනය කිරීමට වගබලා ගත යුතුය. ලංසු ලේඛණයන්ට ලංසු කැදවීමෙන් පසු ප්‍රබල සංශෝධනයක් කිරීමෙන් හැකි සෑම විටම වැලකී සිටිය යුතුය. ලංසු ලේඛණයන්ට පසුව කරන සංශෝධනයන්හිදී එම සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට ක්‍රියාකල යුතුය. | | කලින් සඳහන් කළ පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 5.3.15 විධිවිධාන අ නුව ප්‍රසම්පාදන කටයුතු පවත්වාගෙන යනු ලැබේ. |
| 4 | ගල්අඟුරු ප්‍රසම්පාදනයේදී මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සකස් කල යුතු ප්‍රසම්පාදන සැලැස්ම පරිපූර්ණ ලෙස විධිමත්ව සකස්කර අනුමත කර එයට අනුගතව කටයුතු කල යුතු වීම සහ කාලීනව ගල්අඟුරු සැපයීම තහවුරු වන පරිදි මූල්‍ය සම්පාදනයන් පිළිබඳව පූර්ව එකගතාවයක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කල යුතුය. | | මේ පිළිබඳව අවධානය යොමු කොට ඇති අතර කාලීනව ගල්අඟුරු සැපයීම තහවුරු වන පරිදි මූල්‍ය සම්පාදනයන් පිළිබඳව පූර්ව එකගතාවයක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කොට එවැනි තත්ත්වයක් නැවතත් ඇතිවීම වළක්වා ගැනීමට අවශ්‍යය විධිවිධාන සලසා ඇත. |
| 5 | එසේ සැපයුම්කරුවකුට වැඩි සංඛ්‍යාවකගේ එකතුවකින් ප්‍රසම්පාදනය සඳහා කටයුතු කරන්නේ නම් එම එකතුවට නෛතික පුද්ගලභාවයක් ඇති බවට තහවුරු කර ගත යුතු අතර එයට තිබිය යුතු ශක්‍යතාවයන් හා නෛතික බැදීම් ඈඩිව තහවුරු වන පරිදි ලංසු ලේඛණ හා ගිවිසුම් ශක්තිමත් කර ගුණාත්මක ගල්අඟුරු තොග කාලීනව ලැබීම තහවුරු කර ගත යුතුය. | | ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී ලංසු කැඳවීම් කරගෙන යනු ලබන්නේ පූර්ව සුදුසුකම් ලබන තෝරාගත් සැපයුම් කරුවන් ගෙනි. එම නිසා එහිදී මෙය බලපාන්නේ නැත. ඉදිරියේදී ජාත්‍යන්තර තරගකාරී විවෘත ටෙන්ඩර් කැඳවීම්වලදී මේ අනුව කටයුතු කරනු ලැබේ. |
| 6 | ගල්අඟුරු ප්‍රසම්පාදනයට අදාල සංයුක්ත දර්ශක තීරණය කිරීමේදී උපරිම ආර්ථික වාසියක් රජයට ලබාගත හැකි පරිදි එම දර්ශක සකස්කිරීමට යොදා ගන්නා කලාපීය දර්ශක පිලිබඳව කාලීනව නැවත සලකා බැලීමට කටයුතු කල යුතුය. | | 2023 - 2024 ගල් අඟුරු වාරයේ සිට දකුණු අප්‍රිකාව, රුසියාව සහ ඉන්දුනීසියාව යන කලාප නියෝජනය වන පරිදි එම කලාප තුනෙහි ගල් අඟුරු දර්ශක වල සාමාන්‍ය අගය ගෙන සංයුක්ත දර්ශකයක් අදාල තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් නිර්දේශ කොට විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි හඳුන්වා දී ඇත. |
| 7 | 2022 සැප්තැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් හා දැනට ලියාපදිංචි සැපයුම්කරුවන්ටද ප්‍රසම්පාදනයට සහභාගීවීමට අවස්ථාව ලබා දෙමින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේදී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවකු ලියාපදිංචි කිරීමේදී මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගයීමට ලක්කරනු ලබන අවම මූලික සුදුසුකම් ලංසු ලේඛනවල ලංසු කරුවන් ඇගයීමේ නිර්නායක ලෙස ඇතුලත් කළ යුතු බව නිර්දේශ කෙරේ. | | මේ සම්බන්ධ පිළිතුර අයිතම 05 ට අදාල වේ |
| 8 | මෙම ප්‍රසම්පාදනයන්ට අදාලව වඩාත් ප්‍රශස්ථ අනුමැතීන් ලබා දිය හැකිවන පරිදි අවශ්‍ය අධ්‍යනයන් කිරීමට සහ තොරතුරු ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් අමාත්‍ය මණ්ඩලය වෙත ලැබෙන ලෙස නිවැරදි තොරතුරු අප්‍රමාදව ඉදිරිපත් කිරීමට අදාල නිලධාරීන්ට නියම කිරීම | | මෙය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |

නාමල් හේවගේ.
සාමාන්‍යාධිකාරී,
(සභාපති වෙනුවට)
සී/ස ලංකා කෝල් (පුද්) සමාගම

(v) එම නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග ඇමුණුම 01 සහ ඇමුණුම 02 මගින් දැක්වේ.

ඇමුණුම 02 සභාගත** කරමි.

(ආ) අදාළ නොවේ.

## යෝජිත ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලය: අරමුණු සහ කාර්යභාරය

## உத்தேச சுயாதீன பொதுமக்கள் வழக்குரைஞர் அலுவலகம்: நோக்கங்கள் மற்றும் பணிப்பொறுப்புகள்

## PROPOSED INDEPENDENT PUBLIC PROSECUTOR'S OFFICE: OBJECTIVES AND ROLE

2205/2026

**8.** ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chithral Fernando, Attorney at Law)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමේ අවශ්‍යතාව රජය පිළිගන්නේද;

(ii) එසේ නම්, එම කාර්යාලය පිහිටුවීමේ අරමුණු කවරේද;

(iii) මෙම කාර්යාලයට පැවරීමට අපේක්ෂිත කාර්යභාරය කවරේද;

(iv) කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් සහ භෞතික සම්පත් පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுயாதீன பொதுமக்கள் வழக்குரைஞர் அலுவலகத்தை நிறுவுவதன் அவசியத்தை அரசாங்கம் ஏற்றுக்கொள்கின்றதா என்பதையும்;

(ii) ஆமெனின், இவ்வலுவலகத்தை நிறுவுவதற்கான நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அலுவலகத்திடம் ஒப்படைக்கப்பட இருக்கின்ற பணிப்பொறுப்புகள் யாவை என்பதையும்;

(iv) இவ்வலுவலகத்தை நிறுவுவதற்குத் தேவையான மனித மற்றும் பௌதிக வளங்கள் பற்றிய விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

---

** *පුස්තකාලයේ තබා ඇත.*
** *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** *Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether the Government accepts the necessity of establishing an Independent Public Prosecutor's Office;

(ii) if so, the objectives of establishing the said Office;

(iii) the role expected to be assigned to this Office; and

(iv) the details regarding the human and physical resources required for the establishment of the said Office?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්

(ii) අපරාධ නඩු සම්බන්ධයෙන් සාධාරණ හා අපක්ෂපාතී නඩු පැවරීම සහතික කිරීමට, නඩු පවරනු ලබන පද්ධතියේ ස්වාධීනත්වය සහ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීමට සහ අඛණ්ඩතාව සහ විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් සහතික කිරීමට එවැනි ස්වාධීන කාර්යාලයක් පිහිටුවීම ඉතා වැදගත් වන බව රජයේ අරමුණ වේ.

(iii) පවතිනු ලබන ක්‍රමයට සමානව, එහෙත් ස්වාධීනව, සාධාරණව හා අපක්ෂපාතීව සියලුම අපරාධ ක්‍රියා සම්බන්ධයෙන් පුළුල් නඩු පැවරීමේ කාර්ය භාරයක් මෙම කාර්යාලයටද පැවරෙනු ඇත.

(iv) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව මෙම කාර්යාලය පිහිටුවීම සඳහා සුදුසු ආයතනික යන්ත්‍රණයක් නිර්දේශ කිරීම සඳහා මා විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ඇතුළත් වාර්තාව ලැබීමෙන් පසු අවශ්‍ය මානව සම්පත් සහ භෞතික සම්පත් සලකා බැලීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම රජය අපේක්ෂා කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 118 යටතේ මම ඔබතුමාට අද උදේ වරප්‍රසාද ප්‍රශ්නයක් භාර දුන්නා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අවස්ථාවේදී ඒ ගැන කථා කරමු. ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම අහන්නේ, ඒක ඉදිරිපත් කරන්න මට දැන් අවස්ථාව දෙනවාද කියලා. මොකද හේතුව, ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අවස්ථාව ඉදිරියටයි තිබෙන්නේ. න්‍යාය පත්‍රයේ එතැනට තවම ඇවිල්ලා නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මෙතැන තමයි ඒක තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඔබතුමා පටලවාගෙන. ඔබතුමා න්‍යාය පත්‍රයවත් දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* න්‍යාය පත්‍රය දන්නේත් නැහැ, ගරු මන්ත්‍රීතුමා. න්‍යාය පත්‍රය දැනගන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඒක දන්නේත් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වැරදීම් වෙනවා නේ. ඔබතුමාට කොයි තරම් වැරදෙනවාද? ඊයේ කොයි තරම් වරද්ද ගත්තාද? එහෙම තමයි, ඉතින්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමාට වරදින්න බැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වරදිනවා, ඕනෑ කෙනෙකුට වරදිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### එල් නිනෝ දේශගුණික සංසිද්ධියේ වත්මන් සහ අපේක්ෂිත බලපෑම
### எல் நினோ காலநிலை மாற்றத்தின் தற்போதைய மற்றும் எதிர்பார்க்கப்படும் தாக்கம்
### CURRENT AND PROJECTED IMPACT OF EL NIÑO CLIMATE PHENOMENON

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, අපි ඊයේ දවසේත්, පෙරේදා දවසේත් විශේෂයෙන්ම විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා රටට සිද්ධ වන හානිය ගැන කථා කළා. අද දවසේ අපි මතු කරන්න කැමැතියි, විශේෂයෙන්ම බොහෝ විශේෂඥයින් කියන ආකාරයට එල් නිනෝ-ලා නිනා කාලගුණික, දේශගුණික විපර්යාස තුළ සිදු විය හැකි හානි සම්බන්ධව. එම හානි කේන්ද්‍ර කරගෙන තමයි අද මා මේ ප්‍රශ්නය යොමු කරන්නේ.

2026 ජූනි 22වන දින කැබිනට් මණ්ඩලය විසින් එල් නිනෝ දේශගුණික සංසිද්ධියෙන් උද්ගත විය හැකි ජල, විදුලිබල හා ආහාර අර්බුද කළමනාකරණය සඳහා කෙටි, මධ්‍ය හා දිගු කාලීන සැලසුම් සකස් කිරීම සඳහාත්, සියලු රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකෘත ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන්නටත්, එය සහතික කිරීම සඳහාත් ගරු පරිසර අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුත් විශේෂ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් හා නිලධාරින්ගේ කමිටුවක් පත් කර තිබෙනවා. ඒක පත් කළේ 2026 ජූනි මාසයේ 22වෙනි දා. අපි ඊට මාස හයකට පමණ පෙර තමයි මේ වාගේ තත්ත්වයක් නිර්මාණය වෙයි කියන කාරණාව රටට හෙළිදරවු කළේ. හැබැයි, පසුවෙලා හරි කැබිනට් මණ්ඩලය මඟින් මෙහෙම වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

එම අනුකමිටුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කෘෂිකර්ම, බලශක්ති හා ජල සම්පාදන ඇතුළු සියලු අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කරන බැවින් පහත සඳහන් කරුණු පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමිය හෝ විෂය භාර අමාත්‍යවරයා හෝ කමිටු සභාපති ලෙස ගරු පරිසර අමාත්‍යතුමාගෙන් නිශ්චිත පිළිතුරු මේ අවස්ථාවේ අපි බලාපොරොත්තු වනවා.

1. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - DMC - සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය - NDRSC - විසින් අනුකමිටුවට ඉදිරිපත් කර ඇති නවතම දත්ත අනුව, නියඟය හේතුවෙන් බලපෑමට ලක් වූ ජනගහනය කොපමණද, එය දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන්ව කවරේද? එය තවදුරටත් වර්ධනය වීමට ඉඩ ඇතැයි අනුකමිටුව තක්සේරු කරන්නේද?

   ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මේ එල් නිනෝ-ලා නිනා ප්‍රශ්නය සමඟ ENSO, ඒ වාගේම IOD තත්ත්වයන් ද ඇති වන බව. එකකට කියනවා, El Niño-Southern Oscillation කියලා. ඒ කියන්නේ, එල් නිනෝ දක්ෂිණ දෝලනය. අනික් එකට කියනවා, Indian Ocean Dipole කියලා. ඒ කියන්නේ, ඉන්දියන් සාගරයේ පවතින උෂ්ණත්වයේ වෙනස. මේ සංකීර්ණ කරුණු පිළිබඳව ඇත්තවශයෙන්ම රටේ ජනතාවත් මීට වැඩිය දැනුවත් කිරීමේ අවශ්‍යතාවකුත් තිබෙනවා. ඒ නිසා මම අහන්න කැමැතියි, මේ තත්ත්වයන් තුළ බලපෑමට ලක් වන පුද්ගලයින් ප්‍රමාණය කොපමණද, ඒ දිස්ත්‍රික්ක කවරේද, ඒ වාගේම මේ තත්ත්වය තවදුරටත් වර්ධනය වන්නට ඉඩකඩ තිබෙනවාද කියලා.

2. මෙරටට එල් නිනෝ බලපෑමේ සම්භාවිතාව පිළිබඳව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් අනුකමිටුව වෙත ඉදිරිපත් කර ඇති නවතම නිල පුරෝකථනය කුමක්ද?

   මොකද, එක වෙලාවකට කියනවා, සියයට 63ක සම්භාවිතාවක් තිබෙනවා කියලා. තවත් වෙලාවකට කියනවා, ඊට වඩා වැඩි ප්‍රමාණයක් කියලා. ලෝක කාලගුණ විද්‍යා සංවිධානය -World Meteorological Organization - කියනවා, ඒක සියයට 80ක්, නැත්නම් ඊට වඩා වැඩි ගණනකට යන්න පුළුවන් කියලා. මොකක්ද නිල පුරෝකථනය කියන එක මම අහන්න කැමතියි.

   එය පෙර පුරෝකථනයන්ට සාපේක්ෂව වෙනස් වී ඇත්නම් එයට හේතු කවරේද? එමෙන්ම, එල් නිනෝ තත්ත්වය උපරිම තීව්‍රතාවට පත්වීමට අපේක්ෂිත කාල සීමාව පිළිබඳව අනුකමිටුවට දැනුම් දී තිබේද?

3. එල් නිනෝ බලපෑම නියඟයකින් සීමා නොවී ඔක්තෝබර් - නොවැම්බර් අන්තර් මෝසම් සමයේදී හදිසි ගංවතුර හා නායයෑම් අවදානමක් ඇති විය හැකි බවට පුරෝකථන ඉදිරිපත්ව තිබෙනවා. ඒ අනුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හඳුනා ගත් වැඩිම අවදානම් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිළිබඳව අනුකමිටුවට වාර්තා කර තිබේද? විශේෂයෙන්ම වර්තමානයේ පවතින නියඟයෙන් වඩාත් පීඩිත උතුරු, නැගෙනහිර බල ප්‍රදේශ, මොනරාගල, බදුල්ල, අම්පාර, මඩකලපුව, හම්බන්තොට වැනි තවත් දිස්ත්‍රික්කවල සිටින සමහර ජනතාව සඳහා කලින් අනතුරු ඇඟවීමේ, එහෙම නැත්නම් මේ එල්ල වන පීඩනයෙන් ජනතාව ආරක්ෂා කිරීමේ, ඒ වාගේම ගංවතුර, නායයෑම් තත්ත්වයක් ආවොත් ජනතාව එම ස්ථානවලින් ඉවත් කිරීමේ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු අනුකමිටුව මඟින් සිදුකර තිබේද?

4. 2026 ජූනි 30වන දින පැවති ප්‍රථම අනුකමිටු රැස්වීමේදී රාජ්‍ය ආයතන මඟින් නියම කරන ලද කාල සීමාව තුළ ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුන් ක්‍රියාකාරි සැලසුම් නියමිත කාල සීමාව තුළ ලැබී තිබේද? මේ දක්වා අනුමත කරන ලද නිශ්චිත නිර්දේශ මොනවාද?

   ඒ කියන්නේ, එල් නිනෝ-ලා නිනෝ, Indian Ocean Dipole, ඒ වාගේම El Niño-Southern Oscillation යන මේ කාලගුණික, දේශගුණික තත්ත්වයන් තුළ අපේ රටට ඇති වන බලපෑම පිළිබඳව සම්පූර්ණ විග්‍රහයක් අපි මේ අවස්ථාවේදී බලාපොරොත්තු වනවා. ඒවා ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා, අදාළ ඇමතිවරයාගෙන්.

   විශේෂයෙන්ම එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත කාල රාමුවක් ඉදිරිපත් කරනවාද කියන එකත් මම අහන්න කැමතියි.

5. බලශක්ති අමාත්‍යාංශය විසින් අනුකමිටුවට ඉදිරිපත් කර ඇති පරිදි රන්දෙනිගල, වික්ටෝරියා, කොත්මලේ ඇතුළු මහවැලි ජලාශවල මේ වනවිට පවතින ජල මට්ටම් ප්‍රමාණයන් කොපමණද? විදුලි නිෂ්පාදනය සඳහා තාප විදුලි බලාගාර මත වැඩි වශයෙන් යැපීමට සිදු වීමෙන් ඇති විය හැකි අමතර පිරිවැය කොපමණද? මෙය ඉදිරි මාස කිහිපය තුළ පාරිභෝගික විදුලි බිල්පත්වලට බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇතැයි අනුකමිටුව තක්සේරු කර තිබේද?

6. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් අනුකමිටුවට ඉදිරිපත් කර ඇති පරිදි, වාරි ජල හිඟ වීම නිසා හානි වී ඇති යල කන්නයේ වී හා අනෙකුත් ක්ෂේත්‍ර භෝග ප්‍රමාණය හෙක්ටෙයාර වශයෙන් කොපමණද? හානියට පත් වගාවන්ට ගොවීන් සඳහා වන්දි/රක්ෂණ ගෙවීම මේ දක්වා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ලබා දී තිබේද? මහ කන්නය සඳහා බීජ වී, පොහොර සහනාධාර සහ වාරි ජලය නිකුත් කිරීමේ සැලැස්ම, බලපෑමට ලක් වූ ගොවි ප්‍රජාවන්ට ප්‍රමාණවත් වන ලෙස අනුකම්පුව මඟින් සම්බන්ධීකරණය කර තිබේද?

මේ ප්‍රශ්නය කල් දමන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේකට වහාම උත්තරයක් අවශ්‍යයි. ලෝකයේ බොහෝ රටවල් එල් නිනෝ-ලා නිනෝ, Indian Ocean Dipole, El Niño-Southern Oscillation කියන බරපතළ තත්ත්ව පිළිබඳ පුරෝකථනවලට අදාළව වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. ඒ නිසා මේක කල් දමන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මම ගරු ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා, මේ බරපතළ ප්‍රශ්නයට ඔබතුමන්ලා ලබා දෙන විසඳුම් සහ ප්‍රතිචාර.

ස්තුතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට සති දෙකකින් උත්තර දෙන බව disaster management භාරව සිටින නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම අද දිනයේදී ගරු පරිසර ඇමතිතුමාගේත්, ජල සම්පාදන ඇමතිතුමාගේත් විශේෂ Ministerial Statements දෙකක් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඒ Ministerial Statements දෙකම තිබෙන්නේ ඔබතුමා මතු කරන එල් නිනෝ situation එක ගැනයි. මම හිතනවා, ඒ Ministerial Statements දෙකෙන් ඔබතුමාගේ ප්‍රශ්නවලින් වැඩි ප්‍රමාණයකට පිළිතුරු ආවරණය වෙයි කියලා. ඒ වාගේම හෙට දිනයේදී බලශක්ති ඇමතිතුමාත්, කෘෂිකර්ම ඇමතිතුමාත් එල් නිනෝ තත්ත්වයට අදාළව එතුමන්ලාගේ සැලසුම් පිළිබඳවත් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපි හිතනවා, මේකට අදාළ කරන මූලික පැහැදිලි කිරීම සිදු වෙයි කියලා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් දක්වන උනන්දුවත් අපි අගය කරනවා. මොකද, World Meteorological Organization එකත් වර්තමාන එල් නිනෝ තත්ත්වය ගැන confirm කරලා තිබෙන්නේ 2026 ජූනි 02වන දා, ගරු කථානායකතුමනි. ඇත්තටම ඔබතුමා ඒක මාස හයකට කලින් ඉදිරිපත් කර තිබීම අපි විශේෂ දෙයක්කොට සලකනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අගය කරනවා, Ministerial Statements දෙකක් ඉදිරිපත් කරන එක ගැන. හැබැයි, මම අහපු නිශ්චිත ප්‍රශ්නවලට ඒක substitution එකක් වෙන්න බැහැ. *[බාධා කිරීමක්]* මට විනාඩියක් දෙන්න. මම අහපු ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරු අවශ්‍යයි. මොකද, විශේෂයෙන්ම මේ සියලුම ආයතන සම්බන්ධ කර ගත්ත අනුකම්පුවක් තිබෙනවා. මම ඒ අනුකම්පුවේ සභාපතිවරයාගෙන් හෝ ගරු අග්‍රාමාත්‍යවරියගෙන් තමයි මේ ප්‍රශ්නය ඇහුවේ. ඒ නිසා ප්‍රශ්නවලින් කොටසකට කල් ගන්නත්, කොටසකට කල් නොගන්නේත් නැතුව මම අහපු නිශ්චිත ප්‍රශ්නයට, නිශ්චිත පිළිතුරු එක් වෙලාවකදී ලබා දෙන්න කියලා මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එල් නිනෝ තත්ත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විවාදයක් පවත්වන්න කියලා මීට සතියකට පමණ කලින් ගරු ජනාධිපතිතුමා තමයි මාව දැනුවත් කළේ. නමුත්, අපි ගියවර පාර්ලිමේන්තු වාරයේදී එල් නිනෝ තත්ත්වය නිසා ඇති වී තිබෙන තියහය පිළිබඳව සම්පූර්ණයෙන් දිනක විවාදයක් පැවැත්වූවා. දිනක විවාදයක් පවත්වලා, අපේ මේ ඇමතිවරු හැමකෙනාම එදා ඒ සම්බන්ධයෙන් කථා කළා. අපි ඊට අමතරව තමයි එල් නිනෝ තත්ත්වය ගැන Ministerial Statements ඉදිරිපත් කරන්නේ. ඒ අතරේ තමයි, විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට ඒ අදාළ ඇමතිතුමා උත්තර ලබා දෙයි. ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. නමුත්, අපි මේ ගැන ජාතික වශයෙන් කල්පනා කරන බව තමයි වැඩිමනත් වශයෙන් මට කියන්න ඕනෑකම තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

## II

## උඩප්පුව සහ අවට ගම්මානවල වෙරළ ඛාදනය වැළැක්වීම

### உடப்பு மற்றும் அதன் அண்டிய கிராமங்களில் கடலரிப்பைத் தடுத்தல்

### PREVENTION OF COASTAL EROSION IN UDAPPUWA AND NEARBY VILLAGES

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் பின்வரும் விடயத்தை கடற்றொழில், நீரியல்

மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

உடப்பு எனும் கிராமம் புத்தளம் மாவட்டத்தின் புத்தளம் தேர்தல் தொகுதியில், முந்தல் பிரதேச செயலாளர் பிரிவில் ஆராச்சிக்கட்டு பிரதேச சபையின் எல்லைக்கு உட்பட்டதாக அமைந்துள்ளது. இந்தக் கிராமமானது, தமிழ் மற்றும் முஸ்லிம் மக்கள் ஒற்றுமையுடன் வாழ்கின்ற ஒரு முக்கிய மீனவக் கிராமமாகும். பெரும்பான்மையாக தமிழ் மக்கள் வாழும் இந்தக் கிராமத்தில், 20,000-25,000 வரையான மக்கள் தங்களுடைய வாழ்வாதாரத்துக்கு கடலையே நம்பி வாழ்ந்து வருகின்றனர். ஆண்டிமுனை முதல் பூனைப்பிட்டி வரை நீளமான இந்தக் கிராமம், நிலப்பரப்பை மட்டுமல்ல, மக்களின் வாழ்க்கை முறையும் பாரம்பரியமும் இணைந்த இன நல்லுறவுக்கு எடுத்துக்காட்டாகத் திகழ்கின்ற முக்கியமானதொரு கிராமமும் ஆகும்.

கௌரவ சபாநாயகர் அவர்களே, தற்போது இப்பகுதியில் காணப்படும் மிக முக்கிய பிரச்சினையாக கடலரிப்பு காணப்படுகின்றது. இதனால் வீடுகள், மீன்வாடிகள் மற்றும் இந்துக் கோயில்கள் உள்ளிட்ட ஏனைய வழிபாட்டுத் தலங்கள் பாதிக்கப்பட்டு இருக்கின்றன. இதன் காரணமாக மக்களின் வாழ்க்கையும் அவர்களின் வாழ்வாதார நடவடிக்கைகளும் பெரும் பாதிப்பை எதிர்கொள்கின்றன. பல குடும்பங்கள் தங்களது வீடுகளை இழக்கும் அபாயத்தில் இருக்கின்றன. சிலர் தற்காலிக இடங்களில் தஞ்சமடைய வேண்டிய சூழலும் உருவாகியுள்ளது. நாள்தோறும் கடல் எவ்வளவு அருகில் வருகிறது என்ற அச்சத்துடனேயே அப்பகுதி மக்கள் வாழ்ந்து வருகின்றனர்.

கடந்த ஆட்சிக் காலத்தில் இப்பிரதேசத்தில் கரையோரப் பாதுகாப்பு தொடர்பான சில திட்டங்கள் ஆரம்பிக்கப்பட்டு இருந்தாலும், அவை தொடர்ந்தும் நிறைவேற்றப்படாமல் இருப்பதாக நான் அறிகின்றேன். குறிப்பாக, கடலரிப்பைக் கட்டுப்படுத்த பாறாங்கற்களைப் பதித்தல், கற்களைப் போட்டு அணை கட்டுதல் போன்ற பாதுகாப்பு நடவடிக்கைகளை அங்கு அவசரமாகச் செய்ய வேண்டும். 'கச்சான் காற்று' என அழைக்கப்படும் பருவக்காற்றுக் காலங்களில் கடல் சீற்றம் அதிகரிக்கும் வாய்ப்பு உள்ளது. மேலும், இப்பகுதியில் காணப்படும் முகத்துவாரம் காரணமாக மழை காலங்களில் வெள்ளநீர் கடலுடன் சேரும் நிலை உள்ளது. இதுவும் கடற்கரையோர மாற்றங்களுக்குக் காரணமாக அமைகின்றது. இந்த நிலை தொடருமாக இருந்தால், ஆண்டிமுனை மற்றும் உடப்பை இணைக்கும் பாலமும் பொதுமக்களின் போக்குவரத்து வசதிகளும் பாதிக்கப்பட வாய்ப்புள்ளது. அதுமாத்திரமன்றி, மீனவர்களின் படகுகள் மற்றும் மீன்பிடி உபகரணங்கள் சில சமயங்களில் சேதமடைகின்றன. இதனால் அவர்களின் தினசரி வருமானமும் குறைகின்றது.

சமீபத்தில் ஏற்பட்ட 'தித்வா' புயல் தாக்கத்துக்குப் பிறகு, கடலரிப்பு அதிகமாகக் காணப்படுகின்றது. அதேபோன்று, செல்வபுரம் பகுதியும் பாதிப்புகளைச் சந்தித்து வருகின்றது. இதனுடன் சேர்த்து கற்பிட்டி, உச்சமுனைத்தீவு, பள்ளியாவத்தை, கீரிமுந்தல் போன்ற மீனவக் கிராமங்களும் கடலரிப்பால் தொடர்ச்சியாகப் பாதிக்கப்பட்டு வருகின்றன.

கௌரவ அமைச்சர் அவர்களே, உடப்பில் கடலரிப்பைத் தடுப்பதற்கு சிறிய வேலைகள் ஆரம்பிக்கப்பட்டாலும், அவற்றின் ஊடாக உடப்புக் கிராமம் முழுவதையும் பாதுகாக்க முடியாது. இது மக்களின் பாதுகாப்பும் வாழ்வாதாரமும் சார்ந்த அவசரமான ஒரு விடயம் என்பதால், இப்பகுதிகளின் நிலைமையைக் கருத்திற்கொண்டு தேவையான நடவடிக்கைகளை கரையோரப் பாதுகாப்புத் திணைக்களத்தின் ஒத்துழைப்புடன் தங்களது அமைச்சின் மூலமாக மேற்கொள்வதற்கு ஆவன செய்யுமாறு இந்த உயரிய சபையில் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

01. உடப்பும் அதனோடு சேர்த்து கற்பிட்டி, உச்சமுனைத்தீவு, பள்ளியாவத்தை, கீரிமுந்தல் போன்ற மீனவக் கிராமங்களும் கடலரிப்பால் தொடர்ச்சியாகப் பாதிக்கப்பட்டு வருகின்றன என்பதை நீங்கள் ஏற்றுக் கொள்கின்றீர்களா?

02. கௌரவ அமைச்சர் அவர்களே, இப்பிரதேசங்களில் கரையோரப் பாதுகாப்புத் திணைக்களத்தின் ஒத்துழைப்புடன் கடலரிப்பைத் தடுப்பதற்கான நடவடிக்கைகளை குறிப்பாக பாறாங்கற்கள் பதித்தல் போன்ற பாதுகாப்பு நடவடிக்கைகளை மேற்கொள்வதற்கு ஆயத்தமாக இருக்கின்றீர்களா?

03. இப்பிரதேசங்களில் கடலரிப்பின் பாதிப்புகளைக் குறைப்பதற்கு இதுவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் என்ன? என்பதை நான் இந்தச் சபையில் கேட்க விரும்புகின்றேன்.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, ගරු එම්.එල්.ඒ.එම්. හිල්බුල්ලාහ් මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නයට අදාළව පිළිතුර දෙන්න මම සූදානම්. පළමුවෙන්ම මා එතුමාට ස්තුතිවන්ත වෙනවා පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව මුහුණපාලා සිටින ඒ දුෂ්කරතාව පිළිබඳව අවධානය යොමු කිරීම පිළිබඳව.

01. පුත්තලම දිස්ත්‍රික්කයේ අඹකඳවිල, උඩප්පුව, කරුකපනේ, කුඩාව - කල්පිටිය, ඉලන්තඩිය - ආලංකුඩා, කිරිමුන්දලම යන වෙරළ තීරයන් ආශ්‍රිතව වෙරළ ඛාදන තත්ත්වයන් වාර්තා වන බව පිළිගනිමි.

02. දැනටමත් මෙම ප්‍රදේශවලට අදාළව රිවට්මන්ට් බැමි ඉදිකිරීම, ග්‍රොයින ව්‍යූහ ඉදිකිරීම, T-දියකඩන ව්‍යූහ ඉදිකිරීම වැනි ස්ථිර වෙරළාරක්ෂක ව්‍යූහ ඉදි කිරීම මඟින් මෙම වෙරළ ඛාදන තත්ත්වයන් පාලනය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.

03. වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා මේ දක්වා ගෙන ඇති පියවර පහත පරිදි වේ.

| වෙරළාරක්ෂක ඉදිකිරීම | වත්මන් තත්ත්වය |
|---|---|
| 01. උඩප්පුව උතුර මීටර් 200 රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම මඟින් උඩප්පුව පාලමට උතුරින් පිහිටි නිවාස ආරක්ෂා කිරීම. | 2026 ජූලි මස වන විට සියයට 100ක් ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. |
| 02. මුදුකටුව ධීවර තොටුපොළ අසල T දියකඩන ව්‍යූහ ඉදිකිරීම මඟින් එක් දින ධීවර යාත්‍රා නැංගුරම් තොටුපොළක් වශයෙන් භාවිත කිරීමට හැකි වන පරිදි සංවර්ධනය කිරීම. | මෙම ව්‍යාපෘතියට අදාළ කළුගල් සැපයුම සියයට 80ක් පමණ අවසන් කර ඇති අතර ඉදිකිරීම් ප්‍රගතිය සියයට 35ක් පමණ වේ. මෙහි ඉදිකිරීම් කටයුතු 2026 නොවැම්බර් වන විට අවසන් කිරීමට නියමිතය. |

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

| වෙරළාරක්ෂක ඉදිකිරීම | වත්මන් තත්ත්වය |
|---|---|
| 03. ඉරණවිල -අඹකඳවිල වෙරළාරක්ෂක ඉදිකිරීම් මඟින් තොඩුවාව-හලාවත වෙරළට සමාන්තර මහා මාර්ගය ආරක්ෂා කිරීම හා hatcheries ආරක්ෂා කිරීම. | මෙම ව්‍යාපෘතියට අදාළව hatcheries ආශ්‍රිත වෙරළාරක්ෂක ඉදිකිරීම් අවසන් කර ඇති අතර ඉරණවිල මාර්ගයට සමාන්තරව මීටර් 200ක රිවට්මන්ට් බැම්මක් ඉදිකිරීම සඳහා කළුගල් ද්‍රව්‍ය සැපයීම් මේ වන විට සිදු කෙරෙමින් පවතී. |
| 04. උඩප්පුව දකුණ (හින්දු කෝවිල ඉදිරිපිට) මීටර් 200ක රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම මඟින් කෝවිල් පරිශ්‍රය හා ආශ්‍රිත නිවාස වෙරළ ඛාදනයෙන් ආරක්ෂා කිරීම. | මේ සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර, කොන්ත්‍රාත් ප්‍රදානය කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. ඉදිකිරීම් ප්‍රගතිය සියයට 25 පමණ වේ. මෙහි ඉදිකිරීම් කටයුතු 2026 නොවැම්බර් වන විට අවසන් කිරීමට නියමිතය. |
| 05. මුතුපන්තිය කළපු මෝය ප්‍රතිස්ථාපනය (මෙය "දිට්වා" ආපදා ප්‍රතිසංස්කරණ විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වේ.) | මෙම ව්‍යාපෘතියේ පළමු අදියර වශයෙන් "දිට්වා" සුළි කුණාටුව මඟින් කොටස් දෙකකට වෙන් වූ මුතුපන්තිය ගම්මානයේ කෘත්‍රිම මෝය වසා දමා පරිසර පද්ධතිය ප්‍රතිස්ථාපනය කර ඇත. මෙහි දෙවන අදියර වශයෙන් මුතුපන්තිය සුසානභූමිය අසල ගේබියන් වෙරළාරක්ෂක ව්‍යුහයක් ඉදි කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත. මෙම ඉදි කිරීම් කටයුතු සඳහා විශේෂ ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 9ක් වෙන්කොට ඇති අතර, ප්‍රදේශයේ ප්‍රජාමූලික සංවිධාන (CBOs) මඟින් ක්‍රියාත්මක කිරීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. |
| 06 ආරච්චිකට්ටුව, කරුකපනේ T දියකඩන ව්‍යුහ 2ක් ඉදිකිරීම මඟින් කරුකපනේ දේවස්ථානය හා කරුකපනේ ගම්මානයේ නිවාස ආරක්ෂා කර ගැනීම. | මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය කළුගල් සැපයුම සිදු කෙරෙමින් පවතී. ඉදිකිරීම් කටයුතු සඳහා යන්ත්‍ර ලබා දීමට ලංසු ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉදිකිරීම්වල ප්‍රමාදයක් පවතී. කෙසේ හෝ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් යන්ත්‍ර යොදා ගනිමින් මෙම වෙරළාරක්ෂක ඉදිකිරීම් 2026 වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂා කෙරේ. |
| 07. කිරිමුන්දලම දූපත ආශ්‍රිතව වෙරළාරක්ෂක ඉදි කිරීම් | කිරිමුන්දලම දූපත කල්පිටියට උතුරින් පිහිටි දූපත් සමූහයේ සංවේදී පරිසර පද්ධතියක් සහිත දූපතක් වන අතර, මෙහි වෙරළ ඛාදන තත්ත්වයට පිළියම් ලෙස කළු ගල් සහිත දෘඪ වෙරළාරක්ෂක ඉදිකිරීම් සුදුසු නොවේ. එබැවින්, ඒ සඳහා විශේෂිත ඉංජිනේරුමය විසඳුමක් වශයෙන් geo bags යොදා ගනිමින් වෙරළාරක්ෂක ඉදි කිරීම් නිර්මාණ සැලසුම් සකස් කර ඇත. දැනට තාවකාලිකව වෙරළ ඛාදන තත්ත්වය පාලනය සඳහා jumbo bags යොදා ගනිමින් හදිසි වෙරළාරක්ෂක ව්‍යුහයක් ඉදි කර අවසන් කර ඇත. |

ඉහත සඳහන් කළ 2026 වර්ෂයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අමතරව,

01. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරුකපනේ වෙරළාරක්ෂක ඉදිකිරීම හා වෙරළ ස්ථායීකරණ ව්‍යාපෘතිය
02. මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩප්පුව දකුණ වෙරළාරක්ෂක ව්‍යුහ නඩත්තු කිරීම හා වැඩි දියුණු කිරීම
03. හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹකඳවිල වෙරළ ස්ථායීකරණය සඳහා T-දියකඩන ව්‍යුහ ඉදි කිරීම
04. මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉරණවිල වෙරළ ස්ථායීකරණය සඳහා T-දියකඩන ව්‍යුහ ඉදි කිරීම

යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2027 වර්ෂයේ අය වැය ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 180කට වැඩි මුදලක් වෙන් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ அமைச்சர் அவர்களே, தெளிவான பதிலை அளித்தமைக்கு நன்றி!

உடப்புப் பிரதேசத்தில் கடலரிப்பைத் தடுப்பதற்கு நீங்கள் எடுத்திருக்கின்ற முயற்சிகள் பாராட்டத்தக்கவை. அந்தப் பாலத்தைப் பாதுகாப்பதற்காக அமைக்கப்படுகின்ற 200 மீற்றர் நீளமான அணைக்கட்டு போதாது என்ற குறை இருக்கின்றது. எனவே, அதற்குரிய நடவடிக்கைகளை நீங்கள் எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

நீங்கள் சொன்னதைப் போன்று, உடப்பு - கற்பிட்டி கரையோரப் பகுதியில் இருக்கின்ற முக்கியமானதொரு islandதான் Keerimundal Island. இது நீண்டகால பாரம்பரியத்தைக் கொண்ட ஒரு தீவாகும். சுற்றுலாத்துறை, மீன்பிடி, விவாசயம் என்பவற்றின்மூலம் இந்த நாட்டின் பொருளாதாரத்துக்குப் பங்களிப்புச் செய்கின்ற கிராமம்தான் கீரிமுந்தல். இந்தத் தீவு Dutch Bayஐக் கொண்ட ஒல்லாந்தர் காலத்திலிருந்து பிரபல்யம்பெற்ற ஒரு தீவாகும். இப்பொழுது இந்த தீவும் கடலரிப்பால் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கிறது. அங்கிருக்கின்ற church எந்த நேரமும் கடலரிப்புக்கு உள்ளாகின்ற சூழ்நிலையிலே இருக்கின்றது. அதுமாத்திரமன்றி, அந்தப் பகுதி மக்களும் அங்கிருந்து வெளியேறுகின்ற அளவுக்கு ஓர் ஆபத்தான நிலைமையே அங்கு இருக்கின்றது.

மேலும், அங்குள்ள மக்களுக்கு குடிநீர் வசதியில்லை. குடிநீரையும் படகுகளில்தான் கொண்டு போகவேண்டி இருக்கின்றது. அங்கு வீதிகளும் இன்னும் செய்யப்படவில்லை. அங்கிருக்கின்ற ஒரு புராதன பள்ளிவாசலும் கடலரிப்பால் முற்றாக கடலுக்குள் போகக்கூடிய நிலையில் இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் எடுக்கின்ற முயற்சிகளுக்கு நாங்கள் நன்றி கூறுகின்றோம்; பாராட்டுக்களைத் தெரிவிக்கின்றோம். கீரிமுந்தல் தீவைப் பாதுகாத்து, அங்கு மீண்டும் உல்லாசப் பிரயாணத்துறையைக் கட்டியெழுப்புவதற்குரிய நடவடிக்கைகளை Department of Coast Conservation and Coastal Resource Management, the Ministry of Tourism, පරිසර අමාත්‍යාංශය, the Ministry of Fisheries, Aquatic and Ocean Resources ஆகியன இணைந்து எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණා ඉදිරිපත් කිරීම ගැන. ඔබතුමා විශේෂයෙන් ඉදිරිපත් කරපු, ඉදි කෙරෙමින්

පවතින බැම්ම ප්‍රමාණවත් නොවන බවට කී කාරණය පිළිබඳව අපි ඉක්මනින් විමසා බලන්නම්. අනෙක් කරුණු සම්බන්ධයෙනුත් අපි සැලකිලිමත් වෙමින් කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, පරිසර අමාත්‍ය ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා.

## එල් නිනෝ සංසිද්ධියෙහි බලපෑම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර: පරිසර අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## எல் நினோவின் தாக்கத்தைத் தணிப்பதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள்: சுற்றாடல் அமைச்சரினது கூற்று
## MEASURES TAKEN TO MITIGATE IMPACT OF EL NIÑO PHENOMENON: STATEMENT BY MINISTER OF ENVIRONMENT

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, මේ වන විට වර්ධනය වෙලා තිබෙන එල් නිනෝ තත්ත්වය හා එමඟින් ඇති වී ඇති බලපෑම් පිළිබඳවත්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳවත් ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

නවතම පුරෝකථන අනුව, ගෝලීය වශයෙන් එල් නිනෝ තත්ත්වය, එල් නිනෝ සංසිද්ධිය මේ වන විට පූර්ණ වශයෙන් - සියයට 100ක්ම - තහවුරු වෙලා තිබෙනවා. එය 2027 පෙබරවාරි දක්වා පවතිනු ඇතැයි ලෝක කාලගුණ විද්‍යා සංවිධානය විසින් ස්ථිර ලෙසම වාර්තා කර තිබෙනවා.

මේ නිසා ලෝකය පුරා වර්ෂා රටාවන්ගේ සහ උෂ්ණත්ව රටාවන්ගේ වෙනස්වීම් අපේක්ෂා කළ හැකි වන අතර, මේ නිසාම ආන්තික කාලගුණික තත්ත්වයක් ඇති විය හැකි බවට පුරෝකථනය කෙරෙනවා.

විශේෂයෙන්ම ලෝක කාලගුණ විද්‍යා සංවිධානය - World Meteorological Organization - විසින් ලෝකයේ එල් නිනෝ තත්ත්වයක් ඇති වීමේ හැකියාව සම්බන්ධයෙන් පළමුවරට කරුණු දැක්වූයේ; තහවුරු කරනු ලැබුවේ 2026 ජුනි මාසයේ 02වන දායි. මේ තත්ත්වය සලකා බලා 2026 ජුනි මාසයේ 22වන දා ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් මඟින්, ඉදිරියේදී ඇති විය හැකි එල් නිනෝ දේශගුණික බලපෑමට මුහුණ දීම සඳහා විශේෂ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් සහ නිලධාරි කමිටුවක් පත් කරනු ලැබුවා. එය පළමු වරට 2026 ජුනි මාසයේ 30 වන දින රැස්වුණු අතර, එහිදී ගෝලීය වශයෙන් වර්ධනය වන එල් නිනෝ තත්ත්වය අප රටට බලපාන ආකාරයත්, ඉන් ඇති විය හැකි බලපෑම් පිළිබඳවත් පුළුල් ලෙස සාකච්ඡා කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. එල් නිනෝ සංසිද්ධිය අප රටට බලපෑම සම්බන්ධයෙන්, අප රට අයත් කලාපය තුළ ක්‍රියාත්මක තවත් කාලගුණික සංසිද්ධීන්ට සාපේක්ෂව, විශේෂයෙන්ම Indian Ocean Dipole වැනි සංසිද්ධි සලකා බලන ලද අතර, මීට පෙර ලෝකයේ එල් නිනෝ තත්ත්වයන් වර්ධනය වූ අවස්ථාවලදී අපේ රටේ කාලගුණික හා දේශගුණික තත්ත්වයන් වෙනස් වුණේ කවරාකාරයෙන්ද කියන එක සම්බන්ධයෙන් වන දත්ත හදාරා අපේ රටට අදාළ පුරෝකථනයක් අපි මෙම කමිටුව හරහා සිදු කර ගත්තා.

ඒ අනුව, අප ඉදිරිපත් කළ පුරෝකථන බොහෝ දුරට නිවැරැදි වුණා. 2026 අගෝස්තු මාසය තුළ ලංකාව පුරා වියළි කාලගුණික තත්ත්වයක් වර්ධනය වූ අතර, නිරිතදිග මෝසම් වර්ෂාව සාපේක්ෂ වශයෙන් අඩු තත්ත්වයක් වාර්තා වුණා. වායුගෝලීය උෂ්ණත්වය සාපේක්ෂ වශයෙන් ඉහළ ගිය අතර, දිස්ත්‍රික්ක ගණනාවක පානීය ජල ගැටලු මතු වුණා.

ඉදිරි කාලය සඳහාත්, විශේෂයෙන්ම සැප්තැම්බර් සිට දෙසැම්බර් අග දක්වා කාලය සම්බන්ධයෙනුත් අපි පුරෝකථනයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව, මෙම වියළි කාලගුණය සැප්තැම්බර් 3වන සතිය දක්වා පවතිනවා. ඉන් අනතුරුව වැසි සහිත කාලගුණික තත්ත්වයක් ඇති වන බවටත්, එම වර්ෂාපතනය සාමාන්‍ය තත්ත්වයට වඩා වැඩි වර්ෂාපතනයක් සහිත තත්ත්වයක් බවට පත් විය හැකි බවටත් අපි දැනට පුරෝකථනය කර තිබෙනවා. මෙම වැසි සහිත කාලගුණික තත්ත්වය දෙසැම්බර් අග දක්වා පවතිනු ඇති බවට විශ්වාස කරන අතර, ජනවාරි මාසයේ සිට යළිත් වියළි කාලගුණික තත්ත්වයක් වර්ධනය වනු ඇති බවටත්, එම වියළි කාලගුණික තත්ත්වය අප්‍රේල් මාසය අග දක්වා පවතිනු ඇති බවටත් දැනට පුරෝකථනය කර තිබෙනවා.

පසුගිය කාලය තුළදී එල් නිනෝ අමාත්‍ය මණ්ඩල හා නිලධාරි අනුකමිටුව විසින් මෙම තත්ත්වයට අදාළ ක්‍රියාමාර්ග සාකච්ඡා කරලා, විශේෂ ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලැබුවා. ඒ අනුව, වර්ධනය වන කාලගුණික හා දේශගුණික තත්ත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡා කිහිපයක් පවත්වනු ලැබුවා. ඒ වාගේම අවශ්‍ය අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ විශේෂ සාකච්ඡා පවත්වමින් එක් එක් දිස්ත්‍රික්කවල තත්ත්වය විමසා බලමින් එහිදී ගත යුතු නිශ්චිත ක්‍රියාමාර්ග පිළිබඳ මැදිහත් වීම් ද සිදු කරනු ලැබුවා.

විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා අගෝස්තු මාසයේ 21වන දින එල් නිනෝ පිළිබඳ අමාත්‍ය මණ්ඩල සහ නිලධාරි අනුකමිටුව රැස් කරමින්, ඒ වන විට පවතින තත්ත්වය පිළිබඳව සමාලෝචනයක් සිදු කරමින්, ගත යුතු කඩිනම් ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කරනු ලැබුවා.

ගරු කථානායකතුමනි, මෙම එල් නිනෝ අනුකමිටුව විසින් නියඟයට මුහුණ දීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබුවා. විශේෂයෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මේ නියං තත්ත්වය සඳහා පූර්ව සූදානම් කටයුතු කරමින්, නියඟය නිසා පානීය ජල පහසුකම් ගැටලුව මතු වූ දිස්ත්‍රික්කවලට පානීය ජල පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය කරන පහසුකම් සලසනු ලැබුවා. අද වන විට අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, මාතලේ, මොනරාගල, පොළොන්නරුව, රත්නපුර කියන දිස්ත්‍රික්ක අටේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 36ක පානීය ජල ගැටලුව මතු වෙලා තිබෙනවා. පවුල් 47,368ක්, පුද්ගලයන් 154,167ක් මේ නියං තත්ත්වය හේතුවෙන් ආපදාවට පත් වෙලා තිබෙනවා. නමුත් මේ වන විටත් මා කලින් සඳහන් කළ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ආදි ආයතන මැදිහත් වෙලා පවුල් 40,945කට සහ පුද්ගලයන්

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

132,748දෙනෙකුට පානීය ජල පහසුකම් ලබා දීම සඳහා කටයුතු සිදු කර තිබෙනවා. මීට කලින් එක් පුද්ගලයෙකු සඳහා වෙන් කරලා තිබුණු ජල ප්‍රමාණය ලීටර 6යි. නමුත් අපි එක් පුද්ගලයෙකු සඳහා වන ජල ප්‍රමාණය ලීටර 15 දක්වා ඉහළ දමා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙම නියඟ තත්ත්වය ජනතාවට මෙන්ම වන ජීවීන් සඳහාත් බලපා තිබෙනවා. පරිසර අමාත්‍යාංශය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා විශේෂ මෙහෙයුමක් සිදු කර තිබෙනවා. ඒ අනුව විල්පත්තුව, යාල, බූන්දල, උඩවලව, කුමන යන ජාතික වනෝද්‍යානවල වන සතුන්ට ජල සම්පාදනය සඳහා මැදිහත්වීම් කරලා තිබෙනවා. පසුගිය කාලය තුළ පමණක් ඒ වනාන්තරවලට ජලය ලීටර 683,000ක් සපයා තිබෙනවා. එය දළ වශයෙන් සියයට 10ක ජල සැපයුම ඉහළ යෑමක්. දළ වශයෙන් ජල පොකුණු 113ක් ඒ සඳහා පාවිච්චි කරනවා. සූර්ය මෝටර් මඟින් සහ බවුසර් මඟින් ඒ ජලය සැපයීම සිදු කර තිබෙනවා. ඒ නිසාම, ජලය හිඟකම හේතුවෙන් සිදු වන වනජීවී මරණ වාර්තා වෙලා නැහැ. නමුත් ගරු කථානායකතුමනි, නියඟ තත්ත්වය නිසා වන අලි ගම් වැදීමේ යම් වැඩි වීමක් තිබෙන බව නිරීක්ෂණය වෙලා තිබෙනවා. ඒ වාගේම මේ තත්ත්වය තුළ අපි වනජීවී කලාප සම්බන්ධවත් නිරීක්ෂණයක යෙදෙනවා. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, කායන්කර්නි සහ පාසිකුඩා මුහුදේ තිබෙන කොරල් පරවල කිසියම් වෙනසක් අප නිරීක්ෂණය කරලා තිබෙන බව. ඒ සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම් මේ වන විටත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරලා තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ නියං තත්ත්වය නිසා කුමන, ගල් ඔය ජාතික වනෝද්‍යානවල කඳවුරු බිම් වසා දමා තිබෙනවා. යාල ජාතික වනෝද්‍යානයේ කලාප අංක 1 සහ 2 සැප්තැම්බර් 14වන දා සිට ඔක්තෝබර් 15වන දා දක්වා වසා දැමෙනවා. අපි මේ වන විටත් සංචාරක කර්මාන්තයේ යෙදෙන සංවිධාන, ආයතන, පුද්ගලයන් දැනුවත් කරලා ඔවුන්ට අවශ්‍ය වෙනස්කම් කිරීම සඳහා කාලය ලබා දීමෙන් පසුව තමයි මේ තීන්දුව අරගත්තේ.

ගරු කථානායකතුමනි, මේ නියඟ තත්ත්වය තුළ වනාන්තර ගිනි ගැනීම් දළ වශයෙන් 90ත්, 100ත් අතර ප්‍රමාණයක් වාර්තා වෙලා තිබෙනවා. මේ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා තිබෙනවා. ඒ මැදිහත්වීමෙන් පසුවත්, වනාන්තර ගිනි ගැනීම් නිසා දළ වශයෙන් හෙක්ටෙයාර 300ක පමණ භූමි ප්‍රමාණයක වනාන්තරවලට පසුගිය කාලයේ හානි පැමිණිලා තිබෙනවා. ඒ වාගේම අපි මේ තත්ත්වය සලකා බලා මාධ්‍ය මඟින් ජනතාවගෙන් ඉල්ලා සිටියා, අස්වනු නෙළන කාලයේදී පිදුරු ගිනි තැබීම් වාගේ දේවල් නොකර කටයුතු කරන්න කියලා. ඒ වාගේම නීති විරෝධී වනාන්තර ගිනි තැබීම්, වන අපරාධ වැනි දේවල් වාර්තා වනවා නම්, "වන සුරැකුම" ඒකාබද්ධ මෙහෙයුම් ඒකකය වෙත, 1995ට වාර්තා කරන ලෙස අපි ජනතාව දැනුවත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, වර්ධනය වෙච්ච මෙම තත්ත්වය නිසා ජීවනෝපාය අහිමි වීම පිළිඳව අපි විශේෂ අවධානයක් යොමු කළා. මේ වනකොට මොනරාගල, බදුල්ල, රත්නපුර, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක 7 තුළ ජීවනෝපාය අහිමිවීම් වර්තා වනවා. ධීවර ක්ෂේත්‍රයේ පවුල් 2,107කට සහ පුද්ගලයන් 7,491ටත්, කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ පවුල් 12,304කට සහ පුද්ගලයන් 36,875කටත්, වැවිලි ක්ෂේත්‍රයේ පවුල් 2,333කට සහ පුද්ගලයන් 7,889කටත්, ස්වයං රැකියා ක්ෂේත්‍රයේ පවුල් 1,769කට සහ පුද්ගලයන් 6,039කටත්, ව්‍යාපාර ක්ෂේත්‍රයේ, ව්‍යවසාය ක්ෂේත්‍රයේ පවුල් 108කට සහ පුද්ගලයන් 369කටත්, සත්ව පාලන ක්ෂේත්‍රයේ පවුල් 2,966කට සහ පුද්ගලයන් 9,408කටත්, මෙම ක්ෂේත්‍රවලට අදාළ නොවන වෙනත් ඒවා යටතේ පවුල් 3,450කට සහ පුද්ගලයන් 10,297කටත් ජීවනෝපාය අහිමිවීම් වාර්තා වනවා. සමස්තයක් හැටියට ගත්තොත්, පවුල් 25,037කට සහ පුද්ගලයන් 78,368කට මෙම තත්ත්වය නිසා ජීවනෝපාය අහිමිවීම් වාර්තා වෙලා තිබෙනවා. මේ සඳහා රාජ්‍ය ආයතන මැදිහත් කර ගනිමින් මෙගොල්ලන්ට අවශ්‍ය සහන සැලසීමට දැනටමත් අපි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඉදිරි කන්නය ආරම්භ කිරීම සඳහා අපි මාර්ගෝපදේශ ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන් අපි මේ සම්බන්ධයෙන් සැප්තැම්බර් 4වැනි දා මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් අදාළ දැනුම්දීම් සිදු කළා. විශේෂයෙන්ම සැප්තැම්බර් 18වැනි දා කන්න රැස්වීම පැවැත්වීමට නියමිතව තිබෙනවා. එහිදී අපි බලාපොරොත්තු වෙනවා, නිශ්චිත දින වකවානු සඳහන් කරමින් ඒ දැනුම්දීම කරන්න. දැනට අපි ගොවීන්ට දැනුම් දීලා තිබෙනවා, ඔක්තෝබර් 15වැනි දා වනවිටවත් වගා කටයුතු ආරම්භ කරන්න කියලා. ඒ අනුව අපි වගා කටයුතු ආරම්භ කිරීම සඳහා දින නියම කර තිබෙනවා.

ඒ වාගේම, ඉදිරි කාලය තුළ අපි බලාපොරොත්තු වනවා, ඊසාන දිග මෝසමෙන් ලැබෙන වැසි ප්‍රමාණයේ වැඩිවීමක්. ඒ නිසා අපි වැඩි ජල ප්‍රමාණයක් රඳවා ගැනීම සඳහා සිඳී ගිය වැව් පිළිසකර කිරීමටත්, ගංගා ඇළ මාර්ග පිළිසකර කිරීමටත් අවශ්‍ය උපදෙස් දැනටමත් ලබා දී තිබෙනවා.

ජනාධිපතිතුමා විසින් පත් කරන ලද අමාත්‍ය සහ නිලධාරි අනුකමිටුව විසින් එල් නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙන බව සඳහන් කරමින් මගේ ප්‍රකාශය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය, ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා.

## එල් නිනෝ බලපෑම යටතේ ජල කළමනාකරණය: නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## எல் நினோ தாக்கத்தின்போது நீர் முகாமைத்துவம்: வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரினது கூற்று
## WATER MANAGEMENT DURING EFFECTS OF EL NIÑO: STATEMENT BY MINISTER OF HOUSING, CONSTRUCTION AND WATER SUPPLY

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු කථානායකතුමනි, පුරෝකථනය කරලා තිබෙන සහ ඇති වෙමින් තිබෙන එල් නිනෝ තත්ත්වය නිසා විශේෂයෙන්ම ජල

සම්පාදන කටයුතුවලට බාධා පැමිණිලා තිබෙනවා. ඒ පිළිබඳව තමයි මම මේ ප්‍රකාශය කරන්න බලාපොරොත්තු වෙන්නේ. මේ වනකොට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හරහා ලබා ගත් තොරතුරු අනුව දිස්ත්‍රික්ක 8ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 36ක පවුල් 40,945කට පානීය ජල ගැටලු ඇති වෙලා තිබෙනවා. මේ වනකොටත් බවුසර් මඟින් සහ වෙනත් විධිවලින් මේ පවුල් සඳහා ජල සම්පාදන කටයුතු සිද්ධ කරමින් තිබෙනවා. මේ ජනතාව ඇත්තටම ජලය සම්පාදනය කරගෙන තිබෙන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල ව්‍යාපෘති හරහා. එහෙම නැත්නම් ප්‍රජා ජල ව්‍යාපෘති හරහා. එහෙමත් නැත්නම් පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කරන ජල ව්‍යාපෘති හරහා. එහෙමත් නැත්නම් ගම්මානවල ක්‍රියාත්මක වන කුඩා කුඩා වෙනත් ජල ව්‍යාපෘති හරහා. එහෙමත් නැත්නම් පවුල් විධියට පාවිච්චි කරන තනි තනි ජල මූලාශ්‍රවලින්. ඒවා, ළිඳක් වෙන්න පුළුවන්, ඇළ දොළ වෙන්න පුළුවන්. එවැනි විවිධ මූලාශ්‍රවලින් ජලය ලබාගත් ජනතාව තමයි මේ විධියට අපහසුතාවට පත් වෙලා ඉන්නේ. ඒ කෙසේ වෙතත්, සම්පූර්ණ වශයෙන් අපි මේ වන විට පවුල් 40,945කට පානීය ජලය සපයමින් ඉන්නවා. ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ තිබෙන ජල ව්‍යාපෘති 352න් දැනට ගැටලු ඇති වෙලා තිබෙන්නේ, schemes දෙකක පමණයි. මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල, මැදගම, මඩුල්ල, මොනරාගල කියන ප්‍රදේශවලට තමයි ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයෙන් ජලය සපයන කටයුතුවලට යම් බාධාවක් වෙලා තිබෙන්නේ. ඒ සඳහා ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, මඩකලපුව දිස්ත්‍රික්කය ගත්තාම, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන්නේ උන්නිච්චායි ජලාශය. වවුනතිව් ජල පිරිපහදු මධ්‍යස්ථානය හරහා තමයි ඒ ජලය සම්පාදනය කරන්නේ. උන්නිච්චායි ජලාශයේ ජල මට්ටම අඩු වීම නිසා ඒ ප්‍රදේශවල පවුල් 75,000කට විතර පැය 24ක් ජලය සපයන එක පැය හතරකින් අඩු කරලා පැය 20කට සීමා කරලා තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්ක සාකච්ඡා කළාම උන්නිච්චායි ජලාශය තුළ තිබෙන ජල ප්‍රමාණය සැප්තැම්බර් මාසය අවසානයේ වැස්ස වැටෙන කල් කළමනාකරණය කර ගන්න පුළුවන් කියන එක තමයි තහවුරු කරලා තිබෙන්නේ. කෙසේ වෙතත්, උන්නිච්චායි ජලාශයේ ජල සැපයුම යම් විධියකින් අපි අපේක්ෂා නොකරන මට්ටමින් බාධාවක් වුණොත් විකල්පයක් විධියට ජලය ලබා ගන්න පුළුවන් ළිං තුනක් පිළිසකර කරමින් පවතිනවා.

කෙසේ වෙතත්, ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය ජල මූලාශ්‍ර කිහිපයක් පොදු වශයෙන් පාවිච්චි කරනවා. දළ වශයෙන් ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය දිනකට ජලය ඝන මීටර් ලක්ෂ 30ක් පිරිපහදු කිරීම සඳහා පාවිච්චි කරනවා. දිවයින පුරා භූගත ජල මූලාශ්‍ර 59කින් ජලය ලබා ගන්නවා. ඒ මඟින් දළ වශයෙන් ඝන මීටර් 77,000ක් විතර ගන්නවා. මේ භූගත ජල මූලාශ්‍ර තමයි යම් මට්ටමකට තර්ජනයකට ලක් වෙලා තිබෙන්නේ. ඒ වාගේම ජලාශ ආශ්‍රිත මූලාශ්‍ර 59කින් ජලය ලබා ගන්නවා. ඒ මඟින් දිනකට දළ වශයෙන් ඝන මීටර් 712,000ක් විතර ගන්නවා. ගංගා, ඇළදොළ සහ වෙනත් ජල මූලාශ්‍රවලින් දවසකට දළ වශයෙන් ඝන මීටර් ලක්ෂ 22ක් විතර ලබා ගන්නවා. මුහුදු ජලය ලබා ගෙන පිරිපහදු කරන ප්‍රධාන ව්‍යාපෘති තුනක් තිබෙනවා, ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය යටතේ. ඒ සියලු මූලාශ්‍රවලින් දැනට ගැටලුවක් ඇති වෙලා තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ භූගත ජල මූලාශ්‍ර සහ මඩකලපුවේ උන්නිච්චායි ජලාශයේ විතරයි. අනෙක් ජල මූලාශ්‍රවලට දැනට ගැටලුවක් නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ මහවැලි අධිකාරිය යටතේ පාලනය වෙන ජලාශ තමයි අපට තිබෙන්නේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව අද ප්‍රකාශයට පත් කළා, ඔවුන් යටතේ තිබෙන ප්‍රධාන ජලාශවල ජලය සියයට 34ක මට්ටමක පවතිනවා කියලා. මේ වෙනකොට කෘෂි කර්මාන්තය සඳහා ජලය නිකුත් කරන එක අවසන් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ තිබෙන ජල ධාරිතාව සැප්තැම්බර් මාසය අවසන් වෙනකල් පානීය ජලය සඳහා කළමනාකරණය කරන්න ප්‍රමාණවත් කියන එක තමයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව අපිත් එක්ක සාකච්ඡා කළාම දත්ත සහිතව පෙන්වා දුන්නේ.

ගරු කථානායකතුමනි, මහවැලි අධිකාරිය යටතේ ක්‍රියාත්මක වෙන ඉහළ සිට පහළ දක්වා ඇති ජලාශ පද්ධතියේ දළ වශයෙන් සියයට 50කට වැඩි ජල ධාරිතාවක් රැඳෙනවා. ඒ නිසා ඒ ජලාශවලින් ජලය ලබාගෙන පිරිපහදු කරන ඒවාට දැනට බාධාවක් ඇති වෙලා නැහැ. ඒ පිළිබඳ ගැටලුවක් ඇති නොවේ යැයි අපි හිතනවා. විශේෂයෙන් අම්පාර දිස්ත්‍රික්කයට ජලය සපයන්නේ සේනානායක සමුද්‍රයෙන් අරගෙන. මේ වනකොට සියයට 25කට ආසන්න ප්‍රමාණයකට ඒ ජල මට්ටම අඩු වෙලා තිබෙනවා. නමුත් කෘෂි කර්මාන්ත කටයුතු සඳහා ජලය නිකුත් කරන්නේ නැති නිසා සැප්තැම්බර් මාසය අවසානයේ වැස්ස වැටිලා ජලය ලැබෙන කල් ඒ ජලාශයේත් ඒ ජල ධාරිතාව ප්‍රමාණවත් වෙයි කියලා තමයි සලකන්නේ. ඒ පිළිබඳත් ගැටලුවක් ඇති වෙන එකක් නැහැ කියලා හිතනවා.

ගංගාවලින් ජලය ලබා ගන්නා බස්නාහිර පළාතේ ප්‍රධාන ජල මූලාශ්‍ර වන්නේ කළු ගඟ සහ කැලණි ගඟ. පසුගිය දවස්වල මේ ගංගා ද්‍රෝණිවලට ඇද හැලුණු වර්ෂාපතනය නිසා මේ ගංගාවල ජල ධාරිතාවේ අඩුවීමක් වෙලා නැහැ. ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ ලක්ෂ 13ක් පාරිභෝගිකයන් ඉන්නේ බස්නාහිර පළාතේ. ඒ පාරිභෝගිකයන්ට ජල සැපයීම සම්බන්ධයෙන් කිසිදු තර්ජනයක් මේ වෙනකොට එල්ල වෙලා නැහැ. ඒ නිසා සැප්තැම්බර් මාසයේ නැවත වැස්ස වැටෙනකල් කළු ගඟින්, කැලණි ගඟින් ජලය ලබා ගන්නා බස්නාහිර පළාතේ ජල සැපයුමට බාධාවක් ඇති නොවෙයි කියලා තමයි හිතන්නේ. ඒ තිබෙන ජල ධාරිතාවත් එක්ක එවැනි ගැටලුවක් ඇති වෙන එකක් නැහැ.

ගරු කථානායකතුමනි, ප්‍රජා ජල ව්‍යාපෘති හරහාත් ජලය සම්පාදනය කරගන්නවා. ලංකාව පුරා ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ජල මූලාශ්‍ර 5,464ක් පාවිච්චි වෙනවා කියලා තමයි සංඛ්‍යා දත්තවල තිබෙන්නේ. ඒ අතරින් ජල මූලාශ්‍ර 1,897ක් තර්ජනයට ලක් වෙලා තිබෙනවා. සමහර ඒවා සිඳී ගිහිල්ලා. සමහර ඒවා සිඳී යා හැකියි කියලා අපි පුරෝකථනය කර තිබෙනවා. මේ ජල මූලාශ්‍ර කියන්නේ සමහර විට ළිං වෙන්න පුළුවන්, නළ ළිං වෙන්න පුළුවන්, කුඩා වැව් වෙන්න පුළුවන්, කුඩා ඇළවල් වෙන්න පුළුවන්. මේවා වෙනත් දිය පහරවල් වාගේ පොඩි පොඩි ජල මූලාශ්‍රවලින් පවුල් 100කට, 150කට ජල සම්පාදනය කරන කුඩා ජල ව්‍යාපෘති. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, ඒ සිඳී ගිය ජල මූලාශ්‍රවලින් අපහසුතාවට පත් වෙච්ච ජනතාව විධියට තමයි මේ පවුල් හතළිස්දහස් ගණන වාර්තා වෙන්නේ. ඔවුන් වෙනුවෙන් දැනටමත් ජල සම්පාදන කටයුතු ආරම්භ කර තිබෙනවා. ඇත්තටම මේ කටයුතු ආපදා කළමනාකරණ යන්ත්‍රණය හරහා තමයි සිද්ධ වෙන්නේ. ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය ආපදා කළමනාකරණ යන්ත්‍රණය තිබෙනවා. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්තුමා ඉන්නවා, ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා හෝ සභාපතිතුමිය ඉන්නවා, ඒ වාගේම වෙනත් නිලධාරින් ඉන්නවා.

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

මොන ග්‍රාම නිලධාරි වසම්වල මොන ගම්වලටද ජල සැපයුමට බාධා වෙලා තිබෙන්නේ කියලා ප්‍රාදේශීය වශයෙන් තමයි සමාලෝචනය කරන්නේ. ඒ නිසා ප්‍රාදේශීය වශයෙන් උත්තර හොයාගන්න එක තමයි මේකෙදි හොඳම යන්ත්‍රණය. ඒ සඳහා තමයි ආපදා කළමනාකරණ යන්ත්‍රණය ක්‍රියාත්මක වෙන්නේ. මොකක්ද කළ යුත්තේ කියන එකට එතැනින් තමයි උත්තර හොයන්නේ.

ගරු කථානායකතුමනි, ජල සම්පාදන අමාත්‍යවරයා විධියට මට වගකීමක් තිබෙන නිසා මේ දිස්ත්‍රික්ක අතෙන් වඩාත්ම තර්ජනයට ලක් වෙලා තිබෙන මොනරාගල සහ මඩකලපුව කියන දිස්ත්‍රික්ක දෙකේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට මම සහභාගි වුණා. ඒ කියන්නේ, දිස්ත්‍රික්ක දෙකේම මේකට අදාළ නිලධාරින් වන දිසාපතිතුමා, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් සහ ආපදා කළමනාකරණ නිලධාරින් ඇතුළු ප්‍රාදේශීය සභා සභාපතිවරු එකතු කරගෙන තිබෙන යන්ත්‍රණය හරහා වැඩ කටයුතු සිද්ධ වෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් සමාලෝචනය කරලා, සාකච්ඡා කරලා වැඩිමනත් විධියට අපට ගත හැකි ක්‍රියාමාර්ග හඳුනාගෙන ඒ අවශ්‍ය කටයුතුවලට සම්බන්ධ වෙන්න මට පුළුවන් වුණා. විශේෂයෙන්ම මඩකලපුව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ meeting එකට විතරක් නොවෙයි, උන්නිච්චි ප්‍රදේශයටත් මම ගියා. එහි ජනතාවත් හම්බ වුණා. ඉලුප්පඩිච්චේනෙ ප්‍රදේශයටත් මම ගියා. එහි ජනතාවත් හම්බ වුණා. ඒ වාගේම අපි වාකරේ කායන්කර්නි ප්‍රදේශයටත් ගියා. එහි ජනතාවත් හම්බ වුණා. ඔවුන්ගේ කටයුතු සිදු වෙලා තිබෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් සාකච්ඡා කළා. සමහර ප්‍රජා ජල ව්‍යාපෘතිවල තත්ත්වය නිසා ඒවා තර්ජනයට ලක් වෙලා තිබෙනවා. ඒවා ගැන පෞද්ගලිකව සොයා බලන්න මම සහභාගි වුණා. ඒ අනුව තමයි අපි හඳුනා ගත් සමහර ඒවා එල් නිනෝ තත්ත්වයේ බලපෑම අවම කිරීම සඳහා පිහිටුවා තිබෙන අමාත්‍ය අනුකමිටුවට අපි වාර්තා කළේ. සමහර ඒවා ප්‍රායෝගිකව බිම සිද්ධ වෙන ඒවා. සමහර ඒවා සම්බන්ධයෙන් අපි ක්‍රියාමාර්ග ගත යුතුයි, පහසුකම් සැපයීම සඳහා වෙනස් කරන්න ඕනෑ මොනවාද කියන එක සම්බන්ධයෙන්. ඒ අනුව තමයි අපි චක්‍රලේඛ වෙනස් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, කලින් එක පුද්ගලයෙකුට දවසකට පානීය ජලය ලීටර් 6යි දෙන්න තිබුණේ. පරිසර ඇමතිතුමාත් මේක කිව්වා. එක පුද්ගලයෙකුට පානීය ජලය ලීටර් 6ක් දෙන්න තමයි කලින් චක්‍රලේඛයේ තිබුණේ. අපි ඒක වෙනස් කරලා තිබෙනවා. ඒ අනුව දැන් පානීය ජලය ලීටර් 15ක් ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. වෙනත් අවශ්‍යතා සඳහාත් ජලය ලබා දෙන්න චක්‍රලේඛ වෙනස් කරන්න අපි යෝජනා කර තිබෙනවා. ඒ වාගේම තමයි ගොඩක් වෙලාවට මේ ජල සැපයුම් කරන්නේ ප්‍රාදේශීය සභා මගින්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ජල බවුසර් මේ සඳහා පාවිච්චි කරනවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ තිබෙන ජල බවුසර් ද මේ සඳහා පාවිච්චි කරනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තිබෙන ජල බවුසර් ද පාවිච්චි කරනවා. ඒ වාගේම ත්‍රිවිධ හමුදාව යටතේ තිබෙන ජල බවුසර් ද මේ සඳහා පාවිච්චි කරනවා. බොහෝ විට පාවිච්චි වෙන්නේ ප්‍රාදේශීය සභා බවුසර්. නමුත් ප්‍රාදේශීය සභා ක්‍රියාත්මක වෙන්නේ පළාත් සභා යටතේ කියලා අපි දන්නවා.

ආපදා කළමනාකරණ යන්ත්‍රණයෙන් මුදල් ලැබෙන්නේ ප්‍රාදේශීය ලේකම්ට. පඩි ගෙවාගන්නවත් විධියක් නැතුව සිටින බොහෝ ප්‍රාදේශීය සභා තිබෙනවා. ඒ නිසා මේ ආපදාව වෙලාවේ ඔවුන්ට ජල සම්පාදන කටයුතු කරන්න ගියාම මුදල් නැහැ. තිබෙන ට්‍රැක්ටර් වෙන්න පුළුවන්, ජල බවුසර් වෙන්න පුළුවන්, වෙනත් රථ වෙන්න පුළුවන්. ඒවා පාවිච්චි කරද්දි ඉන්ධන සඳහා යන වියදම් වැඩි වෙනවා. ඒ වාගේම සමහර විට අමතර වශයෙන් රියදුරන් බඳවා ගන්න වෙනවා. රියදුරන් සඳහා අතිකාල දීමනා දෙන්න වෙනවා. මේ ජල බවුසර්වල විවිධ repairs එනවා. ඒවා සම්පූර්ණ කරගන්න ඕනෑ. එවැනි කටයුතු සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හරහා යොමු කරන මුදල් ප්‍රාදේශීය සභාවලට ලබා දෙන්නේ කොහොමද කියන කාරණාව ගැන අපි කථා කළා.

මම සහභාගී වූ මොනරාගල රැස්වීමට අපේ ඌව පළාත් ආණ්ඩුකාරතුමාත් සම්බන්ධ වුණා. එතුමාත් පළාත් සභාව හරහා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න පොරොන්දු වුණා. ඒ වාගේම, මේ චක්‍රලේඛ වෙනස් කරලා අවශ්‍යතා සම්පූර්ණ කරගන්න ප්‍රාදේශීය සභා සඳහා යන වියදම් ලබා දෙන්නේ කොහොමද කියලා අපි යෝජනා කර තිබෙනවා. ඒ වාගේම, සමහර විට සමහර ගම්මානවල ස්වේච්ඡා සංවිධාන තිබෙනවා කියලා අපි දන්නවා. ගමට අවශ්‍ය ජලය සම්පාදනය කරන්න ඒ සංවිධාන පෙරට එන්න පුළුවන්. නමුත් ඔවුන්ට වියදම් ලබාදිය යුතුයි. ඒ සම්බන්ධයෙන් මේ චක්‍රලේඛවල සඳහන් වෙලා නැහැ. අපි ඒවා යෝජනා කර තිබෙනවා. මේ චක්‍රලේඛ වෙනස් කරලා ඔවුන්ගේ දායකත්වයත් ලබාගන්න කටයුතු කෙරෙමින් තිබෙනවා. මේ රාජ්‍ය පද්ධතියට විතරක්, ප්‍රාදේශීය ලේකම් යන්ත්‍රණයටම පමණක් මේ ජල සම්පාදන කටයුතු කරන්න බැහැ. ඒ නිසා ස්වේච්ඡා සංවිධානවල සහ සමහර පෞද්ගලික ධනපතීන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ඒ අවශ්‍ය වෙනස්කම් කරන්න අප කටයුතු කරමින් සිටිනවා.

ගරු කථානායකතුමනි, මේ එල් නිනෝ තත්ත්වය ගැන පුරෝකථනය කරලා තිබෙනවා. මේ වියළි කාලගුණය බොහෝ විට සැප්තැම්බර් මාසය - මේ මාසය - අවසන් වෙනකොට පහව යයි. ඒ කියන්නේ, තව සති දෙකකින් වැස්ස ඇද වැටෙයි කියන එක තමයි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරෝකථනය. ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් වැහැලා - බොහෝ විට ජනවාරි මාසයේත් යම් වැසි ප්‍රමාණයක් ලැබෙයි. - පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස වෙනකොට සාමාන්‍යයෙන් වියළි කාලගුණයක් තමයි අපේ රටේ තිබෙන්නේ. නමුත් 2027 දී මේ මාස තුනේ අපි අපේක්ෂා නොකරන මට්ටමේ වියළි කාලගුණයක් අපට අත්විඳින්නට සිද්ධ වෙයි කියලා තමයි පුරෝකථනය කරලා තිබෙන්නේ. ඒ නිසා අපි මේ දැන් අත්විඳිමින් තිබෙන ජල ගැටලුව - ජල සම්පාදනයේ ගැටලුව - පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාසවල නැවත පැන නඟින්න නියමිතයි. ඒ නිසා අපි මේ ගන්නා ක්‍රියාමාර්ග මේ වෙලාවට උත්තරයක් වාගේම 2027 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාසවලදී එළඹෙන්නට නියමිත, අත්විඳින්නට නියමිත වියළි කාලගුණය වෙනුවෙන් ගන්නා පූර්ව ක්‍රියාමාර්ග වෙන්න පුළුවන්. අපි දැනටමත් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. අතහැර දමා තිබෙන නළ ළිං තිබෙනවා. ඒ නළ ළිං කාලයක් තිස්සේ පාවිච්චි කරලා නැහැ. නමුත් ඒවා ජල මූලාශ්‍රයක් විධියට පාවිච්චි කරන්න පුළුවන්. අපි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ භූගත ජල විමර්ශන අංශය යොදාගෙන නළ ළිං පිළිසකර කරන වැඩ පිළිවෙළක් ආරම්භ කළා. මේ වනවිට මොනරාගල දිස්ත්‍රික්කයේ නළ ළිං 57ක් පිළිසකර කර ජල මූලාශ්‍ර විධියට නැවත පාවිච්චියට ගන්න පටන්ගෙන තිබෙනවා. ඒ වාගේම බදුල්ල දිස්ත්‍රික්කය, මඩකලපුව දිස්ත්‍රික්කය ඇතුළු තවත් දිස්ත්‍රික්කවල නළ ළිං ප්‍රතිසංස්කරණය කරන්නත් අපි සැලසුම්

සකස් කරලා තිබෙනවා. මේ සැප්තැම්බර් මාසය අවසාන වෙනකොට, එහෙම නැත්නම් මේ සති දෙකේ මේවා පාවිච්චි කරන්න බැරි වුණත්, මේවා පිළිසකර කරන ක්‍රියාමාර්ගය; පිළිසකර කරන වැඩ පිළිවෙළ අපට ප්‍රයෝජනවත් වෙනවා, 2027 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස තුනේදී. ඒ වාගේම භූගත ජල විමර්ශන අංශය ශක්තිමත් කිරීම සඳහා වාහන, යන්ත්‍ර සහ අනෙකුත් අමතර උපාංග ගෙන්වා ගැනීමට අපි කටයුතු කරලා තිබෙනවා.

අපි මේ වෙලාවේදී මේ මධ්‍ය කාලීන සහ දිගු කාලීන පිළිතුර සහිතව තමයි කටයුතු කරමින් සිටින්නේ. පවුල් හතළිස් දහස් ගණනක් කියන ප්‍රමාණය සුළු පටු නැහැ. නමුත්, ඔවුන් අපහසුතාවට පත්වෙලා තිබෙනවා. ඔවුන්ගේ ජන ජීවිතය කඩා නොවැටෙන විධියට අපි ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. ඒ වාගේම තවදුරටත් තිබෙන ගැටලු හඳුනාගෙන ඒවා වෙනස් කිරීම සඳහාත් කටයුතු කරන්න සූදානමින් ඉන්නවා. මේ කාරණා ටික තමයි මට ඉදිරිපත් කරන්න තිබෙන්නේ, ගරු කථානායකතුමනි. කෙසේ වෙතත්, අමාත්‍ය අනුකමිටුව නිරන්තරයෙන් රැස්වෙලා, තිබෙන ගැටලු හඳුනාගෙන ඉදිරියේදී ජනතාවට සහන සැපයීම සඳහා කටයුතු කරන්න අපි සූදානමින් ඉන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද කාරණය, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් පුළුවන්ද, ඉදිරිපත් කරන්න?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ගරු මන්ත්‍රීතුමා. අධ්‍යයනයකින් පස්සේ, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් පිළිතුරක් ලැබෙන්න සලස්වන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට පිළිතුරක් ලැබෙන්න සලස්වන්නම්.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

මට මේක කියන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද උදේ හමු වුණා. ඒ ගැන අධ්‍යයනයකින් පස්සේ ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්න කටයුතු කරන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඉන්නකෝ. මම මේ වාගේ වරප්‍රසාද ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් ඔබතුමා මට එකකටවත් ඉඩ දුන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මට කථා කරන්න දෙන්න. මට කථා කරන්න විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා, ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකට අදාළව තමයි කිව්වේ. අද උදේ පිටු 4ක ලියුමක් ලැබුණා. ඒ ගැන අධ්‍යයනයකින් පස්සේ ඔබතුමාට දැනුම් දෙන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, under Standing Order No. 118 -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 146 අනුව තමයි මම ඔබතුමාට මේ කියන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමාට ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හෙටවත් දෙනවාද, මේක කථා කරන්න?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අධ්‍යයනයකින් පසුව ඔබතුමාට දැනුම් දෙන්නම්. උදේ නේ, භාර දුන්නේ. අධ්‍යයනයකින් පස්සේ ඔබතුමාට කියන්නම්, එය වරප්‍රසාද ප්‍රශ්න යටතේ නඟන්න පුළුවන්ද, බැරිද කියලා.

ගරු සභානායකතුමනි, ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා ඉදිරිපත් කරන්න ඔබතුමාට පුළුවන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, Standing Order No. 118 යටතේ මට point of Order එකක් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ඒ ගැන කිව්වා.

ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට කාරණාවක් මතු කරන්න අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට යෝජනාව ඉදිරිපත් කරන්න දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හොඳයි, මම ඊට පස්සේ කියන්නම්කෝ.

## දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

## தித்வா புயலை எதிர்கொள்வதற்காக முன்னாயத்தத்துடன் இருக்கவில்லை என்பது தொடர்பில் முழுமையாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு

## SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY ON THE LACK OF PREPAREDNESS TO FACE CYCLONE DITWAH AND REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝ නා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2026 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාලසීමාව, 2026 දෙසැම්බර් 19 දින දක්වා දීර්ඝ කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් අධ්‍යයනයකින් පස්සේ අවස්ථාව ලබා දීමට කටයුතු කරන්නම්. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමාට මම දැන් පැහැදිලිවම ඒ පිළිබඳව කිව්වා නේ. ඔබතුමා මේ සභාවේ වැඩ කටයුතුවලට බාධා කළොත් මම ඔබතුමාව එළියට දානවා. මතක තියාගන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, එහෙම බැහැ. *[බාධා කිරීමක්]*

ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය අනුමත කිරීම, ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය. You have 14 minutes.

# කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත: තීරණය

## பெண்களின் வலுவூட்டல் சட்டம்: தீர்மானம்
## WOMEN EMPOWERMENT ACT: DETERMINATION

[පූ.භා. 11.24]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික, එකී පනතේ 13 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අතර, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු හෙයින් ද;

කොමිෂන් සභාව සඳහා පත් කරනු ලබන සාමාජිකයින් අතරින් සභාපතිවරයා ද ඇතුළුව අවම වශයෙන් තිදෙනෙකු (03) පූර්ණ කාලීන සාමාජිකයින් වශයෙන් පත් කිරීමට අදාළ පනතේ 5(5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පැවරෙන කාර්යභාරයේ වැදගත්කම ද සැලකිල්ලට ගනිමින්, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා ගෙවීම සඳහා 2026.08.10 දිනැති අංක 26/1522/819/010-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇති හෙයින් ද:-

(i) සභාපතිවරයා වෙත මාසිකව රු.135,000.00ක ද, සාමාජිකයින් වෙත මාසිකව රු.90,000.00ක ද පාරිශ්‍රමික ගෙවීමට;

(ii) සභාපතිවරයා සඳහා මාසිකව රු.6,000.00ක ද, සාමාජිකයින් වෙත රු.4,250.00ක ද සන්නිවේදන දීමනාවක් ගෙවීමට; සහ

(iii) මාසික ඉන්ධන හා ප්‍රවාහන දීමනාව පහත පරිදි ගෙවීමට:

| | ඉන්ධන දීමනාව | ප්‍රවාහන දීමනාව* |
|---|---|---|
| සභාපති | 220L | රු. 50,000.00 |
| අනෙකුත් සාමාජිකයින් | - | රු. 25,000.00 |

* සභාපතිට ප්‍රවාහන දීමනාව හිමි වන්නේ රජය විසින් රියදුරෙකු සහිත නිල වාහනයක් ලබාදිය නොහැකි අවස්ථාවන්හි දී පමණි.

ඊට අනුකූලව, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාරව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට ඉහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ගෙවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි."

ගරු කථානායකතුමනි, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 13වැනි වගන්තිය ප්‍රකාරව කාන්තාවන් සවිබල ගැන්වීමේ ජාතික කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් සඳහා පාරිශ්‍රමික දීමනා ලබා දීම සම්බන්ධ වූ තීරණය මේ සමඟ අද දිනයේදී ඉදිරිපත් වනවා. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ සාමාජික ව්‍යුහයට, ආර්ථික සංවර්ධනයට සහ රාජ්‍ය ප්‍රතිපත්තිවලට අතිශයින්ම වැදගත් වන යෝජනාවක් මෙම ගරු සභාව හමුවට අද ඉදිරිපත් කිරීමට ලැබී තිබෙනවා. 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 13 වැනි වගන්තියට අනුකූලව සහ 2026 අගෝස්තු 10වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කාන්තාවන් සවිබල ගැන්වීමේ ජාතික කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් සඳහා වූ පාරිශ්‍රමික දීමනා තීරණය කිරීමේ මෙම යෝජනාව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා මම යෝජනා කරනවා.

මෙම පාර්ලිමේන්තුව 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත සම්මත කළ අවස්ථාවේදී එය සාමාන්‍ය පනතක් පමණක් වුණේ නැහැ. එම පනත, මෙරට ජනගහනයෙන් සියයට 52කට අධික වන කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඉහළ නැංවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ව්‍යවස්ථා රාමුවක් මඟින් නිර්මාණය කරන ලද එකක්. කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික දීමනා පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු බවත්, එම මුදල් සෘජුවම ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු බවත් මෙම පනතේ පැහැදිලිව සඳහන් වනවා. සභාපතිවරයා ඇතුළුව අවම වශයෙන් පූර්ණ කාලීන සාමාජිකයන් තුන්දෙනෙකුද ඇතුළුව හත්දෙනෙකුගෙන් සමන්විත කොමිෂන් සභාවක් පත් කර තිබෙනවා. විශේෂයෙන්ම මෙම කොමිෂන් සභාවේ මුල්ම සභාපතිනිය ලෙස ආචාර්ය රමණී ජයසුන්දර මහත්මිය තේරී පත් වුණා. එතුමියගේ ඉල්ලා අස්වීමෙන් පසුව අද වන විට ශ්‍රෙස් ආසිරිවාදම් මහත්මිය සභාපති ධුරයට තේරී පත්වෙලා තිබෙනවා. එතුමිය විශ්‍රාමික තානාපතිනියක් වාගේම යුරෝපීය සංගමයේ දූත මණ්ඩල ප්‍රධානී ලෙසද, රසායනික අවි තහනම් කිරීමේ සංවිධානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරිය හැටියට ද කටයුතු කරපු තැනැත්තියක්. ඒ වාගේම එතුමියට අමතරව ශ්‍රීන් සරුර් මහත්මිය, ජනහා සෙල්වරාස් මෙනෙවිය, ජයන්ති කුරු උතුම්පාල මහත්මිය, වෛද්‍ය පද්මා ගුණරත්න මහත්මිය, ආචාර්ය කලන සේනාරත්න මහතා සහ එම්.යූ. ගයනි මහත්මිය කොමිෂන් සභාවේ සාමාජිකයින් හැටියට කටයුතු කරන අතර, විධායක අධ්‍යක්ෂ ධුරයෙහි කේ.ඩී.ආර්. ඔල්ගා මහත්මිය කටයුතු කරනවා. මේ හත්දෙනාට අමතරව විධායක අධ්‍යක්ෂවරියක් ද පත් කරමින්, අනෙකුත් සෙසු කාර්ය මණ්ඩල සමඟ මෙම කාර්යය කරමින් යන වෙලාවේ, පුළුල් පාලන පරීක්ෂණ හා ප්‍රතිපත්තිමය කටයුතු බාධාවකින් තොරව ඉදිරියට ගෙන යෑම සඳහා මෙම කොමිෂන් සභාව අත්‍යවශ්‍ය සාධකයක් වන බව අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම ඒකාබද්ධ අරමුදලින් සෘජුවම වේතන, පාරිශ්‍රමික ගෙවීම මඟින් මෙම කොමිෂන් සභාව කිසිදු දේශපාලන මැදිහත්වීමකින්, පරිපාලන ප්‍රමාදයකින් හෝ පාලන බලපෑමකින් තොරව සම්පූර්ණයෙන්ම ස්වාධීනව කටයුතු කිරීම තහවුරු කර තිබෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙලා තිබුණු කාන්තා කමිටුව මේ මඟින් අහෝසි වෙලා තමයි කාන්තා කොමිසම කියන එක තවදුරටත් ස්ථාපිත වන්නේ. "1938" නම් වූ උපකාරක සේවාව ද සහිතව කාන්තාවන් හිංසනයට ලක්වුණාම ඒ පිළිබඳව දැන්වීම සඳහා පිහිටුවා තිබූ කාන්තා කමිටුවට නීතිමය කටයුතු සඳහා මැදිහත් වීමේ බලතල තිබුණේ නැහැ. හැබැයි මේ වනකොට නීතිය බලගැන්වීම සඳහා අවශ්‍ය වන, ඒ වාගේම ලැබෙන පැමිණිලි පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට හෝ අධිකරණයට යෑමට කාන්තා කමිටුවට හැකියාවක් තිබුණේ නැහැ. හැබැයි, මේ ආරම්භ කරන කාන්තා කොමිසමට පරීක්ෂණ පැවැත්වීමට, සමථයකට පත් කිරීමට හා නීතිමය කටයුතු සමඟ සම්බන්ධ වීමට බලතල ලැබෙනවා. මෙහි මූල්‍ය ස්වාධීනත්වය ගත්තොත්, අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රතිපාදන මත තමයි කාන්තා කමිටුව ක්‍රියාත්මක වුණේ. හැබැයි, මේ වනකොට කාන්තා කොමිසමට ඒකාබද්ධ අරමුදලින් සෘජු මූල්‍ය සහතිකයක් ලැබී තිබෙනවා.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

මේ සියල්ල එක්කම මා මේ අවස්ථාවේ තවත් කාරණයක් කියන්න කැමැතියි. ගරු කථානායකතුමනි, කාන්තාවන් බලගැන්වීම කියන්නේ පුණ්‍යකර්මයක්වත්, අනුකම්පාව පදනම් කරගත් කාර්යයක්වත් නොවෙයි. එය රටේ ආර්ථික පුනර්ජීවනය සඳහා අතිශයින්ම වැදගත් වන මහා ආර්ථික අවශ්‍යතාවක්. කාන්තා ශ්‍රම දායකත්වය ඉහළ නැංවීම තුළ ලංකාවේ ආර්ථික ස්වාධීනත්වය සියලුදෙනාටම හිමි වනවා. ලංකාවේ කාන්තාවන් සියයට 52කට ආසන්න පිරිසක් සිටින අතර, අධ්‍යාපනයෙන් ඉදිරියෙන් සිටින්නේත් කාන්තාවන්. හැබැයි, ශ්‍රම බලකාය සඳහා ඔවුන්ගේ දායකත්වය පවතින්නේ සියයට 32ක, 35ක මට්ටමක. මේ ශක්‍යතාව සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීම රටේ GDP එක වර්ධනය කරගන්නත් හේතු වනවා. එකම ආකාරයේ රැකියාවල නියුතු වුණත්, ඔවුන්ට අසමානකොට සැලකීම කියන එක සමාජය තුළ අපි දකිනවා. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානතාව ඇති කරන්න නම්, ආර්ථික සමතුලිතතාව ඇති වෙන්නත්, ආර්ථික සාධාරණත්වයත් හිමිවෙන්නත් ඕනෑය කියන එක අපි තරයේ විශ්වාස කරන නිසාම එකම ආකාරයේ රැකියාවක් සඳහා සමාන වේතනයක් ලබා දීම තහවුරු විය යුතු බවත්, නොවිධිමත් රැකියා ක්ෂේත්‍රයේ සිටින කාන්තාවන් ආරක්ෂා කිරීම සහ ග්‍රාමීය, නාගරික මෙන්ම උතුරු, නැඟෙනහිර වැනි කාන්තා ගෘහ මූලික පවුල් වැඩිම ප්‍රමාණයක් ජීවත් වන පළාත්වල කාන්තා ව්‍යවසායකයන් සඳහා මූල්‍ය අවස්ථා ප්‍රවර්ධනය කිරීමටත් මෙම කොමිසම ආර්ථික වර්ධන කටයුතු සඳහාත් මැදිහත්වීම් සිදු කරනවා. ස්ත්‍රී පුරුෂභාවය පදනම් වූ හිංසන වාගේම රැකියා ස්ථානවල සිදුවන හිරිහැර කිරීම් රටේ ආර්ථිකයට විශාල වශයෙන් වක්‍ර පාඩුවක් සිදු කරනවා. මෙම කොමිෂන් සභාව කාන්තාවන්ට සිදුවන අසාධාරණයන් සඳහා ක්ෂණික නෛතික ආරක්ෂාව සහ විසඳුම් ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියා කරන බව මා මේ අවස්ථාවේ කියනවා. ඒ වාගේම තමයි, කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියට ශ්‍රී ලංකාව ලබා දී ඇති ජාත්‍යන්තර පොරොන්දු ඉටු කිරීමටත් මෙම ව්‍යුහය උපකාරී වනවා.

ගරු කථානායකතුමනි, ශක්තිමත් ජාතික කාන්තා කොමිෂන් සභාවක ආයෝජනය කිරීම කියන්නේ, රටේ ආර්ථික නිෂ්පාදනයට, සමාජ යුක්තියට, සමාජ සංවර්ධනයට, ඒ වාගේම බහුමාන දරිද්‍රතාව තුරන් කිරීමට අතිමහත් ප්‍රතිලාභ ලබා දෙන කර්තව්‍යයක් කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ නිසා ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම භාරගෙන ඇති මෙම කොමිෂන් සභාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම තීරණය අත්‍යවශ්‍යයි කියලා අපි හිතනවා. එබැවින් මෙම යෝජනාවට මෙම ගරු සභාවේ සිටින සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

கௌரவ சபாநாயகர் அவர்களே, இலங்கையின் சமூகக் கட்டமைப்பு, பொருளாதார மேம்பாடு மற்றும் சமூக அபிவிருத்தி நெறிமுறைகளுடன் சம்பந்தப்பட்ட மிக முக்கியமானதொரு பிரேரணையை இந்த உயரிய சபையில் சமர்ப்பிப்பதில் நான் பெருமிதம் அடைகின்றேன். 2024ஆம் ஆண்டின் 37ஆம் இலக்க, பெண்கள் வலுவூட்டல் சட்டத்தின் 13ஆம் பிரிவுக்கு இணங்கவும், 2026 ஓகஸ்ட் 10ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்துக்கு அமையவும், பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழுவின் தவிசாளர் மற்றும் உறுப்பினர்களுக்கான ஊதியங்கள் மற்றும் கொடுப்பனவுகளைத் தீர்மானிக்கும் இப்பிரேரணையை பாராளுமன்றத்தின் ஒப்புதலுக்காக முன்மொழிகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, சட்டரீதியான கடப்பாட்டையும் பாராளுமன்றப் பொறுப்பையும் ஒப்பிட்டுப் பார்க்கையில், இந்தப் பாராளுமன்றம் 2024ஆம் ஆண்டின் 37ஆம் இலக்க, பெண்கள் வலுவூட்டல் சட்டத்தை நிறைவேற்றியபோது, அது வெறுமனே சாதாரண ஒரு சட்டமாக அமையவில்லை என்பது நாங்கள் அனைவரும் அறிந்த விடயமாகும். நாட்டின் மக்கள் தொகையில் 52 சதவீதத்துக்கும் அதிகமாக இருக்கும் பெண்களின் உரிமைகளைப் பாதுகாக்க அரசியலமைப்பு ரீதியாகச் சுயாதீனமானதொரு கட்டமைப்பு இச்சட்டத்தின்மூலம் உருவாக்கப்பட்டு இருக்கின்றது. ஆணைக்குழு உறுப்பினர்களின் ஊதியங்கள் மற்றும் கொடுப்பனவுகளை பாராளுமன்றமே தீர்மானிக்க வேண்டும் என்றும், அவற்றைத் திரட்டு நிதியத்தின்மூலம் - Consolidated Fund - வழங்க வேண்டும் என்றும் இச்சட்டம் தெளிவாகக் கூறுகின்றது. தவிசாளர் உட்பட குறைந்தபட்சம் மூன்று முழுநேர உறுப்பினர்கள் இந்த ஆணைக்குழுவுக்கு நியமிக்கப்பட வேண்டும். ஆணைக்குழுவின் பரந்த நிருவாக, விசாரணை மற்றும் கொள்கை சார்ந்த பணிகளைத் தடையின்றி முன்னெடுக்க இது அவசியமானதென நாங்கள் முழுமையாக நம்புகின்றோம். திரட்டு நிதியத்திலிருந்து நேரடியாக ஊதியம் வழங்கப்படுவதன்மூலம் இந்த ஆணைக்குழு எந்தவோர் அரசியல் தலையீடோ, நிருவாகத் தாமதமோ, நிருவாக அழுத்தமோ இல்லாது முற்றிலும் சுயாதீனமாகச் செயற்படுவது உறுதி செய்யப்படுகிறது.

நான் கூறவேண்டிய இன்னொரு முக்கியமான விடயம் இருக்கின்றது. அதாவது, இவ்வளவு காலமும் எங்களுடைய அமைச்சின்கீழ் இயங்கிவந்த மகளிர் பணியகத்துக்கு - National Committee on Women - அப்பாற்பட்டுத்தான், நாங்கள் பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழுவை நியமித்திருக்கிறோம். இவ்வளவு காலமும் இல்லாத சட்டபூர்வமான நடவடிக்கைகளை மேற்கொள்வதற்கான அதிகாரம் இந்த ஆணைக்குழுவுக்குக் கிடைக்கப் பெறுகின்றது. எங்களுடைய அமைச்சின்கீழ் இயங்கிவந்த மகளிர் பணியகத்துக்கு இல்லாத சட்டரீதியான அங்கீகாரம் மற்றும் சட்டமூலங்களைத் தீர்மானிக்கும் அதிகாரம் என்பன இந்த ஆணைக்குழுவுக்குக் கிடைக்கப்பெற்று இருக்கின்றது. சட்ட மீறல்கள் குறித்து விசாரணை செய்யவோ அல்லது நீதிமன்றம் செல்லவோ அதிகாரம் இல்லாதிருந்த மகளிர் பணியகத்துக்கு - National Committee on Women - அப்பாற் சென்று, விசாரணைகளை நடத்த, சமரசம் செய்ய மற்றும் உயர் நீதிமன்றம்மூலம் உத்தரவுகளை அமுல்படுத்தக்கூடிய நேரடி அதிகாரம் பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழுவுக்குக் கிடைத்திருக்கின்றது.

நிதிச் சுதந்திரமானது, முன்னர் அமைச்சின் வருடாந்த நிதி ஒதுக்கீட்டில் மட்டுமே தங்கியிருந்தது. எனினும், இச்சட்டத்தின் 13ஆம் பிரிவின்படி, நேரடியாக திரட்டு நிதியத்திலிருந்து நிதி உத்தரவாதம் அளிக்கப்பட்டுள்ளது. இதன்மூலம் சுயாதீனமாக இயங்கும் தன்மை கிடைத்திருப்பதை நாங்கள் குறிப்பிட விரும்புகின்றோம்.

கௌரவ சபாநாயகர் அவர்களே, பெண்களை வலுவூட்டுவது என்பது ஒரு தர்ம காரியம் அல்ல. அதேபோல, அனுதாப அடிப்படையில் நடக்கவேண்டிய ஒரு காரியமும் அல்ல. மாறாக, நாட்டின் பொருளாதார மீட்சிக்கு மிக முக்கியமான பேரினப் பொருளாதாரத் தேவையாகும். பெண்களின் தொழிலாளர் பங்களிப்பை எடுத்துக்கொண்டால், இலங்கையில் பெண்கள் 52 சதவீதமாக உள்ளபோதிலும், கல்வியில் முன்னணியில் இருந்தபோதிலும், தொழிலாளர்

படையில் அவர்களின் பங்களிப்பு 32 - 35 சதவீதம் மட்டுமே. இந்த ஆற்றலை முழுமையாகப் பயன்படுத்துவது நாட்டின் GDP வளர்ச்சிக்கு அத்தியாவசியமானது என்பதை நான் முழுமையாக நம்புகின்றேன்.

பொருளாதாரச் சமத்துவமானது, ஒரு நாட்டின் நல்லிணக்கத்துக்கு மிகவும் முக்கியமானது என்பதை நாங்கள் விளங்கியிருக்கிறோம். பாலின வேறுபாடு இன்றி சமத்துவமாக வாழ வேண்டுமென்றால், பொருளாதார சமத்துவத்தை ஏற்படுத்துதல் அவசியமாகும். பொருளாதாரச் சமநிலை மற்றும் சம ஊதியத்தை எடுத்துக்கொண்டால், ஒரே மாதிரியான வேலைக்குச் சம ஊதியம் வழங்குவதை உறுதிசெய்வதற்கு இந்த ஆணைக்குழு முழுமையாக முயற்சி எடுக்குமென நாங்கள் நம்புகின்றோம்.

முறைசாரா துறையிலுள்ள பெண்களைப் பாதுகாத்தல், கிராமப்புற மற்றும் வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள பெண் தொழில்முனைவோருக்கு நிதி வாய்ப்புகளை அதிகரித்துக் கொடுப்பதற்கு இந்த ஆணைக்குழுமூலம் தீர்மானங்கள் எடுக்கப்படும். பாலின வன்முறைகளும் வேலைத்தள துன்புறுத்தல்களும் நாட்டின் பொருளாதாரத்தில் பெரும் இழப்பை மறைமுகமாக ஏற்படுத்துகின்றதை நாங்கள் அறிந்திருக்கின்றோம். இந்த ஆணைக்குழுவானது, பெண்களுக்கு எதிரான அநீதிகளுக்கு உடனடி சட்டப் பாதுகாப்பையும் தீர்வையும் வழங்கும் ஓர் ஒம்புட்ஸ் மையமாகச் செயற்படுமென நான் கூற விரும்புகின்றேன். பெண்களுக்கு எதிரான அனைத்து வகையான பாகுபாடுகளையும் ஒழிப்பதற்காக ஐ.நா. சபையின் உடன்படிக்கைக்கு இலங்கை அளித்துள்ள சர்வதேச வாக்குறுதிகளை நிறைவேற்ற இக்கட்டமைப்பு உதவுகின்றது.

நாங்கள் முழுமையாக நம்புகின்ற ஒரு முக்கியமான விடயம்தான், இலங்கையில் பாலின சமத்துவத்தை ஏற்படுத்துவதன்மூலம் சமுதாயப் பாதுகாப்பை மட்டுமல்லாது, நாட்டில் இருக்கக்கூடிய சகல இனங்களுக்குமான பொருளாதார அபிவிருத்தியையும் சமமான வாழ்வையும் ஒருமைப்பாட்டையும் ஏற்படுத்த முடியும் என்பது. பெண்களை வலுவூட்டுவதன்மூலம் மாத்திரம்தான் அவர்களது குடும்பங்களில் இருக்கின்ற பொருளாதார நிலைகளை மாற்றி, அவர்களை வலுவூட்டி, தேவைப்படுகின்ற சட்டத் தீர்மானங்களை எடுக்க முடியும். பெண்களுடைய சுதந்திரம் என்பது, ஒரு நாட்டின் அபிவிருத்தியின் முக்கிய படிக்கல்லாகவும் தூணாகவுமே இருக்குமென நான் நினைக்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, ஒரு வலுவான, சுயாதீனமான தேசிய மகளிர் ஆணைக்குழுவில் முதலீடு செய்வது நாட்டின் பொருளாதார உற்பத்தித்திறன், சமூக நீதி மற்றும் சமூக அபிவிருத்திக்கு அபரிமிதமான பலன்களைத் தரும் என்பதையும், இலங்கைப் பெண்களின் உரிமைகளைப் பாதுகாக்கும் பொறுப்பை ஏற்றுள்ள இந்த ஆணைக்குழுவை முழுமையாகச் செயற்படுத்துவதற்கு இத்தீர்மானம் மிக அவசியமானது என்றும் நான் கூறுகின்றேன். எனவே, இத்தீர்மானத்துக்கு இந்த உயரிய சபையின் அனைத்து கௌரவ உறுப்பினர்களும் ஏகமனதாக ஆதரவளிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். நன்றி!

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Dayasiri Jayasekara. You have five minutes.

[පූ.භා. 11.39]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අද කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ ගැන අපි ඉතාම සතුටු වනවා. ඇමතිතුමිය මේ ගෙනාපු කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය තුළින් විශේෂයෙන්ම කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට විශාල සහයෝගයක් සහ ශක්තියක් ලබා දී තිබෙනවා. එම නිසා මම විශේෂයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන එතුමියට ස්තුතිවන්ත වනවා වාගේම අපේ සහයෝගයත් ඒ සඳහා ලබා දෙනවා කියන කාරණයත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත යටතේ අද දවසේ මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න බලාපොරොත්තු වුණා. මීට පෙරාතුවත් මේ සම්බන්ධව මම වරප්‍රසාද ප්‍රශ්න කිහිපයක් පාර්ලිමේන්තුවේදී යොමු කර තිබෙනවා. 2004 ඉඳන් මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරයෙක් විධියට මම දන්නවා, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම මන්ත්‍රීවරයෙකුට කිසි දවසක එය පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන්න නොහැකියාවක් තිබුණේ නැහැ කියන එක. මොකද, මම ඉතිහාසයේ ඉඳලා අවුරුදු ගණනක් මේ සම්බන්ධව වැඩ කරලා තිබෙනවා.

විශේෂයෙන්ම 118වන ස්ථාවර නියෝගයේ බොහොම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා, "මන්ත්‍රීවරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිරීමක් බැලූ බැල්මට පෙනෙන පරිදි වරප්‍රසාද කඩකිරීමක් බවට කථානායකවරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි පැමිණිල්ලක් විභාග කිරීමට ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යවන්න පුළුවන්" කියලා. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව තමයි ඊට පසුව තීන්දුවක් ගන්නේ. ඒ සම්බන්ධව විභාග කරලා සති දෙකක් ඇතුළත තීන්දුවක් දෙන්න එම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට බලය තිබෙනවා. නමුත්, මේ විධියට අපේ බලය යටපත් කරන්න ගන්න පියවර පිළිබඳව මගේ විශාල විරෝධය මම මේ අවස්ථාවේදී පළ කරනවා.

විශේෂයෙන්ම 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් 2018 මාර්තු 07 දින අනුමත කරනු ලදුව, 2018 අප්‍රේල් 15 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි සම්මත කර තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය හා 2026 අප්‍රේල් මස 07වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ස්ථාවර නියෝග අංක 29 යටතේ තමයි මම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වුණේ. හැබැයි, ඒක ඉදිරිපත් කරන්න ඉඩ දුන්නේ නැහැ.

ඒ වාගේම විශේෂයෙන් මම කියන්න කැමැතියි, මේ වනකොට ඒසී/0356/2026 බී-206 යන විමර්ශන ගොනුව යටතේ වර්තමාන කථානායක ජගත් වික්‍රමරත්න මැතිතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් විමර්ශනයක්

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ක්‍රියාත්මක කරමින් තිබෙන බව. විශේෂයෙන්ම කථානායක ධුරයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී භාවිත කරනු ලබන රාජ්‍ය සම්පත් සහ පහසුකම් භාවිතයේදී සිදු කරන ලදැයි කියනු ලබන දූෂණ, අක්‍රමිකතා පිළිබඳව විමර්ශනයක් සිදු කරමින් පවතින බව තමයි පුවත් පත්වල වාර්තා කර තිබුණේ. ඒ සම්බන්ධව 2026 සැප්තැම්බර් මස 04වන දින "ලංකාදීප", "ඩේලි මිරර්" හා "දිනමිණ" කියන පුවත් පත් හැම එකකම වාර්තා කර තිබුණා. පාර්ලිමේන්තුවට නායකත්වය දෙන ඔබතුමා ගැන මේ තිබෙන කාරණය පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපට මතු කරන්න තිබෙන අයිතිය පැහැදිලියි. ඒකට අයිතියක් තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාටම ඒ අයිතිය තිබෙනවා. ඒ ගැන කථා කළායින් පස්සේ ඔබතුමා මාව සභාවෙන් එළියට දමන්න හදනවා නම්, ඒ ගැන මම කනගාටු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද දින න්‍යාය පත්‍රයට අනුකූලව කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ වන තීරණය ගැන කථා කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ ගැන මම කථා කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැත්නම් ඔබතුමාගේ කථාව අවසන් කිරීමට මට සිදු වනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ. මට කථා කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 91,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම කථා කරන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම කොහොමද කරන්නේ? *[බාධා කිරීම්]* එහෙම කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
"සෑම මන්ත්‍රීවරයකු විසින්ම සිය අදහස් ප්‍රකාශ කිරීම සාකච්ඡාවට භාජනය වෙමින් පවතින විෂයයට සීමා කරනු ලැබිය යුත්තේ ය." කියලා 91වන ස්ථාවර නියෝගයේ සඳහන් වනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, තමුන්නාන්සේට,- *[බාධා කිරීම්]* තමුන්නාන්සේට මේක අහගෙන ඉන්න බැරි නම්, කරුණාකරලා නියෝජ්‍ය කථානායකතුමාට මූලාසනය භාර දීලා ඔබතුමා එළියට යන්න. *[බාධා කිරීම්]* මොකද, මේක කථා කරන්න ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විෂයයට අනුව කථා කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධව බොහොම පැහැදිලිව අපට කථා කරන්න අයිතියක් තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විෂයයට අනුව කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පළමුව මගේ වරප්‍රසාද ප්‍රශ්නය මම **සභාගත*** කරනවා.

මම ඔබතුමාගෙන් ඉල්ලනවා, ඔබතුමාට මේක අහගෙන ඉන්න බැරි නම් කරුණාකරලා නියෝජ්‍ය කථානායකතුමාට මූලාසනය භාර දීලා එළියට යන්න කියලා. *[බාධා කිරීම්]* එතකොට අපට මේ ගැන කථා කරන්න පුළුවන්. මේක සම්ප්‍රදාය. *[බාධා කිරීම්]* තමුන්නාන්සේ මේ සම්ප්‍රදාය කඩ කරන්නේ කොහොමද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමෙන් පසුව ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්නම් කියලා කරුණක් කිව්වාට පසුව ඔබතුමා සම්පූර්ණයෙන්ම වැරැදි පූර්වාදර්ශයක් මේ ලබා දෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තමුන්නාන්සේට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත්ව තිබෙන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විරුද්ධව,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙමින් යන්නේ. කරුණාකරලා,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
*[බාධා කිරීම්]* ක්‍රියාදාමයක් තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සම්පූර්ණයෙන්ම මාතෘකාවට අනුව නොවෙයි කථා කරන්නේ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, මට මේ ගැන කථා කරන්න දෙන්න කියලා. *[බාධා කිරීම්]* මේක අහගෙන ඉන්න ඔබතුමාට අමාරු නම් කරුණාකරලා ඔබතුමා මූලාසනයෙන් ඉවත් වෙන්න. *[බාධා කිරීම්]* නියෝජ්‍ය කථානායකතුමෙක් ඉන්නවා. එතුමාට මූලාසනය භාර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඔබතුමාට ඕනෑ විධියට මේ ගැන කථා කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* මේ තිබෙන Standing Ordersවලට අනුව විතරයි කථා කරන්න පුළුවන්. *[බාධා කිරීම්]* ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව අනුව පැහැදිලිව,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. (Dr.) Rizvie Salih. You have 10 minutes.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට තව විනාඩි දෙකක් තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විනාඩි දෙකක් තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා කොහොමද එහෙම නතර කරන්නේ? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Dayasiri Jayasekara, your time is over.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්] මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මොකක්ද මේ ලජ්ජා නැති වැඩේ? [බාධා කිරීම්] මොකක්ද මේ ලජ්ජා නැති වැඩේ? [බාධා කිරීම්] මේක කියවන්න දෙන්නේත් නැහැ. ලජ්ජයි, ලජ්ජයි. [බාධා කිරීම්]

[11.45 a.m.]

**ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)
Hon. Speaker, I wish to speak on the Determination under the Women Empowerment Act, No. 37 of 2024. - *[Interruption.]*

At the outset, I would like to say that I do not regard this merely as another item of legislative business before this House, but as part of a much larger national commitment, a commitment to ensure that every woman in Sri Lanka is able to live with dignity, equality, security and opportunity.

The Women Empowerment Act takes our approach beyond the traditional concept of protecting women. It speaks of empowerment, and empowerment means much more than protection; it means that a woman should have the opportunity to learn, work, earn, participate, make decisions, seek justice and determine the course of her own life. - *[Interruption.]*

Sir, the Act establishes an important institutional framework. It provides for the National Commission on Women, the formulation and implementation of a National Policy on the advancement and empowerment of women, mechanisms for the protection of women's rights and an Ombudsperson for Women's Rights.

The Commission has substantial responsibilities including receiving and investigating complaints concerning violation of women's rights, conducting inquiries, making recommendations for law reform, assessing the impact of legislation and policies and

promoting awareness of women's rights. Will this institution deliver what the women of Sri Lanka want? This is the real test before us. Sir, this is a very important topic before us. It concerns more than 50 per cent of the population of this nation and the rights that they are entitled to and the benefits they could reap because it is their right once again.

We are a multi-religious, multilingual society. Our religion and our beliefs have always remained near and dear to us, so has the sentiments about one's language. Therefore, Sir, a vital task before the National Commission on Women is to facilitate and ensure that every facility and provision that has been provided to them under this Act is carried out to the very letter. That is, to pursue education and careers of their choice while still holding on to their beliefs, convictions and traditions. There lies inclusivity and true celebration of our nation's colourful diversity.

Hon. Speaker and Hon. Members of the House, there is the woman living in Colombo and the woman living in a remote village. They are not a homogenous group. Among them, there is the plantation worker, the factory worker, the professional, the entrepreneur, the woman working abroad to sustain her family, the single mother, the elderly woman and the woman living with a disability. And, there are women who, because of poverty, social circumstance and other vulnerabilities, may not even know where to turn to when their rights are violated. If this legislation is to achieve its full purpose, the benefits must reach each one of them. We must be unequivocal in this matter.

We must also know that harassment of women is not a minor inconvenience, and discrimination is not something that a woman should be told just to tolerate, as they have been told through ages.

The Act also gives importance to law reform. That is particularly significant because discrimination does not always arise from deliberate individual conduct; sometimes, it arises from an outdated law, an old procedure or some institutional practice that is called "traditional". That system has failed to recognize the realities faced by women in this age and day. The Commission's ability to assess legislation, policies and practices and to recommend reforms gives as an opportunity to identify such structural barriers and Parliament shall remain receptive to those recommendations. Let us also take into account the valuable perspective of the law and social justice. When society changes, Parliament must have the courage and wisdom to examine whether our laws continue to serve our people fairly.

Sir, there is another dimension of empowerment that requires our particular attention, which is economic empowerment. A woman who has no economic independence can be extremely vulnerable. Economic empowerment means access to education, employment, finance and entrepreneurship. It also means, fair remuneration, ability to own and control resources and ensures that work of equal value receives equal remuneration.

The Act also recognizes particular needs of women with disabilities. We must, therefore, ensure that women's empowerment is not only reflected in our economic policies and employment policies, but also in our financial inclusion programmes and in national development strategies that we may formulate.

Sir, I also wish to talk about representation. A democracy cannot be fully representative if a substantial proportion of its population remains underrepresented in places where decisions are made. The Act recognizes the importance of women's participation in decision-making structures and positions at every level of government and in mechanisms connected with the administration of justice. Women should not only be beneficiaries of policy, but should also be architects of policy. Sir, we must ensure that women have a seat at the table and not be on the menu alone when it comes to decision-making and governance; they should not be consulted after decisions are made, but should be part of that decision-making process.

Sir, this is an important administrative provision that has been provided for in the Act. At the same time, we must ensure that the remuneration provided is adequate to attract persons with necessary competence, experience and integrity, while being administered with transparency and proper accountability.

The National Commission on Women is not able to function alone and isolated. The Ministry responsible for women and child affairs, the Police, the Judiciary, the Attorney-General's Department, legal aid services, provincial and local authorities, educational institutions, the civil society and community organizations, all have important roles to play. I would add one more institution of paramount importance and that is the family because laws can punish and institutions can protect, but lasting social change requires a change in attitudes, which begin from our very homes. We must create workplaces where harassment is unacceptable, schools where girls are encouraged to lead and communities where a woman seeking help is supported rather than stigmatized.

Sir, this Act was passed in 2024. We must, now, ensure that the machinery created by this Act becomes fully functional, visible and accessible. The National Commission on Women must become an institution that women know about. Sir, let us build a Sri Lanka where a woman's opportunity is not determined by her gender, where her safety is not dependent upon her social status, where her economic future is not limited by outdated expectations, where her voice is not diminished because she is a woman and where leadership is determined by her ability, integrity, commitment and service to the people.

Sir, the matter before the House today is not one of women alone. If that is so, I would not be on my feet at this moment. It is an issue of justice, an issue of human

dignity and ultimately, an issue of the kind of Sri Lanka we wish to leave behind for the next generation.

Therefore, I respectfully call upon the Members of this House to support the Determination before us. Also, I urge that its implementation be pursued with the urgency, resources and institutional commitment that the women of our country truly deserve.

Thank you, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Mujibur Rahuman. You have 11 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
සාධාරණ කථානායක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
A gentleman!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you may begin your speech.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, we would like to acknowledge you as the permanent Speaker. Thank you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you may please proceed.

[පූ.භා. 11.56]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඒ යෝජනාව ස්ථිර කරනවා. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. "නියෝජ්‍ය කථානායකතුමා" නොවෙයි, "කථානායකතුමා" කියලා ඔබතුමාට කිව්වොත් හරි කියලා තමයි මා හිතන්නේ. *[බාධා කිරීම්]* කථානායකතුමා සම්බන්ධයෙන් දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. අපේ දයාසිරි මන්ත්‍රීතුමා කාරණයක් මතු කළා. විශේෂයෙන්ම අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ අංක AC/0356/2026/B/2006 ලිපි ගොනු යටතේ විමර්ශනයක් සිදු වෙනවා, කථානායකතුමාට විරුද්ධව. මේ කථානායකතුමාට විරුද්ධව ඒ විමර්ශනය වෙන්නේ මේ පාර්ලිමේන්තුවේ එතුමා කථානායකවරයා හැටියට පත් වෙලා මේ අවුරුදු දෙකක සීමාව තුළ වෙච්ච යම් යම් සිද්ධීන් සම්බන්ධවයි. ඒ විමර්ශනය,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විමර්ශනය කරන කොට එතුමා මේ කථානායක පුටුවේ රැඳී සිටීම සදාචාර නැහැ. ඒක තමයි ගැටලුව වෙලා තිබෙන්නේ. ඒක නීතිමය වශයෙනුත් ප්‍රශ්නයක්ව තිබෙනවා. ඒ කියන්නේ, යම් ආයතනයක ඉහළ නිලධාරියෙක් සම්බන්ධව පරීක්ෂණයක් යනවා නම්, අනිවාර්යයෙන්ම ඒ ඉහළ නිලධාරියා තාවකාලිකව හෝ අයින් වෙන්න ඕනෑ, පරීක්ෂණවලට ඉඩ දීලා. මේක තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට එන්න කලින් ගත්තු mandate එක. ඉතින් මේවා තමයි මැතිවරණ වේදිකාවලදී ඔබතුමන්ලා කිව්වේ. "අපි බලයට ආවාම අපේ ආණ්ඩුවේත් හොරකම් සිද්ධ වෙනවා නම්, අපි ඒවා අල්ලනවා; අපි ඒවා ගේනවා" කියලා තමයි බලයට ආවේ. දැන් ඔබතුමන්ලා බලයට ඇවිල්ලා තිබෙනවා. දැන් නීතියට උඩින් කවුරුවත් නැහැ කියලාත් ජනාධිපතිතුමා කියනවා. *[බාධා කිරීම්]* ඔබතුමා මොකද, මේ ගැරඩින්ට භූමිතෙල් ගැහුවා වාගේ කෑ ගහන්නේ? ඔබතුමා අහගෙන ඉන්නකෝ. *[බාධා කිරීම්]* ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වාහනයෙන් මේවා ඇද්දේ මෙයා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මොනවාද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇයි, වාහනයෙන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමා, එතකොට දැන් ඒක පිළිගන්න ඕනෑ- *[බාධා කිරීම්]* දැන් ඒ නීතිය ස්ථාපිත කරන්න. කවුරු වැරැදි කළත්, ඒ වරද විමර්ශනය කරන්න ඉඩ දෙන්න ඕනෑ. ඒක පාර්ලිමේන්තුවේ කථා කරන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා කියන්නේ විශාල ප්‍රශ්නයක්. ඒක මන්ත්‍රීවරුන්ගේ අයිතීන් පිළිබඳ ප්‍රශ්නයක්; ස්ථාවර නියෝග පිළිබඳව අපට තිබෙන අයිතිය පිළිබඳ ප්‍රශ්නයක්. අපි මෙතැන කථා කරන්නේ නැතුව ගිහිල්ලා කොහේ කථා කරන්නද? කථානායකතුමාට පුළුවන් ඒකට උත්තර දෙන්න. එතුමාට උත්තර දෙන්න අයිතිය තිබියදීත්, මන්ත්‍රීවරයෙකුට නැඟිටලා පාර්ලිමේන්තුව ඇතුළේ ස්ථාවර නියෝග අනුව ප්‍රශ්නයක් මතු කරන්න ඉඩ දෙන්නේ නැත්නම් ඒක විශාල ගැටලුවක්. මම දන්නේ නැහැ ගරු ලාල් කාන්ත ඇමතිතුමා, ගරු අගමැතිතුමිය ඔබ මෙය අනුමත කරනවාද කියලා. ගරු අගමැතිතුමියත් එක්ක මම මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ දෙපාරක් හිටියා මට මතකයි. ඔබතුමිය දැකලා ඇති, මීට කලින් හිටපු කථානායකතුමන්ලා මේ විධියට හැසිරුණේ නැති බව. අපි ඇත්ත කථා කරන්න එපා යැ. මේ කථානායක පුටුවේ හුඟක් අය වාඩි වෙලා හිටියා නේ. ඔබතුමියලාත් අපිත් එදා විපක්ෂයේ ඉඳගෙන නොයෙකුත් දේවල් සම්බන්ධව, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට කථා කිරීමට තිබෙන අයිතිය සම්බන්ධව ප්‍රශ්න කළා. වත්මන් ජනාධිපතිතුමා අප එක්ක විපක්ෂයේ වාඩි වෙලා ඉන්න කොටත් අපි fight කළා. කිසිම කථානායකවරයෙක් මේ විධියට,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැසිරුණේ නැහැ. ඉතින් මේක නිවැරැදි කර ගන්න, ලාල් කාන්ත ඇමතිතුමා. මේක ඔබතුමන්ලාගේ ආණ්ඩුවට හොඳ නැහැ. ඔබතුමන්ලා වේදිකාවල නැඟලා බෙරිහන් දෙනවා නේ, විනිවිදභාවය, නීතියේ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරනවා කියලා. නමුත් තමුන්නාන්සේලාගේ පිලෙන්ම ගෙනැල්ලා වාඩි කරපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විධියට හැසිරෙනවා. අපරාදේ අර සහතිකේ නැති වුණත් අපට රන්වලව ගෙනැල්ලා මෙතැන තියන්න තිබුණා. දැන් අප කියන්නේ, සහතිකය ඕනෑ නැහැ, රන්වල ගෙනැල්ලා මෙහි වාඩි කරවන්න කියලායි. අපි සහතිකය අහන්නේත් නැහැ. *[බාධා කිරීම්]* අපි අහන්නේ නැහැ, සහතිකය. සහතිකය එපා, අපට. *[බාධා කිරීම්]* සහතික එපා, අපට. තියෙන සහතික ටික ඇති. රන්වල ගෙනැල්ලා එහි වාඩි කරවන්න. නැත්නම් මේ නියෝජ්‍ය කථානායකතුමා කථානායක කරන්න. මෙතුමාට මොකක්ද තිබෙන අඩුපාඩුකම? මෙතුමා ඩොක්ටර් කෙනෙක්. මෙතුමාට සියලුම සුදුසුකම් තිබෙනවා. මොකද, මෙතුමා සාධාරණව මේ සභාව මෙහෙයවනවා. ඉතින් මෙතුමාව කථානායක කරන්නකෝ. ඒක කරන්නේත් නැහැ. *[බාධා කිරීම්]* මම දැන් මගේ කථාවට එන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mujibur Rahuman, you have got to speak on the topic of this Debate. The women of Colombo want to hear what you say about them and their rights.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ වන තීරණය අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මේ කොමිසම ගැන කථා කරද්දී කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මා හිතන විධියට, කලින් හිටපු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමිය තමයි පසුගිය ආණ්ඩුවේදී මෙම යෝජනාව ඉදිරිපත් කළේ. එතුමිය විශාල වැඩ කොටසක් කළා. මේ අවස්ථාවේදී එතුමියවත් මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මේ කාන්තාවන් සවිබල ගැන්වීම ගැන කථා කරනකොට අපි දන්නවා, අපේ රටේ කාන්තාවන් ස්වයං රැකියා රාශියක් කරන බව. ඒ කාන්තාවන් අතර ආනයනය කර භාණ්ඩ විකිණීම ස්වයං රැකියාවක් හැටියට කරන කාන්තාවන් ද විශාල පිරිසක් අද ඉන්නවා. අද අපට පේන්න තිබෙන දේ තමයි, ඒ ආනයනකරුවන්ට පසුගිය මාස කිහිපය තුළම හිරිහැර රාශියක් රේගුව තුළ සිද්ධ වී තිබෙනවා කියන එක. මා කියන දේ ගැන හොයලා බලන්න. ඒ හින්දා පසුගිය මාස කිහිපය තුළ ආනයනයේ විශාල අඩුවීමක් තිබෙනවා. මොකද, දැන් ආනයනකරුවන් නැති ගැන්විලා ඉන්නවා, ඔවුන්ට රේගුව තුළ සිදු වන අසාධාරණ හා හිරිහැර සම්බන්ධයෙන්. හිතා මතාම කරන මේ හිරිහැර නිසා ආනයනය කිරීම අද ඔවුන් නවත්වා තිබෙනවා. විශේෂයෙන් මහා පරිමාණ ආනයනකරුවන් - ව්‍යාපාරිකයන් - රාශියක් අපේ රටේ ඉන්නවා. ඔවුන්ගේ ආයතනවල මේ රටේ තරුණ තරුණියන් දහස් ගණන් රස්සාවල් කරනවා. ආනයනය කරන සුළු පරිමාණ ව්‍යාපාරිකයන් ද ඉන්නවා. ඒ තැන්වලත් පුද්ගලයන් 100, 200 සේවය කරනවා. ඒ නිසා ආනයනය කියන්නේ, අපේ රටේ තිබෙන විශාල කර්මාන්තයක්; විශාල network එකක්. ඒ මඟින් ආදායම් මාර්ග කීපයක් හරහා අපේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙනවා. නමුත් අපට පේනවා, රේගුවේ එම හැසිරීම නිසාම පසුගිය මාස කිහිපය තුළම ආනයනය අඩු වෙලා තිබෙන බවක්. රේගු ආඥාපනතට අනුව දඩ මුදලක් ගැහුවාම සියයට 50ක් ත්‍යාග හැටියට රේගු නිලධාරින්ට යනවා; සියයට 20ක් රේගු නිලධාරින්ගේ සුබසාධනයට යනවා. මේ දඩ මුදල්වලින් රාජ්‍ය ආදායමට එකතු වෙන්නේ සියයට 30යි. ඒ මුදල මිලියන 300ක් වුණත්, මිලියන 400ක් වුණත්, මිලියන 500ක් වුණත් එයින් සියයට 70ක් යනවා, රේගු නිලධාරින්ට. සියයට 30යි එන්නේ රජයේ ආදායම හැටියට.

සමහර ආනයනකරුවන් හිතා මතාම undervalue කරලා භාණ්ඩ ආනයනය කරනවා. ඒක ඇත්ත. සමහර අය හිතා මතාම ඇත්ත වටිනාකම දාන්නේ නැහැ. ඒකට තමයි Valuation Directorate එකක් තිබෙන්නේ. Valuation Directorate එකට

ගියාම ඒගොල්ලෝ ඒ ලියකියවිලි පරීක්ෂා කර බලා ඒගොල්ලන් කියන වටිනාකමේ යම් අඩුවක් කර තිබුණා නම් ඒ වෙලාවේම දඩයක් ගහලා ඒ භාණ්ඩ ටික release කරනවා. එහෙම භාණ්ඩ release වුණාට පස්සේ මොකද වෙන්නේ. ඊළඟට, තවත් ආයතන ගණනාවක්ම තිබෙනවා; තවත් ආයතන 15ක් විතර තිබෙනවා. ඒවා අතර RTF Directorate එක තිබෙනවා; PCAD එක තිබෙනවා; Preventive Directorate එක තිබෙනවා. Preventive Directorate එකේ branches විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ආයතනවල අය ඒ බඩු තිබෙන කඩවලට, එහෙම නැත්නම් ඔවුන්ගේ ගබඩාවලට පැනලා ඒවා raid කරනවා. Raid කරලා නැවත වතාවක් දඩ ගහනවා. නමුත්, ඒ භාණ්ඩ release කරපු නිලධාරින්ට විරුද්ධව කිසිම ආකාරයේ ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. එනම්, ඒ භාණ්ඩ මුදා හැරපු අයට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්නේ නැහැ. ඒ භාණ්ඩවලට අදාළව දඩ ගැහුවාම ඒ දඩය ගෙවලා භාණ්ඩ ටික අරගෙන ගිය ව්‍යාපාරිකයාට නැවත දඩයක් ගහනවා මිසක්, වැරැදි ආකාරයෙන් invoices හදලා ඒවා අනුමත කරපු නිලධාරින්ට, ඒ භාණ්ඩ මුදා හැරීමට තීන්දු ගත්තු නිලධාරින්ට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය.

ඇයි ඒ අයට ක්‍රියාමාර්ගයක් ගන්නේ නැත්තේ? එසේ නොකරන එක විශාල ප්‍රශ්නයක්. දැන් සමහර තැන්වල මීට අදාළ තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. Undervalue කරලා invoices ආවම, undervalue කරලා ලියකියවිලි ආවාම අද තිබෙන තාක්ෂණයත් එක්ක ඕනෑම තැනකට සම්බන්ධ වෙලා ඒ භාණ්ඩවල ඇත්ත වටිනාකම සොයා ගන්න පුළුවන්. අද එවැනි තත්ත්වයක් තිබෙනවා. එවැන්නක් නැහැ කියන්න බැහැ. නමුත්, එහෙම වෙන්නේ නැහැ. එහෙම අවස්ථා තිබියදීත් සමහර අය ඒ භාණ්ඩ මුදා හරිනවා. පසුව වෙනත් අංශයකින් ගිහිල්ලා ඒ කඩවලට පනිනවා. පැනලා, සමහර කඩවල් සීල් තියනවා; සමහර ඒවායේ ගබඩාවලට සීල් තියනවා. ඒ හින්දා අද ව්‍යාපාරිකයන් විශාල අකරතැබ්බයකට මුහුණ දී සිටිනවා. ඒ හින්දා තමයි අපි මේ කාරණය ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරන්නේ. මේක හොඳට අහ ගන්න. අද ආනයනය විශාල ප්‍රමාණයකින් පහත වැටිලායි තිබෙන්නේ. එහෙම පහත වැටිලා තිබෙන්නේ රේගු නිලධාරින්ගේ මාෆියා හැසිරීම උඩ. ඔබතුමන්ලා ආවේ මාෆියා කඩන්න නේ. මේ මාෆියාවට අත තිබ්බා, මංගල සමරවීර හිටපු ඇමතිතුමා. එතුමා අලුත් රේගු පනත් කෙටුම්පතක් ගේන්න හැදුවා. හැබැයි, ගේන්න දුන්නේ නැහැ. එදා ඒකට විරුද්ධ වෙලා ඒක නවත්වා ගත්තා. ඔබතුමන්ලා මාෆියාව ගැන කථා කළා. මාෆියා බිඳිනවා කිව්වා. ඒ හින්දා මේ මාෆියාව ගැනවත් හිතන්න.

සමහර ව්‍යාපාරිකයන් අතර genuine ව්‍යාපාරිකයන් ඉන්නවා. ඒ ව්‍යාපාරිකයන් භාණ්ඩ ගෙනාවත් කරන්නේ ඒකමයි. එක එක ආයතනවලින් පනිනවා. එහෙම නැත්නම් උදේට එන්න කියනවා, රේගුවට. උදේට එන්න කියලා රු 12.00ට තමයි කට උත්තරය ගන්නේ. රු 12.00 වන කල් තියාගෙන ඉන්නවා. ඊළඟට කියනවා, තමන් කියන ගණනට invoices හදාගෙන එන්න කියලා. ඒගොල්ලන් කියන දේ පිළිගන්න කියනවා. පිළිගෙන කට උත්තර දෙන්න කියනවා. එහෙම කළේ නැත්නම් කඩවල් ටික සීල් තබනවා; ගබඩාව සීල් තබනවා. නිලධාරින් කියන දේට එකඟ වුණේ නැත්නම් බලහත්කාරයෙන් පිළිගන්න කියලා ඒගොල්ලන්ට බලපෑම් කරනවා. සමහර අය මේවාට අභියෝග කරන්නේ නැහැ. ඒ, ඇයි? සමහර අය ඉහළ නිලධාරින්ට පැමිණිලි කළත්, ඒ ඉහළ නිලධාරින් කියන්නේත් පහළ නිලධාරින් කියන ගණන ගෙවලා යන්න කියලායි. අද ඔවුන් උසාවි යන්නේ නැහැ. ඒ ඇයි? උසාවි ගියාම ඔවුන්ට ගැටලු ඇති වන්න පුළුවන්. මොකද, ඔවුන් නැවත වතාවක් භාණ්ඩ ආනයනය කරනකොට මේ රේගුව ඇතුළෙන්ම තමයි භාණ්ඩ එන්න ඕනෑ. එහෙම අභියෝග කළාම රේගු නිලධාරින් හැම point එකකම ඒ ආනයනකරුවන්ගේ භාණ්ඩ නවත්වලා ඒවා පරීක්ෂා කරන්න පටන් අරගෙන ඒ හිරිහැරය කරනවා. ඒ නිසා ඔවුන් උසාවි යන්න භයයි; උසාවි යන්න කැමැති නැහැ. දිගින් දිගටම මේ විධියට වෙන නිසා අද imports අඩු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමාගේ ලේකම්තුමා හිටපු රේගු අධ්‍යක්ෂවරයෙක්. එතුමා මේ ගැන දන්නවා; එතුමා අපට වඩා මේ ගැන හොඳට දන්නවා. මේ රේගුවේ සිදුවන, නිලධාරින් කරන වංචා, දූෂණ සම්බන්ධව එතුමා හොඳට දන්නවා. අපට තේරුම් ගන්න බැරි ජනාධිපතිතුමාගේ ලේකම්වරයාත් මේක දැනගෙන ඇයි මේ මාෆියාව කඩන්න වැඩ කරන්නේ නැත්තේ කියලායි. ඇයි, මේ මාෆියාව කඩන්න වැඩ කරන්නේ නැත්තේ? ඇයි, මේකට නිශ්ශබ්දව ඉන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුවට විශාල චෝදනාවක් ආවා, කන්ටේනර් 323ක් නිදහස් කිරීමක් පිළිබඳව. ඒකට ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා. ඒ කමිටුවෙන් වාර්තාවකුත් නිකුත් කළා. ඒ වාර්තාවට අනුව එදා හිටපු DGට චෝදනාව එල්ල වුණා; අධ්‍යක්ෂ ජනරාල්වරයාට චෝදනාව එල්ල වුණා. ජනාධිපතිතුමා පත් කරපු කමිටුවේ වාර්තාවෙන් පැහැදිලිව ඔහුට චෝදනා කළා, ඔහු බලය අවභාවිත කළා කියලා. නමුත්, අපට කියන්න කනගාටුයි, දැන් ඔහුට promotion එකක් දීලා අතිරේක ලේකම්වරයා හැටියට ඔහුව පත් කරලා තිබෙනවා. එහෙම වෙන්නේ කොහොමද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, your time is up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

චෝදනාවක් ලබපු කෙනෙක්ව අතිරේක ලේකම් කෙනෙක් හැටියට පත් කරන්නේ කොහොමද? මේ වාගේ දේවල් කරන්නද ඔබතුමන්ලා 2024දී ජනතාවගේ අනුමැතිය හා බලය ගත්තේ? මේක තමයි තමුන්නාන්සේලා පසුගිය ආණ්ඩුවට කරපු චෝදනාව. තමන්ගේ නිලධාරින්ව ආරක්ෂා කරනවා. තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා, තමුන්නාන්සේලා වෙනුවෙන් පෙනී සිටින, තමුන්නාන්සේලා වෙනුවෙන් කඩේ යන නිලධාරින්ව ආරක්ෂා කරනවා. එහෙම නැත්නම් අර අධ්‍යක්ෂ ජනරාල්වරයා - ජනාධිපතිතුමා පත් කරපු කමිටුවෙන් වැරදිකාරයෙක්ව කරපු අධ්‍යක්ෂ ජනරාල්වරයා - දැන් අතිරේක ලේකම්වරයෙක් හැටියට පත් වෙලා ඉන්නේ කොහොමද? එහෙම වෙන්න බැහැ, ගරු අගමැතිතුමියනි. තමුන්නාන්සේලා හදන්න කථා කරපු රාජ්‍ය පාලනය, තමුන්නාන්සේලා ගොඩනගනවා කියපු රාජ්‍ය පාලනය, විනිවිදභාවයකින් වැඩ කරනවා කියපු රාජ්‍ය පාලනය, වංචා හා දූෂිත නිලධාරින්ට කිසිම ඉඩක් නැහැයි කිව්ව රාජ්‍ය පාලනය තුළ මේක වෙන්න බැහැයි කියන එක තමයි අපි මතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් තවත් එක දෙයක් මම කියන්න කැමැතියි. ආනයනකරුවන්ට මේ රේගුව

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

තුළ සිදුවන හිරිහැර සහ මේ වෙන දූෂණ සම්බන්ධව මුදල් ඇමතිවරයා හැටියට ජනාධිපතිතුමා වහාම මැදිහත් වෙලා කටයුතු කරන්න ඕනෑ. අද වනකොට උද්ධමනය සියයට 8කට ගිහිල්ලා මුදල් සංසරණය සම්පූර්ණයෙන්ම ඇනහිට තිබෙනවා. අද වනකොට රට තුළ ආර්ථිකය එක තැන පල් වෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ආනයනකරුවන් සියලුදෙනා අද වනකොට අක්‍රිය වෙලා තිබෙනවා. එම නිසා ආනයන අඩු වෙලා තිබෙනවා. මේ රටේ විශාල ආර්ථික සම්බන්ධතාවලින් යුතු network එකක් තිබෙනවා. ඒ නිසා මේ ක්‍රියාවලිය දිගටම ගිහින් මේ network එක කඩා වැටුණොත් අපේ රටේ ආර්ථිකයට බරපතළ හානියක් සිදුවනවා. ඒ තත්ත්වයට අපේ රටේ ජනතාවට මුහුණ දෙන්න වෙනවා කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Prime Minister (Dr.) Harini Amarasuriya. You have 14 minutes to speak on the Determination before the House.

[12.09 p.m.]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Deputy Speaker, this is an important Determination presented by the Minister of Women and Child Affairs that we are debating today. The institutionalization of the National Commission on Women is being further strengthened through what has been presented today.

අපි අද දින ස්ථිර කරන මෙම යෝජනාව හරහා සිද්ධ වෙන්නේ මොකක්ද කියලා සඳහන් කරන්න මම කැමතියි. පළමුවැනි වතාවට අපේ රටේ කාන්තාවන් වෙනුවෙන් පත් කරන මේ කොමිෂන් සභාවේ ස්වාධීනත්වයත්, ආයතනික ව්‍යුහයත් ශක්තිමත් කිරීමට ප්‍රධාන පියවරක් තියන්න තමයි අද මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කොමිසමේත්, දැනට ලංකාවේ පවතින අනෙක් ස්වාධීන කොමිෂන් සභාවලත් සභාපතිත්වය දරන අයට හා සාමාජිකයන්ට ලබා දෙන දීමනා සහ වේතන පිළිබඳව යම් තීරණයක් අද පාර්ලිමේන්තුවෙන් ගන්න කියන යෝජනාව තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක හරිම තීරණාත්මක එකක්. මොකද, මේ හරහා තමයි ඒ කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ඔවුන්ගේ කාර්යභාරය ඉටු කරන්න පුළුවන් වෙන වටපිටාව, ආයතනික පහසුකම්, තත්ත්වය ඇති කරන්න පුළුවන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කොමිෂන් සභාව පත් කිරීම සඳහා වන පනත පාර්ලිමේන්තුවට ගේන්න වැඩ කරපු විශාල පිරිසක් ඉන්නවා. ස්වාධීන කාන්තා කොමිසමක් පිහිටුවා ගැනීම සඳහා දීර්ඝ සටනක්, දීර්ඝ අරගලයක් ඉතිහාසය තුළ කෙරිලා තමයි අපි අද මේ තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. මේක ලේසි ගමනක් වුණේ නැහැ. මේක මේ රටේ කාන්තා ව්‍යාපාර, කාන්තාවන් වෙනුවෙන් සටන් කරන, අරගළ කරන අය දේශපාලන පක්ෂ භේදයකින් තොරව ඉල්ලා සිටි දෙයක්. මේ අරගළය හරහා තමයි මේ පනත පසුගිය පාර්ලිමේන්තුවෙන් සම්මත කරගන්න හැකියාව ලැබුණේ. පසුගිය පාර්ලිමේන්තුවේ පැවැති මන්ත්‍රීවරියන්ගේ සංසදයත් මේ සඳහා විශාල මැදිහත්වීමක් කළා. අපි ඒක මතක් කළ යුතුයි. ඒ සංසදයේ හිටපු සභාපතිතුමිය වන වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියත් මේ සඳහා මැදිහත්වීමක් කළා. ඒක අපි මතක් කළ යුතුයි. අද අපට මේ කොමිෂන් සභාව ස්ථාපිත කරන්න පුළුවන් වෙච්ච එක පිළිබඳවත්, දැන් මේක වැඩ කරන කොමිෂන් සභාවක් බවට පත් කිරීමට පුළුවන්වීම පිළිබඳවත් එතුමියත් සතුටු වෙන බව මට විශ්වාසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවෙන් පිට කාන්තා ව්‍යාපාර ගණනාවක් මේ වෙනුවෙන් පෙනී සිටියා. ඒ නිසාම තමයි මේකේ වැදගත්කම තවත් අපට දැනෙන්නේ. ඕනෑම ආයතනයක් අලුතින් පටන් ගන්න එක ලේසි පහසු දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ආරම්භක සාමාජිකයන්ට විශාල වගකීමක් එනවා. මොකද, මේ කොමිසමේ ක්‍රියාකාරිත්වය, ආයතනික පසුබිම, කොමිසම ක්‍රියාත්මක වෙන සංස්කෘතිය නිර්මාණය කරන්න පුළුවන් වෙන්නේ ඒ මූලික සාමාජිකයන්ට. ඒ නිසා අද මේ කොමිසමේ ඉන්න සාමාජිකයන්ට මේ කොමිසමේ මුල් සාමාජිකයන් හැටියට විශාල වගකීමක් තිබෙනවා. ඔවුන් අද ගන්න තීරණ, ඔවුන් ක්‍රියාත්මක කරන ක්‍රම, ඒ ආයතනය තුළ ඇති කරගන්න සංස්කෘතිය හරහා තමයි මේ කොමිසමේ ඉදිරි ක්‍රියාකාරිත්වය තීරණය වෙන්නේ. ඒ නිසා අපි සතුටු වෙනවා, මේ කොමිසම ආරම්භ කිරීම පිළිබඳව. මේ කොමිසමට සාමාජිකයන් පත් කිරීම, සභාපති කෙනෙක් පත් කිරීම, ඔවුන්ට ස්ථානයක් ලබා දීම, ඔවුන් කාර්ය මණ්ඩලයක් ලබා දීම සිදුකළ යුතු වෙනවා. දැනට මේකට විධායක අධ්‍යක්ෂවරයෙක් පත් කරලා තිබෙනවා. කාර්ය මණ්ඩලයක් ලබා දීලා තිබෙනවා. ඔවුන්ට එදිනෙදා කටයුතු කිරීම සඳහා මුදල් වෙන් වෙලා තිබෙනවා. සාමාජිකයන්ගේ දීමනා පිළිබඳ යෝජනාවත් අද අපට සම්මත කරගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. මේකට විපක්ෂය වුණත් එකඟ වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ නිසා මේ සම්බන්ධයෙන් ඉතාම වැදගත් පියවරක් තමයි අපි මේ ගන්නේ. කොමිසමක් කියන එක කොළ කැල්ලකට විතරක් සීමා නොවී, නීතියට විතරක් සීමා නොවී, ඇත්තටම ඔවුන්ගේ කාර්යය ක්‍රියාත්මක කරවීමටත්, මේ රටේ කාන්තාවන් සහ දරුවන් ඇතුළු ඒ සේවාවන් අවශ්‍ය සියලුදෙනා වෙනුවෙන් මැදිහත්වීම සඳහාත් එම කොමිසම තවත් ශක්තිමත් කිරීමේ වැදගත් පියවරක් තමයි අපි මේ තියන්නේ. ඒ නිසා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ පියවර මේ දක්වා ඉදිරියට ගෙන ඒම පිළිබඳව කොමිසමේ සභාපතිතුමියට, සාමාජිකයන්ට සහ විධායක අධ්‍යක්ෂකතුමියට මම ස්තුතිවන්ත වෙනවා. මෙතැනට එන ගමන ලෙහෙසි වුණේ නැහැ. ආයතනයක් පටන් ගන්න කොට තිබෙන ප්‍රශ්න හා එන අභියෝග පිළිබඳව අපි හොඳින් දන්නවා. ඒවා ස්ථාපිත කිරීමට

අවශ්‍ය පසුබිම හරියට සකසා ගැනීම, ඒගොල්ලන්ට ක්‍රියාත්මක වෙන්න තැනක් සොයා ගන්නා එක, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටිය හරියට හදා ගන්නා එක, භාණ්ඩාගාරයෙන් ඒ සඳහා මුදල් වෙන් කරවා ගන්නා එක ආදී මේ සියලු දේවල් පහසුවෙන් කවුරුවත් බන්දේසියක් මත තියලා "මෙන්න මෙහෙමයි වෙන්න ඕනෑ" කියලා ඉදිරිපත් කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා තමයි මේ කොමිෂන් සභාව ආරම්භ කිරීමත් සමඟ මෙහි මුල් සාමාජිකයන්ට, විශේෂයෙන්ම සභාපතිතුමියට සහ විධායක අධ්‍යක්ෂකතුමියට විශාල කාර්යභාරයක් පැටවුණේ. ඒ නිසා තමයි අද මේ වැදගත් පියවර තබන්නේ. ඔවුන් ඒ කරපු වැඩ කොටස තුළින් ඉදිරියට මේ ගමන හරියට කරගෙන යෑමට අවශ්‍ය පසුබිම ක්‍රමානුකූලව හැදෙමින් පවතිනවා. ඒ නිසා ඉදිරියේදී කාන්තා කොමිෂන් සභාවට මේ රටේ ගැහැනුන්ට, මේ රටේ දරුවන්ට විශාල සේවයක් කරන්න පුළුවන් වෙන ආයතනයක් හැටියට ශක්තිමත්ව ඉදිරියට යන්න හැකි වෙනවා කියන එක ගැන කිසිම සැකයක් නැහැ.

මම හිතන විධියට, මේකේ අවශ්‍යතාව ගැන අපි කාටවත් අලුතින් කියන්න අවශ්‍ය නැහැ. අපේ සමාජ අර්බුද ගැන කථා කරනකොට, ඒ සමාජ අර්බුද තුළ, අපේ රට තුළ වාචික ප්‍රචණ්ඩත්වය අද වෙනකොට විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා කියන එක ඉතාමත් පැහැදිලියි. සමාජ මාධ්‍ය හරහා සිද්ධ වන දේ, මාධ්‍ය තුළ සිද්ධ වෙන දේ, සමහර වෙලාවට එතැන තාක්ෂණය පාවිච්චි කරලා සිද්ධ වෙන ප්‍රචණ්ඩත්වය, harassment කියන එක ඉතාම භයානක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. The harassment and violence that women and children are facing today, Hon. Deputy Speaker, are not merely physical, as we well know. The way technology is evolving and the way it is being used today to target women and children in particular is deeply worrying. Therefore, that is something I think and I am sure this House and this Commission will take very seriously. A couple of days ago, I received a letter detailing how deepfake images are being used, particularly targeting women political leaders in this country and the threat that it poses to democracy and the functioning of democracy in this country. I think, as women political leaders, when we come into these positions, we were aware that this is the kind of backslash to expect. So, this is not a personal problem, this is not about any one of us individually feeling threatened by this, but the impact that this has on the functioning of our democratic systems and more importantly, the message it sends to other women, the younger women, about coming forward to taking up these positions is what is worrying. I think it is unfortunate.

Also, this is not a problem that could be tackled individually or even by an individual country; this is something that we need to come together globally to tackle. The social media platforms which facilitate this kind of technological violence should also take this issue up more seriously. This is a global issue; this is a regional issue. Whatever the background, the political affiliation or the ideological affiliation is, women in public positions across the world are facing this issue, and it is important that social media platforms and technology experts also take this issue seriously and come up with safeguards because this is threatening not just to individual women or women leaders, but also to democratic systems and the well-being of women and children in general. You would have noticed even recently some incidents involving women who are facing some kind of trauma, and the kind of reaction and responses they get on social media platforms could be extremely detrimental to their well-being, their safety and security. So, this is something to be taken very seriously, and I hope the National Commission on Women would take up these issues and engage with the relevant stakeholders to make these spaces, not just physical spaces, but digital spaces as well, safer for women and children in general.

මේ කොමිෂන් සභාව දැන් පියවරෙන් පියවරට ශක්තිමත්වීම පිළිබඳව මා ඉතාමත්ම සතුටු වෙන බව නැවත වතාවක් ප්‍රකාශ කරනවා. ඔවුන්ගේ කාර්ය භාරය ඉෂ්ට කිරීමට අවශ්‍ය පසුබිම මේ විධියට සකස් වෙන එක ගැන සතුටු වෙනවා. ඒ සඳහා මැදිහත් වෙච්ච, මහන්සි වෙච්ච සභාපතිතුමියටත්, සාමාජිකයන්ටත්, විධායක අධ්‍යක්ෂකතුමියටත්, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයටත් ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මට කාලය ලබාදීම පිළිබඳ ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have eight minutes.

[பி.ப. 12.21]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள 2024ஆம் ஆண்டின் 37ஆம் இலக்க, பெண்களின் வலுவூட்டல் சட்டத்தின் கீழான தீர்மானம் குறித்த விவாதத்தில் எனது கருத்துகளை எடுத்துரைக்க விழைகின்றேன்.

2024ஆம் ஆண்டின் 37ஆம் இலக்க, பெண்களின் வலுவூட்டல் சட்டத்தின் 13ஆம் பிரிவின்கீழ் முன்வைக்கப்பட்டுள்ள புதிய ஒழுங்குவிதிகள் மற்றும் தீர்மானங்கள் முதன்முறையாக தேசிய பெண்கள் மேம்பாட்டுக் கொள்கை, தேசிய பெண்கள் ஆணைக்குழு மற்றும் முறைமன்ற நடுவர் ஆகியவற்றுக்குச் சட்ட அடிப்படையிலான அடித்தளத்தை வழங்கி உள்ளன. இவை நாட்டின் சட்டம் மற்றும் சமூகக் கட்டமைப்பில் முதன்மையானதொரு திருப்புமுனையாகப் பார்க்கப்படுகின்றன. இவற்றின் முதன்மையான சிறப்புக் கூறுகள் பின்வருமாறு:

முதலாவதாக, அரசியலமைப்புச் சபையின் பரிந்துரையின் பேரில் நியமிக்கப்படும் ஏழு உறுப்பினர்களைக்கொண்ட சட்ட அடிப்படையிலான அமைப்பாக பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழு உருவாக்கப்பட்டுள்ளது. இதில் பெரும்பான்மையான பெண் உறுப்பினர்கள் இருப்பார்கள் என்பதோடு, தலைவரும் ஒரு பெண்ணாகவே இருத்தல் வேண்டும் என்பது கட்டாயமாக்கப்பட்டுள்ளது.

இரண்டாவதாக, கடந்த காலத்திலிருந்த அமைப்புகளைப் போலன்றி, இந்தப் புதிய சட்டத்தின் 30ஆம் பிரிவின்கீழ், இந்த

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

ஆணைக்குழுவின் பரிந்துரைகள், கட்டளைகளை மீறுவோருக்கு எதிராக உயர் நீதிமன்றத்தின் மூலமாக நீதிமன்ற அவமதிப்பு நடவடிக்கைகளை எடுக்கும் தெளிவான சட்டச் செயலாக்கம் மற்றும் நீதித்துறை அதிகாரம் ஆணைக்குழுவுக்கு வழங்கப்பட்டுள்ளது.

மூன்றாவதாக, பாலினப் பாகுபாடு, பணியிடத் துன்புறுத்தல்கள் மற்றும் பெண்களின் அடிப்படை உரிமைகள் மீறப்படும் வேளைகளில் விரைவான விசாரணை நடத்தித் தீர்வுகளைப் பெறத் தனியான முறைமன்ற நடுவர் - ஒம்புட்ஸ்மன் - முறைமை உருவாக்கப்பட்டுள்ளது.

நான்காவதாக, பெண்களது தற்றொழில் வாய்ப்புகள், சட்ட உதவி, தொழில்முறைப் பயிற்சிகள் மற்றும் பாலினச் சமத்துவ விழிப்புணர்வு நடவடிக்கைகளுக்கு நேரடியாக நிதியளிக்கும் வகையில் பெண்களுக்கான தேசிய நிதியம் உருவாக்கப்பட்டுள்ளது.

ஐந்தாவதாக, பெண்களுக்கு எதிரான அனைத்து வகையான பாகுபாடுகளையும் களைவதற்கான ஐக்கிய நாடுகளின் பன்னாட்டு உடன்படிக்கையின் உறுதிகளை இலங்கை உள்நாட்டுச் சட்டத்துக்குள் கொண்டுவந்து இணைத்துள்ளது.

இலங்கையின் வரலாற்று அடிப்படையிலான சட்டச் சூழலையும், 2024ஆம் ஆண்டின் 37ஆம் இலக்க, சட்டத்தின் புதிய ஒழுங்குவிதிகளையும் ஒப்பிட்டுப் பார்க்கும்போது, சட்டம் மற்றும் நிறுவன அதிகாரத்தில் ஏற்பட்டுள்ள மாற்றங்களை தெளிவாக நாம் புரிந்துகொள்ளலாம்.

பழைய சட்டக் கட்டமைப்பின்கீழ் அதிகாரத்துவ முறைமையானது, சட்ட அடிப்படையிலான அதிகாரமற்ற இலங்கை மகளிர் பணியகம் மற்றும் அமைச்சுக்களின் அறிவுரைக் குழுக்களையே சார்ந்திருந்தது. புதிய சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் **அரசியலமைப்புச் சபையால்** பரிந்துரைக்கப்படும் கட்டற்ற அமைப்பாகவே இயங்கும் பெண்கள் தேசிய ஆணைக்குழுவை நிறுவுகின்றது. பழைய சட்டக் கட்டமைப்பின்கீழ் செயலாக்க அதிகாரங்கள் வெறும் பரிந்துரைகளை மட்டுமே வழங்க முடிந்தது. மேலும், அமைச்சின் முடிவுகள் அல்லது மனித உரிமைகள் ஆணைக்குழுவின் பரிந்துரைகள அது சார்ந்திருந்தது. புதிய ஒழுங்குவிதிகளின்படி, நேரடி விசாரணை அதிகாரம், அழைப்பாணை அனுப்பும் உரிமை மற்றும் உயர் நீதிமன்ற அவமதிப்பு நடவடிக்கை எடுக்கும் அதிகாரம் ஆகியன வழங்கப்பட்டுள்ளன. பழைய சட்டக் கட்டமைப்பின்கீழ், குறைகளைத் தீர்க்கும் முறையானது, காவல்துறை மற்றும் குடிசார் தொழிலாளர் நீதிமன்றங்கள் ஊடான நீண்டகாலத் தாமதங்களைக் கொண்ட சிக்கலான நடைமுறையாகக் காணப்பட்டன. புதிய கட்டமைப்பின்கீழ், பாலினப் பாகுபாடு மற்றும் பணியிடத் துன்புறுத்தல்களுக்கு விரைவான தீர்வுகாணத் தனியான பெண்கள் உரிமைகளுக்கான முறைமன்ற நடுவர் நியமிக்கப்பட்டுள்ளார்.

பழைய சட்டக் கட்டமைப்பின்கீழ், நிதி வழங்கல் ஆண்டுதோறும் அமைச்சுக்களுக்கு ஒதுக்கப்படும் அரச பாதீட்டின் மாறுதல்களுக்கு உட்பட்டிருந்தது. புதிய கட்டமைப்பின்கீழ், சட்ட அடிப்படையிலான பெண்களுக்கான தேசிய நிதியம்மூலம் நிதி திரட்டல் மற்றும் நிருவாகப் பராமரிப்பு மேற்கொள்ள வழிவகுக்கப்பட்டுள்ளது. வாழ்நாள், கல்வியறிவு, தாய் சேய் நலன் பேணல் முதலிய மனித மேம்பாட்டுக் குறிகாட்டிகளில் இலங்கை உலகளவில் பாராட்டுகளைப் பெற்றிருந்தாலும், முடிவெடுக்கும் உயர்மட்டப் பதவிகளில் பெண்களின் பிரதிநிதித்துவம் மிகவும் கவலையளிக்கும் நிலையிலேயே உள்ளது.

இலங்கையின் குடித்தொகையில் 52 சதவீதமும் வாக்காளர் தொகையில் 56 சதவீதமும் பெண்களாவர். எனினும், 225 உறுப்பினர்களைக் கொண்ட இந்த நாடாளுமன்றத்தில் 22 பெண் பிரதிநிதிகளே உள்ளார்கள். இது வெறும் 9.8 சதவீதமாகும். உலகளவில் நாடாளுமன்றப் பெண் பிரதிநிதித்துவ வரிசையில் 193 நாடுகளில் எமது இலங்கை 135ஆவது இடத்தில் உள்ளது. ருவாண்டா நாட்டின் நாடாளுமன்றம் 65 சதவீதத்துக்கும் அதிகமான பெண் பிரதிநிதித்துவத்தைக் கொண்டுள்ளமையை இவ்விடத்தில் குறிப்பிடுவது பொருத்தமாக இருக்குமென நம்புகின்றேன். சுவீடன், பின்லாந்து, நோர்வே முதலிய நாடுகளின் நாடாளுமன்றங்கள் 42-47 சதவீதமான பெண் பிரதிநித்துவத்தைக் கொண்டுள்ளன. தெற்காசிய வலயத்திலுள்ள நேபாள நாடாளுமன்றத்தில் 34 சதவீதமும், பாகிஸ்தான் நாடாளுமன்றத்தில் 21.7 சதவீதமும், வங்காளதேச நாடாளுமன்றத்தில் 21 சதவீதமும் பெண் பிரதிநிதிகள் உள்ளனர். இலங்கையில் இப்பொழுது செயற்பாட்டிலுள்ள உள்ளூராட்சி மன்றங்களில் பெண்களின் பிரதிநிதித்துவம் 23.8 சதவீதமாக உள்ளது. எமது அயலிலுள்ள இந்திய மாநிலமான தமிழ் நாட்டில் இது 50 சதவீதமாக உள்ளமை குறிப்பிடத்தக்கது.

நாட்டிலுள்ள அமைச்சரவை அமைச்சர்கள் 22 பேரில் இருவர் மட்டுமே பெண்களாவர். இது 9 சதவீதமாகும். நாட்டிலுள்ள 32 பிரதி அமைச்சர்களில் ஒருவர் மட்டுமே பெண்ணாவார். இது 3 சதவீதமாகும். கனடா நாட்டு அமைச்சரவையில் 50 சதவீதமானவர்கள் பெண்களாவர். இந்த நிலை 2025ஆம் ஆண்டு முதல் தொடர்ச்சியாக நிலவி வருகின்றது என்பதை நான் இந்த இடத்தில் குறிப்பிடுவது பொருத்தமாக இருக்குமென நம்புகின்றேன். நாட்டிலுள்ள 25 அமைச்சுச் செயலாளர்களில் நால்வர் மாத்திரமே பெண்களாவர். இது வெறும் 16 சதவீதமாகும். நாட்டிலுள்ள 25 மாவட்டச் செயலாளர்கள் அல்லது அரசாங்க அதிபர்களில் ஒருவர் மாத்திரமே பெண்ணாவார். இது 4 சதவீதமாகும். நாட்டிலுள்ள உயர் நீதிமன்ற நீதிபதிகள் 13 பேரில் ஒருவர் மட்டுமே பெண்ணாவார். அதேபோல, மேன்முறையீட்டு நீதிபதிகள் 15 பேரில் ஒருவர் மட்டுமே பெண்ணாவார். இவை முறையே 7.7 மற்றும் 6.7 சதவீதமாகும். நாட்டிலுள்ள 17 அரச பல்கலைக்கழகத் துணைவேந்தர்களில் ஒருவர் மட்டுமே பெண்ணாவார். இலங்கையின் குடித்தொகையில் 52 சதவீதமாகவுள்ள பெண்களின் பிரதிநிதித்துவத்தை சட்டவாக்கத்துறை, நிருவாகத்துறை, நீதித்துறை மற்றும் முடிவுகளை எடுக்கும் தளங்களில் 50 சதவீதம் என்னும் அளவுக்கு சமநிலையை நோக்கி உயர்த்த வெறுமனே விழிப்புணர்வுப் பரப்புரைகள் மட்டும் போதாது. அதற்குச் சட்டக் கட்டமைப்பு அடிப்படையிலான மாற்றங்களும் தேவையாகும்.

2024ஆம் ஆண்டின் 37ஆம் எண்கொண்ட பெண்களின் வலுவூட்டல் சட்டத்தின் புதிய ஒழுங்குவிதிகள் மற்றும் தீர்மானங்கள் முன்னேற்றகரமான நடவடிக்கைகள் என்ற பொழுதிலும், இதன்மீது சில விமர்சனங்கள் முன்வைக்கப்படுகின்றன. முதலாவதாக, இந்தச் சட்டமானது பெண்களின் சமூகம், பொருளாதாரம், மகளிர் தேசிய ஆணைக்குழுவின் பணிமுறைப் பதவிகள், உரிமைகள்,

ஊதியங்கள் முதலியன பற்றி பேசினாலும், நாடாளுமன்றம், மாகாண சபை மற்றும் உள்ளூராட்சிமன்ற வேட்பாளர் பட்டியல்களில் பெண்களுக்கான கட்டாய ஒதுக்கீட்டைச் சேர்க்கத் தவறிவிட்டது எனப் பெண் அமைப்புகள் விமர்சிக்கின்றன.

இரண்டாவதாக, புதிதாக உருவாக்கப்பட்டுள்ள பெண்கள் தேசிய ஆணைக்குழு ஏற்கனவே இயங்கிவரும் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு மற்றும் மகளிர் விவகாரத்துக்குப் பொறுப்பான அமைச்சு ஆகியவற்றுக்கு இடையிலான அதிகார வரம்புகளில் குழப்பங்களும் முரண்பாடுகளும் எழ வாய்ப்புள்ளது. மூன்றாவதாக, பெண்களுக்கான தேசிய நிதியத்துக்குப் போதுமான அரச நிதி ஒதுக்கீடுகள் சரியான நேரத்தில் கிடைக்காதவிடத்து, இப்புதிய ஆணைக்குழுவும் முறைமன்ற நடுவர் அலுவலகமும் பெயரளவு அமைப்புகளாக மாறக்கூடிய நிலைவரும் இடர் உள்ளது.

மேலே குறிப்பிட்ட விமர்சனங்களையும் அறைகூவல்களையும் நிவர்த்திசெய்து, 2024ஆம் ஆண்டின் 37ஆம் இலக்க, பெண்களின் வலுவூட்டல் சட்டத்தை வெற்றிகரமாக நடைமுறைப்படுத்த பின்வரும் பரிந்துரைகளை நான் முன்வைக்க விரும்புகின்றேன்.

முதலாவதாக, நாடாளுமன்றம், மாகாண சபை மற்றும் உள்ளூராட்சித் தேர்தல் சட்டங்களில் திருத்தங்களைக் கொண்டுவந்து, வேட்பாளர் பட்டியலில் குறைந்தபட்சம் 50 சதவீதமான பெண் வேட்பாளர்கள் இருப்பதைக் கட்டாயமாக்க வேண்டும்.

இரண்டாவதாக, புதிய பெண்கள் ஆணைக்குழுவுக்கும் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவுக்கும் இடையே தெளிவான எல்லைகளை வரையறுத்து, குறைகள் தாமதமின்றி விசாரிக்கப்படுவதை உறுதிசெய்ய சட்ட அடிப்படையிலான புரிந்துணர்வு ஒப்பந்தங்கள் செய்யப்பட வேண்டும்.

மூன்றாவதாக, பெண்களுக்கான தேசிய நிதியத்துக்கு வெறும் நன்கொடைகளை மட்டும் நம்பியிருக்காமல், ஒவ்வோர் ஆண்டின் பாதீட்டிலும் நாடாளுமன்றத்தின்மூலம் நேரடி நிதி ஒதுக்கீட்டை உறுதிசெய்ய வேண்டும்.

நான்காவதாக, இச்சட்டத்தின்கீழ் அமைக்கப்படும் ஆணைக்குழுவின் செயற்பாடுகள் மற்றும் இலக்குகளின் முன்னேற்றத்தை அரையாண்டுக்கு ஒரு முறை மதிப்பாய்வு செய்து அறிக்கை சமர்ப்பிக்க நாடாளுமன்ற சிறப்பு மேற்பார்வைக் குழுவொன்றை நியமிக்க வேண்டும்.

ஐந்தாவதாக, குடும்பப் பொறுப்புகள் காரணமாக பெண்கள் வேலைகளைக் கைவிடுவதைத் தடுக்க குறைந்த செலவிலான குழந்தைகள் காப்பகங்கள், முன்பள்ளிகள், நெகிழ்வுத் தன்மைகொண்ட பணி நேரங்கள் மற்றும் மகப்பேறு விடுப்பு வசதிகளைச் சட்ட அடிப்படையிலானதாக்க வேண்டும்.

இலங்கையில் பெண்களின் வலுவூட்டல் சட்டம் என்பது ஏதோ ஒரு சாராருக்கு வழங்கப்படும் சலுகை அல்ல. மாறாக, அது நாட்டின் பொருளாதார மீட்சிக்கும் ஜனநாயக முதிர்ச்சிக்கும் இன்றியமையாத ஒரு முதலீடாகும் எனக்கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of this House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Mrs.) Anushka Thilakarathne. You have ten minutes.

[අ.භා. 1.00]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට සුළු වේලාවකට පෙර සභා ගර්භයේ ලොකු ගෝරනාඩුවක් තිබුණා, අපගේ පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවට ආවාට පස්සේ උදේ වරුවේ මේ සභාවේ සෙල්ලමක් තිබෙනවා. ඒ තමයි, මොනවා හරි ටිකක් කියලා කෑ ගහලා, මාතෘකාවක් හදලා, මීඩියාවලට මොනවා හරි ප්‍රකාශයක් දීලා, තමන්ගේ රූපය පෙන්වා ගන්න කරන සෙල්ලම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික විගණන කාර්යාලය විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අටවන හා නවවන පාර්ලිමේන්තු වාරයන් පිළිබඳව සිදු කරන ලද විශේෂ විගණන වාර්තාවක් තිබෙනවා. දැන් කියන්නේ අපේ ගරු කථානායකතුමා හොඳ නැහැ කියලා නේ. එම විශේෂ විගණන වාර්තාවේ සඳහන් වෙනවා, 2016 වර්ෂයේ සිට 2024 දක්වා කාල පරිච්ඡේදය තුළදී කථානායක ධුරය වෙනුවෙන් ඉන්ධන ලීටර් 299,146ක් නිකුත් කර තිබුණු අතර, ඒ සඳහා රුපියල් 75,260,648ක මුදලක් වියදම් කරලා තිබෙනවාය කියලා. ගරු කථානායකවරයා විසින් 2023 වර්ෂය සඳහා ලබාගෙන ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 47,926යි; ඒ සඳහා වියදම් කරලා තිබෙන මුදල රුපියල් 19,373,866ක්; මාසිකව භාවිත කරන ලද ලීටර් ප්‍රමාණය 3,994යි. 2024 වර්ෂයේදී අපි බලයට පත්වීමට පෙර ගරු කථානායකවරයා විසින් ලබාගෙන ඇති ඉන්ධන ලීටර් ප්‍රමාණය 73,461යි; ඒ සඳහා වියදම් කරලා තිබෙන මුදල රුපියල් 26,045,103ක්; සාමාන්‍යයෙන් මාසිකව භාවිත කරන ලද ලීටර් ප්‍රමාණය 6,122යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු කථානායකවරු සහ නියෝජ්‍ය කථානායකවරු පිළිබඳව එකී විගණන වාර්තාවේ නිරීක්ෂණ තිබෙනවා. එම විගණන වාර්තාවේ නිරීක්ෂණ යටතේ 6.1හි මෙසේ සඳහන් වනවා:

> "ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙහි කථානායකවරයාට ඉන්ධන භාවිතය සම්බන්ධයෙන් සීමාවන් පනවා නොතිබීම හේතුවෙන් සීමාරහිත ලෙස ඉන්ධන භාවිත කිරීමට අවස්ථාව සලසා දී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. තවද මෙම සීමාරහිතව ඉන්ධන ලබා දීම හේතුවෙන් ඉහත වගුව අංක 07හි දැක්වෙන පරිදි 9වන පාර්ලිමේන්තුවෙහි අවසන් වර්ෂ දෙක වන 2023 හා 2024 වර්ෂයන් තුළදී කථානායකවරයා විසින් සාමාන්‍යයෙන් මාසිකව පිළිවෙළින් ඉන්ධන ලීටර් 3,994ක් හා 6,122ක් භාවිත කර තිබුණි. මෙම ලීටර් ප්‍රමාණයේ වර්ධනය 2022 වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 66ක හා සියයට 155ක පමණ ප්‍රශ්නගත වර්ධනයක් ලෙසද නිරීක්ෂණය විය. 2023 හා 2024 වර්ෂයන් දෙක සඳහා ඉන්ධන සඳහා එම වර්ෂයන් දෙක තුළදී වාර්ෂිකව පිළිවෙළින් රුපියල් 19,373,866ක් හා රුපියල් 26,045,103ක වියදමක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව අනෙකුත් වර්ෂයන්ට සාපේක්ෂව ඉන්ධන භාවිතය මෙම වර්ෂයන් දෙකෙහි දී සැලකිය යුතු ප්‍රමාණයක වැඩි වීමක් බවත් නිරීක්ෂණය විය."

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු කථානායකතුමා හොඳ නැහැ, අපේ ගරු කථානායකතුමා ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන්නේ නැහැ, අපේ ගරු කථානායකතුමාට දූෂණ චෝදනා තිබෙනවා කියලා උදේ මේ සභාවේ ලොකු ගෝරනාඩුවක් කළා. මේ වාර්තා අරගෙන කියෙව්වොත් මේ රටේ සාමාන්‍ය ජනතාවට තේරෙයි, අපට කන්න අඩින්න නැතිව සිටියදී, පෝලිම්වල මිනිස්සු මැරෙද්දී, කොරෝනා හැදිලා මිනිස්සු අන්ත දුක් විඳිද්දී, අපේ රට බංකොලොත් වෙද්දී, අපේ රට ලෝකයේ පිළිගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබියදී හිටපු කථානායකවරු, හිටපු නියෝජ්‍ය කථානායකවරු සුරසැප විඳපු විධිය. ඒ බව මේ විගණන වාර්තාවේ සඳහන් වනවා.

ඒ නිසා විපක්ෂයට අවධාරණය කර කියනවා, පාර්ලිමේන්තුවේ අවධානය දිනා ගන්න නම් තමන්ට නියමිත වේලාවේදී ලබා දී තිබෙන මාතෘකාවට අනුව මේ රටේ මිනිස්සුන්ට ආමන්ත්‍රණය කරන්න, තමන්ගේ කාලයෙන් හරියට ප්‍රයෝජනයට ගන්න කියලා. එහෙම නැති වුණොත් තවදුරටත් ප්‍රතික්ෂේප වෙනවා මිසක්, ලකුණු දමා ගන්න පුළුවන් කියලා හිතාගෙන ඉන්නවා නම් ඒක කවදාවත් වෙන්නේ නැහැ කියන කාරණයත් මතක් කරමින්, අද දවසේ විවාදයට භාජන කරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික තීරණය කිරීම සම්බන්ධයෙන් වන යෝජනාවට අපි විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ අනුව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිතුමියගේ වැටුප රුපියල් 135,000ක් ලෙසත්, සාමාජිකයන්ගේ වැටුප රුපියල් 90,000ක් ලෙසත්, සභාපතිතුමියගේ ප්‍රවාහන දීමනාව රුපියල් 50,000ක් ලෙසත්, සාමාජිකයන්ගේ ප්‍රවාහන දීමනාව රුපියල් 25,000ක් ලෙසත්, සභාපතිතුමිය වෙත මාසික ඉන්ධන දීමනාව ලීටර් 220ක් සහ සන්නිවේදන දීමනාව රුපියල් 6,000ක් ලෙසත්, සාමාජිකයන් සඳහා සන්නිවේදන දීමනාව රුපියල් 4,250ක් ලෙසත් තීරණය කර තිබෙනවා.

ඇත්තටම අපි ජාතික ජන බලවේගය ආණ්ඩුව හදලා, අපේ ආණ්ඩුව ඇතුළේ මේ අවුරුදු දෙක තුළ විශේෂයෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් විවිධ අමාත්‍යාංශ සහ විවිධ ක්ෂේත්‍ර පදනම් කර ගනිමින් විශේෂ කාරණා රාශියක් සිදු කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහිදී ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමට අදාළව දරුවන් 250ට වඩා අඩු පාසල්වල දරුවන්ට ලිපිද්‍රව්‍ය දීමනාව වශයෙන් රුපියල් 6,000ක් ලබා දීම, පාවහන් සඳහා දීමනාවක් ලබා දීම, ඒ වාගේම අස්වැසුම දීමනාව වැඩි කර ලබා දීම වැනි කටයුතු සිදුකර තිබෙනවා. ඒ වාගේම මහපොළ ශිෂ්‍යාධාර මුදල වැඩි කර තිබෙනවා. ඊළඟට, වැඩිහිටි දීමනාව, ආබාධිත අය සඳහා ලබා දෙන දීමනාව කියන මේ සියලු දීමනා වැඩි කර තිබෙනවා.

පවුල් ඒකකයේ මූලික සාධකය බවට පත් වන කාන්තාවට - අම්මා කියන කෙනාට; අක්කා කියන සහෝදරියට; දුව කියන කාන්තාවට - විශේෂයෙන්ම ලොකු බරක් පැටවෙනවා. කථාවට අපි කියන්නේ අහසටයි, අම්මාටයි නිවනක් නැහැ කියායි. කාන්තාව මත පැටවෙන මේ කියන බර අඩු කිරීමට අපි කටයුතු කර තිබෙනවා. මම කලින් පැහැදිලි කළ ආකාරයට, බංකොලොත් වෙච්ච රටක් මේක. එක පෙළැන්තියක් සුර සැප විඳිද්දී රටේ බහුතරයක් දුක් විඳපු රටක් මේක. නමුත් අපි මේ අවුරුදු දෙක ඇතුළත විවිධ ප්‍රතිසංස්කරණ කරමින්, විවිධ දීමනා ලබා දෙමින් කාන්තාවන් වෙනුවෙන් යම් ප්‍රගතියක් ඇති කර දෙන්න උත්සාහ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කාන්තාවන්ගේ ශ්‍රම බල සහභාගිත්වය ගැනත් කථා කරන්න ඕනෑ. අපි කාන්තාවන්ගේ ශ්‍රම බල සහභාගිත්ව අනුපාතිකය වැඩි කරගෙන තිබෙනවා. ඒ අනුව 2024 වර්ෂයේදී සියයට 29.8කින් අපි කාන්තා ශ්‍රම බල දායකත්වය වැඩි කරගෙන තිබෙනවා. ඒ වාගේම ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය ලෙස 2024 වර්ෂයේදී වතු අංශයෙන් ස්ත්‍රීන් සියයට 39.4කුත්, ග්‍රාමීය අංශයෙන් සියයට 33.5කුත්, නාගරික අංශයෙන් සියයට 32.3කුත් වශයෙන් අපි කාන්තා ශ්‍රම දායකත්වය වැඩි කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම විවිධ ක්ෂේත්‍රවල ජීවත් වන ජනතාවට, ඒ කියන්නේ මලෙයහම් ජනතාව වෙනුවෙන්, දුක් විඳින මිනිස්සු වෙනුවෙන්, වසර ගණනාවක් තිස්සේ තම දරු පවුලට ජීවත් වෙන්න නිවසක් නැතිව දුක් විඳිමින් මේ රටට සල්ලි හම්බ කර දීපු මිනිස්සුන්ට - විශේෂයෙන්ම අම්මා කියන, කාන්තාව කියන කෙනාට - ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් අත්පත් කර දෙන්න අපි පසුගිය අවුරුදු දෙක ඇතුළත කැප කිරීම් කර තිබෙනවා. අපි ඒවා ඔප්පු කර පෙන්වා තිබෙනවා. ඒ නිසා අපිට මෙතැන බොරුවට කෑ ගහන්න අවශ්‍ය නැහැ. අපිට මෙතැන බොරුවට මාතෘකා හදන්නත් අවශ්‍ය නැහැ.

අපිට පෙනෙනවා, දැන් විපක්ෂයට මාතෘකා නැති වුණාම, විපක්ෂයට කියා ගන්න දේවල් නැති වුණාම මෙහේදි කෙඳිරි ගාන්න බැරි නිසා, ජාත්‍යන්තරයට ගිහිල්ලා කෙඳිරි ගාන බව. අපිට ඒ කෙඳිරිලි ඇහෙනවා. ජාත්‍යන්තරයට ගිහිල්ලා කෙඳිරි ගානවා. ඔන්න ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනය වෙනවා, හොරකම් කරපු අය අත්අඩංගුවට ගන්නවා කියලා ජාත්‍යන්තරයට ගිහිල්ලා කෙඳිරි ගානවා. නමුත් ඒ කෙඳිරිලි එකකින්වත් වැඩක් නැහැ.

ශ්‍රී ලංකාවේ දූෂණ පිටුදැකීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සහ අපරාධ පරීක්ෂණවල ප්‍රගතිය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ නියෝජ්‍ය මහ කොමසාරිස්වරිය හොඳ වාර්තාවක් ලබා දෙනවා. විපක්ෂය ජාත්‍යන්තරයට කෙඳිරි ගාද්දී ජාත්‍යන්තරයේ මිනිස්සු අපිව අගයනවා, විපක්ෂයේ මිනිස්සු අපිව අගයන්නේ නැති වුණාට. අපට අවශ්‍ය නැහැ, ඒගොල්ලන්ගේ ඇගයීම්. හොඳම ඇගයීම මේ රටේ මිනිස්සු ලබා දීලා තිබෙනවා. හොඳම සහතිකය මිනිස්සු ලබා දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Anushka Thilakarathne, your time is up.

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)

ඒ නිසා ඔයගොල්ලන්ගේ කෙඳිරිලි ඔහොමම තියා ගන්න. ඔබලාට තවත් අවුරුදු ගණනක් කෙඳිරි ගාන්න වෙයි. හැබැයි, ජාතික ජන බලවේගයේ අපි කෙඳිරිය දිහා බලන්නේ නැතුව අපේ වැඩේ කරගෙන යනවා. අවශ්‍ය පනත් අපි සම්මත කර ගනිමින්, රටට කරන්න අවශ්‍ය දේ අප සියලුදෙනා එකතු වෙලා කරනවා කියලා මතක් කරමින්, මා නිහඬ වෙනවා. වේලාව ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa, Leader of the Opposition. You have an allocation of ten minutes.

[අ.භා. 1.11]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා ඡන්ද කාලයේදී මේ රජයේ සාමාජිකයෝ විපක්ෂයේ ඉන්නකොට කරනවාය කියපු දේවල් අද කරලා නැහැ. මම කැමැතියි මේ අවස්ථාව උපයෝගී කරගන්න, ඒ නොකරපු දේවල් කිහිපයක් ඉදිරිපත් කරන්න. එහෙම කරන්නේ ලකුණු දමා ගන්න නොවෙයි. රජයට කියනවා, ඒ ටික කරලා ඔබතුමන්ලා ලකුණු දමා ගන්න කියලා.

2025.01.01 සිට 2025.03.31 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් සඳහා 10/2025 චක්‍රලේඛය අනුව 2025 වසරට යෝජිත නව වැටුපට විශ්‍රාම වැටුප ගළපා සකස් කර තිබෙනවා, 2025.07.01 සිට ගෙවීමට. නමුත් 2020.01.01 සිට 2025.03.31 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය අයගේ පඩි නඩි ඔක්කෝම සකස් කරලා තිබෙන්නේ, 03/2016 චක්‍රලේඛය අනුව. ඒ කණ්ඩායමට අයත් 154,000ක් ඉන්නවා. කරුණාකරලා, ඒ අයගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂික විෂමතාව විසඳන්න කටයුතු කරන්න. ඒ වාගේම ඒ කාල වකවානුව තුළ නොගෙවූ හිඟ මුදලත් ලබා දෙන්න කටයුතු කරන්න. එසේ නොකළහොත්, ඒක මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්, ඒ වාගේම ඔබතුමන්ලා පොරොන්දු වුණු ආකාරයට ඒ අයට සහන ලබා නොදීමක් බව මතක් කරනවා.

දෙවැනි කාරණය හැටියට මම මතක් කරන්න කැමැතියි, The Finance Company එක පිළිබඳ කාරණය. The Finance Company එක ඇවර කරලා, ඉස්සර වෙලාම තැන්පත්කරුවන්ට සියයට 5.5ක මුදලක් ලබා දුන්නා. ඊළඟට 7.5ක මුදලක් ලබා දුන්නා. පසුගිය දවසක ඔවුන් මා මුණ ගැහෙන්න ඇවිල්ලා, මාධ්‍යවලට කරුණු කාරණා, දුක් ගැනවිලි ඉදිරිපත් කළා. සමහරෙකුට තවත් සියයට 10ක මුදලකුත් ගෙවාගෙන යාම ආරම්භ කරලා තිබෙනවාලු. මම කියනවා, සියයට 10ක මුදලක් නොවෙයි, ඉතුරු ඔක්කෝම මුදල් ටික ලබා දෙන්න ඕනෑය කියලා. ඇත්ත වශයෙන්ම ඒ හේතුවෙන් අසහනයට පත්වෙච්ච 6,300ක් ඉන්නවා. ද ෆිනෑන්ස් ආයතනය මහ බැංකුවේ භාරකාරත්වයට ලබා දෙන්නට පෙර තිබුණු profit එක Rs. 1.7 billion, රුපියල් මිලියන 1,700ක්. හැබැයි, මහ බැංකුව පාලනය භාර ගත්තාට පස්සේ 2008-2018 කාල වකවානුව තුළදී ඒ ආයතනය රුපියල් බිලියන 19ක් පාඩු ලබන ආයතනයක් බවට පත්වෙලා තිබෙනවා. එසේ තිබියදී, මහ බැංකුව යටතේ තිබෙන ද ෆිනෑන්ස් ආයතනය පාඩු ලබනවාය කියලා දැන දැනත්, 2019දී "One Billion " කියලා වැඩසටහනක් මඟින් ඒ ආයතනය ප්‍රවර්ධනය කරන්නටත් කටයුතු කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ ආයතනය සතු සම්පත් කොල්ල කාලා, මුදල් කොල්ල කාලා, ඉඩම් කොල්ල කාලා, ඈවර කිරීමේ ක්‍රියාවලිය ඉතාම අකාර්යක්ෂම අන්දමින්, දුර්වල අන්දමින් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ද ෆිනෑන්ස් ආයතනයේ තැන්පත්කරුවන් 6,300කගේ අයිතිවාසිකම් සුරක්ෂා කරනවාය කියලා මේ රජය පොරොන්දු වුණා. එසේ කරනවා නම්, සාධාරණ ක්‍රමවේදයක් හරහා ඒ සම්පත්වල වටිනාකම තක්සේරු කරලා, විනිවිදභාවයෙන් යුක්ත වූ ක්‍රමවේදයකට ඒවා වෙන්දේසි කරලා, සියයට 5.5ක, 7.5ක, 10ක මුදලක් නොවෙයි, ඒ තැන්පත්කරුවන්ට ඔවුන්ගේ සියලු මුදල් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ 6,300දෙනා වෙනුවෙන් අපි හඬ නඟනවාය කියන කාරණයත් මේ අවස්ථාවේදී කියා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඇහුණා මේ සභාවේ කියනවා, බොහොම කාර්යක්ෂම විධියට මේ රජය වැඩ කටයුතු කරගෙන යනවා කියලා. ඔබතුමා දන්නවාද, වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තයේ දෙවැනි පියවර ගැන? මේ කරුණු කාරණා මට ඉදිරිපත් කරන්නේ ඉංජිනේරුවන්, තාක්ෂණ නිලධාරින්, සිවිල් ඉංජිනේරුවන් ඇතුළු විද්වත් කණ්ඩායමක් විසින්. 2022 ජනවාරි පටන් ගත් සංවර්ධන කටයුතු 2025 ජනවාරි 03වන දා වනකොට මාස 36කින් අවසන් වන්නට තිබුණා. නමුත්, අද වනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ අය පුරෝකථනය කරනවා, අද දවසේ ඉඳලා තව අවුරුදු එකහමාරකට මේක අවසන් කරන්න බැරි වෙයි කියලා. Conflict of interest ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා. Project Management Unit එක ඇත්ත වශයෙන්ම clientගේත් representative වෙලා, ඒ වාගේම consultant සහ engineerත් වෙලා. එක පුද්ගලයෙක්, එක කණ්ඩායමක්, එක unit එකක්, හැබැයි රාජකාරි දෙකක් ක්‍රියාත්මක කරනවා. මේ වාගේ මහා පරිමාණයේ ව්‍යාපෘතියකට අවශ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු නැහැ. බරපතළම දේ මොකක්ද දන්නවාද? මේ ඉදිකිරීමේ ක්‍රියාවලිය extend කර තිබෙනවා, EOT-1, EOT-2, EOT-3 කියලා. ඒකට කියන්නේ, කාල වේලාව දීර්ඝ කිරීම - Extension of Time - කියලා. මේ දීර්ඝ කළ හැම කාල වේලාවක්ම කැබිනට් අනුමැතියක් නොලබා, අඩුම ගණනේ කැබිනට් එකට Note එකක්වත් දමන්නේ නැතිව තමයි ක්‍රියාත්මක කර තිබෙන්නේ. ඒ නිසා නැඟෙනහිර බහලුම් පර්යන්තයේ දෙවැනි පියවරේ වැඩ කටයුතුවල ගෙවීම් කටයුතු ක්‍රියාත්මක වෙන්නේ අනීතිකව.

EOT-3 අවසන් වුණා, in July, 2026. දැන් යනවා, EOT-4. මේකටත් කැබිනට් අනුමැතියක් නැහැ; Cabinet Note එකක් නැහැ. අඩුම ගණනේ වරාය අධිකාරියේ අනුමැතියවත් නැහැ. එහෙම නැතිව මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළ එක පැත්තකින් මේක අනීතික ක්‍රියාවලියක් වනවා. ඒ වාගේම මේ ඈවර කරන ක්‍රියාවලිය තුළ ගෙවන අලාභය නිසා ඇත්ත වශයෙන්ම රටටත් පාඩුවක් වනවා. ඒ වාගේම මූලික ගෙවීම් දිගින් දිගටම ගෙවනවා, prolonged preliminary payments. එතකොට liquidated damages ක්‍රමවේදය හරහාත් රට පාඩු ලබනවා: prolonged preliminaries නිසාත් රට පාඩු ලබනවා. ඒ නිසා අපි රජයට යෝජනා කරනවා, ඔබ මේ රට වෙනුවෙන් පෙනී සිටිනවා නම්, ලක්ෂ 220කගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිනවා නම්, කරුණාකරලා ව්‍යවහාරික විගණනයක් කරලා, පාර්ලිමේන්තුවෙත් විමර්ශනයක් කරලා, මේ වැරදි තත්ත්වය නිවැරදි කරන්නට කටයුතු කරන්න කියලා.

මේ රජය බලයට ගෙන එන්නට, නියෝජ්‍ය කථානායකවරයකු වශයෙන් ඔබතුමා ඔය පුටුවේ වාඩි කරන්නට මේ රටේ සංවර්ධන නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරින් විශාල ප්‍රමාණයක් ලොකු කැප කිරීමක් කළා. ආර්ථික සංවර්ධන නිලධාරින් 14,008ක් ඉන්නවා, හැම වසමකටම එක්කෙනා ගණනේ. සංවර්ධන නිලධාරින් 150,000ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල, ඒ වාගේම දෙපාර්තමේන්තුවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල ඉන්නවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ අයට නිසි ව්‍යවස්ථාවක් නැහැ, තමන්ගේ වෘත්තියට. මේක තමයි ඒගොල්ලන්ගේ එකම ඉල්ලීම.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඇත්ත වශයෙන්ම සංවර්ධන නිලධාරින් හැටියට කටයුතු කළ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අයත් ඉන්නවා. නමුත්, ඒ අය මන්ත්‍රීවරු වුණාට පස්සේ ආර්ථික සංවර්ධන නිලධාරින් 14,008 සහ සංවර්ධන නිලධාරින් 150,000 අමතක කරලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මේ අයට - ආර්ථික සංවර්ධන නිලධාරින්ට සහ සංවර්ධන නිලධාරින්ට - සේවා ව්‍යවස්ථාවන් ටික ලබා දෙන්න කටයුතු කරන්න.

එක දෙයක් නම් මේ ආණ්ඩුව කරලා තිබෙනවා. ආර්ථික සංවර්ධන නිලධාරි කියන තනතුර ප්‍රජා සංවර්ධන නිලධාරි කියලා නම වෙනස් කරලා, "අස්වැසුම" ක්‍රියාත්මක කරන්න, "අත්තම" වැඩසටහන ක්‍රියාත්මක කරන්න, "ප්‍රජා ශක්ති" වැඩසටහන ක්‍රියාත්මක කරන්නට ඒ අයට වගකීම භාර දී තිබෙනවා. ඔබතුමා දන්නවාද, "අත්තම" කියන වැඩසටහනෙන් සංවර්ධනයක් කරන්නේ ජනතාවගෙන්ම සල්ලි එකතු කරලා කියලා. මේ රජය පත් කර ගත්තේ ඒක කරන්න නොවෙයි නේ. දැන් ඕනෑ තරම් මුදල් එක්රැස් කර තිබෙනවා, මහා භාණ්ඩාගාරයේ. සභානායකතුමා කිව්වා, ටොන් ගණන් ඉතුරු කර තිබෙනවා කියලා. එහෙම ටොන් ගණන් ඉතුරු කර තිබෙනවා නම්, "අත්තම" වැඩසටහනට ප්‍රදේශයේ ජනතාවගෙන් සල්ලි එකතු කරන්නේ ඇයි කියන එක මම අහන්න කැමැතියි. මොනවා හෝ අර්බුදයක් එනකොට සංවර්ධන නිලධාරින් අන්දවන්නේ නැතිව, ආර්ථික සංවර්ධන නිලධාරින් අන්දවන්නේ නැතිව, පසුගිය කාලයේ නුවරට ගෙනැල්ලා කරපු ලොකු සම්මන්ත්‍රණය වාගේ ඒවාට සීමා වෙන්නේ නැතුව කරුණාකර ඒ අයගේ දුක්ගැනවිලිවලට විසඳුම් ලබා දෙන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ඔබතුමා දකින්න ඇති, ඊශ්‍රායල රටට යටිතල පහසුකම් අංශයෙන් රැකියා ලබා දෙන්න පොරොන්දු වෙලා අද වන විට අවුරුදු 2ක් ගිහිල්ලාත්, ඒ රැකියා ලොතරැයිය ක්‍රියාත්මක කරන්නේ නැති බව. යෝග්‍යතා පරීක්ෂණ කරලා තිබෙනවා, පොලිස් වාර්තා ලබා දීලා තිබෙනවා. එතැන 1,200ක් ඉන්නවා. ඒ lottery එක ක්‍රියාත්මක කරලා agreements ටික ලබා ගන්න බලාගෙන 560දෙනෙක් ඉන්නවා. නමුත්, ඒ මොකවත් කරන්නේ නැහැ. මොකක්ද දන්නවාද, රහස? ආණ්ඩුවෙන් යවනවා නම්, රුපියල් ලක්ෂ 10කට අඩු ප්‍රමාණයක් තමයි වැය වෙන්නේ. පෞද්ගලික අංශයේ විවිධ ඒජන්තවරුන් හරහා යවන වැඩසටහනක් දැන් ආරම්භ කරලා තිබෙනවා. ඒකට රුපියල් ලක්ෂ 35ක් යනවා. රජයෙන් යවන වැඩසටහන අඩපණ කරලා පෞද්ගලික ඒජන්තවරුන් හරහා යවන ක්‍රමය ශීඝ්‍රගාමී කරලා තිබෙනවා. ඒ අය අර අහිංසක තරුණයන්ගෙන් රුපියල් ලක්ෂ 35ක් පමණ අය කරලා තමයි ඊශ්‍රායලයේ යටිතල පහසුකම් අංශයට යවන්න පුද්ගලයන් බඳවා ගන්නේ. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමියගෙන් මම අහනවා, ඒක සාධාරණද කියලා. ඇයි, මේ ප්‍රශ්නය විසඳන්නේ නැත්තේ? ඇයි, ආර්ථික සංවර්ධන නිලධාරින්ගේ ප්‍රශ්නය විසඳන්නේ නැත්තේ? ඇයි, සංවර්ධන නිලධාරින්ගේ ප්‍රශ්නය විසඳන්නේ නැත්තේ? ඇයි, ඊශ්‍රායලයට යන්න බලාපොරොත්තුවෙන් සිටින ඒ තාරුණ්‍යයේ ප්‍රශ්නය විසඳන්නේ නැත්තේ? ඇයි, වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තයේ ගැටලුවලට විසඳුම් ලබා දෙන්නේ නැත්තේ? ඇයි, The Finance Company එකේ තැන්පත්කරුවන් 6,300කගේ අයිතිවාසිකම් සුරක්ෂා කරන්නේ නැත්තේ? ඇයි, 2020-2024 කාල වකවානුව තුළ විශ්‍රාම ගිය 154,000කගේ වැටුප් විෂමතා ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්නේ නැත්තේ?

අවසාන වශයෙන් මම පැහැදිලිව මේ කාරණයත් කියන්න කැමැතියි. මේ මොහොත වන විට පාර්ලිමේන්තුවේ රැස්වීම් කාලසටහන සකස් කර තිබෙනවා, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කටයුතු කරන්න. අපි පැහැදිලිවම කියනවා, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අධිකරණයේ ස්වාධීනත්වයට එල්ල කරන මරු පහරක් බව. එය මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හකුළුවන - සංකෝචනය කරන - මේ රටේ ජනතාවගේ මානව අයිතීන්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන ඉතාම දරුණු, පහත්, නින්දිත, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලියක්. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම තුළ මේ රටේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්න විසඳෙනවාද කියලා මම අහන්න කැමැතියි. බඩු මිල ප්‍රශ්නය විසඳෙනවා ද? ආර්ථික සංවර්ධනය ක්‍රියාත්මක නොවීමේ ප්‍රශ්නය විසඳෙනවා ද? ආර්ථිකය වර්ධනය නොවීමේ, අපනයන වර්ධනය නොවීමේ, දුප්පත්කම වැඩි වීමේ, විරැකියාව නිර්මාණය වීමේ ප්‍රශ්න විසඳෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ තිබෙන කර්මාන්තශාලා අයිති අය ඒවා වසා දමලා පිට රට ගිහින් කර්මාන්තශාලා නොව කර්මාන්ත ජනපද පිහිටුවනවා. මෙන්න, අද රටේ තත්ත්වය. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා මේ රටේ ජනතාවට යුක්තිය, සාධාරණත්වය, ආර්ථික සංවර්ධනය ඉෂ්ට වෙනවාද? අපි ඒ ප්‍රශ්නය අහන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම නැහැ. වෙන්නේ එකම එක දෙයක් පමණයි. ඒ තමයි, රට තුළ one-party State එකක් ඇති වීම. එක පක්ෂයක් රට පාලනය කරන, රාජ්‍ය ක්ෂේත්‍රය පාලනය කරන තනි පක්ෂ පාලනයක් නිර්මාණය කිරීමේ මූලික පියවර මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා තබලා තමයි අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල කරන්නේ. අප ඒක අනිවාර්යයෙන්ම ප්‍රතික්ෂේප කරනවා, ඒකට විරුද්ධ වෙනවා, ඒකට විරුද්ධව මේ රටේ ජනතාව පෙළගස්වනවා කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙසේ වෙතත්, වී ගොවියාට ලබා දෙනවා කියපු රුපියල් 150ක සහතික මිල කෝ? ගොයම් කකා කියපු ඒ සහතික මිල කෝ? ලාල් කාන්ත ඇමතිතුමාම කියනවා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් වැය වෙනවා කියලා. හැබැයි, මේ රජය වී කිලෝවකට දෙන්නේ රුපියල් 120ක සහතික මිලක්. තමන් ජනාධිපති පුටුවට ගෙන එන්නට, ගොවියෙකුගේ පුතෙකු රටේ ජනාධිපති කරන්නට දරපු ප්‍රයත්නයට ගොවීන් දසලක්ෂ ගණනින් ශක්තිය ලබා දුන්නාම, අද රජය හිතා මතාම කරන්නේ මොකක්ද? වී කිලෝ එකක් සඳහා රුපියල් 120ක සහතික මිලක් ලබා දෙනවා. වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් වැය වෙනවා කියන එක දැන දැනත් හැම වී කිලෝවකින්ම රුපියල් 17ක් වී ගොවියාට හිතා මතාම පාඩු කරන යුගයක තමයි අප ඉන්නේ. ඇත්ත වශයෙන්ම ඒ ගොවි ජනතාවටත්, රටේ සමස්ත ජනතාවටත් කොත්තමල්ලි සූත්‍රයේ පිහිටම තමයි කියන එක මේ අවස්ථාවේ කියන්න සිදු වෙනවා.

අවසාන වශයෙන්, මම මේ කාරණය අහන්න කැමැතියි. මට පෙර කථා කළා, නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරියක්. එතුමියගේ කථාව මම හොඳින් අහගෙන හිටියා. එතුමියට තම කථාව තුළින් කරුණු කාරණා ඉදිරිපත් කරන්න අයිතිය තිබෙනවා. ඒ ගරුත්වය අපි රකිනවා. හැබැයි, මගේ කථාව අවසන් කරමින් මම එතුමියගෙන් එක ප්‍රශ්නයක් අහන්න කැමැතියි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි, ඔබතුමියලාගේ ආණ්ඩුවයි කියනවා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක පුද්ගලයෙකුට දින 30ක් ජීවත් වෙන්න - ඒ කියන්නේ මාසයකට - රුපියල් 18,200ක් ප්‍රමාණවත් කියලා. මම එතුමියගෙන් අහන එකම එක ප්‍රශ්නය මෙයයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක

පුද්ගලයෙකුට මාසයක් ජීවත් වෙන්න - දින 30ක් ජීවත් වෙන්න - රුපියල් 18,200ක් ප්‍රමාණවත් කියලා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවත් කියනවා. මේ රජයත් ඒක අනුමත කරනවා. මම එතුමියගෙන් අහන්න කැමැතියි, ඔබතුමිය මහ පොළොවේ පය ගහලා ඉන්නවා නම්, එක පුද්ගලයෙකුට රුපියල් 18,200කින් මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලා ඔබතුමිය පිළිගන්නවාද කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. (Dr.) Hiniduma Sunil Senevi. You have 13 minutes, Hon. Minister.

[අ.භා. 1.27]

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි.

අද දවසේ ඉතාම වැදගත් පනතක් යටතේ ගෙනෙන තීරණයක් සම්බන්ධයෙන් විවාදයට ගැනෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර කථා අහගෙන ඉන්න කොට මට හිතෙනවා අද දවසේ විවාදයට තේමාවක් තිබෙනවාද කියලා. අඩුම තරමින් වැකියක්, දෙකක්වත් ඒ වෙනුවෙන් එකතු කරනවා නම් වටිනවා. මොකද, මෙය කාන්තාව සවිබල ගැන්වීම පිළිබඳව කෙරෙන සාකච්ඡාවක් වන නිසා.

2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය පිළිබඳවයි අපේ මේ සාකච්ඡාව. මේ වන විට ඒ සම්බන්ධ කරුණු බෙහෙවින් අනාවරණය කරලා තිබෙනවා. මුලින්ම මා කැමැතියි ස්තුතිවන්ත වෙන්න, ගරු සරෝජා පෝල්රාජ් ඇමතිතුමියට, මේ වටිනා සංශෝධනය මේ විධියට රැගෙන ඒම පිළිබඳව. මොකද, මේ පාරිශ්‍රමික දීමනාව එහෙම නැත්නම් මේ වැඩි කිරීම ඉතාම උචිත, වැදගත්, අත්‍යවශ්‍ය දෙයක් හැටියට අපි පිළිගන්නවා. ඉන් කාන්තාව සවිබල ගැන්වීම කියන එක සංකල්පීය වාගේම ප්‍රායෝගික තලයේත් ඉතාම වැදගත් ලෙස ඉෂ්ට වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සභාව තුළ මේ සම්බන්ධ කරුණු රැසක් අනාවරණය වුණත් මම කැමැති වෙනවා ටිකක් වෙනස් පැත්තකින් මේ පිළිබඳව කරුණු දක්වන්න. කාන්තාව හෙවත් ස්ත්‍රිය පිළිබඳව අපේ පෘථුල සාකච්ඡාව මේ පනත හැම අතින්ම ඉක්මවා යන විස්තීර්ණ එකක්. ඒ වැදගත්කමේ යම් තලයක් මේ පනත යටතේ ගෙන එනු ලබන තීරණය යටතේ සාකච්ඡා කෙරෙනවා. එසේ වුණත් කාන්තාව බලගැන්වීම සහ ඒ විෂය පිළිබඳව අපේ උනන්දුව, සාකච්ඡාව අතිශය පුළුල් එකක්. එසේම, කාන්තාව පිළිබඳව පවත්වන මේ සංවාදයේදී කරන කරුණු දැක්වීම කිසි විටෙකත් අනුකම්පාව කේන්ද්‍ර කරගෙන කළ යුත්තක් නොවෙයි කියලා. මේ විවාදය ආරම්භ කරමින් විෂය භාර ගරු ඇමතිතුමියත් එය සිහිපත් කළා. කාන්තාවක වීම නිසාම ඇය කිසිදු ආකාරයකින් වෙනස්ව සැලකීමකට හෝ අඩුම තරමින් වෙනස්ව සිතීමකට - වෙනස් හැඟීමකට - ලක් විය යුතු නැහැ. ජාතික ජන බලවේගය කියන්නේ මේ තත්ත්වය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන එය ක්‍රියාකාරී තත්ත්වයට පත් කරන්න මහ පොළොවට ගෙනැල්ලා වැඩසටහන් හදපු, ඒ වෙනුවෙන් දිනපතා මහන්සි වන ව්‍යාපාරයක්. ඒ නිසා අපි පනතක් පිළිබඳව, සංශෝධන පිළිබඳව සාකච්ඡා කරන්නේම ඒක ජන සමාජයේ ක්‍රියාකාරිත්වයත් සමඟ අවියෝජනීයව බැඳිලා තිබෙන හැටි කල්පනාවට අරගෙන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි "ගැහැනු අපි එක මිටට" කියලා තේමාවක් හදාගෙන, දේශපාලන මැදිහත්වීමක් කරලා කාන්තාව වෙනුවෙන් විශාල අදහසක්, සංකල්පයක්, ප්‍රතිපත්තියක් සහ ක්‍රියාකාරිත්වයක් පොළොවට ගෙනාවා. කාන්තාව දෙස බලන බැල්මට, මේ දර්ශනයට අපි හැමෝටම විශාල ඉතිහාසයක් තිබෙනවා. කාන්තාව සවිබල ගැන්වීම ගැන අපට පුළුවනි, මාර්ග දෙකකින් කල්පනා කරන්න. එකක් තමයි කාන්තාව, කාන්තාව තුළම ශක්තිමත් කරන්නේ කොහොමද කියන එක. දෙවැනි එක තමයි, කාන්තාව සමාජය තුළ පුරවැසියකු හැටියට ශක්තිමත් කිරීම සහ ඒ හා බැඳුණු ආනුෂංගික වරප්‍රසාද, අයිතිය සහ අවස්ථා පිළිබඳ සාකච්ඡාව.

මේ අතරින් මා පළමුව සාකච්ඡා කරන්න කැමැතියි, කාන්තාව, කාන්තාව ගැනම හිතන විධිය ගැන. මොකද, මේක ඉතාම වැදගත් වෙනවා, සංකල්පීය, දාර්ශනික කරුණක් මේක ඇතුළේ ගැබ් වෙන නිසා. ඇගේ නිසි දැක්ම ඇ තුළම බීජයක් ලෙස දැරියකගේ ළමා වියේදීම රෝපණය කරලා පෝෂණය කරන්නට ඕනෑ. ඒ හරහා තමයි දිගු ගමනක් යන්න පුළුවන් වෙන්නේ. ඒ හරහා තමයි සමාජයක් හැටියට කාන්තාව ශක්තිමත් කිරීම සම්බන්ධ විශාල ජයග්‍රහණයන් රැසක් අත්පත් කරගන්න පුළුවන් වන්නේ. මා කලින් කිව්වා වාගේ කාන්තාවගේ වරප්‍රසාද, අවස්ථා, ආරක්ෂාව, පහසුකම් පිළිබඳ අදහස බිළිඳු වියේ සිටම පෞරුෂ වර්ධනයට අදාළ කාරණයක් හැටියට සමාජයක රෝපණය වෙන්න ඕනෑ. මම හිතනවා, මේ කාරණය බැඳිලා තිබෙන්නේ අධ්‍යාපනයත් එක්ක කියලා. මුල් ළමා වියේ සිටම සංවිධානාත්මකව ද්විතීය, තෘතීය අධ්‍යාපනය දක්වා, වෘත්තීය මට්ටම් දක්වා අරගෙන එන්න ඕනෑ අදහසක් මේක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී මෙතැනට පැවරෙනවා, ලොකු වගකීමක්. මේ අදහස ඉතාම සියුම් විධියට සාකච්ඡා කෙරෙන ගීතයක කොටසක් ඔබතුමාටත්, මේ සභාවටත් මතක් කරන්න මම කැමැතියි. නුදුරු දිනයක අපෙන් සමුගත්ත ශ්‍රී ලංකාවේ ජීවත් වුණු අති විශිෂ්ට කාන්තාවක් තමයි ආචාර්ය නන්දා මාලනිය. දැරිය තුළ මේ බලගැන්වීම කරන අයුරු ඇගේ සුප්‍රකට ගීයක තිබෙනවා. ඒක මහින්ද අල්ගම මහත්මා ලියූ ගීයක්. මා එහි කොටසක් කියන්නම්.

"චන්ද්‍ර මඬුලු යට සුරංගනාවන් දූ සනහන්නට ගීත ගයනවලු.

දුවේ එපා ඒ කථා අහන්නට මේ නැළැවිලි ගී මමයි කියන්නේ."

මේක අම්මා කියන්නේ. ඇය කියනවා, දැරියකට මුලින්ම සත්‍ය හෙළිදරව් කරන්න ඕනෑ කියලා. මේ බලගැන්වීම පටන් ගන්න ඕනෑ එතැනින්. මුලින්ම රෝපණය කරන්න ඕනෑ, මේ සත්‍යය. මවගේ භූමිකාවේ ප්‍රබල බව මේකෙන් කියැවෙනවා. ඇයම සිය දියණියට සියුම් විධියට ශක්තිය සපයනවා, දියණිය තාර්කික බවට යොමු කරනවා පුංචි කාලයේ ඉඳලාම. මේක තමයි මම කලින් කියපු අර සංකල්පීය කොටස. මොකද, මේ නැළැවිලි ගී කියන්නේ අම්මා. අම්මා ඒ කාරණය සුරංගනාවකට පවරන්නේ නැතුව ඉතාම තාර්කික විධියට, සත්‍ය විධියට දැරියට හෙළි කරනවා මම තමයි ඔබේ ළඟ ඉන්න ආරක්ෂකයා, එතැනින්

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

තමයි පටන් ගන්න ඕනෑ කියලා. මේ බලගැන්වීම අධ්‍යාපනය හරහා එන්න ඕනෑ කියන එක මා කලිනුත් කීවේ මෙබඳු නිර්මාණ අධ්‍යාපනය හරහාම සාකච්ඡා කරන්න ඕනෑ නිසා.

මා කැමතියි, මෙන්න මේ කුඩා පොත් පිංච මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න; සභාගත කරන්න. ජාතික ජන බලවේගය හැටියට අපි " විසිවන සියවස ඉතිහාසයේ මහහැරුණු මොහොත සහ ජාතික පුනරුදය" පිළිබඳව මේ කුඩා පොත් පිංච ඉදිරිපත් කළා. මේ කුඩා පොත් පිංචේ තිබෙනවා, විශිෂ්ට කාන්තාවන් 4දෙනෙක් පිළිබඳව අදහස්. කාන්තාව බලගැන්වීම පිළිබඳ අර අධ්‍යාපන කටයුත්තේදී අපට පුළුවනි, - අපේ රටේ හිටපු සෝමා දේවිය වෙන්න පුළුවන්, අනුලා දේවිය වෙන්න පුළුවන්, සුගලා බිසව වෙන්න පුළුවන් - ඒ ඕනෑම තැනකින් පටන් ගෙන දරුවන්ට කරුණු කියා දෙන්න. ඒවා ඉතාම වැදගත් ඉතිහාස කරුණු. ඒ ඓතිහාසික කාන්තාවන් සහ වැදගත්, ශක්තිමත්, බලවත් කාන්තා පෞරුෂ පිළිබඳව කරන සාකච්ඡාව දරුවන්ට ගෙනියන අතරේ, අපට පුළුවන් වෙන්න ඕනෑ, සමකාලීන විශිෂ්ට ගැහැනිය ගැන මෙන්ම නූතන විද්වත් කාන්තාව පිළිබඳවත් දරුවන්ට උගන්වන්න. ඒ බලගැන්වීම කියන එක ආර්ථික කාරණයකට ඌනනය කරලා, සාකච්ඡා කරන එක සුදුසු නැති නිසායි මා මේ තරම් මේ මාතෘකාව ඈතට ගෙනියන්න පුළුවන්ද කියලා බලන්නේ. එහෙම නැත්නම් මේ නූතන විද්වත් කාන්තාව පිළිබඳ සාකච්ඡාව මඟ හැරෙනවා. ඒ නිසාම තමයි කාන්තා හිමිකම් පිළිබඳව අතිවිශාල මැදිහත්වීමක් කරපු මේ විශිෂ්ට චරිත හතර අපි සිහිපත් කරන්න ඕනෑ. මේ අය සිහිපත් කරන්න ඕනෑ උදාහරණ සඳහා පමණයි.

මේ පොත් පිංචේ සඳහන් වෙනවා, 20වැනි සියවසේ ශ්‍රී ලංකාවේ දැනුම් නිෂ්පාදනයේ බල කුලුනු 10ක් විතර පිළිබඳව. ඩී.ජේ. විමලසුරේන්ද්‍රගේ ඉඳලා එහි සඳහන් වෙනවා. ඒ අතරේ තමයි ආචාර්ය කුමාරි ජයවර්ධනත් ඉන්නේ. ඇය දැනටත් ජීවමානව සිටින අතිවිශිෂ්ට ශාස්ත්‍රවන්තියක්. ඒ වාගේම තමයි, ගෘහ නිර්මාණ ශිල්පයේ ප්‍රමුඛ කාන්තාව, සමාරම්භක කාන්තාව හැටියට ගැනෙන මිනට් ද සිල්වා මැතිනිය. ඒ වාගේම තමයි, කාන්තා සෞඛ්‍ය පිළිබඳව දකුණු ආසියාවටම, ආසියාවටම විශාල පරමාදර්ශයක් සැපයූ වෛද්‍ය ශිවා චින්නතම්බි මැතිනිය. කාන්තාව බලගන්වන්න වෙන්නේ මෙන්න මේ ගැඹුරු සාකච්ඡාව ඇතුළේ කියන එකයි මගේ කල්පනාව.

අපේ ඇමතිතුමියගේ යෝජනාවට සහාය පළ කරන අතරේම මම අයේෂා රාවුෆ් මැතිනිය ගැනත් කියන්න ඕනෑ. එතුමිය තමයි මුස්ලිම් දැරියන්ගේ අධ්‍යාපනය පිළිබඳව විශිෂ්ටම මැදිහත්වීමක් කරපු කාන්තාව. එතුමිය මුස්ලිම් දැරියන්ගේ අධ්‍යාපන අයිතිය වෙනුවෙන් කොළඹ නගරයේ කොඩි අළෙවි කරමින් අරමුදලක් හදාගෙන 1947දී පාසලක් පටන් ගත්තා. ඉන්පසුව එතුමිය එම පාසලේම විදුහල්පතිනිය බවට පත් වුණා. මෙන්න මේ වාගේ පරමාදර්ශී කාන්තාවන් පිළිබඳ සාකච්ඡාව අධ්‍යාපනය හරහා කුඩා සන්ධියේ ඉඳලාම අපේ දරුවන්ට දායාද කළොත්, කාන්තාව බලගැන්වීම කියන එක ශිෂ්ටාචාරමය කටයුත්තක් හැටියට අප අතට එනවා. එහෙම නැත්නම් පනතකට එකතු කරන සංශෝධනයකින් ඔබ්බට ගිය සාකච්ඡාවක් අපට දියත් කර ගන්න පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තා අයිතිය, ගෞරවය සම්බන්ධයෙන් අපේ රජය අරගෙන තිබෙන විශිෂ්ට පියවර සමඟ අපි ප්‍රායෝගික තලයේ බැඳිලා තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, ගරු ජනාධිපතිතුමා ඇතුළු අප සියලුදෙනා කාලාන්තරයක් තිස්සේ පෙන්වා දෙනවා, කාන්තා හිංසනය සිදු වන තැනක් හැටියට පොදු ප්‍රවාහන සේවය. ඔබ සියලුදෙනා වාගේම මේ ගරු සභාවත් දන්නවා, පොදු ප්‍රවාහන සේවය සම්බන්ධයෙන් අපේ ප්‍රවාහන අමාත්‍යතුමාත්, නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු අපි සියලු දෙනාමත් අරගෙන තිබෙන සාධනීය පියවර පිළිබඳව. මම එයින් එක පියවරක් සිහිපත් කරන්නම්. මෙට්‍රෝ බස් කියන්නේ, පහසුකම් සහිත, ශිෂ්ටත්වය සමඟ බැඳුණු, නව නිර්මාණයක් ඇතුළත තිබෙන්න ඕනෑ බස් සේවාවක්. මෙබඳු බස් සේවාවකදී කාන්තාවන්ට හිංසන සිද්ධ වෙන්න තිබෙන අවස්ථා මඟ හැරෙනවා. පහසුකම් සහිතව, ගෞරවනීය විධියට නිසි ආසනයක වාඩි වෙලා, තදබද නොවුණු බස් රථයක යනකොට කාන්තා හිංසනය සිදු වන එක වැළකෙනවා. එම නිසා කාන්තාව සවිබලගැන්වීම කියන එක අපේ රජය භාර අරගෙන තිබෙන්නේ හුදු කථා බහකට විතරක් අදාළ කර ගත්ත දෙයක් හැටියට නොවෙයි. ඒක මහ පොළොවේ සංවර්ධන ක්‍රියාදාමයන් එක්ක බැඳිලා තිබෙනවා.

ඒ වාගේම මා මේ අවස්ථාවේදී විශිෂ්ට ලේඛිකාවන් ගැනත් මතක් කරන්නට ඕනෑ. ඉන්දියාවේ සිටි කමලා දාස් වැනි විශිෂ්ට ලේඛිකාවක් වෙන්න පුළුවන්, ශාන්ති දිසානායක වාගේ අපේ රටේ ලේඛිකාවක් වෙන්න පුළුවන්. ඔවුන් කුස්සියේ යුද්ධය ඉවර කරලා, දරුවන්ගේ සුමය ඉවර කරලා, දවස කෙළවර තමයි කුස්සියේ තිබෙන මේසයේ කෙළවරක තියාගෙන නව කථා, කෙටි කථා, කවි සහ ගීත ලියන්නේ. ඇයට අතිරේක විවේකයක් සැලසෙන ශිෂ්ට සම්පන්න ජීවිතයක් දායාද කරන්න අපට පුළුවන් නම් එතැනදී තමයි කාන්තාව සවිබල ගැන්වෙන්නේ.

මට නියමිත අවසාන විනාඩි දෙක මම පාවිච්චි කරන්න කැමතියි, තවත් අතිරේක කාරණයක් ඉදිරිපත් කරන්න. ඊයේ මේ සභාව තුළ කියැවුණු යම් කරුණක් මා නිවැරදි කළ යුතු වෙනවා. ඒ කරුණ ඇත්තටම මා කලින් කිව්වා වාගේ අධ්‍යාපනය සමඟ බැඳිලා තිබෙන්නේ. මොකද, නිසි අධ්‍යාපනයක් නොලැබීම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුද්ගලයන් විධියට තමන්ට කරුමයක් වෙනවා වාගේම ඒක සමාජයටත් කරුමයක් වෙනවා. සමහර වෙලාවට ඒක පාර්ලිමේන්තුව කරාත් ඇවිල්ලා තිබෙනවා. ඊයේ පාර්ලිමේන්තුවේදී විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක් සාවද්‍ය තොරතුරක් සභාගත කළා. රාජ්‍ය ආයතනයක සභාපතිවරයෙක් නම් කරලා, මහාචාර්යවරයෙක් නම් කරලා, ඔහු වැටුප් දෙකක් ගන්නා බවට තොරතුරු ඉදිරිපත් කළා. මේක ගැඹුරු සම්ප්‍රදායන් පිළිබඳව, වෘත්තීය මට්ටමක් ගැන නොදැනීම නිසා හෝ කරුණු දැනගෙන මුළා කිරීමේ අදහසින්, අපහාස කිරීමේ අදහසින් ගෙනාපු කාරණයක්. ඒ තමයි, විශ්වවිද්‍යාල මහාචාර්යවරු සප්ත වාර්ෂික නිවාඩු ලබා රාජ්‍ය ආයතනවල හෝ වෙනත් ආයතනවල සේවය සපයා වැටුප් ලබා ගැනීමේ හැකියාව පිළිබඳ පතුරුවා හැරපු බරපතළ ගණයේ බොරුව. මගේ අතේ තිබෙනවා, මේ කාරණය පිළිබඳව මෙසේම අගතියට පත් වුණු මහාචාර්යවරයෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් තොරතුරු දැනගැනීමේ පනත යටතේ කරුණු ඉල්ලා 2026.08.12 දිනැතිව ගෙන්වා ගත් තොරතුරු. ඒකේ තිබෙනවා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති දැනට පවත්නා චක්‍රලේඛ ප්‍රතිපාදන යටතේ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සප්ත වාර්ෂික නිවාඩු හිමි ආචාර්යවරුන් හා නිලධාරින්හට එම කාලසීමාව තුළදී දේශීය හෝ විදේශීය ආයතනයක වෘත්තීය කටයුතුවල නියැළිය හැකි බව. එහි අවසන් කොටසෙන් අහනවා, තමන්ට විශ්වවිද්‍යාලයේ වැටුප ගන්නා ගමන් දෙවනුව සේවයට ගිය ආයතනයේ වැටුප ලබන්න පුළුවන්ද, දීමනා ලබන්න පුළුවන්ද කියලා. එම විමසීමට ලැබුණු පිළිතුර තමයි, සප්ත වාර්ෂික නිවාඩු මත වෙනත් ආයතනවල තනතුරු දරන විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හා නිලධාරින් හට එම ආයතන මඟින් වැටුප් ගෙවීමේදී වැටුපට අමතරව ලබාදෙන ජීවන වියදම් දීමනාව වැනි ව්‍යවස්ථාපිත දීමනාවන් හැර එකී තනතුරට අදාළ වැටුප

ගෙවිය හැකියි කියන එක. ඒ නිසා මේක ඉතා පැහැදිලිව තිබෙන තත්ත්වයක්. ඒ සාවද්‍ය තොරතුරට මම මේ විධියට පිළිතුරු සපයන්නේ මේ හේතුව නිසායි. අපේ රජයේ වගකීම් භාරගෙන වැඩ කරනවා, විශ්වවිද්‍යාලවල වැඩ කරන ප්‍රඥාවන්තයින්. ඔවුන් මේ වාගේ ක්ෂේත්‍රවල වැඩ කරනවා, තමන්ගේ සප්ත වාර්ෂික නිවාඩුව ඇතුළේ. ඒකට සාධාරණයක් ඉටු කරන්න ඕනෑ නිසායි මම මේ කාරණය ඉදිරිපත් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් අවසන් කරනවා. අද දවසේ සාකච්ඡාවට ගන්නේ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය ගැනයි. එය ඉතාම වැදගත් එකක්. ගැහැනියගේ සතුට පැහැර ගත් සමාජයක්, මේක. ඒ නිසා කාන්තාව සවිබල ගැන්වීම සහ නිසි තැන ප්‍රදානය කරනවා කියන්නේ, ඇයගෙන් පැහැර ගත් සතුට ඇයට ලබා දෙන එකයි. ඒක, අධ්‍යාපනය සමඟ බැඳුණු දීර්ඝ කාලීන කටයුත්තක්. ඒ සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග රජය විසින් ඉදිරියේදී ගන්නා බවත්, දැනට රැගෙන තිබෙන බවත් සිහිපත් කරමින්, ගරු අමාත්‍යතුමියගේ යෝජනාවට සහය පළ කරමින් මා නිහඬ වෙනවා. මට කාලය ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Namal Rajapaksa. You have eight minutes.

[අ.භා. 1.42]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද දින විවාදයට ගෙන තිබෙන කාරණයට අදාළව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සහ පඩි වැඩි කිරීම සම්බන්ධයෙන් අපේ විරෝධතාවක් නැහැ. තව වැඩි කරන්න පුළුවන් නම් තව වැඩි කරන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, අර පොත් පිංචක් ගැන කථා කළා නේ. ඔබතුමන්ලා ජනාධිපතිවරණයේදී මුළු රටේම, හැම ගෙදරකටම පොත් පිංචක් බෙදුවා. හැබැයි, ඒ පොත් පිංචෙන් නම් කිව්වා, මේ රටේ රාජ්‍ය සේවකයාගේ පඩිය මාස හයෙන් හයට උද්ධමන අනුපාතිකයට සාපේක්ෂව වැඩි කරනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාස හයෙන් හයට රාජ්‍ය සේවකයාගේ පඩි වැඩි කරනවා කිව්වා, උද්ධමනය අනුව. ඔබතුමන්ලාගේම වාර්තාවලට අනුව අද සියයට 10යි. මේ වෙනකොට ඔබතුමන්ලා ඒ සියයට 10 වැඩි කළාද? *[බාධා කිරීමක්]* ඒක, වෙන පොතක්ලු. හරි, හරි. බෙදපු අය කියවලාත් නැහැ, ඒ පොත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතින් කොහොමද වැඩේ කරන්නේ? ජනාධිපතිතුමා තමයි කයිවාරු ගැහුවේ. නමුත් බෙදපු අයවත් පොත කියවලා නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, ඔබතුමන්ලා මාස හයෙන් හයට උද්ධමනයට අනුව සියයට 10කින් පඩි වැඩි කරන එක කෙසේ වෙතත්, අර සෙවනගල කර්මාන්තශාලාවේ සේවකයින්ට ගෙවපු දීමනාත් නවත්වලා තිබෙනවා. පඩිත් අඩු කරලා, එය වසා දමා තිබෙනවා. අඩු ගණනේ ගෙවපු එකවත් ගෙවාගෙන යන්න. ඒකත් නැහැ, ඒකත් වසා දමලා.

අනෙක් පැත්තෙන්, ගොවි ජනතාව රවට්ටපු රැවටිල්ල බලන්න. රුපියල් 150ට වී කිලෝවක් ගන්නවා කිව්වා. වෙලාවට පොහොර ටික දුන්නේ නැහැ, වතුර ටික දුන්නේ නැහැ. හාල් ඇටයක් පිටරටින් ගෙනෙන්නේ නැහැ කිව්වා. එක පැන් පහරින් හාල් මාෆියාව නවත්වනවා කියලා තමයි ජනාධිපතිතුමා කයිවාරු ගැහුවේ. අන්තිමට මොකක්ද වුණේ? මාස දෙකකට හරියන්න පිටරටින් හාල් ගෙනැල්ලා තිබෙනවා. මේ අවුරුද්දට ගේන්නෙම නැහැ කියලා ඇමතිවරයා කිව්වා. හැබැයි, තවම ගේනවා. තනිකර බොරුව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කාලයේදී උපාධිධාරින්ට ඔබතුමන්ලාගේ පැලවත්තේ කාර්යාලයට එන්න කියලා, ජනාධිපතිතුමාත් වාඩිවෙලා කිව්වා 35,000ටම එකවර රැකියා දෙනවා කියලා. අර පොත් පිංචත් ගෙවල්වලට බෙදුවේ, ඒ කට්ටිය ලව්වා තමයි. ඒ 35,000ම ගෙන්වලා මොකක්ද කිව්වේ? "අපි එකවර රැකියා ටික දෙනවා, හය නැතිව බෙදන්න" කිව්වා. වයස පනත් වෙනස් කරලා හරි, නීති හදලා හරි ගන්නවා කියලා පොරොන්දු වුණා. නමුත් අද වෙනකොට ඔබතුමන්ලා කරලා තිබෙන්නේ මොකක්ද? ඔබතුමන්ලා මේ රටේ උපාධිධාරිනුත් - ඒ 35,000ත්- දේශපාලනික වශයෙන් පාවිච්චි කරලා අතහැර දමා තිබෙනවා.

විදුලි බිල අඩු කරනවා කිව්වා, කෙටි කාලයක් ඇතුළත ජනතාවට දැනෙන්න. රුපියල් 9,000ක විදුලි බිල රුපියල් 6,000ට බස්සනවා කිව්වා. රුපියල් 6,000ක විදුලි බිල රුපියල් 4,000ට ගෙනෙනවා කිව්වා. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? රුපියල් 6,000ක විදුලි බිල රුපියල් 4,000ට ගෙනෙන එක කෙසේ වෙතත් රුපියල් 6,000ක විදුලි බිල රුපියල් 8,000ට ඉහළ ගිහින් තිබෙනවා. අඩු කරන එක කෙසේ වෙතත්, විදුලි බිල වැඩි කරන එක නම් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රුපියල් 6,000ක බිලක් ආපු කෙනාට දැන් රුපියල් 8,000ක් ගෙවන්න වෙලා තිබෙනවා.

ඒ කාලයේ කිව්වා, නැවෙන් බාන ගණනට තෙල් දෙනවා කියලා. එහෙම නේද? ඇමතිට රුපියල් 150ක කොමිස් එකක් යනවා කිව්වා. ඒ කොමිස් එක අපි පැය 24න් නවත්වනවා කිව්වා. නවත්වලා මිල අඩු කරනවා කිව්වා. තෙල්වල බදු සම්පූර්ණයෙන් අයින් කරලා තෙල් මිල අඩු කරලා දෙනවා කිව්වා. දැන් මොකක්ද වුණේ? තෙල් මිල අඩු කළාද? එදා ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගත් කාලයටත් වඩා රුපියල් 30ක් වැඩියෙන් අද බදු ගහනවා. දැන් කොමිස් එක රුපියල් 180ද කියලා තමයි ඔබතුමන්ලාගෙන් අහන්න වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධීවරයාට කිව්වා නේ, මාළු ඉන්න තැන SMS එකකින් කියනවා කියලා. SMS එකක් ගැහුවාම මාළුවා ඉන්න තැන කියනවා කිව්වා. මට පෙනෙන්නේ දැන් ඒ app එක දීලා තිබෙන්නේ මාළුවාට. මාළුවාට app එක දීලා SMS එක ගහනවා, "මෙන්න ධීවරයා එනවා, දැන් වෙන තැනකට පලයන්" කියලා. ඇයි, මෙහෙම ජනතාව රවටන්නේ? ඔබතුමන්ලා මේ පොරොන්දු ඉෂ්ට කරන්නේ නැති එකේ බලාපොරොත්තුව මොකක්ද? Vitz කාර් එකක් දෙනවා කිව්වා, රුපියල් ලක්ෂ 12ට. දැන් ඇමතිවරයා කියනවා, එහෙම එකක් කිව්වේ නැහැයිලු. අන්න, මරික්කාර් මන්ත්‍රීතුමා ගිය සතියේ පාර්ලිමේන්තුවේදී හඬපටයක්ම දාලා ඒ ගැන ඇහෙන්න සැලැස්වුවා. ජපානයෙන් බයිසිකල් ගෙනැල්ලා දෙනවා කිව්වා. අත්‍යවශ්‍ය ආහාරවලට, බෙහෙත්වලට, පාසල් උපකරණවලට තිබෙන VAT එක අයින් කරනවා කිව්වා. තොරතුරු තාක්ෂණ සේවය ප්‍රවර්ධනය කරන්න, ඩොලර් උපයන්න, තරුණයන්ගේ රැකියා උත්පාදනය කරන්න - රැකියා නිර්මාණය කරන්න - tax එක අයින් කරලා දෙනවා කිව්වා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, අද වනකොට මේ එකක්වත් කරන්න තමුන්නාන්සේලාට හැකියාව ලැබී නැහැ. ඒ විතරක් නොවෙයි. දිනෙන් දින බදු වැඩි කරනවා. ජනතාවට දරාගන්න බැරි වන

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

විධියට මේ රටේ බදු වැඩි කරනවා. මුදල් අමාත්‍යාංශයේ රුපියල් කෝටි ගණන් තිබෙනවා කියලා ජනාධිපතිතුමා නම් කියනවා. හැබැයි, ගමට ගියාම ගමේ වැඩක් සිදුවන බවක් නම් පෙනෙන්න නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ කාලයේ පටන් ගත්තේ හොරු අල්ලන්න නේ. ඒක නේ ඔබතුමන්ලාගේ මහ ලොකු සටන් පාඨය. බාල ගල් අඟුරු ගෙනාවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බාල ගල් අඟුරු නැව් 19ක් ගෙනාවා. නැව් 19ක් ගෙනාවා විතරක් නොවෙයි, ආපු නැව් 19න් මෙට්‍රික්ටොන් 120,000ක් අතුරුදහන්. මෙට්‍රික්ටොන් 120,000ක් කියන්නේ, රුපියල් කෝටි 462ක් වටිනා ගල් අඟුරු අතුරුදහන්. ඒ කියන්නේ මොකක්ද? ඔබතුමන්ලා නැව් 2ක් අතුරුදහන් කරලා. ජනාධිපතිතුමා කිව්වේ කාලා බලලා නොවෙයි ගත්තේ කියලා නේ. ඉතින් අපිත්, රටේ ජනතාවත් හිතුවා, හරි, කාලා බලලා නැහැ, ගත්තාට පස්සේ තමයි කාලා තිබෙන්නේ කියලා. බලනකොට ගත්තාට පස්සේත් කාලා, ගෙනාපු නැව් දෙකකුත් ගිලලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් කවුද මේ ගල් අඟුරු නැව් දෙක ගිල්ලේ? මේ වාර්තාවලට අනුව ගල් අඟුරු මෙට්‍රික්ටොන් 120,000ක් අතුරුදහන්, ගෙනාපු නැව් 19න්. ගෙනාවාට පස්සේත් කාලා, ගෙනෙන්න කලිනුත් කාලා.

හැකර් කෙනෙක් පැන්නා කිව්වා, ඩොලර් මිලියන 2.5ක් අතුරුදහන්. ඒ මුදල ගිය තැනක් නැහැ. පෞද්ගලික බැංකුවලින් කෝටි, ප්‍රකෝටි ගණන් අතුරුදහන්. මේවා පිටුපස කවුද ඉන්නේ? මේ ඉස්සරහා වාඩිවෙලා ඉන්න ලොකු ඇමතිවරු ද කියලා සැකයකුත් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Namal Rajapaksa, with an extra one minute, you have a total of three minutes left.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් මේ ඉස්සරහා වාඩිවෙලා ඉන්න, ටයි, කෝට් දමාගෙන ඉන්න අය මේවා පිටුපස ඉන්න බවක් පෙනෙනවා. එහෙම නැත්නම් ඉතින් ඩොලර් මිලියන 2.5ක් වැරදි account එකකට වැටෙන්න විධියක් නැහැ නේ, මන්ත්‍රීතුමා? මෙච්චර කල් උණ්ඩියල් කරලා පිට රට යවනවා කියපු බිලියන ගණන් එකපාරම මේ රටවලට යන්න විධියක් නැහැ නේ. පෞද්ගලික අංශයේ බැංකුවල මුදල් මේ ආණ්ඩුව ආවාට පසු වැරදි ගිණුම්වලට වැටෙන්න විධියක් නැහැ නේ. එහෙනම්, මේවා පිටුපස කවුද ඉන්නේ?

කන්ටේනර් 323ක් පැන්නුවා. පසුගිය දවස්වල කුඩු කන්ටේනරයක් ඇල්ලුවා වරායේදී. ඒ, අයිස් කියන මත්ද්‍රව්‍යය කන්ටේනරයක්. මොකක්ද කළේ? ඒක අල්ලපු නිලධාරියාට විරුද්ධව පරීක්ෂණයක් කරනවා; DIGට විරුද්ධව පරීක්ෂණයක් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි ඇත්ත. නුවරඑළියේ අයිස් මත්ද්‍රව්‍යය හදන ෆැක්ටරියක් තිබෙනවා කිව්වා. කෝ, ඒ ෆැක්ටරිය? කන්ටේනර් 323ක් පන්නන එක අල්ලන්නේ නැහැ. ඇයි කන්ටේනර් 323 පැන්නුවේ කියලා කටඋත්තර ලියන්නේ නැහැ. කුඩු කන්ටේනරයක් ඇල්ලුවාම, ඒක අල්ලපු කෙනාගේ කටඋත්තරය ලියාගන්න එකෙන්, ඔහුට විරුද්ධව පරීක්ෂණයක් කරන එකෙන් හිතාගන්න පුළුවන් නේ, කවුද කන්ටේනර් 323 පැන්නුවේ කියලා. ඒ වාගේම හිතාගන්න පුළුවන් නේ, මොනවාද ඒකේ තිබුණේ කියලා. එක කන්ටේනරයක බිලියන 8ක බඩු තිබුණා නම්, කන්ටේනර් 323ක කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කන්ටේනර් අල්ලපු මනුස්සයා ගැන පොලීසියෙන් පරීක්ෂණයක් කරනවා නම් ඉතුරු කන්ටේනර් 322 කොහොමද කියලා හිතාගන්න පුළුවන්. අපි ආණ්ඩුවට කියන්නේ මෙයයි. අපි අනුරාධපුරයේ රැස්වීම කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආණ්ඩුවේ බොරුවලට, මේ ආණ්ඩුවේ වංචාවලට, මේ ආණ්ඩුවේ හොරකම්වලට විරුද්ධව පක්ෂ භේදයකින් තොරව මේ රටේ දහස් ගණනක පිරිසක් අනුරාධපුරයට එකතු වනවා. මේ මර්දනයට බය වෙලා අපි ඒ ජන සටන අත හරින්නේ නැහැ. ආණ්ඩුවේ සුපුරුදු දේශපාලන න්‍යාය පත්‍රය දාලා අධිකරණ පෙන්වලා, බන්ධනාගාර පෙන්වලා විපක්ෂය මර්දනය කරන්න පුළුවන් කියලා ආණ්ඩුව හිතනවා නම්, එහෙම නම් ආණ්ඩුවට වැරදිලා. අපට ground එකක් දුන්නේ නැහැ නේ; අපි ඉල්ලපු ground එක දුන්නේ නැහැ. ඔබතුමන්ලා හිතනවා නම් ඒ විධියට විපක්ෂය මර්දනය කරලා අපේ ජන සටන නවත්වන්න පුළුවන් කියලා, ජනතාවගේ නැඟිටීම නවත්වන්න පුළුවන් කියලා, ආණ්ඩුවටත් වැරදිලා.

මම අහගෙන එක මන්ත්‍රීවරියක් කියනවා, ජනාධිපතිතුමා බලන්න මිනිස්සු කානු දිගේ එනවා කියලා. ඒ, අර ආපු ගැරඬියා ද දන්නේ නැහැ. ඊළඟට කියනවා, ජනාධිපතිතුමාගේ පින්තූර කිරිවලින් නාවනවාලු. ඉතින් ඔබතුමන්ලා බලාගෙන ඉන්න, කානු දිගේ ගැරඬි එයි. මම තව කථා කරන්න ගියොත් තව මොනවා කටින් පනීවි ද දන්නේ නැහැ. එම නිසා මම මීට වඩා කාලය ගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම අවසාන වශයෙන් ආණ්ඩුවට කියන්නේ මෙයයි. ඔබතුමන්ලා මේ රටේ ජනතාවට දුන් පොරොන්දු තිබෙනවා. කරුණාකරලා ඔබතුමන්ලාගේ මේ බොරුව, ඔබතුමන්ලාගේ දූෂණය නවත්වලා ඒ පොරොන්දු ඉටු කරන්න. දැන් අවුරුදු දෙකක් ගිහිල්ලා ඉවරයි. ඒ අවුරුදු දෙක සමරන්න, වටේ ගිහිල්ලා, රස්තියාදු ගහලා, රැස්වීම් තියලා වරායට එන බෝට්ටු ටිකත් නවත්වලා ජනාධිපතිතුමා ගිහින් රැස්වීම් තියලා අධි ආරක්ෂිත කලාපයක් කරලාත් කානුව ඇතුළෙන් ගැරඬියා රිංගනවා නම් ආණ්ඩුව ගැන හිතාගන්න පුළුවන් නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Hemali Weerasekara. You have 10 minutes.

[අ.භා. 1.52]

**ගරු හේමාලි වීරසේකර මහත්මිය (නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. (Mrs.) Hemali Weerasekara - Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යුහය, ආර්ථික විභවය හා ආයතනික ස්වාධීනත්වය සම්බන්ධයෙන් මූලික වැදගත්කමක් ඇති යෝජනාවක් අද මෙම ගරු සභාව වෙත ඉදිරිපත් කරලා තිබෙනවා. මෙම පාර්ලිමේන්තුව 2024 අංක 37

දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත සම්මත කිරීමෙන් හුදෙක් නීතිමය ලේඛනයක් සම්මත කිරීමක් පමණක් නොවෙයි සිදු කෙරුණේ. ඒ මඟින් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 52කට වැඩි ප්‍රමාණයක් වන කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධන කිරීම සඳහා ස්වාධීන නීතිමය රාමුවක් අප විසින් ස්ථාපිත කරනු ලැබුවා. කාන්තාවන් සවිබල ගැන්වීම කියන්නේ තවදුරටත් පුණ්‍ය කටයුත්තක් නොවෙයි. එය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිය හා තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ආර්ථික අවශ්‍යතාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ජනගහනයෙන් සියයට 52කට ආසන්න පිරිසක් කාන්තාවන් වුණත්, අධ්‍යාපන ජයග්‍රහණ ඉහළ මට්ටමක තිබුණත්, කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය තවම සියයට 32ක, සියයට 35ක මට්ටමක තමයි තිබෙන්නේ. ඉන් භාවිතයට නොගන්නා ආර්ථික හැකියාව ප්‍රයෝජනයට ගැනීම දිගු කාලීන ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍යයි. ඒ වාගේම සමාන කාර්යයන් සඳහා සමාන වැටුප්, රැකවරණය, ආර්ථිකය විධිමත් කිරීම වාගේම විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යවසායිකාවන් ආරක්ෂා කිරීම වාගේ ව්‍යුහාත්මක ගැටලු විසඳීමත් එම පනත හරහා සිදු වනවා. ඒ වාගේම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදු වන ප්‍රචණ්ඩත්වය, රැකියා ස්ථානවල හිංසනය හේතුවෙන් ඵලදායිතාව අහිමි වීම වැනි දේ සඳහා කොමිෂන් සභාව මඟින් කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට නීතිමය සහන ලබා දෙමින්, අවශ්‍ය මැදිහත් වීම් සිදු කරනවා. මෙම ආයතනික ව්‍යුහය කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය - CEDAW - යටතේ ශ්‍රී ලංකාව සතු වගකීම් ඉටු කරන්න මැදිහත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විධියට කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ කැපවීම ක්‍රියාත්මක කිරීම සඳහා යන්ත්‍රණයක් සකස් කර තිබෙනවා. ඒ වාගේම කාන්තා අයිතිවාසිකම් තවදුරටත් තහවුරු කිරීම සඳහා සංශෝධිත ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත් කෙටුම්පත ඇතුළු නව නීති සම්පාදනය කිරීම මේ වනකොටත් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම හිංසනයෙන් වින්දිත කාන්තාවන් වෙනුවෙන් මුළු දිවයිනම ආවරණය වන පරිදි කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පහසුකම් සැලසීම සඳහා සැලසුම් කරමින්, ඒ සඳහා රැකවරණ මධ්‍යස්ථාන සාදා තිබෙනවා. ඒ 11වැනි කාන්තා රැකවරණ මධ්‍යස්ථානය පසුගිය වසරේ නුවරඑළියේදී විවෘත කරනු ලැබුවා.

කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සහ දේශීය ආර්ථිකය වෙනුවෙන් කාන්තාවන්ගේ සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා පසුගිය වසරේත්, මේ වසරේත් ව්‍යාපෘති 500කට අධික ප්‍රමාණයක් සැලසුම් කරලා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිකුත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ එක්කම පසුගිය වසර 10ක කාල සීමාව තුළ, ඒ කියන්නේ 2015.06.30වැනි දායින් පසුව ආයතනික රැකවරණයෙන් ඉවත්ව විවාහ වෙලා සිටින, එහෙම නැත්නම් විවාහ වීමට අපේක්ෂාවෙන් හෝ පසුවන ආයතනගතව සිටි තරුණ තරුණියන් හෝ ජීවන උපායක් නොමැතිවීම හේතුවෙන් තවදුරටත් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල රැඳී සිටින අවුරුදු 18 ඉක්ම වූ තරුණ පිරිස්වලට - විශේෂයෙන්ම කාන්තාවන්ට - නිවසක් තනා ගැනීම සඳහා මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහනට දත්ත එකතු කිරීම පසුගිය වසරේ සිදු වුණා. ඒ අනුව එවැනි අයට නිවසක් තනා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 20ක මූල්‍ය පරිත්‍යාගයක් සිදු කරන වැඩසටහන මේ වසරේ ක්‍රියාත්මක වනවා. එළඹෙන 17වැනි දා ජනාධිපතිතුමාගේ සුරතින් ගම්පහ, කොළඹ, කළුතර දිස්ත්‍රික්කවලදී රුපියල් ලක්ෂ 20ක නිවාස ආධාර ලබා දෙන එම වැඩසටහන ක්‍රියාත්මක වනවා. එම වැඩසටහන සඳහා විශේෂයෙන්ම මව්වරුන් ඇතුළු කාන්තාවන් තේරී පත්ව සිටිනවා. මම සතුටින් කියන්න කැමැතියි, මගේ ආසනයේත් ඉතාම කුඩා දරුවන් සිටින මව්වරුන් දෙදෙනෙක් සහ තරුණියක් මේ සඳහා තේරී පත්ව තිබෙන බව.

ඒ වාගේම අක්‍රියව පැවති ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයට අයත් ග්‍රාමීය සංවිධාන ව්‍යුහය වන කාන්තා කාර්යාංශ සංවිධානය නැවත ප්‍රතිෂ්ඨාපනය කරලා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවක ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීමත් මේ වන විට අවසන් කරලා තිබෙනවා. ඒ හරහා කාන්තාවන්ගේ ව්‍යවසායකත්වය බලගැන්වීම, නායකත්වය සඳහා සූදානම් කිරීම, කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම සහ රටේ ආර්ථික සංවර්ධනයට කාන්තා ශක්තිය එකතු කිරීම දැන් සිදු වෙමින් පවතිනවා. අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන මඟින් කාන්තාවන් හා දරුවන් වෙනුවෙන් ලබා දෙන සේවා වඩාත් කාර්යක්ෂම කිරීම, ජනතාවට සමීප වීම පහසු කිරීම හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය සේවා ඩිජිටල්කරණයට ලක් කිරීමේ වැඩසටහනට සමගාමීව කාන්තාවන් හා ළමයින් පිළිබඳව පුළුල් ජාතික දත්ත පද්ධතියක් සකස් කිරීම ආරම්භ කරලා එය ක්‍රියාවේ යෙදවෙමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම රුපියල් 5,000ක්ව පැවති පෙර පාසල් ගුරුවරියන් සඳහා ලබා දෙන "ගුරු අභිමානී දීමනාව" රුපියල් 6,000 දක්වා වැඩි කිරීමක් සිද්ධ කරලා තිබෙනවා. ඒ වාගේම "දිරිය මංපෙත" ජීවනෝපාය සංවර්ධන වැඩසටහන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් කේවල් හා කණ්ඩායම් වශයෙන් ව්‍යාපෘති සිදු වෙමින් පවතිනවා. ව්‍යවසායිකාවන් සඳහා වෙළෙඳ පොළක් නිර්මාණය කරලා තිබෙනවා, "ලිය ශක්ති අළෙවි පොළ" කියලා. ඒ වාගේම ආර්ථිකයට කාන්තා සහභාගිත්වය සඳහා පවතින විශාලම අභියෝගය වන දරුවන් හා වැඩිහිටියන් රැක බලා ගැනීමේ වගකීමට පහසුව සපයමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන මට්ටමින් රැකවරණ සලසන්නන්ගේ ජාලයක් සකස් කිරීමත් සිදු වනවා. එමඟින්ම පුහුණුව ලත් රජයේ ලියාපදිංචි විශ්වසනීය රැකවරණය සලසන්නෙකුගේ සේවය පහසු මිලකට ලබා ගත හැකි අතර විරැකියා ප්‍රශ්නයට රැකියා අවස්ථාවක්ද නිර්මාණය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සඳහා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" සංකල්පයට අනුව ග්‍රාමීය ප්‍රජාව හා අඩු ආදායම්ලාභීන් ඉලක්ක කරගෙන සිදු කරන "ප්‍රජා ශක්ති" වැඩසටහන මඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් උසස් කිරීම වාගේම ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් අවශ්‍ය සහන ලබා දීම, ඔවුන්ගේ ආර්ථිකය, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග රැසක් ද රජය මඟින් ආරම්භ කරලා තිබෙනවා. මේ යටතේ සෑම සංවර්ධන නිලධාරියෙක් හරහාම වසමේ සවිබල ගැන්විය යුතු පවුල් 50ක් තෝරා ගනිමින් සමෘද්ධි බැංකු මඟින් සිදු කරන ක්‍රියාවලිය හරහාද, ප්‍රජා ශක්ති ප්‍රජා සංවර්ධන වැඩසටහන මඟින් සිදු කරන ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීමේ ව්‍යාපෘති හරහාද සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය සඳහා වැඩි වශයෙන් කාන්තාවන් පාදක වන බවත් මම කියන්න කැමැතියි.

[ගරු හේමාලි වීරසේකර මහත්මිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවක් කියන්නේ තවත් එක් තනි පුද්ගලයෙක් නොවෙයි. ඇය දරුවන්, සැමියා, දරු පවුල, දෙමව්පියන්, සහෝදර සහෝදරියන් කියන සමාජයේ බැඳීම් ගණනාවක් එක්ක ජීවත් වන, ඒ බැඳීම් එක්ක ගැට ගැහුණු කෙනෙක්.

මේ වනතුරු රජය මඟින් ක්‍රියාත්මක කරන සියලු සංවර්ධන කටයුතු මඟින් සිද්ධ වන, ඒ කියන්නේ දරුවන්, ශිෂ්‍යයන්, වෘත්තිකයන්, වැඩිහිටියන් වෙනුවෙන් සිදු කරන සෑම සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියක් හරහාම සෘජුව හෝ වක්‍රව කාන්තා සවිබල ගැන්වීම සිදු වන බව මම මේ වෙලාවේ කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 13 වගන්තිය යටතේ කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් සඳහා වේතන වැඩි කිරීමේ යෝජනාව පැත්තට නැවත හැරුණොත්, ශක්තිමත් හා ස්වාධීන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් සඳහා ආයෝජනය කිරීම තුළින් ආර්ථික ඵලදායීතාව, සමාජ සාධාරණත්වය හා යහ පාලනය සඳහා දිගු කාලීන ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන්. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම දරන පුද්ගලයන් සඳහා නිසි වේතන හා දීමනා ලබා දීම මෙම වැදගත් නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍ය පියවරක්. එබැවින්, මෙම වේතන හා දීමනා සම්බන්ධ තීරණය මෙම ගරු සභාව අනුමත කරන ලෙසත්, සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ පූර්ණ සහයෝගය ඊට ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana. You have six minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.02]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද දිනයේදී සාකච්ඡාවට ගැනෙන මේ කාන්තාවන් සවිබලගැන්වීම කියන කාරණය ඉතාම වැදගත් කාරණාවක්. මොකද, අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් කාන්තාවන්. ඒ වාගේම මේ රටේ ආර්ථිකය සවිබලගන්වන්නත් කාන්තාවන් දායක වෙනවා. ඒ අයගේ සුබසිද්ධිය සඳහාත්, ආරක්ෂාව සඳහාත් කටයුතු කිරීම වැදගත්. ගෙදර බුදුන් අම්මා හැටියට අපි කාන්තාවට තමයි ප්‍රමුඛස්ථානය ලබා දෙන්නේ. පවුලක් ආරක්ෂා කරන්නේ, පවුල කළමනාකරණය කරන්නේ කාන්තාවන්. ඒ නිසා කාන්තාවන් වෙනුවෙන් කරන ඕනෑම හොඳ කටයුත්තකට සහයෝගය අප ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා තුන් වතාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරපු මට අද උදෑසන සිදු වෙච්ච සිදුවීම පිළිබඳව නම් ලොකු කනස්සල්ලක් ඇති වුණා. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කථා කිරීමේ අයිතිය වාගේම අදහස් දැක්වීමේ අයිතිය ඉතිහාසයේ ඉඳන් ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ අයිතිය කථානායකවරයා කියන පුද්ගලයාගෙන් ලැබිලා තිබෙනවා. කථානායකවරයා ඒකපාක්ෂික නැහැ. කථානායකවරයා ස්වාධීන පුද්ගලයෙක් හැටියට තමයි අපි හඳුන්වන්නේ. විශේෂයෙන්ම එතුමා රටේ තුන්වන පුරවැසියා හැටියට සලකනවා. හැබැයි, අද මොකක්ද සිදු වුණේ? දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා යම් කාරණාවක්, වරප්‍රසාද කඩවීමක් ඉදිරිපත් කරනකොට ඒක නතර කරන්න, එතුමාගේ මයික්‍රෆෝනය off කරන්න කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව වරප්‍රසාද ප්‍රශ්නයක් යම් මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කළොත්, ඒකට අවශ්‍ය කරන ඉඩහසර ලබා දෙනවා, කාලය ලබා දෙනවා. හැබැයි, අද උදෑසන සිදු වුණු මේ සිදුවීම ඉතාම කනගාටුදායකයි. මොකද, මේ ආණ්ඩුව තේරී පත් වුණේ, බලයට ආවේ system change කරනවා කියලා. ඒ කියන්නේ, මේ තිබෙන system එකට වඩා හොඳ system එකක් මේ රටේ ඇති කරනවා කියන අදහස තුළ තමයි මේ ආණ්ඩුව බලයට ආවේ. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ? මේ තිබෙන system එකත් විනාශ කරමින් යනවා.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වේ මේකයි. විශේෂයෙන්ම ගරු කථානායකතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ පැමිණිල්ල මේ මොහොතේදී විභාග වෙමින් පවතිනවා. දූෂණ විරෝධී පනතේ 107වන වගන්තිය අනුව එතුමාට හැකියාවක් නැහැ, තමන් ගැන විමර්ශනයක් සිදු වනකොට, තමන් ගැන චෝදනාවක් ඉදිරිපත් වෙලා තිබෙනකොට ගරු කථානායකවරයා හැටියට කටයුතු කරන්න. එතැන පැහැදිලිව conflict of interest එකක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ යම් නිලයක්, ඇබෑර්තුවක් - vacancy එකක් - තිබුණොත් ඒ සඳහා නිලධාරීන් පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කටයුතු කරන්නේ ගරු කථානායකතුමාගේ ප්‍රමුඛත්වයෙන්. එතකොට එතුමාට ඒ නිලධාරීන් පත් කිරීමේ අවකාශය තිබෙනවා. එතුමා පිළිබඳවම එම ආයතනයේ විමර්ශන සිදු වෙනවා නම්, ඒ තනතුරට කෙනෙක්ව පත් කරන්නට එතුමාටත් හැකියාව ලැබෙනවා නම්, එතැන පැහැදිලිවම conflict of interest එකක් තිබෙනවා. ඒ නිසා තමයි අපි පැහැදිලිවම කියන්නේ මේ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියලා. ඒ විතරක් නොවෙයි, දැන් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එනවා. ඒ වාගේම දූෂණ විරෝධී පනතේ සංශෝධන එනවා. මේවා එනකොට අර චෝදනාව තිබෙන පුද්ගලයාම නඩු අහනවා නම්, පැහැදිලිවම එතැන වෙන්නේ conflict of interest එකක්. ඒකයි අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මේ කාරණය පැහැදිලි කළේ. හැබැයි, එතුමාට ඒ අවස්ථාව නොදී ඉතාම ඒකාධිපති ආකාරයට එතුමාගේ මයික් එක off කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,

අපි ඒක හෙළා දකිනවා. අපි ඒකයි කිව්වේ, ව්‍යවස්ථාදායකය, විධායකය සහ ගරු අධිකරණය යන මේ කුලුනු තුන ඉතාම වැදගත්, අධිකරණය ස්වාධීනව තිබිය යුතුයි කියලා. හැබැයි, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා අධිකරණයේ බලයත් තමන්ගේ අතට ගන්න ආණ්ඩුව ඒකාධිපති ආකාරයට කටයුතු කරනවා කියන එක අපට පෙනෙන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මාතෘකාවට අදාළ නොවුණත් මම මේ කාරණයත් කියන්න ඕනෑ. කටාන ආසනයේ ග්‍රාමවාසීන් කිහිපදෙනෙක් ඇවිල්ලා මාව මුණ ගැහුණා. සීදූව, කටුනායක ප්‍රදේශයේ කර්මාන්තශාලාවක් නිසා තමන්ගේ ජන ජීවිතයට සහ ඒ ප්‍රදේශයට යම් අපහසුතාවක් ඇති වෙලා තිබෙනවා කියලා ඒ අය ප්‍රකාශ කර සිටියා. අපි රජයෙන් ඉල්ලා සිටිනවා, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. අපි සංවර්ධනයට විරුද්ධ නැහැ. හැබැයි, ඒ සිමෙන්ති කර්මාන්තශාලාව තුළින් යම් පාරිසරික හානියක් හෝ යම් ගැටලුවක් ඒ ප්‍රදේශයේ ජනතාවට ඇති වෙනවා නම් ඒ පිළිබඳව මැදිහත් වෙලා ආණ්ඩුවේ වගකීම ඉෂ්ට කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අතුල වෙලඳගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.08]

**ගරු අතුල වෙලඳගොඩ මහතා**
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාන්තාවන් සවිබලගැන්වීමේ පනත යටතේ අද දවසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව ඉතාම වැදගත්, කාලෝචිත එකක් වාගේම, ඒ සඳහා සුදුසුම අවස්ථාව දැන් නිර්මාණය වෙලා තිබෙනවාය කියලා අපි හිතනවා. ඒ කාර්යය ඉටු කරගැනීමේදී සෑහෙන කාලයක් පුරා අපේ රටේ විවිධ කාන්තා සංවිධාන විසින් විවිධ කාන්තා අරගළ සිදු කළ බව අපි දන්නවා. ඒ සියල්ල කොතෙක් සැලකිල්ලට ලක් වුණත්, අපේ රටේ අගමැති තනතුරට කාන්තාවක් පත් වෙච්ච, පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරියන් 20කට වැඩි ප්‍රමාණයක් පළමුවැනි වතාවට තේරී පත් වුණු, ඒ ගෞරවනීය පසුබිම නිර්මාණය වුණු කාලයක එවැනි ආණ්ඩුවකින් මේ කාර්යය සම්පූර්ණ කර ගැනීමට අපට හැකි වුණා. අපි රටක් විධියට සෑම ක්ෂේත්‍රයකම පුනරුදයක් ඇති කරමින්, සෑම ක්ෂේත්‍රයකින්ම ජයග්‍රහණ ලබා ගනිමින් තිබෙනවා. ඒ වෙනුවෙන් වෙහෙස මහන්සි වුණු හැමෝටම සතුටු වෙන්න පුළුවන් අවස්ථාවක් බවට මේ අවස්ථාව පත් වෙලා තිබෙනවාය කියලා මම හිතනවා. අපේ රටේ කාන්තාව සවිබලගැන්වීම කියන කාරණාව කෙසේ වෙතත්, යම් යම් දිස්ත්‍රික්කවලට ගියාම අපි දැක්කේ, ග්‍රාමීය දුප්පත්කම පිටුදැකීම සඳහා වෙච්ච විවිධ ව්‍යාපාර ඇතුළේ බොහෝ වෙලාවට කාන්තාව මෙවලමක් බවට පාවිච්චි කරගන්නා ආකාරයයි. එහෙම පොරොන්දු දීපු ඉතිහාසයක් තිබුණා.

වැසිකිළි පෝච්චියක්, ටකරන් තහඩුවක්, පොල් පැළයක්, ආහාර මල්ලක් වැනි දෙයක් පොඩි ෆෝම් කැබැල්ලකට සීමා කරපු ඉතිහාසය වෙනස් කරලා, ඒ කිසිවක් නොදී අලුත් ආණ්ඩුවක් නිර්මාණය කර ගැනීමේදී, සියලු ජනතාව සවිබලගන්වමින් සියයට 52ක් වෙච්ච අපේ රටේ කාන්තාවට විශේෂ වගකීමක් පසුගිය මැතිවරණයේදී පැවරුවා. ඒ අනුව තමයි "ගැහැනු අපි එක මිටට" කියන සංවිධානය බිහි වුණේ. එය සංවිධානාත්මක විධියට මුළු රටේම පැතිරිලා, ග්‍රාම සේවා වසම් 14,000කට වැඩි ප්‍රමාණයක් තිබෙන අපේ රටේ සංවිධානාත්මක බලවේග ලෙස බිහි වෙද්දී ඒ රැවටීමේ දිශාවට ගිය ගමන වෙනස් කරන්නත් කාන්තාවන් විශාල දායකත්වයක් සැපයුවා කියලා මම හිතනවා. ඒ අනුව ඔවුන් ලබා ගත්ත සුවිශාල ජයග්‍රහණයක් විධියට තමයි අපි මේක දකින්නේ.

මේකෙදි කාන්තාවන් වෙනුවෙන් කොමිෂන් සභාවක් නිර්මාණය කරගැනීම දක්වා වූ ගමනක් ඇවිත් තිබෙනවා. අද දවසේ ඒ කොමිෂන් සභාවේ සභාපතිනිය, සාමාජික පිරිස වෙනුවෙන් පාරිශ්‍රමික සහ දීමනා ගෙවීම පිළිබඳ තීරණය මේ සභාවට ඉදිරිපත් කර තිබෙනවා. දරුවන් ඇතුළු අපේ රටේ අම්මලා, අක්කලා, නංගිලා - සහෝදරියන් - යන සියලු දෙනාට තමන්ගේම වෙච්ච මේ පාලනය ඇතුළේ තමන්ට ඇති වන ගැටලු සහ තමන්ගේ යෝජනා, අදහස් නෛතික වශයෙන් ඉෂ්ට කරගත හැකි වන පරිදි ස්ථාපිත වූ ආයතනයක් සකස් කරගැනීම අපි කවුරුත් සතුටට පත්වෙන කරුණක් බවට පත් වෙනවා කියලා මම හිතනවා. මේ කාර්යය වෙනුවෙන් අපේ වත්මන් රජයේ අගමැතිතුමිය ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයටත් මා මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය දවස්වල පොඩි සාකච්ඡාවක් ඇති වුණා ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන ඇති කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව. එම ක්‍රියාවලිය අපේ රටේ පටන් ගත්තා. ප්‍රජාව වෙනුවෙන් ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන 1,000ක් නිර්මාණය කරගැනීමේ කටයුත්තට ආණ්ඩුව මැදිහත් වෙලා තිබෙනවා. මේ වනවිට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන දෙකක් වීරකැටිය සහ බෙලිඅත්ත යන ප්‍රදේශවල ක්‍රියාත්මක වෙනවා. පසුගිය පළමුවැනිදා වලස්මුල්ල, ඕමාර ප්‍රදේශයේ එම මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා මුල්ගල තිබ්බා, අපේ සඳරුවන් මන්ත්‍රීතුමා විසින්. පසුගිය දවස්වල විපක්ෂයේ අය මේ ක්‍රියාවලිය පිළිබඳව කිසිම අගක් මුලක් නැතිව කථා කරන ආකාරය අපි දැක්කා. ළදරු විපක්ෂය, නොමේරූ විපක්ෂය කිසිම ප්‍රතිපත්තියකින්, දැක්මකින් තොරව තමන්ගේ ලාභ, බාල අදහස් සමාජගත කරන ක්‍රියාවලිය අවසන් වෙලා නැහැ කියලායි මම හිතන්නේ. ඒ අනුව මේකත් හැල්ලුවට අරගෙන කථා කරනවා මිස අපේ රටේ ප්‍රජාවට ක්‍රමානුකූලව ලැබෙන මේ ප්‍රජා සත්කාරය වෙනුවෙන් ඇත්ත අදහස කියන්නේ නැහැ. මම හිතන විධියට ඒක ඔවුන්ගේ ස්වභාවය; විධිය. නමුත් අපි ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

ඇත්තටම මේ මධ්‍යස්ථාන ආරම්භ කරන්නේ ප්‍රජාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම වෙනුවෙන්. ප්‍රජාවට අවශ්‍ය කරන ඒ ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවන්න අපි හඳුනා ගන්නේ ළඟම රෝහලේ සිට කිලෝමීටර තුනකට, හතරකට වඩා දුරින් තිබෙන, 5,000-10,000 අතර ජන සනත්වයක් තිබෙන ප්‍රදේශයක්. මූලික වශයෙන් සෞඛ්‍ය සම්බන්ධයෙන් ජනතාවට ඒ පහසුකම් ලබා දීම සඳහා ආණ්ඩුව මේ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන 1,000ක් ඇති කිරීමට කටයුතු කරනවා. අද වනවිට මේ සේවාව ලබා දෙන මධ්‍යස්ථාන ඉතාම සක්‍රිය ලෙස ඒ කාර්යභාරය කරන්න පටන් අරගෙන තිබෙනවා. විශේෂයෙන් මේකෙදිත් වැඩිපුරම ගෙවල්වල ඉන්න, අපේ අම්මලා, අක්කලා, නංගිලාට, පවුලේ බර දරන ඒ සියලු කාන්තාවන්ට මේ වෙනුවෙනුත් දැන් මැදිහත් වෙන්න අවස්ථාව ලැබිලා තිබෙනවා.

අපේ රටේ බෝ නොවන රෝග නිසා ජීවිත විශාල ප්‍රමාණයක් නැති වෙන බව අපි දන්නවා. සමහර වෙලාවට හෘදය රෝග,

[ගරු අතුල වෙළඳගොඩ මහතා]

පිළිකා, අධි රුධිර පීඩනය, කොලෙස්ටරෝල් ඇතුළු විවිධ විධියේ සංකූලතා එක්ක රෝහල්ගත වුණාට පස්සේ ජීවිත අවදානමක් තිබෙන බව අපි දන්නවා. ඒ වෙනුවෙන් විශාල පිරිවැයක් දරන්නත් සිද්ධ වෙනවා. ඊට කලින් මේ රෝග තත්ත්ව හඳුනා ගැනීමක් මේ මධ්‍යස්ථානවලින් කෙරෙනවා. අදාළ ප්‍රදේශයේ ජීවත් වෙන සියලු දෙනා මෙහි කටයුතු කරන කාර්ය මණ්ඩලය හඳුනනවා. ඔවුන්ව පෞද්ගලිකව හඳුනනවා. ඒ අය පූර්ව ප්‍රතිකාර ඒකකයක් ලෙස ක්‍රියාත්මක වෙලා, ඒ ප්‍රදේශයේ නිවෙස්වලට ගිහිල්ලා පූර්ව පරීක්ෂණ කටයුතු කරලා, ඔවුන්ගේ ශරීරයේ තිබෙන ඒ රෝගී තත්ත්වයන්, සංකූලතා මොනවාද කියලා හඳුනා ගත්තාට පස්සේ තමන් පිළිබඳ නිසි අවබෝධයක් සහිතව ජනතාවට රෝහල් කරා යන්න පුළුවන්. ඒ වාගේම ජනතාව අනවශ්‍ය විධියට ගිහිල්ලා රෝහල්වල පිරෙන එකත් නතර වෙනවා. රෝහල්වල තිබෙන තදබදයත් එක්ක ඒ රෝහල් දරන අමාරුකම අපි දන්නවා. ඒක ක්‍රමානුකූලව සැහැල්ලු කරලා ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා මේ මධ්‍යස්ථාන රටේම ආරම්භ කරන්න පටන් ගත්තාට පස්සේ විපක්ෂයේ කණ්ඩායම ඉතාම ප්‍රයෝජනවත් මේ සේවාව පිළිබඳව අඩුපාඩු පෙන්වා දීම හෝ යෝජනා ඉදිරිපත් කරනවා වෙනුවට මේ සියල්ල දෙස බලන්නේ තමන්ගේ ලාභ, බාල, කුහක, දූෂ්ට චේතනාවෙන්. විපක්ෂයේ කාර්යභාරය විය යුත්තේ මේක නොවෙයි. නමුත් අපි දිගටම දකින්නේ ඒ තත්ත්වයයි.

මේ රටේ ජනතාවගේ සෞඛ්‍ය වඩාත් උසස් තැනක තිබුණොත්, රටේ ශ්‍රම බලකාය වඩාත් සෞඛ්‍ය සම්පන්න වුණොත්, නිරෝගී සම්පන්න වුණොත් තමයි රටට අවශ්‍ය ආර්ථික සමෘද්ධිය ළඟා කර ගත හැකි වන්නේ. එහෙම වුණොත් තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන තේමා පාඨය අනුව ජනතාවට ලැබෙන්න ඕනෑ පහසුකම් වඩාත් හොඳින් ලබා දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ගැනත් වැරැදි පුරෝකථන කරන වෙලාවකදී, මේ ක්‍රියාවලිය ශක්තිමත් කරන්න, මේ වෙනකොට වත්මන් සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු රටේ සමස්ත සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මේ වෙනුවෙන් අවධානය යොමු කරලා, ප්‍රාථමික සෞඛ්‍ය පූර්ව සූදානම් කිරීම වෙනුවෙන් මේ මධ්‍යස්ථාන ආරම්භ කරලා මේ ක්‍රියාවලිය කරගෙන යනවා. අපි විශ්වාස කරනවා, කිසිම අගක් මුලක් නැතුව කරන මේ විවේචනවලටත් ජනතාවගේ පැත්තෙන් පිළිතුරක් ලැබෙයි කියලා.

දැන් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඇවිල්ලා කථා කරලා ගියා. එතුමා විදුලි බිල අඩු කිරීම සම්බන්ධව කථා කරනවා. හැබැයි, එතුමාගේ විවාහ මංගල්‍යයට ගිය විදුලි බිල ගෙව්වේ නැහැ. අද විදුලි බිල ගැන කථා කරනවා. අවුරුදු හයකට පස්සේ ඒ විදුලි බිල ගෙව්වේ, මිය ගිය සනත් නිශාන්ත මන්ත්‍රීතුමා විසින්. එහෙම නායකයෝ ඇවිල්ලා මෙතැන කථා කරලා හැම දෙයක්ම හෑල්ලු කරද්දී, අපි ආණ්ඩු පක්ෂය විධියට ඉතා වගකීමෙන් කියනවා, රටේ ජනතාවගේ ජන මතය ජාතික ජන බලවේගය හරියට තේරුම් අරගෙන තිබෙනවා බව. ඒ අනුව තමයි ක්‍රමානුකූලව මේ අණපනත් මඟින් ජනතාවගේ පහසුකම් වාගේ අයිතිවාසිකම් දිනා දීමේ අවස්ථාවක ඉන්නේ. කාන්තාවන් සවිබල ගැන්වීම වෙනුවෙන් මේ ඉදිරිපත් කර තිබෙන ඉතාම වැදගත් යෝජනාවට අපේ සහයෝගය පළ කරමින්, ඒ සඳහා මැදිහත් වුණු සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.17]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பெண்களின் பாதுகாப்பு, வரப்பிரசாதங்களை உறுதிப்படுத்தும் வகையில் கொண்டுவரப்பட்டுள்ள பெண்கள் வலுவூட்டல் பற்றிய விடயம் தொடர்பில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு முதலில் நன்றிகளை கூறிக் கொள்கின்றேன்.

இன்று நமது நாட்டில் பெண்கள் தங்களது சேவைகளைப் பல விதங்களில் வழங்கிக்கொண்டு இருக்கிறார்கள். குறிப்பாக, கல்வித்துறையில் பெண்கள் பாரியளவில் முன்னேற்ற மடைந்து, அதற்கூடாக நாட்டுக்குப் பல சேவைகளை வழங்கிக்கொண்டு இருக்கிறார்கள். எனினும், எமது நாட்டில் அண்மைக்காலமாக நடக்கின்ற நிகழ்வுகளைப் பார்க்கும் பொழுது மிகவும் கவலையாக இருக்கின்றது. முஸ்லிம் பெண்களை வீட்டுக்குள்ளே அடைத்து வைத்திருப்பதாகவும், அவர்களுக்கு உரிய சுதந்திரம் கொடுப்பதில்லை என்றும் பொதுவாகச் சொல்லப்படுகின்றது. இன்றைக்கு அவற்றை யெல்லாம் தாண்டி அவர்கள் கல்வித்துறையில் பாரிய முன்னேற்றமடைந்து, சிறந்த பெறுபேறுகளைப் பெற்று, தொழில்வாய்ப்புகளைப் பெறுகின்றார்கள். எனினும், அவர்கள் தொழில்செய்யும் இடங்களில் ஆடை தொடர்பான பிரச்சினை களுக்கு - ஆடை கட்டுப்பாட்டுக்கு - முகங்கொடுக்கவேண்டி உள்ளது.

மேற்கத்தேய நாடுகளில்கூட, இராணுவத்தில் இணைவோருக்கு தங்களது கலாசார ஆடைகளை அணிவதற்கு சந்தர்ப்பம் கொடுக்கப்பட்டு இருக்கின்றது. அதேமாதிரி, அண்மைய நாடான இந்தியாவில், அங்கு வாழும் சீக்கிய சமூகத்தினருக்குத் தங்களுடைய கலாசார ஆடையை அணிய முடியும். இவற்றைக் கருத்திற்கொள்ளாமல் கடந்த காலத்தில் முஸ்லிம் சமூகத்தில் பெண்களுக்கு இருந்த கட்டுப்பாடுகள் பற்றி கதைத்துக்கொண்டு இருக்கின்றார்கள். அதுமாத்திரமன்றி, அவர்கள் தங்களது சேவைகளை நாட்டுக்கு வழங்குவதற்கு முன்வரும்போது, சுற்றறிக்கைகள் என்றும் பிற விடயங்கள் என்றும் கூறி, அவர்களுடைய முன்னேற்றத் துக்குப் பாரிய தடைகளை ஏற்படுத்துகின்றார்கள்.

இலங்கையின் அரசியலமைப்பின்படி, அவரவருக்குரிய கலாசார ஆடையை அணிய முடியும். எனினும், முஸ்லிம் பெண்களை ஒரு வைத்தியசாலையில் பணியாற்றுவதற்கு நியமித்துவிட்டு, அவர்களுக்குத் தமது கலாசார ஆடையை அணிவதற்குத் தடை விதிக்கிறார்கள். நான் குறிப்பாகச் சொல்வது, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் ஏற்பட்ட பிரச்சினையைத்தான்.

தற்பொழுது, அவர்களை transfer பண்ணி இருக்கிறார்கள். முஸ்லிம் பெண்கள் அணியும் உடையை ஒழுக்கமான, நல்ல உடை என்றுதான் சொல்கிறார்கள். அதற்காக நாங்கள் மற்றவர்களுடைய உடையைக் குறைசொல்லவில்லை. ஒவ்வொரு சமூகத்துக்குமென தனியான கலாசாரம் இருக்கின்றது. மிகவும் கவலைக்குரிய விடயம் என்ன வென்றால், இந்தச் சம்பவத்துக்கு மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சோ, இலங்கையில் இருக்கின்ற பெண்கள் சார்ந்த குழுக்களோ, அமைப்புகளோ எதிர்ப்புத்

தெரிவிக்கவில்லை என்பதுதான். அதுமாத்திரமன்றி, அந்தப் பெண் உத்தியோகத்தர்களுக்கு ஆதரவான கருத்துகளைத் தெரிவிக்கவில்லை என்பதும் வேதனைக்குரிய விடயமாகும்.

இன்று கிட்டத்தட்ட 700 முஸ்லிம் பெண் வைத்தியர்கள் இந்த நாட்டுக்குச் சேவைகளை வழங்கிக்கொண்டு இருக்கின்றார்கள். அதேபோல, கல்வித் துறையிலும் ஆசிரியர்களாக சேவையாற்றிக்கொண்டு இருக்கின்றார்கள். இந்த விடயம் தொடர்பில் மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு நல்லதொரு முடிவை உடனடியாக எடுக்க வேண்டும். அதாவது, சம்பந்தப்பட்ட அனைவருடனும் கலந்துரையாடி, அந்தந்தத் துறை சார்ந்தவர்களுக்கு அவர்களது கலாசார உடையை கௌரவமான முறையில் அணிவதற்குரிய சந்தர்ப்பத்தைக் கொடுத்து, முஸ்லிம் பெண்களும் இந்த நாட்டுக்குச் சேவைகளை வழங்குவதற்குரிய சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அத்துடன் இன்னொன்றையும் குறிப்பிட விரும்புகின்றேன். Waqf Board ஊடாகச் சிலருக்கு நீதி கிடைக்கவில்லை என்று நினைத்தால், Waqf tribunalக்குப் போக வேண்டும். நீதிச் சேவைகள் ஆணைக்குழுவானது, Waqf Board, Waqf tribunalக்குத் தகுதியான chairman, membersஐ நியமிக்காமல் காலத்தை இழுத்தடித்துக்கொண்டு இருக்கின்றது. அது ஏனென்று தெரியவில்லை. பல வேலைகளைத் துரிதமாகச் செய்யும் அரசாங்கம் என்ற வகையில், நீங்கள் அவர்களை நியமிப்பதற்குரிய நடவடிக்கைகளை விரைவாக எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், கீழ் மல்வத்து ஓயா project ஊடாக ஏனைய மாவட்டங்களில் இருக்கின்ற மக்களைக் கொண்டுவந்து வவுனியா மாவட்டத்தில் குடியேற்றுகிறார்கள். வவுனியா மாவட்டத்திலே பலர் விவசாயக் காணிகள் இல்லாமல் இருக்கிறார்கள். அவர்களுக்குக் கொடுப்பதற்குக் காணி இல்லை. ஏனெனில், காணிகளை Department of Forest Conservation பிடித்துவைத்து இருக்கின்றது. இந்த நிலையில், வவுனியா மாவட்டத்திலுள்ள காணிகளை அந்த மக்களுக்குக் கொடுக்காமல், ஏனைய மாவட்ட மக்களுக்குக் கொடுப்பதை நாங்கள் கடுமையாக ஆட்சேபிக்கின்றோம். முதலில் எமது மாவட்ட மக்களுக்குக் கொடுத்துவிட்டு, மிகுதியாக இருந்தால் அவற்றை மன்னார், முல்லைத்தீவு போன்ற அயல் மாவட்டங்களிலுள்ள மக்களுக்குக் கொடுப்பது தொடர்பில் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

சிறுபோக நெல்லை அரசாங்கம் கொள்முதல் செய்திருந்தாலும், கிட்டத்தட்ட 45 நாட்களாகியும் வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களில் இருக்கின்ற விவசாயிகளின் accountக்கு காசு வைப்பிலிடப்படவில்லை. அங்குள்ள விவசாயிகள் கடன் எடுத்துத்தான் விவசாயத்தைச் செய்திருக்கிறார்கள். எனவே, விரைவாக அவர்களுக்குரிய கொடுப்பனவுகளைக் கொடுக்குமாறு நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, மன்னார் மாவட்டத்தின் நானாட்டான் பிரதேச செயலாளர் பிரிவின் மடுக்கரை மற்றும் அறுவைக்குண்டு பகுதிகளில் 'தித்வா' புயல் காரணமாக மக்கள் வாழ முடியா தென அடையாளப்படுத்தப்பட்டது. எனினும், அவர்களுக்கு மாற்றுக் காணிகளைக் கொடுப்பதில் பிரச்சினை காணப்படு கின்றது. அரசாங்கமானது, காணிக்கு 50 இலட்சம் ரூபாயும் வீடு கட்டுவதற்கு 50 இலட்சம் ரூபாயும் கொடுப்பதாகத் தெரிவித்தது. இதை அவர்களுக்கு ஒழுங்குபடுத்திக் கொடுத்தால், அவர்கள் எங்கேயாவது காணி எடுத்து வீடு கட்டக்கூடிய நிலைமை ஏற்படும். எனவே, இதைச் செய்து கொடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

மேலும், கிழக்கு மாகாணத்தில் இரண்டாவது வர்த்தக மையமாக இருப்பது கல்முனை நகரமாகும். அதுமாத்திரமன்றி, அதிக மக்கள் தொகையைக் கொண்ட நகரமும்கூட. எனினும், அங்கு நிரந்தர DS ஒருவர் இல்லை. இதனால் அங்கு பல பிரச்சினைகள் ஏற்படுகின்றன.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ සාකච්ඡාවට බඳුන් වී ඇති ප්‍රධාන කාරණාව තමයි, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ වන තීරණය. පසුගිය කාලයේ, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පත් කරනු ලැබුවා. මා හිතන්නේ, ඒක මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ විශාල ජයග්‍රහණයක් කියලායි. එය විශේෂයෙන් මන්ත්‍රීවරියන් විධියටත්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය විධියටත් අප එකතු වෙලා ලැබූ ජයග්‍රහණයක්. ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් වර්තමාන රජය මේ සම්බන්ධයෙන් කටයුතු කළා. ගරු ජනාධිපතිතුමාට තිබෙන බලතල අනුව එම කොමිසම සඳහා සාමාජිකයන් 5දෙනෙක් පත් කරනු ලැබුවා. ඒ වාගේම, තවත් නියෝජිතයන් දෙදෙනෙකු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයෙන් ව්‍යවස්ථානුකූලව පත් කරනු ලැබුවා. මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අපට තවත් ගැටලු කිහිපයක් තිබුණා. එකක් තමයි, කාන්තා කොමිසමට වැඩ කටයුතු කර ගෙන යෑම සඳහා, තමන්ගේ කාර්ය භාරය හොඳින් ඉෂ්ට කිරීම සඳහා කාර්යාලයක් නොතිබීම. තවත් එකක් තමයි, දීමනා ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කරලා නොතිබීම. මොකද, අපේ රටේ මුල් වරට තමයි "කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව" ස්ථාපිත කළේ. දැන් එය ස්ථාපිත කරලා, ඒ අඩුපාඩුකම් සකස් කරමින් යනවා. මෙහිදී කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය භාර ගරු ඇමතිතුමියගෙන් විශාල වශයෙන් උදවු ලැබෙනවා. මේ කාන්තා කොමිසමට ස්වාධීනව තමන්ගේ වැඩ කටයුතු කර ගෙන යන්න පුළුවන්. ආරම්භක මුදලක් ද ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, ලබන අවුරුද්දේ අය වැයෙනුත් මේ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

මෙය ළමයින් සහ කාන්තාවන් සඳහා විශේෂයෙන් ලැබුණු වරප්‍රසාදයක් විධියට තමයි අප සඳහන් කරන්නේ. මොකද, අපට අභියෝග කරපු කට්ටියකුත් සිටියා. "පුළුවන් නම් කාන්තා කොමිසම පත් කරන්න, පුළුවන් නම් සභාපතිවරියක් පත් කරන්න, පුළුවන් නම් මේ සඳහා වැඩ පිළිවෙළක් හදන්න" කියලා

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

ඒ කට්ටිය අපට අභියෝග කළා. විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ සමහර අය අපට ඒ සම්බන්ධයෙන් නිකම් කෝචොක් එකට වාගේ කථා කළා. අපි අන්න ඒ අභියෝගය භාර ගත්තා. අපි කාන්තා කොමිසම ස්ථාපිත කරලා තිබෙනවා, ඒකට අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා, ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. මෙතෙක් කල් තිබුණු ඒ කාන්තා කොමිසම හරහා තවත් අයිතියක්, වරප්‍රසාදයක් අපේ රටේ කාන්තාවන්ට දැන් ලැබී තිබෙනවා. ඒ කටයුතු වෙනුවෙන් මැදිහත් වෙන්නත් ඒ කාන්තා කොමිසමේ ඉන්න සාමාජිකයන්ට හැකියාව ලැබී තිබෙනවා.

සමහර අය මේවා කථාවට පමණක් සීමා කරලායි තිබුණේ. හැබැයි, ඒ කථාව අවුරුදු 2ක් වාගේ කාලයක් තුළ ක්‍රියාවලියක් බවට පත් කරලා, එහි ප්‍රතිලාභ කාන්තාවන්ට ලබා ගන්න පුළුවන් විධියට එය ස්ථාපිත කරලා තිබෙනවා. ඒකයි මා කිව්වේ, මේක මේ නව රජය සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් විධියට අප ලබා ගත් විශේෂ ජයග්‍රහණයක් කියලා.

මෙහි ප්‍රධානම දේ මේකයි. මේ කියන කාන්තා කොමිසමට වාගේම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයටත් වගකීම් රාශියක් තිබෙනවා. මේ වෙලාවේදී ඒ වගකීම් ඉෂ්ට කිරීම සඳහා ව්‍යාපෘති ගණනාවක් සකස් කරලා තිබෙනවා. මොකද, කාන්තාවන් සවිබල ගැන්වීම අමාත්‍යාංශයේ කාර්ය භාරයක්, ඒ වාගේම එය මෙවැනි ආයතනවලත් කාර්යභාරයක් වනවා.

කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා රජය විධියට හා අමාත්‍යාංශය විධියට මැදිහත් වෙලා, ඒ වාගේම අනෙකුත් අමාත්‍යාංශත් මැදිහත් වෙලා ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වාගේම, කාන්තාවන්ට සිද්ධ වන වෙනස් කොට සැලකීම පිළිබඳවත්, ස්ත්‍රී පුරුෂභාවය හා ලිංගික දිශානතිය පදනම් කර ගෙන සිදු වන හිංසනයට එරෙහිව කාන්තාවන් ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් කටයුතු කිරීම වෙනුවෙන් එම පනතට ශක්තියක් දීම සඳහා තමයි අමාත්‍යාංශය විධියට දැන් වැඩ කටයුතු කර ගෙන යන්නේ. මම ඒකට උදාහරණ කිහිපයක් කියන්නම්. දැන් මෙතැනදී සමහර අයගේ කථා අපට ඇහුණා. පසුගිය කාලයේ අපි දැක්කා, අපේ රට මොන වාගේ උද්ධමනකාරී තත්ත්වයකද තිබුණේ කියලා. උද්ධමනය සියයට 76කට වැඩි වුණු කාලයකුත් තිබුණා. එතකොට සමහර අය තමතමන් ඉඩම් බෙදා ගත්තු හැටි, රජයේ දේපළ අවභාවිත කරපු හැටි මේ රටේ ජනතාව දන්නවා. ඒකට දඬුවමකුත් දුන්නා, මේ විපක්ෂයට.

අපි මොන ප්‍රශ්නය තිබුණත්, ලෝක යුද්ධයක් තිබෙන වෙලාවකත්, - අපි දන්නවා මැද පෙරදිග සිද්ධ වෙන දේවල් ටික. මේ වෙලාවේත් බොර තෙල් මිල වැඩි වෙලා තිබෙනවා.- මේ යුද්ධය අස්සේත් මේ ආර්ථිකය කළමනාකරණය කරමින් ජනතාවට වරප්‍රසාද ලබා දෙමින් ලෝකයම කියන විධියට, ලෝක සංවිධාන කියන විධියට මේ ආර්ථිකය වර්ධනීය මට්ටමක, එහෙම නැත්නම් ප්‍රශංසනීය මට්ටමක තියාගෙන යනවා. ඒ ගැන ලෝකයේ ජනතාව සහ සියලු සංවිධාන ප්‍රශංසා මුඛයෙන් කථා කරද්දී විපක්ෂයට දැඩි ඉරිසියාවක් හිතිලා තිබෙනවා. ඒගොල්ලන් මොකක්ද කළේ? ඒ උද්ධමනය කාලයේදී මොකක්ද කළේ? ඒ බර ජනතාවට දෙමින් පෝලිම් යුගයකට ගෙන යමින් මොකක්ද කළේ? ශුද්ධයක් දැම්මා. යුද්ධය අස්සේ අපි මේ ආර්ථිකය කළමනාකරණය කරද්දී එදා ඒගොල්ලන් මොකක්ද කළේ? ශුද්ධයක් දාලා මේ රට කඩාගෙන වැට්ටුවා. ඒකේ ප්‍රතිඵල වැඩිපුරම භුක්ති වින්දේ කාන්තාවෝ හා ළමයින්. ඒ අයට කුස්සියේ උයා ගන්න බැරි වුණා ගෑස් ටික නැති නිසා. ඒක අපි හොඳටම දන්නවා. ආර්ථිකය කඩාගෙන වැටුණා, ඔවුන්ගේ ආරක්ෂාව නැති වුණා, ඔවුන්ගේ ආර්ථිකයට දෙන්න තිබුණු සුබසාධන කප්පාදු කරන්න සිද්ධ වුණා.

හැබැයි දැන් මොකක්ද වෙන්නේ? දැන් වෙන දේවල් ගැන මම පොඩ්ඩක් කියන්නම්, මතක් කරලා දෙන්නම්, "වැටුප් වැඩි වුණාද, වැඩි වුණාද, දැන් උද්ධමනය නේද, ඒක ගළපනවා නේද" කියලා තප්පුලන කට්ටියට. ගුරුවරුන්ගේ වැටුප ගැන විතරක් මම පොඩි සඳහනක් කරන්නම්. 2024දී දෙසැම්බර් වෙනකොට ගුරුවරයෙකුගේ වැටුප 65,424යි. 2025 ජනවාරිවලදී ඒක වැඩි වෙනවා, මේ රජය යටතේ වැඩි වෙනවා 88,757 දක්වා. ඊට පස්සේ 2026 ජනවාරි වෙනකොට 104,247 දක්වා වැඩි වෙනවා. ඒ වාගේම අපි දන්නවා සියලු රාජ්‍ය සේවකයින්ගේ වැටුප වැඩි වුණා කියලා. ලබන අවුරුද්දේත් වැඩි වෙනවා. මට කියන්න තිබෙන්නේ මේකයි. පුළුවන් තරම් ළඟ විතරක් බලලා හරියන්නේ නැහැ දුරත් බලන්න, දුරත් බලන්න දේශපාලනය කරනවා නම්. ඒ වාගේම තමන් ගැන විතරක් නොවෙයි ජනතාව ගැනත් බලලා දේශපාලන ප්‍රතිපත්ති හදා ගන්න, ඔය වැටිලා ඉන්න වළෙන් ගොඩට එන්න නම්.

ගුරුවරුන්ගේ වැටුපේ ඉඳන් සියලු රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීම දැනුණේ පවුලට. ඒක දැනුණේ අම්මලාට, කාන්තාවන්ට. මම මේ කිව්වේ එක කාරණයක් කාන්තාවන් සවිබල ගැන්වීමට සිදු කළ. ඒ වැටුප් වැඩිවීමේ ප්‍රතිලාභ පවුලට දැනෙද්දී ඒ පවුල ආර්ථික වශයෙන් යම්කිසි සවිබල ගැන්වීමක් වෙනවා. එතැනින් මේ රජය නතර වුණේ නැහැ. අපි කථා කරන "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" කියන තැනට අපේ ආර්ථිකය හා අපේ සමාජය පරිවර්තනය කරද්දී අපේ කාන්තාවන්ටත් ලොකු වගකීමක් තිබෙනවා, කොහොමද මේ පුනරුදය කරා යන්නේ කියලා. කාන්තාවන් සවිබල ගැන්වෙද්දී කාන්තාවන්ගේ ආරක්ෂාව ගැන අපි රජයක් විධියට පැති ගණනාවකින් හිතලා තිබෙනවා, මහන්සි වෙලා තිබෙනවා .

මම කරුණු කිහිපයක් කියන්නම්. කාන්තාවන්ට, දරුවන්ට ආරක්ෂාව තිබෙන්නේ ආරක්ෂිත නිවාසයක් තුළ කියලා අපි හැමවිටම දකිනවා. මොකද, කාන්තාවන්ට දරුවොත් එක්ක දොරවල් වහගෙන ආරක්ෂාවක් ඇතිව හුස්ම ගන්න නිවසක් තිබෙන්න ඕනෑ. ආහාර ටික පිස ගන්න, ගැහැනු දරුවන්ට ආරක්ෂාව සපයන්න තමන්ගේම නිවසක් තිබෙනවා නම්, හෙවණක් තිබෙනවා නම් අම්මා කෙනෙකුට ලොකු ශක්තියක්. හැබැයි පසුගිය කාලයේ ගෙවල් හැදුවේ කොහේද? අලි ඉන්න කැලේ බාගෙට ගෙවල් හදලා දාලා ආවා. ඒ ව්‍යාපෘති මග නතර වුණා. කඩා වට්ටපු ආර්ථිකය තුළ ඔවුන්ට ගෙවල් හදා දෙන්න පුළුවන් වුණේ නැහැ. හැබැයි පසුගිය අවුරුදු දෙකක් වාගේ කාලය තුළ, - 76ක් ගැන නොවෙයි අපි මේ කථා කරන්නේ - ඔබට සතුටු විය හැකි විධියට "තමන්ගේ තැනක්- ලස්සන ජීවිතයක්" කියන ව්‍යාපෘතිය යටතේ අපි මොනවාද කළේ? 2025 වර්ෂයේදී නිවාස 3,000ක් සඳහා ලක්ෂ 10 ගාණේ අපි ප්‍රතිපාදන වෙන් කළා. 2026දීත් "තමන්ගේ තැනක්-ලස්සන ජීවිතයක්" කියන ව්‍යාපෘතිය යටතේම නිවාස 9,700කට ලක්ෂ 10 ගාණේ ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා.

අපි උතුරු නැහෙනහිර පළාත තුළ නැවත පදිංචි කිරීමේ නිවාස විතරක් 2,500ක් හදලා තිබෙනවා, ලක්ෂ 20 ගණනේ මූලික මුදලක් දීලා. ඉන් එහාට ගිහින් ඔවුන් ඊට වැඩි මුදලක්

හොයාගෙන ලස්සන ගෙවල් හදාගෙන තිබෙනවා. ඒ වාගේම මලෙයෙහම් ජනතාව සඳහා වන නිවාස ව්‍යාපෘතිය දැනට ඉන්දීය රජයත් එක්ක එකතු වෙලා සිදු කරනවා. දැනට අපි එම නිවාස ව්‍යාපෘතියේ නිවාස 2,500ක් හදා තිබෙනවා. අපට තවත් නිවාස දෙදහස් ගණනක් හදන්න තිබෙනවා.

ඒ වාගේම වතු නිවාස හා නාගරික පැල්පත් නිවාස වෙනුවට මහල් නිවාස සංකල්පය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරිය එකතු වෙලා දියත් කරනවා. නිවාස නැතිව සිටින සහ අනාරක්ෂිත නිවාසවල ඉන්න ජනතාවට ආරක්ෂිතව සිටිය හැකි නිවාස ලබා දෙන වැඩ පිළිවෙළ මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ වාගේම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ "දිවියට සවියක්" කියන වැඩසටහන තුළින් විශේෂයෙන්ම පරිවාස මධ්‍යස්ථානවල ඉන්න දරුවන් සමාජගතවීමේදී නිවසක් ඉදිකර ගැනීම සඳහා ලක්ෂ 20ක් ලබා දෙනවා. එම වැඩ පිළිවෙළ යටතේ 1,000කට නිවාස ලබා දෙන්න අප බලාපොරොත්තු වෙනවා. මම හිතන විධියට, එම වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා, සියලු දිස්ත්‍රික්කවල. ඒ වාගේම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවත් එක්ක එකතු වෙලා තවත් නිවාස ප්‍රමාණයක් හදනවා. ඒ අනුව මේ අවුරුද්ද තුළ නිවාස විශාල ප්‍රමාණයක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි හිතනවා, ආර්ථික වශයෙන් කාන්තාව ශක්තිමත් කරනවා වාගේම, නිවාසයක් ලබා දීම තුළින් වඩා ආරක්ෂිත තැනක් ඒ කාන්තාවට ලබා දෙනවා කියලා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විශේෂ කණ්ඩායම් දෙකක් අද මුණ ගැසුණා. ඒ කණ්ඩායම් දෙකෙන් එකක් වන මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ ආයතනය අපිත් එක්ක කථා කළා. ඒ වාගේම වවුනියාව, මඩකලපුව ආදී ප්‍රදේශවල ඉන්න කාන්තා සංවිධාන කිහිපයකුත් අද අපිත් එක්ක කථා කළා. ඔවුන් අපට ප්‍රධාන ප්‍රශ්න තුනක් පැහැදිලි කළා. ඒ අනුව කාන්තාවන් දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම අවශ්‍යයි කියන කාරණය ඔවුන් සඳහන් කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දේශපාලනික වශයෙන් අපි කොහොමද සවිබල ගැන්වුණේ කියන කථාව ඔබතුමියත් හොඳටම දන්නවා. අපි මේ දේශපාලන වෙනස කළා වාගේම, සමාජ පුනරුදය උදෙසා, ලස්සන රටක් හැදීම උදෙසා දැනටත් අපි කාන්තාවන් දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම "ගැහැනු අපි එක මිටට" යටතේ ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම අපි කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ කාන්තා කාර්යාංශයත් සමඟ එක්ව කාන්තාවන් සවිබල ගැන්වීමේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහාත් කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම ආර්ථික වශයෙන් ඔවුන් සවිබල ගැන්වීමටත්, පවුලක් විධියට ඔවුන් ගම තුළ සවිමත් කිරීමටත් අපේ ප්‍රජා ශක්ති වැඩසටහන යටතේ කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවස අපට තීරණාත්මකයි. සමාජ වෙනසක් වෙන්නේ මෙවැනි පනත් තුළින් කාන්තාවන් සවිබල ගැන්වුවොත් විතරයි කියන කාරණාවත් මතක් කරමින්, විපක්ෂයේ සිහින බොඳ වී ජනතාවගේ සිහින සැබෑ වුණු දවසක් විධියට අද දවස හඳුන්වා දෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.37]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சுடன் தொடர்புடைய இன்றைய விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மிகவும் சந்தோஷம் அடைகின்றேன்.

சிறுவர்கள் மற்றும் பெண்களுடைய உரிமைகளைப் பாதுகாக்கின்ற பொறுப்பு இந்த அமைச்சுக்கு இருக்கின்றது. அவ்வாறான சூழ்நிலையில், முஸ்லிம் பெண் ஊழியர்கள் தங்களுடைய கலாசாரத்தை, தங்களுடைய மதத்தைப் பிரதிபலிக்கும் வகையில் தங்களுடைய ஆடைகளை அணிந்து கொண்டு கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்குக் கடமைக்குச் சென்றபோது, அங்கிருந்த வைத்திய அத்தியட்சகரால் திருப்பி அனுப்பப்பட்டு இருக்கிறார்கள். அதன் காரணமாக ஏற்பட்ட பிரச்சினையால் குறித்த ஊழியர்களுக்கு வேறொரு வைத்தியசாலைக்கு இடமாற்றம் கொடுக்கப்பட்டு இருக்கின்றது. உண்மையிலேயே இது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். கடந்த 35-40 வருடங்களாக இவ்வாறான பிரச்சினை எங்குமே இருக்கவில்லை. முஸ்லிம் பெண்கள் தங்களுடைய கலாசாரத்துக்கு, மதத்துக்கு ஏற்ப ஆடைகளை அணிந்து கொண்டு தாதியர்களாக - nursesஆக - கடமை புரிந்தார்கள். முஸ்லிம் பெண்கள் தங்களுடைய கலாசாரத்தைப் பேணும் வகையிலான ஆடைகளோடு தங்களுடைய தொழிலைச் செய்யக்கூடிய உரிமையைப் பெற்றுக்கொடுக்க வேண்டிய பொறுப்பு சுகாதார அமைச்சருக்கு மாத்திரமல்ல, மகளிர் விவகாரத்துக்குப் பொறுப்பான அமைச்சருக்கும் இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் உரிய நடவடிக்கை எடுக்க வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, பாலர் பாடசாலைகளுக்கென common syllabus - பொது பாடத்திட்டமொன்று - உருவாக்கப்பட வேண்டும்; அங்கு கற்பிக்கின்ற ஆசிரியர்களுக்குப் பயிற்சிகள் வழங்கப்பட வேண்டும்; அதற்கான அடிப்படை வசதிகள் செய்யப்பட வேண்டுமென நாங்கள் நீண்ட காலமாகச் சொல்லி வந்தோம். தற்பொழுது, இதற்குரிய நடவடிக்கைகளை கௌரவ பிரதம அமைச்சரின் கீழுள்ள கல்வி அமைச்சு மேற்கொள்கின்றது. இதையிட்டு நான் உண்மையிலேயே மிகவும் சந்தோஷமடை கின்றேன். நேற்றைய தினம் நடைபெற்ற கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில்கூட நாங்கள் இது தொடர்பில் ஆராய்ந்தோம். மகளிர் மற்றும் சிறுவர் அலுவல்களுக்குப் பொறுப்பான அமைச்சர் என்ற அடிப்படையில், நீங்கள் கல்வி அமைச்சோடு தொடர்பு கொண்டு, இவ்விடயம் தொடர்பில் தேவையான ஆலோசனை களையும் ஒத்துழைப்புகளையும் வழங்க வேண்டும். கிட்டத்தட்ட 10 ஆண்டுகளுக்கு முன்னர், நான் சிறுவர் அபிவிருத்தி மற்றும் மகளிர் விவகார பிரதி அமைச்சராக இருந்தபோது இந்த வேலைத்திட்டத்தை ஆரம்பித்தேன். எனினும், இன்னும் அது முடிவடையவில்லை. எனவே, கௌரவ மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர் அவர்கள், கல்வி அமைச்சோடு இணைந்து இந்த வேலைத் திட்டத்தை துரிதப்படுத்த வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

Eastern Provinceஐ மையப்படுத்தி மட்டக்களப்பு மாவட்டத்தில் National Commission on Women Regional Office ஒன்று உருவாக்கப்படுமாக இருந்தால், பெண்களை மேலும் வலுப்படுத்தக்கூடியதாக இருக்கும். குறிப்பாக, அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை மாவட்டங்களை உள்ளடக்கிய தாக அது உருவாக்கப்பட வேண்டும். ஏனெனில், அந்தப் பிரதேசங்களிலுள்ள நிறையப் பெண்கள் பல்வேறுபட்ட பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். அவர்களுக்கு நீதி, நியாயம், உரிமைகள் மறுக்கப்படுகின்றன. குடும்பத்தில் கணவனால் பாதிப்புகள் ஏற்படுகின்றன. சட்ட நடவடிக்கை எடுப்பதற்காக பொலிஸ் நிலையம், நீதிமன்றம், வைத்தியசாலை போன்ற இடங்களுக்குச் செல்லும்போது உரிமை மீறல்கள் இடம்பெறுகின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் உடனடியாக இதனை அங்கு உருவாக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, Women's Rights Complaint and Investigation Unitஉம் மட்டக்களப்பு மாவட்டத்தில் இல்லை. எனவே, அங்கு பெண்களால் வழங்கப்படுகின்ற complaintsஐ investigate பண்ணுவதற்கான - விசாரிப்பதற்கான - unit ஒன்றை உருவாக்க வேண்டும். அதேபோன்று, பெண்களுக்கு எதிரான குடும்ப வன்முறை மற்றும் பாலியல் வன்முறைக்கு ஒருங்கிணைந்த referral systemஐயும் உருவாக்க வேண்டும். பாதிக்கப்பட்ட பெண்களுக்காக ஐரோப்பிய நாடுகள் மற்றும் ஏனைய நாடுகளில் உள்ளதைப் போன்று, முழுமையான வசதிகளுடனான healing centres உருவாக்கப்பட வேண்டும். இதனை அரசாங்கம் மாத்திரம் செய்யாமல், தனியாருடைய ஒத்துழைப்பையும் பெற்று செய்ய வேண்டும். அத்தோடு, பெண் தலைமைதாங்கும் குடும்பங்களுக்கான பொருளாதார வலுவூட்டல் திட்டங்கள், vocational training, start-up capital and market access வழங்குதல், மாற்றுத்திறனாளி பெண்களுக்கான சிறப்பு பொருளாதார மற்றும் பாதுகாப்புத் திட்டங்களையும் ஏற்படுத்த வேண்டும்.

1929 Children Helpline, 1938 Women Helpline சேவைகளை மேலும் வலுப்படுத்த வேண்டும். ஒவ்வொரு பாடசாலையிலும் trained counsellor, school social workerஐ நியமித்து அது சார்ந்த சேவைகளை வலுப்படுத்த வேண்டும். ஒவ்வொரு Education Zoneஇலும் school social work unit உருவாக்கப்பட வேண்டும். அதேபோன்று, வெளிநாடுகளில் கடமைபுரிகின்ற பெண்களின் பாதுகாப்பையும் இந்த நாட்டில் இருக்கின்ற சிறுவர்களின் பாதுகாப்பையும் உறுதி செய்ய வேண்டும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நேற்றைய பாராளுமன்ற அமர்வில் போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள், கட்டுநாயக்க அதிவேக நெடுஞ்சாலையை சிலாபம் வரை அதாவது, தெதுரு ஓயா பாலம் வரை நீடிப்பதற்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் அனுமதி வழங்கியுள்ளதாகவும் அதற்கான feasibility studiesஐ விரைவில் ஆரம்பிக்கவுள்ளதாகவும் தெரிவித்தார். அதற்காக அவருக்கு எங்களுடைய நன்றிகளையும் பாராட்டுகளையும் தெரிவித்துக்கொள்கின்றோம். அவர் எடுத்திருக்கின்ற முயற்சி வெற்றியடைய வேண்டுமென நாங்கள் வாழ்த்துகின்றோம். இது புத்தளம் மாவட்ட மக்களுக்கு மிகவும் மகிழ்ச்சியானதொரு செய்தியாகும். இந்தத் திட்டம் சிலாபத்துடன் நிறுத்தப்படாமல் புத்தளம் நகரம் வரை நீடிக்கப்பட வேண்டும் என்பதே புத்தளம் மாவட்ட மக்களுடைய எதிர்பார்ப்பாகும். புத்தளம் மாவட்டமானது, வடமேல் மாகாணத்தின் முக்கியமானதொரு மாவட்டமாகும். சுற்றுலாத்துறை, மீன்பிடித்துறை, உப்புத் தொழில், விவசாயம் உள்ளிட்ட பல்வேறுபட்ட பொருளாதார நடவடிக்கைகளின் முக்கிய மையமாக புத்தளம் மாவட்டம் விளங்குகின்றது. கற்பிட்டி, வில்பத்து போன்ற சுற்றுலா தளங்கள் உட்பட பல்வேறு தொழில் நிறுவனங்கள் இந்த மாவட்டத்தில் அமைந்திருக்கின்றன.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Madam, I will wind up in a minute.

Foreign investment, tourism attraction, prawn farms, fishing culture, ornamental fish, salt production, agriculture, solar power, wind power எனப் பல்வேறுபட்ட விடயங்களை இந்த மாவட்டம் கொண்டுள்ளது. எனவே, கட்டுநாயக்க - சிலாபம் அதிவேக நெடுஞ்சாலை திட்டத்தை புத்தளம் வரை நீடிப்பதற்கான களஆய்வை மேற்கொள்ளுமாறு கௌரவ அமைச்சர் அவர்கள் சனாதிபதி அவர்களிடம் கோரிக்கையை முன்வைத்து, இந்த வேலைத்திட்டத்தை எதிர்கால national physical planஇல் உள்ளடக்க முயற்சிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இது வெறுமனே தனிக்கட்சிக்குரிய, தனிநபருக்குரிய விஷயமல்ல. புத்தளம் மாவட்டத்தைச் சேர்ந்த எல்லா பிரதிநிதிகளும் ஒன்றுசேர்ந்து, கௌரவ அமைச்சர் அவர்களுடனும் மாண்புமிகு சனாதிபதியுடனும் கலந்துரையாடி, இந்த விஷயத்தைச் செய்ய வேண்டும். வீதி அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சு இந்த வேலைத்திட்டத்தைத் தயாரித்து, இதற்கான நிதியைப் பெற்றுக்கொள்வதற்காக நிதி அமைச்சினுடைய ERDஇன் ஊடாக இதனைச் சமர்ப்பிக்கின்றபொழுது, சவூதி அரேபியா தூதுவருடன் கலந்துரையாடி, Saudi Fund for Development - SFDஇலிருந்து இதற்கான நிதியைப் பெற்றுக் கொடுப்பதற்கு நாங்கள் முழு முயற்சி எடுப்போமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.45]

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2024ஆம் ஆண்டின் 37ஆம் இலக்க, பெண்களின் வலுவூட்டல் சட்டத்தின் 4ஆம் பிரிவின் ஏற்பாட்டின்கீழ் தாபிக்கப்பட்டுள்ள பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழுவின் தவிசாளர் மற்றும் உறுப்பினர்களின் ஊதியம் மற்றும் கொடுப்பனவு தொடர்பிலான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

விசேடமாக, பெண்ணை வலுவூட்டுவதும் முன்னேற்று வதும் அவளுடைய வாழ்வுக்கும் வாழ்வாதாரத்துக்கும் நன்மை

பயப்பதோடு, குடும்பத்தினதும் சமூகத்தினதும் நாட்டினதும் முன்னேற்றத்துக்கு அடித்தளமாகவும் அமைகின்றன என்பதை எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் நன்கு அறிந்திருக்கின்றது. மலையக மக்களை எடுத்துக்கொண்டாலும் சரி, பெண்களை எடுத்துக்கொண்டாலும் சரி, எமது ஈராண்டு ஆட்சிக் காலத்தில் அவர்களுடைய வாழ்வில் பாரியதொரு மாற்றத்தை ஏற்படுத்தி இருக்கின்றோம். அதுமாத்திரமன்றி, எல்லாத் துறைகளிலும் பின்தள்ளப்பட்டு, புறக்கணிக்கப்பட்டு இருந்த பெண்களின் வாழ்விலும் பாரியதொரு மாற்றத்தை ஏற்படுத்தி இருக்கின்றோம். மேலும், பல வருட காலமாக ஸ்தாபிக்கப்படாமல் நிறுத்தி வைக்கப்பட்டிருந்த இந்தத் தேசிய ஆணைக்குழுவாக இருக்கட்டும், வேலைத்திட்டங்களாக இருக்கட்டும், எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் சொன்னதுபோல, பாலர் பாடசாலைகளுக்கான பொதுவானதொரு பாடத்திட்டத்தைக் கொண்டுவருகின்ற விடயமாக இருக்கட்டும், இவை பற்றி பல வருடங்களாகப் பேசப்பட்டு வந்தபோதிலும், தேசிய மக்கள் சக்தியின் ஆட்சிக் காலத்தில்தான் அவை நடைமுறைப்படுத்தப்படுகின்றன என்பதைக் கூறிக்கொள்வதில் பெருமை அடைகின்றேன்.

எமது மலையக மக்கள் வறுமைக் கோட்டுக்குக்கீழ் வாழ்பவர்கள்; போசணைக் குறைபாடு மிகுந்தவர்கள் என்பதை நாங்கள் நன்கு அறிவோம். இன்று பெருந்தோட்டத்துறையில் அதிகமாக வேலைசெய்பவர்கள் மலையகப் பெண்களாவர். அவர்களுடைய ஊதியத்தை அதிகரித்தமையானது, அப்பெண்களுக்குக் கிடைத்த மாபெரும் வெற்றியாகவே நான் பார்க்கின்றேன். அதன் நிமித்தம் அவர்களால் தங்களுடைய குடும்பத்தின் பொருளாதார நிலையை ஓரளவுக்கேனும் சீரமைத்துக் கொள்ள முடிந்துள்ளது. இன்று மகளிர் அமைச்சின்கீழ் இயங்கி வருகின்ற சிறுவர் பராமரிப்பு நிலையங்களிலும், 300க்கும் குறைவான மாணவர்கள் உள்ள பாடசாலைகளிலும் வழங்கப்படும் காலை உணவுக்கான தொகை 100 ரூபாயாக அதிகரிக்கப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமல்ல, மஹபொல புலமைப் பரிசிலும் இருமடங்காக ஆக்கப்பட்டு இருக்கின்றது. கல்வித் துறையில் பாரிய சுமையாக இருந்த பல விடயங்களுக்கு அமைச்சின் மூலம் நிவாரணங்கள் வழங்கப்பட்டு, எமது மக்களும் கல்வித்துறையில் சிறந்து விளங்குவதற்கு வாய்ப்பு அளிக்கப் பட்டு இருக்கிறது.

சுகாதாரத் துறையை எடுத்துக்கொண்டால், தற்பொழுது நாடு முழுவதும் ஆயிரம் 'ஆரோக்யா' மத்திய நிலையங்கள் நிறுவப்பட்டு வருகின்றன. இது எமது மக்களுக்கான அடிப்படைச் சுகாதார சேவைகளைப் பெற்றுக்கொள்வதற்கும், அதற்காக அவர்கள் செல்லவேண்டிய இடங்கள் தொடர்பில் வழிகாட்டுவதற்கும் உதவுகின்றது. எனவே, எங்களுடைய அரசாங்கமானது, கல்வித் துறையிலும் சுகாதாரத் துறையிலும் பாரியளவிலான மாற்றங்களை ஏற்படுத்தி, மக்களுக்குச் சேவை செய்திருக்கின்றது.

இருபது வருடங்களாக வழங்கப்படாமல் நிலுவையில் இருந்த பெருந்தோட்ட மக்களுடைய ETF, EPF கொடுப்பனவைச் செலுத்துவதற்கு 4.5 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இந்தக் கொடுப்பனவை வழங்கும் நடவடிக்கையின் ஆரம்ப நிகழ்வு இன்றைய தினம் கண்டி மாவட்டத்தில் நடைபெறவுள்ளது. மக்களுடைய பிரச்சினையை அறிந்த ஓர் அரசாங்கமாக, அவர்களுடைய பிரச்சினைக்கான தீர்வைக் கொடுத்து, வளமான நாட்டில் அழகான வாழ்க்கைக்கான பொருத்தப்பாட்டை நாங்கள் படிப்படியாகச் செய்துகொண்டு இருக்கின்றோம்.

இன்று "எமது அரசாங்கம்" என்ற எண்ணப்பாடு மலையக மக்கள் மத்தியில் மட்டுமல்ல, முழு நாட்டு மக்களிடமும் ஏற்பட்டு இருக்கின்றது. எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் கூறினார், தங்களுடைய கூட்டத்தை நிறுத்துவதற்காக நாங்கள் மைதானத்தை வழங்கவில்லை என்று. கௌரவ உறுப்பினர் அவர்களே, முடிந்தால் கொடுக்கப்படும் மைதானத்தில் உங்களுடைய ஆதரவாளர் களை நிரப்பிக் காட்டுங்கள்! இப்பொழுது ஆட்சியில் இருக்கின்ற எமது தேசிய மக்கள் சக்தியின் அரசாங்கத்தோடுதான் மக்கள் இணைந்து இருக்கிறார்கள். அதுமாத்திரமல்ல, "எமது அரசாங்கம்" என்ற எண்ணப் பாட்டிலே மக்கள் வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். எனவே, உங்களுக்கு அது சவாலாகத்தான் அமையும்.

வறுமைக் கோட்டுக்குக்கீழ் வாழ்கின்ற மக்களுடைய வறுமையை ஒழித்து, அவர்களுடைய வாழ்க்கையைச் செம்மைப்படுத்த வேண்டும் என்ற நோக்கில், எமது அரசாங்கம் முன்னெடுக்கின்ற 'பிரஜா சக்தி' வேலைத்திட்டத்தில் பெண்களுடைய பங்களிப்பு அதிகரித்திருக்கிறது. விசேடமாக, வீடுகளில் சுயதொழில் செய்கின்ற பெண்கள் இத்திட்டத்தின் ஊடாகக் அடையாளம் காணப்பட்டு, அவர்களைச் சிறந்த தொழில்முனைவோராக மாற்றுவதற்கும், அவர்கள் சமூகத்தில் பொருளாதார ரீதியாகச் சிறந்ததோர் இடத்துக்கு வருவதற்கும், அவர்களின் வாழ்வாதாரத்தில் பாரியதொரு மாற்றத்தை ஏற்படுத்துவதற்குமான வேலைத்திட்டங்களை நாங்கள் இப்பொழுது செய்துகொண்டு இருக்கின்றோம்.

நேற்றைய தினம் பேசப்பட்ட ஒரு விடயத்தைப் பற்றி பேசவேண்டிய அவசியப்பாடு எனக்கு இருக்கின்றது. அதாவது, மலையக மக்களுடைய வீட்டுத்திட்டம் பற்றி பேச வேண்டும். மலையகத்தில் வாழ்கின்ற ஒரு பெண்ணாக, வீடு என்பது ஒரு குடும்பத்துக்கும் பெண்ணுக்கும் எவ்வளவு முக்கியம் என்பதை நான் நன்கு அறிந்திருக்கின்றேன். கபரகலை தோட்டத்தில் வாழ்ந்த 14 குடும்பங்களைச் சேர்ந்தவர்கள் கைவிடப்பட்டிருந்த ஒரு தேயிலைத் தொழிற்சாலையிலே 3½ வருடங்களாக வாழ்ந்து வந்தார்கள். அவர்களில் பெண் பிள்ளைகளும் இருந்தார்கள். இவ்வாறு பல குடும்பங்களோடு வாழும்போது, அவர்கள் எத்தனை சவால்களைச் சந்தித்திருப்பார்கள்? எத்தனை போராட்டங் களைச் சந்தித்திருப்பார்கள்? எத்தனை கஷ்டங்களை அனுபவித்திருப்பார்கள்? இவற்றை அனுபவித்தவர்களுக்குத் தான் இவை பற்றி தெரியுமே தவிர, கொழும்பில் இருந்துகொண்டு மலையக மக்களுடைய நிலைமை புரியாமல், தோட்டப்புறத்தில் வசிக்கின்ற மக்களின் கஷ்டங்கள் புரியாமல் பேசுபவர்களுக்குத் தெரியாது. “6,000 வீடுகளைக் கட்டிக்கொடுப்பதாகச் சொன்னீர்களே! ஏன், இன்னும் கட்டிக்கொடுக்கவில்லை?" என்று கேள்வி கேட்பவர்கள், இந்த வீட்டுத்திட்டம் ஆரம்பிக்கப்பட்டபோது காலநிலை எவ்வாறு இருந்தது என்பதைப் பார்க்க வேண்டும். எத்தனை சவால்களைத் தாண்டி இன்று அந்த மக்களுக்கு அந்த வீடுகளைக் கட்டிக்கொடுத்து இருக்கின்றோம் என்பது அங்கு இருப்பவர்களுக்குத்தான் தெரியும்.

இந்த மலையக மக்களுக்கு வழங்கப்பட்டுள்ள வீடானது, எல்லா வசதிகளையும் கொண்டது. பாதைகள், மின்சாரம், குடிநீர் என எல்லா வசதிகளையும் கொண்ட சிறந்ததொரு வீட்டையே நாங்கள் கொடுத்து இருக்கிறோம். அதேபோல, அந்த வீட்டுக்கான உறுதிப்பத்திரமும் மிகவும் உறுதியானது. மேற்குறித்த நபர்களின் கோபத்துக்குக் காரணம் என்னவென்று நான் யோசித்துப் பார்த்தேன். நாங்கள் வழங்கியிருக்கின்ற கபரகலை வீட்டுத்திட்டமானது, சுற்றுலாத்துறைக்குச் சிறந்த, அழகானதொரு சூழலிலே அமைக்கப்பட்டு இருக்கின்றது.

[ගරු අම්බිකා සාමුවෙල් මෙනෙවිය]

இந்த வீடுகளை யாரும் மூன்றாம் தரப்பினருக்கு விற்க முடியாது. இதற்கு முன்னர் வீடுகளைக் கொடுத்தவர்கள், "நாங்கள் உறுதிப்பத்திரம் கொடுத்தோம்; நீங்கள் கொடுக்கவில்லை" என்று சொல்லிக்கொண்டு இருக்கிறார்கள். இந்த வீட்டுத்திட்டத்திலுள்ள 50 வீடுகளுக்குமான பயனாளிகள் தெரிவில் எந்தவிதமான அரசியல் அழுத்தமும் இருக்கவில்லை. அனர்த்தத்துக்கு உள்ளான, தகுதியானவர்களே பயனாளிகளாகத் தெரிவு செய்யப்பட்டார்கள். இதற்கு முன்னர் கொடுக்கப்பட்ட வீடுகளில் பல இன்று பூட்டிவைக்கப்பட்டு இருக்கின்றன. அதுமாத்திரமன்றி, பல வீடுகள் வாடகைக்குக் கொடுக்கப்பட்டும் இருக்கின்றன. அதற்கான ஆதாரங்கள் என்னிடம் உண்டு. மேலும், பிரதேச சபை தவிசாளர்கள், உறுப்பினர்கள், அரசியல்வாதிகள், அவர்களுடைய கட்சிக்காரர்கள், தொழிற்சங்கவாதிகள் எனத் தகுதியற்றவர்களுக்கு வீடுகள் கொடுக்கப்பட்டுள்ளதுடன், அவற்றில் பல இன்று விற்கப்பட்டும் இருக்கின்றன. "இந்த வீடுகளை இவர்களுக்குக் கொடுக்க வேண்டும். இல்லாவிட்டால், இந்த வீட்டுத்திட்டத்தையே மாற்றுவோம்" என்று அரசியல்வாதிகள் அழுத்தம் பிரயோகித்த நிலையில், எங்களுடைய தேசிய மக்கள் சக்தியின் அரசாங்கத்தால் கட்டிக்கொடுக்கப்பட்ட இந்த வீடுகளானது எந்தவித அரசியல் அழுத்தமும் இல்லாமல் தகுதியானவர்களுக்கே கொடுக்கப் பட்டு இருக்கின்றன.

எங்களுடைய ஆட்சியில் இனிவரும் காலத்தில் கொடுக்கப்படும் வீடுகள் தரமானதாக இருக்கும் அதேவேளை, தகுதியானவர்களுக்கே கொடுக்கப்படும். கடந்த காலங்களில் வீட்டுத்திட்டங்களை மேற்கொள்ளும்போது இடம்பெற்றதாகக் கூறப்படும் ஊழல்கள் குறித்தும் கட்டாயம் விசாரணை செய்து, உரிய நடவடிக்கைகளை எடுப்போம். "நீங்கள் கட்டிக் கொடுக்கின்ற வீடுகளுக்கு உறுதி இல்லை; அது இல்லை" என்று விமர்சிப்பவர்களுக்கு பயம் ஏற்பட்டு விட்டது. அதாவது, தங்களுக்கு மக்களுடைய ஆதரவு இல்லாமல் போய்க்கொண்டு இருக்கிறது, தாங்கள் அரசியல் அநாதைகளாவிட்டோம் என்ற பயத்தில் அவர்கள் இங்கு புலம்பிக்கொண்டு இருக்கிறார்கள். நாங்கள் அந்தப் புலம்பலுக்குப் பயமில்லை. எனவே, நமது அரசாங்கம் தனது ஆட்சிக் காலத்தில், மக்கள் மாட்சியான வாழ்க்கை வாழ்வதற்கான வளமான நாட்டையும் அழகான வாழ்க்கையையும் பெற்றுக்கொடுக்குமெனக் கூறி விடை பெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.56]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
කාන්තාවන් සවිබල ගැන්වීම සම්බන්ධයෙන් වූ යෝජනාවක් සාකච්ඡා කරන මේ අවස්ථාවේ, රටේ අග්‍රාමාත්‍ය ධුරය කාන්තාවකට ලැබී තිබීමත්, ඉතිහාසයේ වැඩිම කාන්තා නියෝජනය මේ දසවන පාර්ලිමේන්තුවෙන් දක්නට ලැබීමත් තුළින් පෙන්නුම් කරනවා, ශ්‍රී ලාංකීය සමාජය කාන්තාවන් සවිබල ගැන්වීමට එකඟ බව. ඒ වාගේම මේ වෙද්දි ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන් අතරින් බහුතරය -සියයට 52ක් - කාන්තාවන් වනවා. ඒක තමයි ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ "ජනතා පරමාධිපත්‍යය" කියලා සඳහන් කරන්නේ. ජනතා පරමාධිපත්‍යයේ වැඩි පංගුව කාන්තාවන්ට හිමි රටක් තමයි මේ රට. ඒ පරමාධිපත්‍යය ක්‍රියාත්මක කරන්නට, ඒ පිළිබඳව කටයුතු කරන්නට මේ පාර්ලිමේන්තුවට අවශ්‍ය බලතල ලබා දීලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන මේ ජනතා පරමාධිපත්‍යයට හානියක් සිද්ධ වන යෝජනාවක්, එහෙම නැත්නම් අයිතිවාසිකම් උල්ලංඝනය වන යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණොත්, මේ බහුතර කාන්තාවන්ට ඒ තුළින් ඍජු බලපෑමක් සිද්ධ වන බව ඒකෙන් තේරෙනවා. එහෙම නම් මේ පාර්ලිමේන්තුවට තේරී පත්වන සියලුදෙනාට ඒ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම පැවරිලා තිබෙනවා.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නමින් ලංකාවේ වාගේම ලෝකයේ බොහෝ රටවල සාකච්ඡා කරන, ලොකු විරෝධතාවක් තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් මේ වෙද්දි ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් ජනතා පරමාධිපත්‍යය තුළින් ලංකාවේ කාන්තාවන් සවිබල ගැන්වීමේ වැදගත්කම ගැන සාකච්ඡා කරන මේ වෙලාවේ මම කියන්න ඕනෑ, අග්‍රාමාත්‍ය ධුරය දරන හරිනි අමරසූරිය මැතිනිය මේ වෙනකල් ඒ පිළිබඳව කිසිදු අදහසක් ඉදිරිපත් කරලා නැති බව. කාන්තාවන් සවිබල ගැන්වීමේදී තෝරා ගන්නා කාන්තාව නිවැරදිද කියන ප්‍රශ්නය අග්‍රාමාත්‍යතුමියගේ නිහඬතාවෙන් පෙන්නුම් කරනවා. ඒ නිසා එතුමියට වගකීමක් තිබෙනවා, ඉදිරි දිනයකදී හෝ මේ පිළිබඳව යම් ප්‍රකාශයක් කරන්නට. ජාතික ජන බලවේගයට කියලා මේ රටේ මිනිස්සු බලය ලබා දුන්නේ අනුරට නොවෙයි. හරිනිගේ ඒ ලස්සන - ලස්සන කියන එකෙන් මම අදහස් කරන්නේ, ඒ වැඩේ ලස්සන ගැන - මාලිමාවට තමයි ඒ බලය ලබා දුන්නේ. ඒ නිසා හරිනි අමරසූරිය කියන අපේ අග්‍රාමාත්‍ය ධුරය හොබවන කාන්තාවට ඒ සම්බන්ධයෙන් ඍජු වගකීමක් තිබෙනවා. මේ අවස්ථාවේ නිහඬව සිටීමේ කිසිදු අයිතියක් එතුමියට නැහැ.

මොකක්ද, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියලා ගෙනාවේ? ඒකේ හංගන්න දෙයක් නැහැ. මේ රටේ ආණ්ඩුව නියෝජනය කරන පාර්ශ්වයට අවශ්‍ය වෙලා තිබෙනවා, අග්‍ර විනිශ්චයකාර ධුරය දරන පුද්ගලයාව දිගටම, බලහත්කාරයෙන් ඒ තනතුරේ තියාගන්න. අග්‍ර විනිශ්චයකාර ධුරය දරන මහත්මයා ඒ පිළිබඳව කිසිදු ඉල්ලීමක් කරලා නැති අවස්ථාවක, මෙතෙක් ඉතිහාසයේ නොවුණු සිදුවීමක් අරගෙන එතුමාට සේවා දිගුවක් ලබා දීලා, බලහත්කාරයෙන් අවුරුදු දෙකක් වැඩ ගන්න දරන උත්සාහයක් තමයි මේ තිබෙන්නේ.

මොනවාද, ලංකාවේ අග්‍ර විනිශ්චයකාර ධුරය දරන කෙනාට පැවරෙන රාජකාරි? පළමුවැනි එක, අධිකරණ සේවා කොමිසමේ සභාපති හැටියට සෑම පහළ අධිකරණ විනිසුරුවරයෙකුගේම විනය, උසස්වීම්, මාරුවීම් සම්බන්ධයෙන් බලතල තිබෙන්නේ, අගවිනිසුරුතුමා අතේ. ඊළඟට, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ පිහිටුවීමේදී ඒ සඳහා විනිසුරුවරුන් පත්කිරීමේ වගකීම තිබෙන්නේ, අගවිනිසුරුතුමා අතේ. ඒ වාගේම ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ලකින් ලබා දෙන තීන්දුවක් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කළොත්, එය විභාග කිරීම සඳහා විනිශ්චය මණ්ඩලය පත්කිරීමේ වගකීම තිබෙන්නේත් අග විනිසුරුතුමා අතේ. ඒ වාගේම ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල ලබා දෙන තීන්දුවක් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කළාම, ශ්‍රේෂ්ඨාධිකරණය හරහා ඒක විනිශ්චය කිරීමේ වගකීම තිබෙන්නේත් එතුමාගේ අතේ. ඒ විනිශ්චය කරන විනිශ්චයකාර මණ්ඩලයට කවුද පත්කරන්නේ කියන වගකීම තිබෙන්නේත් අග විනිසුරුතුමා අතේ. එහෙම නම් අගවිනිසුරු ධුරය කියන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට වාගේම ජනතාවගේ

පරමාධිපත්‍යයටත් විශාල බලපෑමක් කරන්න පුළුවන් තනතුරක්. අන්න ඒ නිසා තමයි අපි දිගින් දිගටම ආණ්ඩුවට කියන්නේ ඒ තනතුරට කිසිම බලපෑමක් නොකර, ඒක ස්වාධීනව තියාගන්න කියලා. හැබැයි, දැන් පෙන්නුම් කරමින් තිබෙන්නේ මොකක්ද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ ආණ්ඩුවේ, එහෙම නැත්නම් මේ ආණ්ඩුවට ඉහළින් ඉන්න එක පුද්ගලයෙකුගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ලක් කරලා, තමන්ට අවශ්‍ය කරන නඩු තීන්දු අරගෙන, තමන්ට ඕනෑ කරන කථාව රට තුළ සමාජගත කරන්න, නීතිය අතට ගන්න දරන උත්සාහයක් තමයි පෙනෙන්න තිබෙන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැන්ම පටන් අරගෙන තිබෙනවා. තීන්දුව එන්න කලින් තීන්දුව කියන්න පටන් අරගෙන තිබෙනවා. අධිකරණයේ ස්වාධීනත්වයට අර්බුදයක් එද්දි, විනිසුරුවරුනුත් අකැමැති වෙද්දි, විනිසුරුවරුන් 65දෙනෙක් තමන් සේවා දිගුවකට අකැමැතියි කියා තිබියදීත්, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියලා බලහත්කාරයෙන් ඒක කරන්න හදනවා. ඒක එක පැත්තකින් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක්.

ඒ අතරතුර ආණ්ඩුවේ ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අගවිනිසුරුතුමාගේ පුතාව ඉලක්ක කරලා නීත්‍යානුකූල නොවන අන්දමට උපයා ගත් ධනයක් පිළිබඳව news එකක් නිකුත් කරමින් පසුගිය දවස්වල මාධ්‍ය මෙහෙයුමක් දියත් කළා. දැන් මොකක්ද සිද්ධ වෙන්නේ? ඒ news එක ඇත්ත හෝ බොරු වේවා, ඒ news එක අල්ලාගෙන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඉතුරු අවුරුදු දෙක තුළ අපට ඕනෑ තීන්දු ටික නොදුන්නොත් ඔබත්, ඔබේ පුතාත් හිරේ, එහෙම නැත්නම් අපට ඕනෑ කරන තීන්දු ටික දෙන්න කියලා. මේක තමයි මේ වෙන්න යන දේ. අමුවෙන් කථා කරන්න වෙන දෙයක් නැහැ. මේ මොහොතේදී අගවිනිසුරුවරයාව බේරා නොගත්තොත් මේ රටේ සමස්ත නීති පද්ධතියම ආණ්ඩුව අතට එන්න පටන් ගන්නවා. ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනයක් කියලා කියන්නේ ඔන්න ඕකයි. මේ ප්‍රජාතන්ත්‍රවාදය කියන අදහස ඇතුළේම තිබෙන්නේ තමන්ට තමන් පිළිබඳව තීරණ ගන්න බැහැ කියන එකයි. ප්‍රජාතන්ත්‍රවාදය කියන අදහස ඇතුළේ තිබෙන්නේ ඒක.

ජනාධිපතිවරයාට රාජකාරි කරන්නට අවශ්‍ය නම් එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවට, අධිකරණයට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ කටයුතු කරන්නේ ස්ථාවර නියෝගවලට එකඟවයි. රාජ්‍ය සේවකයෝ වැඩ කරන්නේ රාජ්‍ය සේවකයන්ට ලබා දී තිබෙන ආයතන සංග්‍රහයට එකඟවයි. එහෙම නම්, මේ රටේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් ලක්ෂණය තමයි, බලය ලබා දීම සහ බලය සීමා කිරීම. එක පැත්තකින් බලය ලබා දෙනවා. අනෙක් පැත්තෙන් බලය සීමා කරන්න පද්ධතියක් තිබෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ මොහොතේදී උත්සාහ කරමින් ඉන්නවා, තමන්ගේ බලය සීමා කරන්න කටයුතු කරන ආයතන ටික තමන්ගේ අතට අරගෙන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ රට පාලනය කරන්න. ඒක තමයි පරාජයට පත් කරන්න ඕනෑ කියන එක අපි දිගින් දිගටම කියමින් ඉන්නේ.

හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේම තව අර්බුදයක් ආවා. ඒ අර්බුදය තමයි, විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම පිළිබඳව නිශ්චිතව සඳහන් නොකිරීම. එහෙම විශ්‍රාම වයස දීර්ඝ කිරීම පිළිබඳව සඳහන් කරලා නැති අවස්ථාවක ආණ්ඩුව පැත්තෙන් - කැබිනට් මණ්ඩලය විසින් - කළ යුතුව තිබුණේ ජනතා පරමාධිපත්‍යයට මේ අවස්ථාව ලබා දීමයි. ඒ තමයි, ජනමත විචාරණයකින් එම දිගුව ලබා ගැනීමේ අවස්ථාව ඉල්ලීම. ඒ වෙනුවට ආණ්ඩුව මොකක්ද කළේ? වගකීම් විරහිතව, හිතාමතාම ඒක ශ්‍රේෂ්ඨාධිකරණයට අත්හැරීම. දැන් ශ්‍රේෂ්ඨාධිකරණයට ආපු ප්‍රශ්නය තමයි, තමන් පිළිබඳ නීතියක්, තමන් පිළිබඳ තීරණයක් තමන්ටම විභාග කරන්නට සිද්ධ වීම. මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ ඊළඟ අර්බුදය. තමන් පිළිබඳ තීරණ තමන්ට ගන්න බැරි වන විධියට system එක හදලා තිබියදී, ඒ system එක බිඳ දැමීම කරන්න මේ ආණ්ඩුව උත්සාහ කරමින් ඉන්නවා. එම නිසා මේ උත්සාහය පරාජයට පත් කළේ නැත්නම් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විශාල අනතුරකට යන බව දිගින් දිගටම පෙන්නුම් කරමින් තිබෙනවා. මේක අපි කියන එකක් නොවෙයි. මේක ලෝකයේ ඉන්න සියලුදෙනාත් කියනවා, නීති ක්ෂේත්‍රයේ ඉන්න සියලුදෙනාත් කියනවා.

ඊළඟ කාරණාව මේකයි. මේ වෙද්දී ආණ්ඩුව, විශේෂයෙන්ම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමන්ගේ අතේ පොඩි භාණ්ඩ ටිකක් තියාගෙන ඉන්නවා. පළමුවැනි එක තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම. දෙවැනි එක තමයි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. තුන්වැනි එක තමයි, පොලීසිය. හතරවැනි එක තමයි, තමන්ගේ ඩිජිටල් ත්‍රස්තවාදීන් ටික. පස්වැනි එක තමයි, 1988 ඉඳලා ත්‍රස්තවාදී ක්‍රියා කරපු මානසිකත්වයේ ඉන්න ඔරිජිනල් ත්‍රස්තවාදීන් ටික. මෙන්න මේ පහ භාවිත කරමින් තමයි මේ මොහොතේදී තමන්ගේ රටේ ජන මතය වෙනස් කරන්න උත්සාහ කරන්නේ. ජනතාවගේ සුබසිද්ධිය ඉහළ නංවන්නට

[ගරු අමිල ප්‍රසාද් මහතා]

නොවෙයි, රට ආර්ථික වශයෙන් දියුණු කරන්න, තමන්ගේ පාලන බලය පවත්වාගෙන යන්න මේ පහ යොදාගෙන කටයුතු කරනවා. මේක මම කියන එකක් නොවෙයි.

මේ සතියේ පුවත් පතක වාර්තා කරලා තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට වෙනම නීතියක් නැහැ කියලා. මොකද, අල්ලස් කොමිසම දැනුත් පටන් අරගෙන තිබෙන්නේ ජනාධිපතිතුමාගේ හයිය පාවිච්චි කරලා අධිකරණයට ඕනෑ තොරතුරු නොදී ඉන්න මට්ටමට කටයුතු කරන්නයි. ඒ කියන්නේ, මේ මොහොත වනවිටත් මේ අනතුර ආරම්භ වෙලා තිබෙන්නේ. එම නිසා රටක් හැටියට අපට සිද්ධ වෙනවා, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරාජයට පත් කරලා කාන්තාවන්ගේ විතරක් නොවෙයි, ලංකාවේ සියලු ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්න. ඒ වෙනුවෙන් විරෝධය දක්වන සියලුමදෙනා කළු මිනිස්සු හැටියට සලකන්නට තරම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ වෙනුවෙන් විරෝධතා දක්වපු හැම කෙනාම පොඩි මිනිස්සු හැටියට සලකමින් කථා කරන්න පුරුදු වෙලා තිබෙනවා. කවුද මේ? කුඩා ජන වරමක් නොතිබුණු, සියයට 50ක් ගන්න බැරි වුණු පොඩි මිනිහෙක් දැන් ඇවිල්ලා කියනවා, පොඩි පොඩි හඬවල්වලට අපි එකඟ වෙන්නේ නැහැ කියලා. මොනවාද, මේ පොඩි හඬවල්? ගරුතර මහා සංඝරත්නය නියෝජනය කරමින් මහානායක හාමුදුරුවරු කිව්වා, මේක කරන්න එපා කියලා; අනුරට අනුව ඒක පොඩි හඬක්. නීතිඥ සංගමය කිව්වා; අනුරට අනුව නීතිඥ සංගමය පොඩි හඬක්. විනිසුරු සංගමය කිව්වා; අනුරට අනුව විනිසුරු සංගමයත් පොඩි හඬක්. ජාත්‍යන්තර සංවිධාන කිව්වා; අනුරට අනුව ඒක පොඩි හඬක්. ඊට අමතරව අවසාන වශයෙන් පොදු රාජ්‍ය මණ්ඩලයීය නීතිඥ සංගමය කිව්වා; අනුරට අනුව ඒක පොඩි හඬක්.

අපි ආණ්ඩුවෙන් අහනවා, අනුරගෙන් අහනවා, ඔබ ඔය කියන ලොකු හඬ කවුද කියලා. ඒ හඬ එනකල්ද ඔබ බලාගෙන ඉන්නේ? ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම දවසින් දවස, දවසින් දවස ක්‍රියාත්මක කරමින්, ප්‍රජතන්ත්‍රවාදය විනාශ කරමින් ඉන්න මොහොතක ආණ්ඩුවෙන් මම ඉල්ලීමක් කරනවා. මේක තමයි සමාජයේ පණිවුඩය. මේ සාකච්ඡාවට මම එකතු කරන්නේ මේ සමාජයේ පණිවුඩය. දිගින් දිගටම ඔබ, සමාජයෙන් එන පණිවුඩයේ පණිවුඩකරුවාට වෙඩි තැබීමේ සංකල්පයක තමයි හිටියේ. මම ඉල්ලීමක් කරනවා, අර කණ්ඩායම් පහ දාලා, එහෙම නැත්නම් වෙනත් ක්‍රමයකට පණිවුඩකරුවා වන මාව විනාශ කරන්නේ නැතුව පණිවුඩය තේරුම් ගන්න උත්සාහ කරන්න කියලා. මෙහෙම එකක් ඔබ ක්‍රියාත්මක කරන්න හිටියා නම් ඔබට තිබුණා, ජන වරම ගනිද්දී ඒක කියන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
තත්පර කීපයකින් මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඔබට තිබුණා, තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට මේක දමන්න. ඒ එකක්වත් ප්‍රතිපත්ති ප්‍රකාශනයට දැම්මේ නැත්තේ මේක සැබෑ අවස්ථාවාදය නිසායි. ඒ අවස්ථාවාදය පරාජයට පත් කරන්න ජනතාවට එකතු වෙන්න කියලා කියමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ කථාව පටන් ගන්න ඉස්සෙල්ලා මම මේ කාරණය කියන්න කැමැතියි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරමින් අධිකරණයට, විශේෂයෙන්ම ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට විශාල අපකීර්තියක්, අපහාසයක් සිද්ධ කරනවා. මේ කථාවල අඩංගු අනවශ්‍ය වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට කටයුතු කරන්න කියලා මම ඔබතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභාවෙන් දිගින් දිගටම ඉල්ලා සිටිනවා, කථා පවත්වනකොට විශේෂයෙන්ම අධිකරණය සහ පුද්ගලයන් අපහසුතාවට පත් වන විධියට කථා කරන්න එපා කියලා. එවැනි කථා සහ අදාළ නොවන වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියාත් මම ඉල්ලා සිටිනවා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Point එක කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ඔය කාරණය තිබෙන්නේ 83 (1)වන ස්ථාවර නියෝගය යටතේ. 83 (1)වන ස්ථාවර නියෝගය මම මේ කියන්නේ. හැන්සාඩ් වාර්තාවෙන් මගේ කථාව ඉවත් කරන්න කියන එක තමයි point එක. 83 (1)වන ස්ථාවර නියෝගය ගැන වූ නිශ්චිත සඳහන මට කරන්න ඉඩ දෙන්න. එහි මෙසේ සඳහන් වනවා:

> "ජනාධිපතිවරයාගේ හෝ වැඩබලන ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ, විනිශ්චයකාරවරයන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් තැනැත්තන්ගේ පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරනු නොලැබිය යුත්තේ ය."

පෞද්ගලික පැවැත්ම පිළිබඳව නොවෙයි මම කථා කළේ. මම කථා කළේ මේ තත්ත්වය යටතේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සිද්ධ වන දේ. පෞද්ගලික පැවැත්මක් ගැන මම කථා කළේ නැහැ. පෞද්ගලික පැවැත්ම කියන්නේ මොකක්ද? *[බාධා කිරීමක්]* පෞද්ගලික පැවැත්ම කියන්නේ, පෞද්ගලිකව කරන වැඩ රාජකාරි. කොහේද මම එහෙම එකක් කථා කළේ? *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.06]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවාසනාවකට, අපේ රටේ තිබෙන සමාජ, ආර්ථික සහ දේශපාලන තත්ත්වය පිළිබඳ හොඳ දර්ශකයක් තමයි විරුද්ධ පක්ෂයේ අද ඉතුරු වෙලා ඉන්න මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පෙනෙන්නේ. දැනට ඉතුරු වෙලා ඉන්න, නන්නත්තාර වෙලා ඉන්න අය තමන් කථා කරන්නේ මොකක්ද කියලා දන්නේ නැහැ. අග්‍ර විනිශ්චයකාරතුමාගේ ප්‍රධාන වගකීම අධිකරණ සේවා කොමිෂන් සභාවට නායකත්වය දෙන එක නොවෙයි. තමන් නොදන්නා දේවල් ගැන කථා නොකර දන්නා දේවල් ගැන විතරක් කථා කරන්න ඕනෑ. අග්‍ර විනිශ්චයකාරතුමාගේ ප්‍රධාන වගකීම අධිකරණ සේවා කොමිෂන් සභාවට නායකත්වය දෙන එක නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණයට නායකත්වය දෙන එක, අධිකරණ පද්ධතියට නායකත්වය දෙන එක.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වාගේ සමාජයක් තමයි අපට පරිවර්තනය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අද දිනයේදී ඉතා වැදගත් යෝජනාවක් කාන්තා හා ළමා කටයුතු ගරු අමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරනු ලැබුවා. මෙවැනි වැදගත් යෝජනාවක් සම්බන්ධයෙන් කථා කරන්න අද විරුද්ධ පක්ෂයේ කාන්තා නියෝජිතවරියකට එක විනාඩි 5ක්වත් වෙන් කරලා නැහැ. ඒගොල්ලන්ගේ තත්ත්වය තමයි ඒකෙන් පෙන්නුම් කරන්නේ. අපි කල්පනා කරන දේ මේකයි. මේගොල්ලන්ටත් උගන්වා ගෙන, මේ සමාජය නව පරිවර්තනයකට ලක් කිරීමේ වගකීම තමයි මේ රටේ ජනතාව අපට භාර දීලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් අපි ඉදිරිපත් කළේ විරුද්ධ පක්ෂය ඇතුළු මුළු සමාජයම නව පරිවර්තනයකට ලක් කිරීමේ වගකීම අපි භාර ගන්නවා කියන එකයි. ඒ සඳහා කටයුතු කරනකොට පවතින නීතිරීති, පවතින ව්‍යුහයන්, පවතින ආයතන අපට ප්‍රතිසංවිධානය කරන්න වෙනවා.

2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත ගත්තොත්, මේ පනතින් පැවරිලා තිබුණු වගකීමක් තමයි, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවීම. ඇත්තටම ගෙවී ගිය ඉතිහාසය තුළ මේ එක් එක් ක්ෂේත්‍ර පිළිබඳව දක්වපු උනන්දුව, ප්‍රතිපත්ති සම්පාදනය කරන මේ පාර්ලිමේන්තුව ඒ පිළිබඳව දක්වපු අවධානය තමයි පෙන්නුම් කරන්නේ. ජාතික කාන්තා කොමිෂන් සභාව පිහිටුවලා, එය බලාත්මක කරලා, ඒ කොමිෂන් සභාව හරහා විශාල කාර්යභාරයක් කිරීම තමයි අපේ බලාපොරොත්තුව. අපේ කාන්තා සමාජය තුළ පසුගිය කාලය පුරාම වාගේම අදටත් දකින්න ලැබෙන පසුගාමීත්වය, එහෙම නැත්නම් ඒ කාන්තාවන්ට සමාජයේ ලැබිය යුතු සමාන අයිතිවාසිකම් පිළිබඳව තිබෙන තත්ත්වයන් තහවුරු කිරීමට අසමත් වීම කියන කාරණාවේදී අපේ ආණ්ඩුව කල්පනා කරනවා, එක පැත්තකින් මේ පවතින ආයතන ශක්තිමත් කරන්න ඕනෑ; පවතින ව්‍යුහයන් වඩා සංවිධානාත්මක කරන්න ඕනෑ කියලා. ඒ අනුව තමයි ජාතික කාන්තා කොමිෂන් සභාවේ සභාපති ඇතුළු කමිටු සාමාජිකයන්ට දීමනා හා පාරිශ්‍රමික තීරණය කිරීම පිළිබඳ යෝජනාව අද දිනයේ ඇමතිවරිය විසින් ඉදිරිපත් කරනු ලැබුවේ. මේක ඉතා වැදගත් යෝජනාවක්. මේ යෝජනාවේදී අපි ආණ්ඩුවක් හැටියට කල්පනා කරනවා, මේ කොමිෂන් සභාව හරහා කාන්තාවට අදාළ අයිතිවාසිකම්, ඒ වගකීම් සියල්ල ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය කරන ආයතන ව්‍යුහයක් බලාත්මක කිරීම, ශක්තිමත් කිරීම සහ ඊට අමතරව අවශ්‍ය නම් නව නීති-රීති, නව අණපනත් පැනවීම. ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කිසිවක් වෙන වෙනම අරගෙන - වියුක්තව අරගෙන - සංවර්ධනය කරන්න පුළුවන්කමක් නැහැ; දියුණු කරන්න පුළුවන්කමක් නැහැ කියලා අපි විශ්වාස කරනවා. අපේ මුළු සමාජයම අත්පත් කරගෙන තිබිච්ච පසුගාමීත්වයේ තත්ත්වය තමයි අපට මේ දකින්න ලැබෙන්නේ.

මේ සම්බන්ධව දේශපාලන ව්‍යාපාරයක් හැටියට, ආණ්ඩුවක් හැටියට අපි කල්පනා කරන දේ මෙයයි. සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික දැක්මකින් යුක්තව දීර්ඝ කාලීන ක්‍රියාවලියක් ඇතුළේ තමයි මේ රටවල්, මේ සමාජයන් ශිෂ්ට සම්පන්න බවට පත් කිරීමේ වගකීම පාලකයන්ට පැවරිලා තිබෙන්නේ. පාලකයන් නොදියුණු, අශිෂ්ට පාලකයන් වුණාම නීති-රීති කොච්චර පැනෙව්වත්, නීති-රීති කොච්චර පොත්පත්වල තිබුණත් වැදගත්කමක් ඇති වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගත්තොත්, එහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය දැන් අවුරුදු 48ක් තිස්සේ ක්‍රියාත්මක වුණා. ඒ අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් වෙලා තිබුණා. හැබැයි, ඒවා පොතට සීමා වුණා. අපි පරම්පරා ගණනක් ඇස් දෙකෙන් දැක්කා, පාරවල් ගාණේ මිනිස්සු මරලා දානවා; පාලකයන්ට අවශ්‍ය විධියට පුද්ගලයන් අතුරුදහන් කරනවා. නාස්තිය, දූෂණය ඉහ වහා ගිය පාලනයක් අපි අත්දැක්කා. නීති-රීති කොච්චර පොත්පත්වල තිබුණත් පාලකයා අශිෂ්ට නම් ඒකෙන් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. අපේ ජාතික ජන බලවේගය රජය බලයට පත් වෙලා ගෙවී ගිය වසර දෙක ඇතුළත මේ ආණ්ඩුවට විරුද්ධව කිසිම මූලික අයිතිවාසිකම් කඩකිරීම් පිළිබඳ චෝදනාවක්, එහෙම නැත්නම් උද්ඝෝෂණවලට පහරදීමක්, පුද්ගලයන් අතුරුදහන් කිරීමක් පිළිබඳව චෝදනාවක් ඇවිත් නැහැ. ඉංග්‍රීසි වචනයක් වැරදිච්ච එකක් පිළිබඳ චෝදනාවක් වැනි ඉතා සිල්ලර ගණයේ චෝදනා තමයි අපට විරුද්ධව විපක්ෂයේ අයට ඉදිරිපත් කරන්න වෙලා තිබෙන්නේ. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. ආණ්ඩුවක් හැටියට අපි ආඩම්බර වෙනවා. ඒගොල්ලන් වාගේ දීර්ඝ කාලයක් මේ රටේ ආණ්ඩුකරණයේ යෙදිලා, මේ රට විනාශ කරපු කණ්ඩායමකට අයත් නොවී ජනාධිපතිවරයා ඇතුළු අපේ කණ්ඩායම දැන් සමත් වෙමින් තිබෙනවා, සෑම ක්ෂේත්‍රයකම ඒ අවශ්‍ය කරන පරිවර්තන ආරම්භ කරලා, සමාජයක් හැටියට ලෝකයේ දියුණු, ශිෂ්ට සම්පන්න රටක් බවට පරිවර්තනය කිරීමේ දිශාවට මේ රට ගෙන යන්න. එහිදී නීතියේ පාලනය ස්ථාපිත වෙලා සෑම ක්ෂේත්‍රයක්ම ශක්තිමත් වෙනවා.

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව දීර්ඝ කාලයක් තිස්සේ තිබෙනවා. ශ්‍රී ලංකා පොලීසිය දීර්ඝ කාලයක් තිස්සේ තිබෙනවා. මේ ආයතන කාටවත් තර්ජනයක් වෙලා නැහැ. අපරාධකාරයන්ට, දූෂිතයන්ට ඒ ආයතන අද තර්ජනයක් බවට පත් වෙලා තිබෙනවා. මේ හැම ආයතනයක්ම අද ශක්තිමත් වෙලා තිබෙනවා. එහෙම ශක්තිමත් වෙලා තිබෙන්නේ පාලකයා සහ පාලනය යහපත් නිසා. දැන් පාලනය කරන්නේ ජාතික ජන බලවේගය රජය. මේ රජය ඇතුළේ මේ හැම ආයතනයකටම ඔවුන්ගේ ස්වාධීනත්වය, ඔවුන්ට අවශ්‍ය කරන නීතිමය ව්‍යුහයන්, වටපිටාවන් සකස් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ඔක්කෝම කෙඳිරි ගාන්නේ.

ඒගොල්ලන් පසුගිය කාලයේ කිව්වා, "අපරාධකරුවන් අල්ලන්නේ කොහොමද? කෝ, අපට නඩු නැහැ. ෆයිල් කෝ?" කියලා. එහෙම අහපු අයගේ කටවල් දැන් වැහිලා. දැන් ඔක්කෝම හය බිරාන්ත වෙලා. ඒගොල්ලන් දැන් චෝදනා එල්ල කරනවා. අපි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා තිබෙනවා. අධිකරණ ක්ෂේත්‍රය තුළ අපි ආරම්භ කර තිබෙන ප්‍රතිසංස්කරණවල එක්තරා කුඩා කොටසක් හැටියට තමයි විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම පිළිබඳව යෝජනාව ඇවිල්ලා තිබෙන්නේ. මේක කිසිසේත්ම අධිකරණයට, එහෙම නැත්නම් නීතියට කරන මැදිහත්වීමක් නොවෙයි. මේ තිබෙන ක්ෂේත්‍ර යම් යම් ප්‍රතිසංස්කරණවලට ලක් කිරීම අපිට ලැබිලා තිබෙන ජනවරමේ අංගයක්. එහිදී විපක්ෂයේ කවුරුන් හෝ කල්පනා කරනවා නම් ඔවුන් වාගේ; ඔවුන් මේවාට කරපු මැදිහත්වීම වාගේ මැදිහත්වීමක් අපේ රජය කරනවා කියලා, ඒක වැරදියි. ඉදිරි කාලය තුළ ඔවුන්ට දකින්න ලැබේවි, මේ ක්ෂේත්‍ර තුළ අපි කර තිබෙන වෙනස්කම් එක්ක මේ රටේ ජනතාවට වඩා හොඳ සේවාවක් ලබා දෙන්න පුළුවන් විධියට මේ සෑම ක්ෂේත්‍රයකම ආයතන පද්ධති ශක්තිමත් වෙන ආකාරය.

අපි ජාතික කාන්තා කොමිෂන් සභාව ස්ථාපිත කරලා මේ රටේ කාන්තාවන් සම්බන්ධයෙන් අද ආරම්භයක් හැටියට ගන්න මේ තීරණයේ ප්‍රතිඵල මම හිතන විධියට ඉතා කෙටි කාලයක් ඇතුළත; අවුරුදු කිහිපයක් යනකොට ඔබට දකින්න ලැබේවි. අපේ ආණ්ඩුව ගත්තත්, අපේ ආණ්ඩුවේ මන්ත්‍රීවරියන් 22කට වැඩි ප්‍රමාණයක කාන්තා නියෝජනයක් තිබෙනවා. ඒ වාගේම, පළාත් පාලන ආයතන ගත්තත්, අපි ඒවාට විශාල කාන්තා නියෝජනයක් ලබා දී තිබෙනවා. ප්‍රායෝගිකව, ප්‍රගතිශීලී දැක්මකින් යුක්තව, දීර්ඝකාලීන සැලැස්මක් ඇතුව මේ රට ශිෂ්ට සම්පන්න දියුණු රාජ්‍යයක් බවට පත් කිරීමේ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" අත්පත් කර දීමේ දිශාවට අපි රට මෙහෙයවනවා. කවර ආකාරයේ දූෂිතයන්, ඔවුන්ගේ ගෝලබාලයන් මේ ආණ්ඩුවට එරෙහිව විවිධ චෝදනා එල්ල කළත්, අපි මේ ගමන ඉතාම ධෛර්යසම්පන්නව යන බව ප්‍රකාශ කරමින්, මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එන්.එම්.එම්. තාහීර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[பி.ப. 3.17]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று பெண்களின் வலுவூட்டல் சட்டத்தின்கீழான தீர்மானம் மீதான விவாதத்திலே நாங்கள் பேசிக்கொண்டு இருக்கின்றோம். உண்மையிலேயே அந்த ஆணைக்குழுவுக்கு அதிகாரங்களை வழங்கி, அதன் பணிகளை முன்னெடுப்பதற்கான சந்தர்ப்பத்தை வழங்க வேண்டும். அதை முன்னெடுக்கின்ற அரசாங்கத்துக்கு எங்களுடைய ஆதரவை இச்சந்தர்ப்பத்தில் வழங்குகின்றோம்.

பொதுவாக இந்த நாட்டிலே மூவின மக்களும் வாழ்கின்றார்கள். எனவே, அந்த மக்களுடைய எல்லா விடயங்களையும் நாங்கள் கருத்திற்கொள்ள வேண்டிய தேவை இருக்கின்றது. பெண்கள் என்று கூறுகின்றபோது, அவர்களுக்குப் பல கடமைகளும் பொறுப்புகளும் இருக்கின்றன. எல்லாக் கடமைகளையும் நிறைவேற்றப் பார்க்கின்ற சந்தர்ப்பத்திலே, தாய்மை என்பது மிக முக்கியமானது. ஒரு சகோதரியாக, மனைவியாக, தாயாக அவர்கள் மிகக் கூடுதலான பங்களிப்பைச் செய்கின்றார்கள். தாய்மைப் பொறுப்பை நிறைவேற்றிக் கொண்டுதான் இந்த நாட்டில் நடைபெறும் எல்லா விடயங்களிலும் அவர்கள் கவனம் செலுத்த வேண்டியவர்களாக இருக்கின்றார்கள். ஓர் ஆசிரியராக, ஒரு வைத்தியராக அல்லது இங்கே இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களாக அவர்கள் பல விடயங்களைக் கையாளுகின்றார்கள். அவர்களுடைய தேவைகளைக் கவனத்திற்கொள்வதுடன், அவர்களை உளரீதியான பாதிப்புகளில் இருந்தும் பாதுகாக்க வேண்டிய தேவையும் இருக்கின்றது. எனவே, பெண்களுக்காக உருவாக்கப்படும் இந்த ஆணைக்குழுவுக்கு பல அதிகாரங்கள் வழங்கப்படுவது முக்கியமானதாகும்.

குறிப்பாக, பெண்கள் அரச அலுவலகங்களிலும் தனியார் அலுவலகங்களிலும் பணிபுரிகின்றபோது பல

அசௌகரியங்களுக்கு உட்படுகின்றார்கள். அவ்வாறான சந்தர்ப்பங்களில், அவர்கள் இவ்வாறான பிரச்சினைகளை எங்கே முறையிடுவது, அதற்கான பரிகாரத்தை எவ்வாறு பெறுவது என்பது பற்றிய சிக்கல்களை எதிர்கொள்கின்றார்கள். அவர்களுடைய எதிர்கால நலனைக் கவனத்திற்கொண்டு அவற்றை மூடி மறைக்கின்ற சந்தர்ப்பங்களும் கூடுதலாக இருக்கின்றன. அவ்வாறான சந்தர்ப்பங்களே அவர்களுடைய நடைமுறை வாழ்க்கையில் பல இன்னல்களையும் துன்பங்களையும் ஏற்படுத்துகின்றன. எனவே, இன்று எடுக்கப்படுகின்ற நடவடிக்கைகள் எதிர்காலங்களில் அவர்களுக்குப் பாதுகாப்பானதாக அமையும் என்று நம்புகின்றோம். இந்த அரசாங்கம் அவ்வப்போது சட்ட நடைமுறைகளில் மாற்றங்களைக் கொண்டுவருகின்றது. அந்த வகையில், இன்றைய விவாதத்துடன் தொடர்புபடுத்தி அண்மையிலேயே கல்முனை வைத்தியசாலையில் நடந்த பிரச்சினையைக் குறிப்பிடலாம் என நினைக்கின்றேன். அந்தப் பிரச்சினைக்கு இதுவரைக்கும் தீர்வைப் பெற்றுக்கொடுக்காத நிலையிலே, அந்த சிற்றூழியர்களுடைய ஆடை தொடர்பான பிரச்சினை இன்றுவரை தீர்க்கப்படாமல் இருக்கின்றது.

ஏன் அதற்கான தீர்வைப் பெற்றுக் கொடுக்க முடியாது? என்பதை இன்றைய தினமாவது அமைச்சர் சொல்வார் என்று எதிர்பார்த்தோம். ஆனால், அமைச்சர் சபையில் இல்லை. பாராளுமன்றத்தைப் பொறுத்தவரையில், முன்வைக்கப்பட்ட கருத்திட்டத்திற்கு அப்பால் உறுப்பினர்கள் பேசுகின்றார்கள் என்று அடிக்கடி பிரச்சினைகள் நடந்து கொண்டிருக்கின்றன. கருத்திட்டத்தைக் கொண்டுவந்த அமைச்சரே பாராளுமன்றத்தில் இல்லாதிருக்கும்போது, யாரிடத்திலே எதனை முறையிடுவது என்ற பிரச்சினைக்கு முதலிலே தீர்வு காண வேண்டிய தேவைப்பாடு இருக்கின்றது. நாங்கள் சில சந்தர்ப்பங்களிலே பார்க்கின்றோம். ஆளுந்தரப்பில் இருக்கின்றவர்கள் பேசினால் எந்தப் பிரச்சினையும் இல்லை. ஆனால், எதிர்த்தரப்பில் இருப்பவர்கள் அதற்கான கருத்துகளைச் சொல்கின்றபோது, ஹன்சாட்டிலிருந்து நீக்கப்படுவதற்கான சந்தர்ப்பம் இருக்கின்றது என்று கூறப்படுகிறது. கடந்த 70 வருடங்களுக்கும் மேலாக ஆட்சி செய்த அரசாங்கங்களை விடவும், கொடுங்கோலான ஆட்சியாகவே நாங்கள் இதைப் பார்க்கின்றோம். எனவே, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை விவகாரத்தில் ஒரு தீர்க்கமான முடிவு எடுக்கப்பட வேண்டும். பெண்கள் சம்பந்தமாகவும் ஏனைய விடயங்கள் சம்பந்தமாகவும் இங்கு பேசுகின்ற எதிர்த்தரப்பில் இருக்கும் பெண்கள்கூட இதுபற்றி பேசவில்லை என்று கூறுகின்றீர்கள். பேசி என்ன செய்ய? என்ற மனநிலையில்தான் இந்த அரசாங்கத்தோடு எல்லோரும் பயணிக்க வேண்டிய நிலை இருக்கின்றது.

அரசினுடைய செயற்பாடுகள் சம்பந்தமாக நான் ஒரு விடயத்தை இந்த இடத்திலே கூறலாம் என்று நினைக்கின்றேன். சர்வதேச மகளிர் தினம் அனுஷ்டிக்கப்படுகின்ற வாரத்திலேதான், ஈரானுக்கு எதிரான இஸ்ரேல்-அமெரிக்காவுடைய விமானக் குண்டு வீச்சின்போது, ஒரு பெண்கள் பாடசாலை தாக்குதலுக்கு உள்ளாக்கப்பட்டு 100க்கும் அதிகமான சிறுமிகள் மரணித்த சம்பவம் இடம்பெற்றது. அந்த விடயத்துக்கு ஓர் அனுதாபச் செய்தியைக் கூற முடியாதவர்கள்தான் இந்தப் பாராளுமன்றத்தில் மகளிர் அமைச்சராகவும், ஏனைய பாராளுமன்ற உறுப்பினராகவும் இருக்கின்றனர். இங்கு எந்த விடயத்தைக் கொண்டுவந்தாலும் அதற்கு ஆதரவாக அல்லது எதிராக எங்களுடைய கருத்துகளை உள்ளீர்க்கும் வகையில் கூறினாலும் அது எந்தவித பிரயோசனமுமற்ற விடயமாகவே காணப்படுகின்றது.

கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஹிஸ்புல்லாஹ் அவர்கள், நாளை கொண்டுவரவிருக்கின்ற பிரேரணை தொடர்பாகப் பேசுவதற்குச் சில நேரம் எனக்குச் சந்தர்ப்பம் கிடைக்காமல் போகலாம். எனவே, அது குறித்த ஒருசில கருத்துகளையும் இந்த இடத்தில் பேசலாமென நினைக்கின்றேன். "இலங்கை தென்கிழக்குப் பல்கலைக்கழகத்துக்கு மருத்துவ பீடமொன்றை நிறுவுதல்" என்ற பிரேரணையை அவர் நாளை கொண்டுவர இருக்கிறார். இங்கிருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் அது தொடர்பாகப் பல தடவை பேசி இருக்கின்றார்கள். நானும்கூட பேசியிருக்கின்றேன். மறைந்த தலைவர் எம்.எச்.எம். அஷ்ரப் அவர்கள் தென்கிழக்குப் பல்கலைக்கழகத்தின் உருவாக்கத்திற்கு முன்னின்று உழைத்தவர். ஒரு மருத்துவ பீடத்தையும் அங்கு உருவாக்க வேண்டிய தேவையிருந்தது. அதற்குப் பல காரணிகளும் இருந்தன. அந்தப் பிரதேசத்தில் 1,000 கட்டில்களைக் கொண்ட ஒரு Teaching Hospitalஐ பாலமுனை மண்ணில் நிறுவுவதற்கான வேலைத்திட்டத்தை அப்போது ஆரம்பித்து அதற்கான இடத்தையும் அடையாளப்படுத்தி இருந்தார். அவர் 2000ஆம் ஆண்டு மரணித்ததற்குப் பின்னர் இதுவரை காலத்திலும் அதற்கான சந்தர்ப்பம் ஏற்படவில்லை. "நாங்கள் பணத்தைச் சேமித்து வைத்திருக்கின்றோம்; எம்மிடம் நிதி வளங்கள் இருக்கின்றன" என்று அரசாங்கம் கூறுகின்ற இந்தச் சந்தர்ப்பத்திலே இதனை முன்னெடுப்பதற்கான வாய்ப்புகள் இருப்பதனால் அதனை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த அரசாங்க காலத்தில் நிந்தவூரிலே ஒரு வைத்தியசாலைக் கட்டுவதற்கான வேலைத்திட்டம் முன்னெடுக்கப்பட்டிருந்தாலும், அது ஆரம்பக் கட்டத்திலேயே கைவிடப்பட்டு இருந்தது. அந்தப் பிரதேசத்தில் இருக்கின்ற பள்ளிவாசலுடைய காணி உட்பட அந்தப் பிரதேசத்தில் இருக்கின்ற தனவந்தர்களுடைய மற்றும் வெளிநாடுகளில் வியர்வை சிந்தி உழைத்த எங்கள் சகோதரர்களுடைய நிதியைக் கொண்டு கொள்வனவு செய்யப்பட்ட சுமார் 7 ஏக்கர் காணி இன்று காடு பிடித்துக் கிடக்கின்றது. நிந்தவூரில் வைத்தியசாலை அமைப்பதற்கென வாங்கப்பட்ட அந்தக் காணியை சுகாதார அமைச்சுக்குத் தாரைவார்த்துக் கொடுத்திருக்கின்றார்கள்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

அந்த இடத்திலேயே தென்கிழக்குப் பல்கலைக்கழகத்துக்கு மருத்துவ பீடமொன்றை நிறுவினால், அந்தப் பிராந்தியத்தில் இருக்கின்ற எல்லோருக்குமான சேவையை இந்த அரசாங்கம் செய்தது என்ற நன்மதிப்பைப் பெறுவதற்கான சந்தர்ப்பம் இருக்கிறது. காரணம், அந்தப் பிரதேசத்தில் இருக்கின்ற சுமார் 80,000க்கும் மேற்பட்ட முஸ்லிம் மக்கள் உங்களுக்கான வாக்குகளை அள்ளி வழங்கினார்கள். ஏன்? நீங்கள் கொடுத்த வாக்குறுதிகள் அப்படி! எனவே, அந்த மக்களின் பிரச்சினைகளைத் தீர்த்து, அவர்களின் அடிப்படைத் தேவைகளையும் பூர்த்தி செய்ய வேண்டும். அங்கே ஆரம்பிக்கப்பட்டு இடைநடுவில் கைவிடப்பட்டிருக்கும் கட்டிடங்களைப் பூர்த்தி செய்து கொடுக்க வேண்டும். நாங்கள்

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

அடிக்கடி ஒலுவில் துறைமுகத்தைப் பற்றி பேசி வருகிறோம். கடலரிப்பினால் அந்தப் பிரதேச மக்கள் தங்களுடைய தோட்டங்களை, காணிகளை இழந்துள்ளார்கள். அதற்கான இழப்பீடுகளைக்கூட இதுவரை கொடுக்காமல் இருக்கின் றீர்கள். எனவே, தென்கிழக்குப் பல்கலைக்கழகத்துக்கு மருத்துவ பீடமொன்றை நிறுவுவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமென இந்தச் சந்தர்ப்பத்திலே கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[3.25 p.m.]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

Hon. Presiding Member, today, before I start off my speech, I would like to mention that a special friend of mine is up there in the Public Gallery. We studied together in England. She is here today, watching her friend at work, I believe. Incidentally, her name is Geshni Gunasekera, who happens to be the late Hon. Prins Gunasekera's daughter. I welcome her to the Public Gallery of Parliament.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කරන දේශනත් එක්ක බලන කොට අද දිනයේදී විවාද කරන මාතෘකාව මොකක්ද කියන එකත් සමහර වෙලාවට හිතා ගන්න බැරි වෙනවා. පනතක් ගැන හෝ Regulation එකක් ගැන පාර්ලිමේන්තුවේ තර්ක කරන කොට අවධානයට ගැනෙන මූලික දෙයක් තිබෙනවා. ඉදිරියේදී අධිකරණ තීන්දුවකදී හෝ මොනයම් හෝ වැදගත් කටයුත්තකදී යම් පනතක්, රෙගුලාසියක් ගෙන ඒම සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තුවේ අභිමතය; ඒ කියන්නේ පාර්ලිමේන්තුවේ දැක්ම, අදහස තීන්දු කරන්නේ, intention එක තීන්දු කරන්නේ අප අද කරන විවාදයෙන්. නමුත් වර්තමානයේ පාර්ලිමේන්තුවේ විවාද දෙස බලන කොට විවාදයට භාජන වන පනතවත් තෝරා ගන්න බැහැ. මොකද, පනතට පරිබාහිර දේවල්ම තමයි කථා කෙරෙන්නේ.

කෙසේ හෝ වේවා, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ පිහිටුවනු ලබන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව සම්බන්ධයෙන් සහ එහි නිලධාරින්ට පාරිශ්‍රමික සහ දීමනා ගෙවීම සම්බන්ධයෙන් වූ තීරණය අනුමත කර ගැනීම තමයි අද දිනයේ මේ විවාදයේ මූලික අරමුණ වන්නේ.

කෙනෙකුට තර්ක කරන්න පුළුවන්, මේක හුදෙක් තවත් කොමිෂන් සභාවක් පමණයි කියලා. නමුත් මෙහි වැදගත්කම ඉතාම ඓතිහාසිකයි. මෙහි වැදගත්කම කියා නිම කරන්න බැහැ. මා එහෙම කියන්නේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) අනුව්‍යවස්ථාව මඟින් ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව සෑම පුරවැසියෙකුටම සම අයිතිවාසිකම් තහවුරු කර තිබෙනවා. ඒ වාගේම, කාන්තා හිංසනයට එරෙහි නීති සහ මෑතකදී සම්මත වූ මා කලින් සඳහන් කළ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත වැනි නෛතික ප්‍රතිසංස්කරණ හරහා වැදගත් පියවර ගණනාවක් ඉදිරියට තබා තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නීතිය පොතේ තිබුණාට යථාර්ථය ඊට වඩා වෙනස්. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් කාන්තාවන් සියයට 52ක් හිටියත්, පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය තවමත් පවතින්නේ සියයට 6කටත් වඩා අඩු - පහළ - මට්ටමකයි. වර්තමාන පාර්ලිමේන්තුව ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ කාන්තා නියෝජිතවරියන්ගේ සංඛ්‍යාව ඓතිහාසික මට්ටමට ළඟා කර ගත්තද, එය තවමත් ප්‍රමාණවත් වන්නේ නැහැ.

ඊළඟට ශ්‍රම බලකාය ගත්තොත්, අධ්‍යාපනය අතින් කාන්තාවන් ඉදිරියෙන් සිටියත්, දේශීය ශ්‍රම බලකාය සඳහා කාන්තා දායකත්වය පවතින්නේ සියයට 35ක් වාගේ අඩු මට්ටමකයි. ඒ වාගේම, අපට බැහැර කළ නොහැකි තත්ත්වය තමයි කාන්තා හිංසනය සහ ආරක්ෂාව. පොදු ප්‍රවාහනයේදී, රැකියා ස්ථානයේදී සහ ගෘහස්ථව සිදු වන වද හිංසා හා හිරිහැර තවමත් ප්‍රබල සමාජීය ගැටලුවක් බවට පත්ව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝක ඉතිහාසය දෙස බලනකොට කාන්තාවන්ගේ අයිතීන් දිනා ගැනීම එක රැයකින් සිදු වෙච්ච දෙයක් නොවෙයි. එය සියවස් ගණනාවක් පුරා දිවගිය අරගළයක ප්‍රතිඵලයක්. 19වන සියවසේ අග භාගයේදී සහ 20වන සියවස මුල් භාගයේදී බ්‍රිතාන්‍යය සහ ඇමෙරිකාව වැනි රටවල suffragette ව්‍යාපාරය ක්‍රියාත්මක වුණා. ඒ ව්‍යාපාරය යටතේ කාන්තාවන් තමන්ගේ ඡන්ද අයිතිය වෙනුවෙන් පාරට බැස්සා. 1893දී ඡන්ද අයිතිය දිනා ගත්ත ලෝකයේ පළමු රට බවට නවසීලන්තය පත් වුණා.

ඒ වාගේම තමයි, වැඩ කරන කාන්තාවන්ගේ අරගළ. 1908දී නිව්යෝර්ක් නගරයේ ඇඟලුම් ක්ෂේත්‍රයේ නිරත වූ කාන්තාවන් පැය අටක වැඩ මුරයක් සහ සාධාරණ වේතනයක් ඉල්ලා අරගළයක් කළා. ඒකට කිව්වේ, "Bread and Peace" අරගළය කියායි. ජාත්‍යන්තර කාන්තා දිනය නිර්මාණය වෙන්නත් බලපෑවේ එම අරගළයයි. කෙසේ වෙතත්, මාර්තු 08 කාන්තා දිනය බවට පත් වන්නේ 1922දී ලෙනින් සහෝදරයා විසින් ඒ විප්ලවයට දායකත්වය දක්වපු කාන්තාවන්ට ගරු කිරීමක් වශයෙන් එම දිනය නම් කරනු ලැබූ නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අනුව අපට පැහැදිලිව පෙනෙනවා, මේක ඓතිහාසික අරගළයක් බව. දෙවන ලෝක යුද්ධයෙන් පස්සේ කාන්තාවන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුවම දායක වූවත් සමඟ රැකියා ස්ථානයේ සමාන සැලකිලි සහ අධ්‍යාපන අයිතිය වෙනුවෙන් ප්‍රබල මතවාද ගොඩනැඟුණා.

ඒ වාගේම තමයි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීම. CEDAW Convention එකට 1979දී ආවේ. ලංකාව 1981දී ඒකට අත්සන් තැබුවා. නමුත්, අපි dualist නීති පද්ධතියක් තිබෙන රටක්. ඒ අනුව මේ වෙනුවෙන් අපි පනතක් සෑදිය යුතු වෙනවා. කාන්තාවන්ට එරෙහිව වෙනස්කොට සැලකීම, හිංසනය වැළැක්වීම සම්බන්ධයෙන් වූ සම්මුතියට අපි 1981දී අත්සන් තැබුවත් මේ රටේ නීතියක් බවට පරිවර්තනය කරලා, පනත් කෙටුම්පතක් සම්මත වෙන්නේ 2024 මා කලින් සඳහන් කළ දිනයේදීයි. 1981දීත් අත්සන් කරලා, 2024 අවුරුද්ද වෙනකම් අපි ඒකට සමාන නීතියක් අපේ රටේ පැනෙව්වේ නැහැ. අන්න ඒ නීතිය යටතේ තමයි අපි මේ කොමිෂන් සභාව පවත්වාගෙන යන්නේ. අන්න ඒ හින්දා තමයි මම කිව්වේ, මේක ගොඩක් වටිනා දෙයක් කියලා. අපට පිළිගන්න සිද්ධ වෙනවා, කොච්චර නීති තිබුණත් අවසානයේදී ආකල්ප තමයි වැඩ කරන්නේ කියන එක.

අපේ රටේ වැඩිම ආදායම් උපයන, ප්‍රධාන විදේශ විනිමය උපයන ආදායම් මාර්ග තුනක් තිබෙනවා. ඒ ආදායම් මාර්ග තුන තමයි, තේ, ඇඟලුම් සහ විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ. මේ ඩොලර් හොයන්නේ අපේ රටේ දුප්පත් කාන්තාවන්ගේ දහඩියෙන් සහ මහන්සියෙන්. අපේ රට ජීවත් වෙන්නේ ඒකෙන්. එහෙම නම්, ඔවුන්ට රැකියා ස්ථාන තුළ සාධාරණ ආරක්ෂාවක් ලබා දීම, සාධාරණ අවස්ථාවක් ලබා දීම කළ යුතුයි. මේක වරදවා වටහා ගන්න හොඳ නැහැ, අපි කාන්තාවන් වෙනුවෙන් විශේෂ අයිතිවාසිකම් ඉල්ලනවා කියලා. මේ, කාන්තාවන් වෙනුවෙන් විශේෂ අයිතිවාසිකම් ඉල්ලනවා නොවෙයි. නමුත්, සමාජය තුළ ඔවුන්ව වෙන්කොට කරන සැලකීම, marginalize වීම වළක්වන්න ඕනෑම රජයක්, සමාජයක් පියවර ගන්න ඕනෑ කියන ස්ථාවරයේ තමයි අපේ ජාතික ජන බලවේගය රජය ඉන්නේ.

සමහර වෙලාවට අපි කෙනෙකුගෙන් අහනවා, දැන් wife මොකක්ද කරන්නේ කියලා. එතකොට ඔහු කියනවා, wife මුකුත් කරන්නේ නැහැ, wife ගෙදර තමයි ඉන්නේ කියලා. හැබැයි, ඇය ගෙදර සිටියදී අතුගානවා, ළමයි බලා ගන්නවා, පිඟන් හෝදනවා, රෙදි හෝදනවා. That is unpaid labour. ඇත්තෙන්ම ඒ කාන්තාවගේ ශ්‍රමයට අපි මිලක් නියම කළා නම් ලංකාවේ ඉන්න ගොඩක් ස්වාමි පුරුෂයන්ට කාන්තාවක් බඳින්න afford කරන්නත් බැහැ. මොකද, ඇය ඒ තරම් කාර්යභාරයක් කරනවා. නමුත්, ආකල්පය මොකක්ද? ඇය මොකුත් කරන්නේ නැහැ, ගෙදර තමයි ඉන්නේ කියන එක. මෙන්න මේ වාගේ පුරුෂ මූලික සංකල්ප අපිට ඉවත් කර ගන්න සිද්ධ වෙනවා. මම තරයේ විශ්වාස කරන දෙයක් තිබෙනවා. ගෘහස්ථ හිංසනය ගත්තත්, කාන්තාවන්ට පීඩාවක් තිබෙනවා. ඒ නීති තව ශක්තිමත් වෙන්න ඕනෑ, ප්‍රතිපත්ති හදන්න ඕනෑ. රැකියා ස්ථානය තුළ ඔවුන්ට හිරිහැරයක් නැතිව ඔවුන්ගේ වැඩ කර ගන්න පුළුවන් ආකාරයට වටපිටාව සකස් කරන්න ඕනෑ. අපි මේ හදන්නේ කාන්තාවන්ට විශේෂ අයිතිවාසිකම් දෙන්න නොවෙයි. අපි මේ හදන්නේ කාන්තාවන් සමාජයෙන් වෙනස්කොට සැලකීම, marginalize වීම වළක්වන්නයි. අන්න එවන් තත්ත්වයක් යටතේ කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට වැදගත් කාර්යභාරයක් කරන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ කොමිෂන් සභාවේ බලතල සහ කාර්යභාරය සම්බන්ධයෙන් කිව්වොත්, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීම පිළිබඳ පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සහ පනතේ විධිවිධාන ප්‍රකාරව පැමිණිලි භාර ගන්නට පුළුවන්. යම් අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමට අදාළ යම් නඩු කටයුතුවලදී එකී අධිකරණයේ අවසර සහිතව ඒකට මැදිහත් වෙන්න පුළුවන්. වඩාත්ම වැදගත් දේ තමයි, කාන්තා අභිවෘද්ධිය සහ සවිබලගැන්වීම පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන්න පුළුවන් වීම.

මම මේ කියපු අවුරුදු 100ක්, අවුරුදු 150ක් විතර පරණ ලංකාවේ ඓතිහාසික අරගළයේ කොටස් තමයි අපේ මේ රජය විසින් දැන් කරමින් සිටින්නේ.

කාන්තාවන් සවිබල ගැන්වීම සහතික කිරීම සහ පහසුකම් සැලසීම සඳහා කාන්තා අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව මූලික ව්‍යූහය සකස් කරන්නට ඕනෑ. සමාජයේ ආකල්පයක් වෙනස් කරන්නත් ඒ ව්‍යූහය සකස් කරන්න ඕනෑ. ඒක, මේ කොමිසමට පැවරෙනවා. කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළව මහජන විමර්ශන පැවැත්වීම, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට ඇති අවස්ථාවකදී නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් සිය මෙහෙයවීමෙන් නඩු පැවරීම, උපරිමාධිකරණයක් විසින් හෝ වෙනත් යම් අධිකරණයක් විසින් සඳහන් කරනු ලැබ ඇති කාන්තා අයිතිවාසිකම් අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් එකී අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි සෑම පියවරම ගැනීම, කාන්තාවන් සවිබල ගැන්වීම පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලබන කර්තව්‍යය ඉටු කිරීමේදී කාර්යය සඳහා යම් තැනැත්තෙකුගෙන් යම් තොරතුරු හෝ වාර්තා ඉල්ලා සිටීම, කාන්තා අයිතිවාසිකම්වලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සමඟ අනුකූල වීම තහවුරු කිරීම, කාන්තා අයිතිවාසිකම් සඳහා වන පිළිගැනීම වර්ධනය කිරීම, කාන්තා අයිතිවාසිකම් නිරීක්ෂණය කිරීමේ අදහසින් පැමිණිලි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සහ විමර්ශන සිදු කිරීම, පොදු ප්‍රතිපත්ති සහ භාවිතය පෝෂණය කිරීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අවශ්‍ය සහාය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍ය ආයතනවල මණ්ඩල සමඟ අන්තර් ක්‍රියාකාරිත්වය සම්බන්ධීකරණය ඇති කිරීම, කොමිෂන් සභාවේ ප්‍රාදේශීය සහ පළාත් කාර්යාල විවෘත කිරීම, රජය සහ අමාත්‍යවරයා වෙත කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මත සහ ප්‍රමිති සමඟ දේශීය නීති සහ ප්‍රතිපත්ති සහ පරිපාලන භාවිතය අනුකූල වන බවට සහතික කිරීම සඳහා ගනු ලැබිය යුතු පියවර ගැන නිර්දේශ ඉදිරිපත් කිරීම, කාන්තා අයිතිවාසිකම්වලට ගරු කිරීම, ඒවා ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ සපුරාලීම සඳහා ව්‍යවස්ථාදායකය සහ පරිපාලන විධාන සහ අවශ්‍ය කාර්ය පටිපාටි පිළිබඳ නියම කළ යුතු නියෝග සකස් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම, වෙනස්කොට සැලකීමට සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ කාන්තාවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන අතර සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් නීතිමය ප්‍රතිපත්ති සහ භාවිතය ඇගයීම සහ අදාළ ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම යනාදී වශයෙන් බලතල රාශියක් මේ කොමිසමට තිබෙනවා.

සමහරු මේක පටලවා ගන්නවා. සමහරු හිතනවා, මේකත් Human Rights Commission එක වාගේ independent වෙන්න ඕනෑ, ආණ්ඩුව මේකට ඇඟිලි ගහනවා කියලා. නැහැ. මේ පනත නැවත නැවත කියවන්න. මේ පනත කියෙව්වාම පැහැදිලි වෙනවා, මේ Commission එක පත් වෙන්නේ මේ කියන්නා වූ කාරණා සඳහා සහ රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා කියලා. ඒකට විශේෂිත වූ ස්ථානයක් අවශ්‍යයි. මක් නිසාද, අද කාන්තාව රැකියා ස්ථානය තුළත්, සමාජය තුළත් එක හා සමාන තත්ත්වයක් ලබා ගනිමින් දෛනික ප්‍රශ්නවලටත් මුහුණ දෙමින් ගැටලුවලට මුහුණ දෙනවා. අපට පිළිගන්න සිද්ධවෙනවා, gender-based violence, ලිංගික දිශානතිය මත පිහිටවපු ප්‍රචණ්ඩ තත්ත්වයකට කාන්තාව ගොදුරු වෙනවා කියන එක. ඒක බස් රථය තුළ වෙන්න පුළුවන්, රාජකාරි ස්ථානය තුළ වෙන්න පුළුවන්. සමහරු හිතනවා, මේ නීති හැදුවාම ඔක්කොම හරියනවා කියලා. නැහැ, හරියන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒකට මනුෂ්‍යයාගේ ආකල්ප වෙනස් වෙන්න ඕනෑ.

අපි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" මඟින් එහෙම නැත්නම් "පුනරුද යුගය" මඟින් මොකක්ද මේ කරන්නේ? මේ රට වෙනස් වෙන්න ඕනෑ, මිනිස්සු වෙනස් වෙන්න ඕනෑ. කාන්තා අයිතිවාසිකම් කියන්නේ, කාන්තාවන් විතරක් කෑ ගහලා කථා කරන්න ඕනෑ දේවල් නොවෙයි. සෑම පිරිමියෙක්ම කාන්තාව වෙනුවෙන් කථා කරන්න ඕනෑ. අපි පත්තරයක් ගත්තත්, පොතක් ගත්තත්, television එක බැලුවත් අම්මා ගැන කවි ගීත ලියා තිබෙනවා. ත්‍රි රෝද රථවල පිටුපස අම්මා ගැන කවි ගීත ලියා තිබෙනවා. හැබැයි, ඒ කාන්තාවම සවසට ගෙදර ගිහින් ගුටි කනවා

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

නම්, ඒක හරි යන දෙයක් නොවෙයි. මේ රටේ තවත් සමහර ආකල්ප තිබෙනවා. ඒවා තමයි වෙනස් වෙන්න ඕනෑ. මිනිහාට අයිතියක් තිබෙනවාද ගැහැනියෙකුට ගහලා තියාගන්න? "අයියෝ පුතේ, තමන්ගේ මිනිහාගෙන් පාරක් කාලා ඉන්න බැරි නම් උඹ ගැහැනියක් නොවෙයි" කියලා කියනවා නේ. නැහැ, ඒක වැරදියි. ගැහැනු ඉන්න ඕනෑ නැහැ  මිනිසුන්ගෙන් ගුටි කකා. ඒවා පරණ මත. තවත් සමහරු කියනවා, ගෑනිගෙයි මිනිහගෙයි රණ්ඩු තිබෙන්නේ බත ඉදෙනකල් විතරයි කියලා. මොන බොරු කථාද? එහෙම එකක් නැහැ. සමහරු කියනවා, "නැහැ, මචං මෙහෙම නේ, ගෙදර ආපුවාම වයිෆ් මට මෙහෙම කිව්වා, මට තරහා ගිය නිසා එකක් ගැහුවා" කියලා. තමන් රැකියාව කරන තැනක මිනිහෙක් මොනවා හරි කිව්වාමත් තරහා ආවා කියලා ඒ මිනිහාට ගහනවාද? නැහැ. ගෙදර ගැහැනියට තමයි තලන්නේ. ඒ නිසා මම විශ්වාස කරනවා, අපි සමාජ මතයක් හදන්න ඕනෑ , කාන්තාවන්ට ගෘහස්ථ හිංසනය කරන්නේම දුර්වල පිරිමි, ඒක පිරිමිකමට නිගාවක්, ඒක පිළිගන්න බැරි තත්ත්වයක් කියලා. තවමත් අපේ සමාජයේ ආර්ථික තත්ත්වය පාලනය කිරීම පිරිමියාගෙන් වන දෙයක්. මම කථාව මෙහෙම අවසන් කරන්නම්. අපි මේවා කරන්නේ ඓතිහාසික අරගළයක ප්‍රතිඵලයක් වශයෙන්. ඒකට අවශ්‍ය නීති රාමුව සකස් කෙරෙනවා, මේ කොමිෂන් සභාවේ වැදගත් රාජකාරිය හරහා. නමුත්, සටන මෙතැනින් ඉවර වෙන්නේ නැහැ. එය තව ඉදිරියට යන්න තිබෙනවා. හැබැයි, කාන්තාව සැබෑ වශයෙන්ම ආරක්ෂා කරන්න නම් අම්මලා තමන්ගේ පුතාලා ලොකු වුණාට පසු කියා දෙන්න ඕනෑ, ඔබ ගැහැනු මේ විධියට බලන්න, ආරක්ෂා කරන්න, ඇයත් අම්මා කෙනෙක් කියන එක. නමුත්, සත්‍ය දේ තමයි අද කාන්තාව වෙනුවෙන් කථා කරන්නට එක පිරිමියෙක්වත් එළියට බහින්නේ නැතිකම. ඒ වෙනුවෙන් පිරිමි එළියට බහින එක අපි වැඩි කරන්නට ඕනෑ. ආකල්ප වෙනස් කරන්නට ඕනෑ.  ආකල්ප වෙනස් කළොත් සමාජය තුළින්ම නීතියට වඩා වැඩි ආරක්ෂාවක් කාන්තාවට ලැබෙනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.39]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය අනුමත කිරීම සම්බන්ධයෙන් පවත්වන විවාදයේදී වචන කිහිපයක් කථා කරන්නට ලැබීම භාග්‍යයක් කොට සලකනවා. ඒ සම්බන්ධව ගරු අමාත්‍යතුමිය ඇතුළු විශාල පිරිසක් කථා කළා වාගේම, ඒ ගැන කාගේවත් විවාදයක් නැහැ. පිරිමියා පවුලක මූලිකයා විධියට සැලකුවාට අද වනකොට බොහෝ වෙලාවට කාන්තාව මූලික වෙලා තමයි පවුල පවත්වාගෙන යන්නේ. ඒ නිසා කාන්තාව සවිබලගැන්වීම පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ. ඒ පිළිබඳ පනත් කෙටුම්පත් සම්මත කර ගැනීම, ඒ සඳහා නීති ඇතුළත් කර ගැනීම අනිවාර්යයෙන් සිද්ධ විය යුතු කාරණයක්.

අද සිදු විය යුතු තවත් දෙයක් තිබෙනවා. මම හිතන්නේ අද වනකොට කාන්තාව විශාල පීඩනයකට ලක් වෙලා ඉන්නේ. පවුලේ කළමනාකරණය, පවුලේ බර කාන්තාව විසින් තමයි පවත්වාගෙන යන්නේ. බොහෝ වෙලාවට ස්වාමියා කුලී වැඩ හෝ කරලා තමන්ගේ වේතනය ගෙනැත් දුන්නාට පස්සේ එය කළමනාකරණය කරගෙන වෙළෙඳ පොළට යන්නේ කාන්තාව. හැබැයි, මහත්තයා දීපු පඩිය අරගෙන, මාසයක් මේකෙන් රෝල ගහන්න ඕනෑ කියන එකත් ඔළුවේ තියාගෙන බඩු ටික ගන්න කාන්තාව වෙළෙඳ පොළට ගියාම ඒ කාන්තාවට කැරකිල්ල ඇවිල්ලා, ක්ලාන්තය හැදිලා වැටෙන තැනට කටයුතු සිද්ධ කරලා තිබෙනවා. දැන් කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරන එකත් මම හිතන හැටියට පාප කර්මයක්. එම නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. කාන්තාව සවිබලගන්වන්නට නම් සාධාරණ මිලකට භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් උද්ධමනය පාලනය කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. අනෙක් පැත්තෙන්, මේ හැම දෙයකටම බදු දැල එළලා කටයුතු කිරීම හරහා ඒ සියලු පීඩනය ජනතාව මත වැටෙන එක අපට වළක්වන්නට බැහැ.

ඊළඟට, අද කතිකාවට ලක්  විය යුතු තවත් කාරණයක් තිබෙනවා. අද කාන්තාවගේ අයිතිවාසිකම් ගැන, කාන්තාව සවිබලගැන්වීම ගැන කථා කරනවා. හැබැයි, රටේ සමස්ත ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන තැනට ආණ්ඩුව කටයුතු සූදානම් කරමින් යනවා. ආණ්ඩුව ඒ වෙනුවෙන් පනත් කෙටුම්පත් සම්මත කරගන්න යනවා. ජනතාව අහම්බයකින් පීඩනය මත ලබා දීපු ජන වරමින් මන්ත්‍රී ධුර 159ක් ලැබුණා කියලා, තුනෙන් දෙකක බලය තිබුණා කියලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්නට ආණ්ඩුව කටයුතු කරගෙන යනවා.

මම දැක්කා, ඉස්සෙල්ලා මන්ත්‍රීවරියක් කථා කරනවා. සන්දර්ශන පවත්වනවා, මාධ්‍යයට මොකක් හෝ දෙයක් පෙන්වන්න ඕනෑවට විපක්ෂයේ මන්ත්‍රීවරු ඇවිල්ලා කථා කරනවා කියලා තමයි කියන්නේ. හැබැයි, ආණ්ඩුව කරන්නෙත් ඒ සන්දර්ශනමයි. ආණ්ඩුව ජනතාවගේ වරම ලබා ගන්න විවිධ මතවාද, පොරොන්දු ගණනාවක් දුන්නා. අද ඒවා ඉෂ්ට කරගන්න බැරි වනකොට, තමන් කොහේ හෝ රැස්වීමක් පවත්වන්න යනකොට, ඒකට මොනවා හෝ අවශ්‍ය කරන අඩුම කුඩුම ටික ලැහැස්ති කරගන්න ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. ආණ්ඩුව ඒ වෙනුවෙන් මේ රටේ තිබෙන ස්වාධීන ආයතන පාවිච්චි කරමින් ඉන්නවා. අද මේ ආණ්ඩුව පාවිච්චි කරන එක් එක් ආයතන හැල්ලුවට ලක් වෙනවා.

හොරුන්ට දඬුවම් දීම ගැන අපේ විවාදයක් නැහැ. හොරකම් කරපු අයට ඒ සඳහා අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දෙන්න ඕනෑ. ඒ අය හොරා කාපු සල්ලි මේ රටට පවරා ගන්නට කටයුතු කළ යුතුයි. ඒකට සමගි ජන බලවේගය විධියට සජිත් ප්‍රේමදාස මැතිතුමා ප්‍රමුඛ අපේ කණ්ඩායම අනිවාර්යයෙන්ම සහයෝගය ලබා දෙන්නට සූදානම්. හැබැයි, ආණ්ඩුව සන්දර්ශන පවත්වමින්, තමන්ගේ දේශපාලන මතය පවත්වා ගැනීම වෙනුවෙන් මේ ආයතන පාවිච්චි කරලා අද හැල්ලුවට ලක් වෙලා ඉන්නවා. ඒකෙන් වෙන්නේ හොරාත් අවසානයේදී මේ කියන කාරණා පාවිච්චි කරලා, මේ කියන ලුහුඬු තැන්වලින් රිංගලා ඇවිල්ලා, අධිකරණය තුළ මෙන්න මේ වාගේ නියෝග දීලා තිබෙනවා, අපේ විනිශ්චයකාරවරුත් ප්‍රකාශ කර තිබෙනවා කියලා මතවාද ගොඩනහන්න කටයුතු කිරීමයි.

දැන් මේ අල්ලස් කොමිසමට වෙනම නීතියක් නැහැ කියලා කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත්තුමා කියනවා. ඒ කට්ටිය නඩු ගෙනෙනවා, කට්ටිය අල්ලාගෙන එනවා, නඩුවේ ප්‍රගතියක් නැහැ, මෙහෙම තිබෙනකොට සාක්ෂි නැහැ, එහෙම වුණාම අල්ලස් කොමිසමෙන් ගෙනාවා කියලා බොරුවට හිරේ තබාගෙන ඉන්න අයිතියක් නැහැ. අද මහෙස්ත්‍රාත්වරුම අල්ලස් කොමිසමට

චෝදනා කරනවා. අනෙක් පැත්තෙන්, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරියට අධිකරණයේ විනිශ්චයකාරවරු කියනවා, සාක්ෂිකරුවන්ට බලපෑම් කරන්න එපා කියලා. අද ඒ තැනට පත් වෙලා තිබෙනවා, නීතිපති වෙනුවෙන් ඉදිරිපත් වන නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්තුමිය සාක්ෂිකරුවන්ට බලපෑම් කරනවා කියලා. මේ අය බලපෑම් කරලා තමන්ට ඕනෑ දේ කියවා ගන්නට, තමන්ට ඕනෑ දේ පෙන්වා ගන්නට වැරදි දෙයක් මේකට ගෙනැල්ලා කටයුතු කරනවා.

ඒ වාගේම අපි දැක්කා, තමුන්නාන්සේලාම කියන හොරු අල්ලන, මේ රටේ ජාවාරම් නතර කරන්න කටයුතු කරන පොලිස් නිලධාරින්ට විරුද්ධව ඔබතුමන්ලාගේ ආණ්ඩුව ක්‍රියාත්මක වෙනවා. මොකක්ද මේ දෙබිඩි පිළිවෙත? මේ කියන කාරණා නිසා අවසානයේදී රටේ හැම තැනකම ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා.

ගොවි ජනතාවගේ ප්‍රශ්න එහෙමපිටින්ම ඉතුරු වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට පුළුවන් වුණාද, මේ ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන්න? වීවලට සාධාරණ මිලක් දෙන්න පුළුවන්ද? වී ටික මිලදී ගන්න පුළුවන්කම ලැබුණාද? වී ටික අද කුණුකොල්ලෙට, තුට්ටු දෙකට විකිණෙනවා. ඒ හරහා අනෙක් පැත්තෙන් අද බරපතළ ප්‍රශ්නයක් නිර්මාණය වෙමින් එනවා. සත්ව නිෂ්පාදන කටයුතු කරන සල්ලි තිබෙන උදවිය අද අඩු මිලට වී අරගෙන ඒවා හාල් බවට පත් කරලා, කුකුළු කෑමවලට stock කරගන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඉදිරි කාලය තුළ මේ රටේ සහල් හිඟයක් ඇති වීමේ බයක්, අභියෝගයක් අපේ රට හමුවේ තිබෙනවා. මේක තමයි වී සඳහා සාධාරණ මිලක් ලබා නොදීම නිසා අනෙක් පැත්තෙන් සිද්ධ වන කාරණය. වී අතිරික්තයක් තිබෙනවා කියලා හිතාගෙන කටයුතු කළාට, අවසානයේ එල් නිනෝ ක්‍රියාත්මක වෙනවා, ආපසු ගංවතුර එනවා කියලා කියනවා. මේ සියල්ල හරහා අපේ ආහාර සුරක්ෂිතතාවට බලපෑම් එල්ල වෙන්න පුළුවන්. ඔබතුමන්ලා ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු කළේ නැහැ.

ඊළඟ කාරණය තමයි, අද රෝහලකට ගොඩ වුණාම බෙහෙත් හේත් නැහැ. ඒ වාගේම රෝහල්වලට අවශ්‍ය කරන පහසුකම් ටික නැහැ. දැන් අලුත්ම න්‍යාය මොකක්ද? අපි දැක්කා අපේ රටේ ගරු ජනාධිපතිතුමා වේදිකාවේ කළ ප්‍රකාශය. මම හිතන විධියට, සුනිල් පෙරේරා මහත්මයාගේ ජිප්සීස් වාදක කණ්ඩායමේ කාගෙන් හරි තමයි එතුමා උපදෙස් අරගෙන තිබෙන්නේ. දැන් එතුමා කියන්නේ, බෙහෙත් හේත් අවශ්‍ය නැහැ කියලායි. අපේ ජනාධිපතිතුමාගේ මතවාදය අනුව, අපේ කාන්තාවෝ පොළට හෝ කඩයට ගිහිල්ලා එනකොට හෝටලයකින් හෝ කැෆේ එකකින් තේ එකක් බීලා යනවා වාගේ පුරුද්දට දැන් රෝහලට යන තත්ත්වයක් තමයි රටේ උද්ගත වෙලා තිබෙන්නේ. දැන් ජනාධිපතිතුමාට උපදෙස් දෙන්නේ අර කණ්ඩායමේ කවුරු හරි වෙන්න ඕනෑ. මොකද, සුනිල් පෙරේරා මහතාගේ ගීතයක් තිබෙනවා; ඒ ගීතය ඇහුවාම,

අනං මනං බෙහෙත්වලට ඇයි ගෙවන්නෙ සල්ලි

ඕන ලෙඩක් හොඳ වනවා බොන්න කොත්තමල්ලි

රුමේනියාවෙලු තිබෙන්නේ හොඳම කොත්තමල්ලි

අපේ රටට ගෙන්නන්නේ දැන් අපේ අනුර මල්ලි ද කියලා අපට සැකයක් තිබෙනවා.

අනුර මල්ලි කොත්තමල්ලි ගෙනැල්ලා, මේ රටේ ජනතාවට කොත්තමල්ලි පොවන්න හදනවා. දැන් මේ රටේ ජනතාවගේ ඔක්කෝම ලෙඩ දුක් කොත්තමල්ලි පොවලා හොඳ කරන්න පුළුවන් ද කියලා අපි අහනවා.

ඔබතුමන්ලා වේදිකාවේ බොහෝ කථා කිව්වා. කෙහෙල් ගෙඩියේ නැට්ට තද කරන තැන ඉඳලා, මුහුදු වතුරින් සල්ෆියුරික් අම්ලය හදන්න කථා කළා. ඒවා කරන්න ඇවිල්ලා දැන් අවසානයේ කොත්තමල්ලි පොවලා මේ රටේ ජනතාවගේ සර්ව රෝග නිවාරණය කරන්න ආණ්ඩුව කටයුතු කරන තැනට පත් වෙලා තිබෙනවා. මේ වාගේ නොහැකියාවකින් යුතු කණ්ඩායමකට අපි කියන්නේ, ඇහුම්කන් දෙන්න, පළපුරුදු අයගෙන් උපදෙස් අරගෙන කටයුතු කරලා මේ රටේ ජනතාව මර උගුලෙන් ගළවා ගන්න ඔබතුමන්ලාට ලැබුණු මේ වරම පාවිච්චි කරලා කටයුතු කරන්න කියන එකයි. ඒ කාරණය මතක් කරමින්, මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.45]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද පාර්ලිමේන්තුව තුළ බොහෝ සේ කථා කරන්නේ විශේෂයෙන්ම කාන්තාවන්ගේ සුරක්ෂිතතාව ගැනයි. ඇත්තටම 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත අනුව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීමට නියමිත වුණත් අපි බලයට එන තාක් කොමිෂන් සභාව පිහිටුවා තිබුණේ නැහැ. අපි බලයට ආවාට පසුව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවා තිබෙනවා. ඇත්තෙන්ම කිව්වොත්, කාන්තාවන් පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා වසර 30කට වඩා වැඩි කාලයක් තිස්සේ ජනතාවගෙන් ඉල්ලීම් ආවා. ඒ කොහොම නමුත්, මේ වනකොට කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවා තිබෙනවා. එම කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කර ගැනීම ජනාධිපතිවරයා විසින් තමයි සිදු කරන්නේ. එම කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ගෙවීම සම්බන්ධව පාර්ලිමේන්තුව විසින් තීරණය කරලා ඒකාබද්ධ අරමුදලින් තමයි ගෙවීම් සිදු කරන්නේ. එම වැටුප් හා දීමනා තීරණය කිරීම සම්බන්ධ යෝජනාව අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීම සඳහා තමයි මෙම විවාදය පැවැත්වෙන්නේ.

ලංකාවේ කාන්තා ජනගහනය සියයට 52ක් වනවා. ලංකාවේ පිරිමි ජනගහනයට වඩා කාන්තා ජනගහනය වැඩියි. පාර්ලිමේන්තුව පැත්තෙන් ගත්තාමත් මෙම දසවැනි පාර්ලිමේන්තුව සුවිශේෂයි. වැඩිම කාන්තා නියෝජනයක් තිබෙන්නේ මේ දස වැනි පාර්ලිමේන්තුවේ. මන්ත්‍රීවරියන් ගත්තාම, අපේ ගරු අගමැතිතුමියත් ඇතුළුව කාන්තා නියෝජනය 22ක් තිබියදී, ආණ්ඩු පක්ෂය මන්ත්‍රීවරියන් 20ක් නියෝජනය කිරීම ගැන අපි සතුටු වනවා. එය, පාර්ලිමේන්තුවේ 225ක මන්ත්‍රී ආසන සංඛ්‍යාව ගත්තාම සියයට 10ක විතර ප්‍රතිශතයක්. එම නිසා කාන්තා නියෝජනය මීට වඩා වැඩි විය යුතුයි කියන තැන ආණ්ඩුව විධියට අපි ඉන්නවා. ඇත්තටම කාන්තා නියෝජනය වැඩි කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මොකද, කාන්තාවන් වෙනුවෙන් කථා කරන්න නම් කාන්තා නියෝජනය - මහජන නියෝජිතවරියන් - වැඩි වීම අවශ්‍යයි. කාන්තාවන්ගේ සුරක්ෂිතතාව පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්වීම අපේ ආණ්ඩුවේ කැපී පෙනෙන තත්ත්වයක්.

[ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය]

කාන්තාවක් ගත්තාම, ඇය ගෘහස්ථ හිංසනයට ලක් වනවා වෙන්න පුළුවන්, මග තොටේදී හිංසනයට ලක් වනවා වෙන්න පුළුවන්, රැකියා ස්ථානයේදී හිංසනයට ලක් වනවා වෙන්න පුළුවන්. ඇයගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට ආණ්ඩුවක් විධියට අපට වගකීමක් තිබෙනවා. විශේෂයෙන් කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත අනුවත් ඇය ආර්ථිකමය වශයෙන්, දේශපාලනික වශයෙන්, සාමාජයීය වශයෙන් හා සංස්කෘතික ජීවිතය තුළ සවිබල ගැන්වීමට අවශ්‍යයි. විශේෂයෙන් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කිරීමේදී කාන්තාව සවිබල ගැන්වීම වෙනුවෙන් ආණ්ඩුවක් විධියට අපි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා, ඒ වෙනුවෙන් බොහෝ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපේ පළමු අය වැයෙන්ම ඒ සඳහා කටයුතු කර තිබෙනවා. උදාහරණයක් විධියට, පෙර පාසල් දරුවන්ගේ ආහාර වේල සඳහා වෙන් කරන ලද මුදල වැඩි කිරීමේ ඉඳලා කටයුතු කර තිබෙනවා. එතැනින් එහාට ගත්තාම, අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් යන දරුවන්ට පාසැල් උපකරණ ලබා ගැනීම සඳහා ලබා දෙන දීමනාව, සපත්තු ලබා ගැනීම සඳහා ලබා දෙන දීමනාව වැඩි කර තිබෙනවා.

එතැනින් එහාට ගියාම මහපොළ ශිෂ්‍යාධාර දීමනාව ගත්තොත්, අපි බලයට එද්දි රුපියල් 5,000ක මාසික දීමනාවක් තමයි තිබුණේ. දැන් ඒ දීමනාව රුපියල් 10,000 දක්වා වැඩි කර තිබෙනවා. එතැනින් තවත් එහාට ගියාම වැඩිහිටි දීමනා වෙන්න පුළුවන්, ආබාධිත පුද්ගලයින්ට ලබා දෙන දීමනා වෙන්න පුළුවන්, වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනා වෙන්න පුළුවන්, විවිධ සහනාධාර වෙන්න පුළුවන්, විශ්‍රාම වැටුප් වැඩි වීම, රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි වීම කියන මේ සියල්ල තුළම කාන්තාවන් සවිබල ගැන්වීම ගැබ් වෙලා තිබෙනවා. යම් පවුලක් ආර්ථික බරින් පීඩනයට පත් වෙලා ඉන්නවා නම්, ඒකේ සෘජු වින්දිතයින් වෙලා ඉන්නේ කාන්තාවන්. එතකොට ආර්ථිකමය වශයෙන් පවුලක් ශක්තිමත් කරනවා කියන්නේ, එතැනම කාන්තාව සවිබල ගැන්වීමක්. එම නිසා මම මේ සභාවට කියන්න කැමැතියි, කාන්තාව සවිබල ගැන්වීම වෙනුවෙන් වෙන කිසිදු ආණ්ඩුවකට වඩා අපි ඉදිරි පියවර රැසක් අරගෙන තිබෙන බව.

මේ අවස්ථාවේ මම විශේෂයෙන් කියන්න ඕනෑ, මත්ද්‍රව්‍ය සම්බන්ධ ගැටලුව සමාජයේ ඛේදනීය තත්ත්වයක් බවට පත් වෙලා තිබෙන බව. මේ තත්ත්වයත් එක්ක අපේ ළමා පරපුර, තරුණ පිරිස් මත්ද්‍රව්‍යවලට ගොදුරු කර ගැනීම එහෙම නැත්නම් මේ ජාවාරම්කරුවන් නිසා සමාජයට අත් වෙලා තිබෙන ඉරණම අපි බලන්න ඕනෑ. පවුලේ ඉන්න කවුරු හරි කෙනෙක් මත්ද්‍රව්‍යවලට ගොදුරු වෙලා ඉන්නවා නම් එතැනදී කාන්තාව තරම් පීඩාවට පත් වන තවත් කෙනෙක් නැහැ.

පෞද්ගලිකව නීතිඥවරියක විධියට මගේ නීතිඥ වෘත්තියේ අවුරුදු 23ක පමණ සේවා කාලය තුළ මගේ අත්දැකීම් ගත්තොත්, පසුගිය දශක දෙකක පමණ කාලය තුළ අධිකරණවලට මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට එන නඩු සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම පුනරුත්ථාපනයට යොමු කරන පිරිස්, රක්ෂිත බන්ධනාගාරගත කරන පිරිස් ද බොහෝ සේ වැඩි වෙලා තිබෙනවා. අපේ පෞද්ගලික අත්දැකීම තමයි, දෙමව්පියන්ට තමන්ගේ දරුවා වෙනුවෙන් අහිංසක බලාපොරොත්තුවක් තිබෙනවා කියන එක. මේ දරුවා හොඳ පාසලකට ඇතුළත් කරලා හොඳ අධ්‍යාපනයක් ලබා දීලා, හොඳ රැකියාවක් කරලා, සමාජයට වැඩදායී පුද්ගලයෙකු විධියට ඉදිවී කියන බලාපොරොත්තුව දෙමව්පියන්ට තිබෙනවා. හැබැයි, දරුවා මත්ද්‍රව්‍යවලට ගොදුරු වුණාම ඒ තිබෙන අහිංසක බලපොරොත්තු ඔක්කෝම සුන්වෙලා යනවා. එවැනි තත්ත්වයක් තුළ තමන්ගේ දරුවා මත්ද්‍රව්‍යවලට ගොදුරු වීමෙන් ඒ පවුල විනාශ වෙලා තිබෙනවා. එහෙම නැත්නම් තමන්ගේ ස්වාමිපුරුෂයා මත්ද්‍රව්‍යවලට ගොදුරු වුණාම ඒ පවුලට අත් වන ඉරණම, ඒ පවුලේ දරුවන්ට අත් වන ඉරණම බලන්න. මෙවැනි දේවල් නිසා මේ සමාජය තුළ ඇති වී තිබෙන ඛේදවාචකය කෙරෙහි ආණ්ඩුවක් විධියට අපි ලොකු අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වෙනුවෙන් ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් "රටම එකට" නමින් ජාතික මෙහෙයුමක් ක්‍රියාත්මක වනවා.

2025 ඔක්තෝබර් 30වැනි දා ඉඳලා මේ දක්වා සංඛ්‍යාලේඛනත් එක්ක ගත්තාම, මත්ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් කොච්චර කරලා තිබෙනවාද කියන එකෙන් අපට පැහැදිලි වනවා, අපි මේ වෙනුවෙන් මොන තරම් මැදිහත් වීමක් කර තිබෙනවාද කියලා. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගත්තාම, 2025.10.30 ඉඳලා 2026.09.06 දින දක්වා වැටලීම් 86,622ක් කරලා අත්අඩංගුවට අරගෙන තිබෙන හෙරොයින් ප්‍රමාණය කිලෝග්‍රෑම් 2,275යි ග්‍රෑම් 301ක්. අයිස් සම්බන්ධයෙන් ගත්තොත්, කිලෝග්‍රෑම් 3,171යි ග්‍රෑම් 434ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. වැටලීම් 105,159ක් කරලා තිබෙනවා. මේ විධියට ගත්තාම මත් පෙති 4,488,121ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මෙන්න මේකයි තත්ත්වය. මේ විධියට ගත්තාම අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව 269,492ක් වෙනවා. එතැනින් රැඳවුම් නියෝග ලබාගෙන ඉන්න සැකකරුවන් සංඛ්‍යාව 3,483ක්. පුනරුත්ථාපනයට යොමු කරලා තිබෙන සංඛ්‍යාව 2,448ක්. මේ විධියට, මාස 10කට ආසන්න කාල සීමාව තුළ සිදු කළ සමස්ත වැටලීම් සංඛ්‍යාව 270,197ක් වනවා. මට කියන්න ඕනෑ කාරණය මෙයයි. මේ විධියට වැටලීම් කරලා මෙච්චර සංඛ්‍යාවක් අත්අඩංගුවට ගන්නවා කියන්නේ මේ අයගේ පවුල්වලට අත්වන ඉරණම කොයි වාගේ එකක් වෙයිද? මේ දේවල්වලින් බැට කන්නේ, දුක් විඳින්නේ අහිංසක කාන්තාවන්.

මේ අවස්ථාවේ මම විශේෂයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට දඬුවම් ලබන සංඛ්‍යාව පිළිබඳවත් කියන්න ඕනෑ. 2025 වර්ෂය වනකොට පිරිමි 28,885ක් සහ කාන්තාවන් 292ක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට දඬුවම් ලබා තිබෙනවා. අනෙක් අතින් රක්ෂිත බන්ධනාගාරගත කරපු සංඛ්‍යාව ගත්තාම, 2025 අවුරුද්දේ පිරිමි හැත්තෑඑක්දහස් ගාණකට ආසන්න සංඛ්‍යාවක් වෙද්දි කාන්තාවන් 3,454ක් වනවා. මෙන්න මේකයි තත්ත්වය. හැබැයි, අපි දැන් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් කරමින් ක්‍රියාත්මක කරන ජාතික මෙහෙයුම ගත්තාම, එහි යම් විශේෂත්වයක් තිබෙනවා. මොකද, කලින් ආණ්ඩුවලින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට දේශපාලන රැකවරණය ලබා දී තිබුණා. හැබැයි, දැන් තත්ත්වය ඊට වෙනස්. ඒක තමයි අපේ ආණ්ඩුවේ තිබෙන වෙනස. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට දැන් කිසිම දේශපාලන රැකවරණයක් ලැබෙන්නේ නැහැ. ඉතින් එහෙම නම්, මේ වැටලීම් සාර්ථක වෙන්න, එහෙම නැත්නම් මේ මත්ද්‍රව්‍ය හා සංවිධානාත්මක අපරාධ මර්දනය වෙනුවෙන් ගෙන යන ආණ්ඩුවේ මේ වැඩ පිළිවෙළත් එක්ක සතුටු වන කණ්ඩායම් අතර බෙහෙවින්ම සතුටු වන කණ්ඩායම තමයි කාන්තාවන්. අන්න ඒකයි මට කියන්න ඕනෑ වුණේ.

කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගන්වනවා විතරක් නොවෙයි, එතැනින් එහාට ගියාම සමාජය තුළ ඇය සුරක්ෂිත කිරීමේ වගකීමත් ආණ්ඩුවක් විධියට අපට තිබෙනවා. දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ඇයට තිබෙන අවිනිශ්චිතතා මගහැර ගන්න අවශ්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපි ගෙනැල්ලා තිබෙනවා. ඉතින් තමන්ගේ දරුවා සමහර වෙලාවට පාසල් යවලා ගෙදර එද්දි, බෑගය පරීක්ෂා කරලා බලන, එහෙම නැත්නම් දරුවා කෙරෙහි සැකයෙන් බලන තැනට අද පත් වෙලා තිබෙනවා. ඉස්කෝලෙට ගියාම දරුවාගේ බෑග් එක ඉස්කෝලෙන් පරීක්ෂා කරලා බලනවා. එහෙම සමාජයක්, එහෙම රටක් තමයි අපට භාර දුන්නේ. ඒ තත්ත්වයත් තමයි අපි දැන් මේ වෙනස් කරලා තිබෙන්නේ.

විශේෂයෙන් අද දවසේදී කථා කරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ වන තීරණය ගත්තාමත්, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට කාන්තාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ලොකු වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබෙනවා. ඇය ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමට වෙන්න පුළුවන්, එහෙම නැත්නම් කාන්තාවට සිදුවන හිංසන, අපරාධ, ඇය සමාජය තුළ පත් වන අපහසුතා සම්බන්ධයෙන් කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට පැමිණිලි කරන්න හැකියාවක් තිබෙනවා. ඒ වාගේම පොලීසිය, නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සෘජුව මැදිහත් වෙලා කටයුතු කරන්න මේ කොමිෂන් සභාවට හැකියාව තිබෙනවා. ඒ වාගේම කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් ඇයට එරෙහිව සිද්ධ වන හිංසන, අපරාධ සම්බන්ධයෙන් තිබෙන නීතිරීති සංශෝධනය කරන්න අවශ්‍ය නම්, එහෙම නැත්නම් නීති සම්පාදනයේදී ඒ වෙනුවෙන් මඟ පෙන්වීමට මේ කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට හැකියාව තිබෙනවා. ඉතින් ඒ නිසා රටක් සංවර්ධනය වෙමින් ඉදිරියට යන අවස්ථාවකදී විශේෂයෙන් කාන්තා ජනගහනය සියයට 52ක් වාගේ වන අවස්ථාවක කාන්තාවගේ සුරක්ෂිතතාව වෙනුවෙන් කටයුතු කිරීමට මේ වාගේ කොමිෂන් සභාවක් පත් කරලා ඒ හරහා ලැබිලා තිබෙන බලතලවලින් උපරිම ප්‍රයෝජනය ගැනීමේ අවස්ථාව කාන්තාවන්ට මෙතැනින් එළඹෙනවා. ඉතින් හැම වෙලාවේම කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ආණ්ඩුවක් විධියට අපි වගකීමෙන් යුතුව කටයුතු කරනවා කියන පණිවුඩයත් ලබා දෙමින්, මගේ කථාව අවසාන කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.56]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

பெண்களின் வலுவூட்டல் சட்டத்தின்கீழான தீர்மானம் இன்றைய தினம் நிறைவேற்றப்பட இருக்கின்றது. என்னைப் பொறுத்தவரை, இலங்கையின் வடக்கு மாகாணத்தில் அரசியல் கட்சியொன்றின் Secretaryஆக ஒரு பெண் இருக்கின்றார் என்ற விதத்திலும், கிட்டத்தட்ட மூன்று வருடங்களுக்கு என்னுடைய பாராளுமன்ற உறுப்பினர் பதவியை அவரிடம் ஒப்படைக்கப் போகின்றேன் என்ற நினைப்பிலும் எனக்கு இந்தத் தீர்மானம் தொடர்பாகக் கதைப்பதில் சரியான சந்தோஷமாக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒரு முக்கியமான விடயத்தைச் சொல்ல வேண்டும். நேற்றைய தினம் இரவு 9 மணியளவில் மிகுந்த வெளிச்சத்தில் யாழ்ப்பாணத்தில் ஓர் ஆணை வாளால் வெட்டிக் கொலை செய்திருக்கிறார்கள். கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஒருவருடைய area வில்தான் அந்தச் சம்பவம் நடந்திருக்கிறது. அவரும் இங்கே இருக்கின்றார். யாழ்ப்பாணத்தில் நீதி, நியாயம் எல்லாம் எங்கே என்று தெரியவில்லை. பாராளுமன்ற உறுப்பினர்களாக நாங்கள் எங்கே போய் எங்களுடைய பாதுகாப்பைத் தேடுவது என்று எங்களுக்குத் தெரியவில்லை. ஆனால், யாழ்ப்பாணத்தினுடைய நிலைமை இப்படித்தான் இருக்கிறது. அதைவிட, இப்போது இன்னுமொரு newsஐப் பார்த்தேன். முல்லைத்தீவிலும் ஒரு மரணம் நிகழ்ந்திருக்கிறது. அது இரண்டாவது விடயம். அண்மைய தினங்களில் நடைபெற்றிருக்கின்ற முக்கிய விடயங்கள் இவை.

அநுர அரசாங்கம் எங்களுடைய வடக்கு மாகாண மக்களுக்கு வாக்குறுதிகளை அள்ளி வழங்கி இருந்தது. எங்களுக்கு international cricket stadium என்றார்கள், indoor cricket stadium என்றார்கள்! அந்த வகையில், யாழ்ப்பாணத்தில் அநுர குமார திஸாநாயக்கவுடைய அரசாங்கம் அடிக்கல் வைக்காத இடமே இல்லை. 'கல்லுக் குமரன்' என்றுகூட சிலரை நாங்கள் அழைக்கிறோம். அந்தளவுக்கு வடக்கு மாகாணத்தில் அடிக்கல் வைக்கப்பட்டிருக்கிறது. எந்த அபிவிருத்தியும் செய்யப்படவில்லை. எங்களுக்கு அது பிரச்சினை இல்லை.

என்னுடைய பிரச்சினை என்னவென்றால், சிலர் சமூக ஊடகங்களில், எங்களுடைய இனப் படுகொலையாளி மகிந்த ராஜபக்ஷ அவர்களுடைய கூட்ட மேடைகளில் நான் ஏறப்போகின்ற விடயம் தொடர்பாக வித்தியாசமான கருத்துகளைத் தெரிவித்துக்கொண்டு இருக்கிறார்கள். இன்றைக்கு முக்கியமான விடயத்தை நான் பார்க்கிறேன், வடக்கு மாகாணத்தில் தலைவன் இல்லாமல் வாழுகின்ற ஒரு சமூகத்தை மேம்படுத்த வேண்டுமாக இருந்தால், யாரிடம் போய் அரசியல் விடயங்களைக் கதைப்பது? நாங்கள் நிற்பது அரசியல் மேடையில், போர்க் களத்தில் அல்ல. அப்படி நாங்கள் ஒருபோதும் நினைக்கக் கூடாது. இந்த அரசியல் மேடையில் அநுர குமார திஸாநாயக்க அரசாங்கம் வடக்கு மாகாண மக்களுக்கு ஏதாவது செய்யும் என்று நாங்கள் நம்பினால், அது முட்டாள்தனம். இரண்டு வருடங்களை நாங்கள் கடந்திருக்கிறோம். சிறிய ஓர் உதாரணத்தைச் சொல்கின்றேன். பெண்களின் வலுவூட்டல் தொடர்பான விவாதம் இன்றைக்கு நடந்துகொண்டிருக்கின்றது. ஆனால், கிழக்கு மாகாணத்தில் அநியாயமாக முஸ்லிம் பெண்களுடைய ஹிஜாபை கழற்றுமாறும், இல்லாவிட்டால் வேறு வைத்தியசாலைக்குப் போகுமாறும் அரசாங்கம் சொல்லியிருக்கிறது. ஆகவே, பெண்கள் உரிமைகள் தொடர்பாக இங்கு மில்லியன் கணக்கில் பணத்தைச் செலவழித்துக் கதைப்பது முக்கியமல்ல; நாங்கள் என்னத்தைச் செய்கின்றோம் என்பதுதான் முக்கியமானது.

அநுர குமார திஸாநாயக்க அவர்கள் சொல்லியிருக்கின்றார், “வடக்கு மாகாணத்தில் 13,000 வீடுகள் கட்டித்தரப்படும்” என்று. நான் சொல்கிறேன், 25,000 வீடுகள் கட்டித் தருவேன் என்று. கட்டுகின்றோமா? இல்லையா? என்பதுதான் பிரச்சினை. 2029இல் நான் 25,000 - 50,000 வீடுகளைக் கட்டித் தருவேன். சொல்லலாம்! செய்வதுதான் முக்கியம். எங்களுடைய

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

இங்கேயிருந்து பார்த்துக் கொண்டிருக்கின்றார். நீங்கள் சொல்லக்கூடாது, "நாங்கள் கள்ளரைப் பிடிக்க வந்த அரசாங்கம்" என்று. உங்களுடைய பாராளுமன்ற உறுப்பினர், ஒரு

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

2022ஆம் ஆண்டு கோப்பாய் police stationஆல் தாக்கல் செய்யப்பட்ட வழக்கு, சம்பந்தப்பட்ட நபர் பாராளுமன்ற உறுப்பினராகப் பதவி வகித்ததற்குப் பிறகு பின்வாங்கப்பட்டிருக்கிறது.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

வைத்திருக்கிற அரசாங்கம் நீங்கள்! ஆடும், phoneஉம் களவு எடுத்ததாக கோப்பாய் police stationஆல் சம்பந்தப்பட்ட நபருக்கு எதிராகத் தாக்கல் செய்யப்பட்ட வழக்குத் தொடர்பான ஆதாரங்கள் என்னிடம் இருக்கின்றன.

எங்களுக்கு ஒரு பெரிய நம்பிக்கை இருக்கிறது சமூகத்தில் மாற்றங்களைக் கொண்டு வர வேண்டும் என்றால், சில அரசியல்வாதிகளுடன் கதைக்கவும், சில அரசியல்வாதிகளை எதிர்க்கவும் வேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது.

මම එක කාරණයක් කියන්න කැමතියි. මම මේක සිංහලෙන් කියන්නම්. තව විනාඩි දෙකහමාරක් මට තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා කියනවා, "අපි හොරු අල්ලනවා" කියලා. හොරු අල්ලන්න ඕනෑ නම් අතිගරු ජනාධිපතිතුමනි, ඇත්තටම අල්ලන්න ඕනෑ පොකට් එකට අත දමලායි.

මම කාරණයක් කියන්නම්.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරලා Jaffna Majistrate's Court එකේ නඩුවක් තිබුණා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වුණාට පස්සේ තමයි ඒක අයින් කර ගත්තේ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා නඩුවක් තිබුණා, 2022දී. මට එතුමාගේ නමත් කියන්න පුළුවන්. ඒ තමයි,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බොරු නම් නැඟිටලා උත්තර දෙන්න කියන්න. නඩුවක් තිබුණා. ඊට පස්සේ මෙතුමාගේ මාමා සාක්ෂිකරුවෙක් විධියට ඉදිරිපත් කරන්නේ නැතුව හිටපු නිසා පොලීසියෙන් නඩුව ඉවත් කර ගත්තා. අනුර කුමාර දිසානායක මැතිතුමාට අපේ යම්කිසි ගෞරවයක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි.

අපට නඩු 29ක් තිබෙනවා. හැබැයි, අපි telephones හොරකම් කරලා නැහැ. අපට තිබෙන්නේ රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් තිබෙන නඩු විතරයි. අපට ඔක්කොම නඩු තිබෙන්නේ රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන්. අපට ආරක්ෂාවත් නැහැ, බම්බුවකුත් නැහැ. ඊයේ රෑ උතුරේ එක් කෙනෙක්ව එළිපිටම කපලා දැම්මා, කඩුවක් ගෙනැල්ලා. ඒ, එතුමාගේ ආසන්නම area එකේ. අනුර කුමාර දිසානායක සහෝදරයා ඇවිල්ලා කරට අත දමාගෙන ඇවිදගෙන ගියපු තැනට එළිපිටම ඊයේ එක්කෙනෙක් කපලා දැම්මා. හැබැයි, මේවාට අනුර කුමාර දිසානායක උත්තර දෙන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ. ඕනෑ කෙනෙකුට ඕනෑ එකක් කියන්න පුළුවන්. ගෙවල් 13,000ක් හදලා දෙනවා කිව්වා.

දැන් ඔය නාමල්ව බන්ධනාගාරගත කළා කියලා අපේ දෙමළ මිනිස්සු වුන් වෙලා ඉන්නවා. අපි දන්නවා, එතුමා දවස් 14න් එළියට එනවා කියලා. ඔය නඩුව ඉවර වෙනකොට ජනාධිපති වෙන්නේ වෙන කවුරු හරි. වුන් වෙලා, වුන් වෙලා අපට politics කරන්න බැහැ. ඔක්කොටම කලින් කියන්න

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සම්බන්ධයෙන් ඔබතුමාට නඩුවක් තිබුණා නේ. ඒක බලා ගන්නකෝ. ඕනෑ නම් නඩුවක් දමා ගන්නකෝ. මම එළියේදිත් ඒ ගැන කියන්නම්. ඕනෑ නම් ඒ නඩුවල numbers එක්කම මම කියන්නම්. එළියේදිත් කියන්නම්.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අහු වෙලා නඩුවක් තිබුණා. 2024දී නඩුව ඉවත් කරලා තිබෙන්නේ. ලජ්ජා වෙන්න ඕනෑ. අනුර කුමාර දිසානායක, ලජ්ජයි නේ? අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ගෞරවයට ලජ්ජයි, මේ වාගේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙලා ඉන්න එක ගැන.

මම තව කාරණයක් කියන්නම්. 12වැනි දා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වේදිකාවට මම නඟිනවා. මම නඟින්නේ මගේ උතුරේ තිබෙන,- මේගොල්ලන් ඇවිල්ලා පව ගැහුවා නේ. ටොන් පව බර ගණනක් ගැහුවා. ඒ පව ටිකට මොකුත්ම කළේ නැහැ කියන්න මට අවස්ථාවක් දුන්නා, ඒගොල්ලන්ගේ වේදිකාවේ. ඉස්සරහට ජනාධිපතිතුමා විධියට රනිල් වික්‍රමසිංහ එන්න කිව්වොත් ඕනෑ නම් මම එතුමා ළඟටත් යනවා. ඊළඟ ජනාධිපතිතුමා විධියට සජිත් ප්‍රේමදාස ආවොත්, එතුමා එන්න කිව්වොත්,-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික චරිතය සම්බන්ධයෙන් කථා කරන්න එපා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඒ, ඉවර වෙච්ච නඩුවක්. ඒක ඇත්ත නඩුවක්. මම බොරුවක් කිව්වේ නැහැ. ඕනෑ නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරගන්න. ඒක ඉවර වෙච්ච නඩුවක්. ඒක ඇත්ත නඩුවක්. එහෙම නැත්නම් නැහැ කියලා කියන්නකෝ. මම ඒ නඩුවේ copy එක්කම පෙන්වන්නම්. ඊළඟට සජිත් ප්‍රේමදාස,-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව පොඩි වේලාවක් දෙන්න.

ඊළඟට සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වෙලා මට කථා කරන්න එන්න කිව්වොත් මම යනවා. මේක දේශපාලනය. විපක්ෂයේ ඉන්න ඕනෑම මන්ත්‍රීවරයෙකුට මම සහයෝගය දෙනවා. ඒ විධියට තමයි නාමල් මන්ත්‍රීතුමා ගැනත් මම හිතන්නේ. එතුමා හොරකම් කර තිබුණත්, හොරු ආරක්ෂා කරන්න සහ එතුමාගේ පෞද්ගලික දේවල්වලට මම support කරන්නේ නැහැ. අපේ අතේ එහෙම ලේ නැහැ. අපට කවදාවත් එහෙම නඩුත් නැහැ. හැබැයි, මම පැහැදිලිව කියන්නේ මේකයි. මම කථාව ඉක්මනින් ඉවර කරනවා. මට තත්පර කීපයක් දෙන්න. මම පැහැදිලිවම කියන්නේ මේකයි. මම එක එක වේදිකාවලට නඟින්නේ මගේ මිනිස්සු නිසායි.

Thank you.

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
Madam Chair, I rise to a point of Order.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉලංකුමාරන් මන්ත්‍රීතුමා.

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
இந்த உறுப்பினர் என்னுடைய பெயரைக் குறிப்பிட்டுப் பேசியிருக்கின்றார். கோப்பாய் பொலிஸ் நிலையத்தில் எனக்கு எதிராக வழக்கு ஏதாவது இருந்தால், அதன் உண்மைத் தன்மையை ஆராயும்படி கேட்டுக்கொள்கிறேன். அன்றைய ஆட்சியாளர்கள் எங்களுக்கு எதிராகப் போலியாகப் பல வழக்குகளைச் சோடித்திருந்தார்கள். அதைப் பூரணமாகத் தெரிந்துகொண்டு, தற்போது இவ்வாறு விமர்சனங்களை முன்வைக்கின்றீர்கள்! நான் கிட்டத்தட்ட 14 வருடங்களாக இந்த அமைப்புக்குள் இருக்கின்றேன். *[இடையீடு]* அதை விளங்கிக்கொள்ள வேண்டும். எனவே, எனக்கு எதிராகப் போலியான வழக்குகளை இங்கே கொண்டுவர வேண்டாம். *[இடையீடு]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Telephone களவெடுத்த வழக்கு, ஆடு களவெடுத்த வழக்கு என்பன இல்லையா?

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
அப்படி வழக்கு ஒன்றும் இல்லை. நன்றாக விசாரித்து விட்டுக் கதையுங்கள்! நீதிமன்றத்தால் அது விசாரிக்கப் பட்டிருக்கின்றது. பொய்யான தகவல்களை வழங்கிய உங்களது திருட்டுக் கூட்டங்கள் மன்னிப்புக் கேட்கவேண்டி இருக்கிறது. எனவே, அந்த வழக்கை எடுத்து மீண்டும் நன்றாக வாசிக்குமாறு நான் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමා දිගින් දිගටම මේ වාගේ බොරු ප්‍රචාර ඉදිරිපත් කරනවා. සමාව ගන්න කියන්න, ඒ ප්‍රචාරවලට. මොකද, ඒක බොරු කථාවක්. පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා මෙහෙම කියන්න හොඳ නැහැ නේ. දැන් ඉලංකුමාරන් මන්ත්‍රීතුමා පැහැදිලිවම කිව්වා, ඒක බොරුවක් කියලා. ඒ වාගේ බොරු කියන්න දෙන්න එපා, මේ සභාවේ. එතුමාට ඕනෑ ඕනෑ දේවල් මේ සභාවේ කියන්න බැහැ නේ. අනිවාර්යයෙන් එතුමාගෙන් සමාව ඉල්ලන්න කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඒක ඔප්පු කරලා පෙන්නුවොත් තමුන්නාන්සේලා 159දෙනා ඉවත් වෙනවාද? පාර්ලිමේන්තුවේ committee එකක් පත් කරන්න. මම නඩු copies අරගෙන ඇවිත් පෙන්වන්නම්. හැබැයි, එහෙම හොරකමක් සම්බන්ධව නඩුවක් මෙතුමාට දාලා තිබෙනවා නම් ඔබතුමන්ලා ඔක්කොම අයින් වෙනවාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේක විවාදයක් බවට පත් කරගන්න අවශ්‍ය නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අද අපේ මේ විවාදයේදී විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කියන්න උත්සාහ කළා, අපි - ජාතික ජන බලවේගය ආණ්ඩුව - බලයට පත් වනකොට ලබා දීපු පොරොන්දු ඉෂ්ට කරලා නැහැ කියලා. අපි තවමත් මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ අවුරුද්දයි මාස 10යි. අපට තව අවුරුදු තුනකට වැඩි කාල සීමාවක් තිබෙනවා. අපි මේ රටේ ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රතිපත්ති එකින් එක ඉටු කරමින් ඉන්නේ. ඒ කාර්යය ඉෂ්ට කරන්න අපට පුළුවන් වෙයි කියලා මම හිතනවා. මම දැන් අද දවසේ මාතෘකාවට එන්නම්.

Hon. Presiding Member, today, we are discussing the Determination under the Women Empowerment Act, which relates to the National Commission on Women. I congratulate the Hon. Minister of Women and Child Affairs for presenting this Determination relating to the National Commission on Women. I was told that women in Sri Lanka had been struggling for nearly 30 years to get this Commission operationalized.

The National Commission on Women was established under the Women Empowerment Act, No. 37 of 2024 and the Commission is now fully operationalized. The Government has the primary responsibility of creating the legal, institutional, economic and social conditions necessary for women to enjoy rights equally to men. The National Commission on Women is particularly important because it is intended to provide the statutory mechanism necessary for protecting and advancing women's rights and gender equality. The Government has to protect women's rights through the established law. It also has to ensure effective protection, justice and rehabilitation systems. What is required is coordinated action by the Police, the courts, the health services, the social services, the educational authorities and other institutions, rather than simply passing legislation. The Government will guarantee equal access to education for all, particularly paying attention to girls who are out of school or at risk of dropping out of school.

The Government must ensure that the National Budget is gender-responsive. It will also try to change the discriminatory social attitudes. The Government cannot achieve gender equality through laws alone; it must be done through schools, the media, religious and community leaders, workplaces, political parties and public institutions. The Government must change the attitude of looking upon women as inferior and attitudes which restrict their participation in social activities. It will protect the vulnerable and disadvantaged women and address issues of women who face multiple disadvantages, women-headed households, women with disabilities, older women, poor rural women, plantation sector women, woman migrant workers and women affected by disasters, conflict and displacement.

If take the functions of the Government and the National Commission on Women, the Government makes and implements policies, provides public services, proposes legislation, allocates resources, runs programmes, enforces laws through relevant agencies and reports through political administration structures while the National Commission on Women monitors and advises on women's issues, protects women's rights, recommends legal reforms, monitors outcomes, receives complaints, monitors rights and complaints, and provides independent oversight and assessments. Therefore, the National Commission on Women has a very important duty to carry out while the Government provides for its services and implements the necessary laws. The National Commission on Women will monitor how everything is implemented and bring how women suffer to the notice of the Government. Then, within the next few minutes, I want to refer to some issues that we discussed yesterday.

අපේ ගරු නජිත් ඉන්දික මන්ත්‍රීමා ඊයේ පැහැදිලි කළා, අපේ ආණ්ඩුව ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන හරහා කරන්න යන දේ පිළිබඳව. මට ඒකට උදාහරණක් දෙන්න පුළුවන්. අපි මේ වෙනකොට වාද්දූව, තල්පිටිය, දළදාවත්ත කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 3කට - තල්පිටිය උතුර, තල්පිටිය දකුණ සහ නාරංපිටිය කියන කොට්ඨාස තුනට - ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථානයක් සකස් කරලා තිබෙනවා. එහි ජනගහනය 8,842යි. එහි නිවාස සංඛ්‍යාව 2,640ක් වෙනවා. එම කොට්ඨාසයේ ජීවත් වෙන ජනතාවට අවශ්‍ය කරන මූලික සෞඛ්‍ය සේවාවන් සැපයීම තමයි අපි මේ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථානයෙන් කරන්නේ.

අපි අද කථා කරන මාතෘකාවට අදාළව විශේෂයෙන් වැඩිහිටි කාන්තාවන් ගත්තාම, මේ වෙනකොට ඒ අය පියයුරු පිළිකා, ගැබ් ගෙල පිළිකා, ඩිම්බ කෝෂ පිළිකා, ගර්භාෂයේ පිළිකා වාගේ නිශ්චිත විශේෂිත රෝගවලින් පෙළෙනවා. ඒ වාගේම  අධිරුධිර පීඩනය, දියවැඩියාව, හෘදය රෝග, strokes, නිදන්ගත වකුගඩු රෝග වැනි බෝ නොවන රෝගවලින් පෙළෙනවා. මෙන්න මේ රෝගීන් පිළිබඳව, - ඒ අය ගැහැනුද, පිරිමිද කියලා නැහැ - කටයුතු කිරීම තමයි ඇත්තටම මේ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථානයෙන් කෙරෙන්නේ. අපි මේ සුවතා මධ්‍යස්ථාන සඳහා ඉතාම සංවිධිත වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. 1977දී පැවැති Alma-Ata සම්මන්ත්‍රණයේදී ලෝකය සාකච්ඡා කළ ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ වැඩ පිළිවෙළේ තවත් එක් අදියරක් තමයි මේ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන හරහා අපි මේ ක්‍රියාත්මක කරන්නේ.

ඉහත මා සඳහන් කළ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථානය හරහා ඒ කොට්ඨාසයේ ජීවත් වන පවුල් දෙදහස් ගණනක 8,800කට ආසන්න ජනතාව සියලු දෙනා ලියාපදිංචි කරනවා. ඒක තමයි ඊට අදාළ මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනියගේ - PHNOගේ - මූලිකම කාර්යය වෙන්නේ. ඊට පසුව ඒ ලියාපදිංචි කරන අය අතර ඉන්න බෝ නොවන රෝග තිබෙන රෝගීන් අපි හඳුනා ගන්නවා. ලියාපදිංචි කළ අය අපි කැඳවනවා, අපේ සුවතා මධ්‍යස්ථානයට. කැඳවලා ඒ අයට දැනට බෝ නොවන රෝග තිබෙනවා නම්, අපි ඒ පිළිබඳව පසුවිපරමක් - follow-up එකක් - කරනවා. ඒගොල්ලන්ට අවශ්‍ය කරන උපදෙස් සපයනවා, උපදේශනය සපයනවා, අවශ්‍ය කරන පරීක්ෂණ කරනවා. ඒ වාගේම ඒගොල්ලන් අදාළ රෝහල්වලට refer කරනවා. ඒ වාගේම අපි මේ පවුල්වල අලුතින් හඳුනා ගන්නා සැක හිතෙන රෝගීන්ට screening programmes කරනවා, ඒ ගොල්ලන්ගේ රෝග හඳුනා ගන්න. ඒ වාගේම ඒ අවට ඉන්න ජනතාවගේ සුළු

රෝගවලට මේ මධ්‍යස්ථාන මඟින් ප්‍රතිකාර කරනවා. ඒ ගොල්ලන්ගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතාවලට අනුව අපි මේ සුවතා මධ්‍යස්ථාන හරහා ප්‍රතිකාර කරනවා.

අපි දන්නවා, රෝගීන් විශාල සංඛ්‍යාවක් බෝ නොවන රෝගවලට රෝහල්වලින් ප්‍රතිකාර ලබලා දැන් නිවෙස්වල රැඳිලා ඉන්න බව, ඒගොල්ලන්ට රෝහල්වලින් නියම කරපු ප්‍රතිකාර ගනිමින්. ඒකට අපි කියනවා, palliative care කියලා. ඇත්තටම මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනිය ඒ ගෙවල්වලට ගිහිල්ලා ඒ රෝගීන් පිළිබඳව සොයා බලනවා. ඒ විධියට සොයා බලා, ඒ අදාළ සංඛ්‍යාලේඛන එකතු කරමින්, සුවතා මධ්‍යස්ථානයට කැඳවන රෝගීන් පිළිබඳව නිරන්තරයෙන් සොයා බලමින් තමයි, මේ කාර්යයන් අපි කරන්නේ. ඊට අමතරව, අපි psychosocial support එකකුත් මේ රෝගීන් සඳහා දෙනවා. මොකද, ඒක කරන්න පුළුවන් උපදේශන සේවා හරහායි. අපි ඒක කරමින් ඉන්නවා. දැන් වාද්දුව, තල්පිටිය, දළදාවත්ත ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථානයට ගියොත්, මේ කාර්යය සිද්ධ වෙන හැටි ඔබට බලා ගන්න පුළුවන්. ඒක තමයි අපි මේ වෙනකොට ලංකාව පුරාම පිහිටුවා ඇති සුවතා මධ්‍යස්ථාන 39ක් හරහා සිද්ධ කරන්නේ. මේ අවුරුද්දේ ඒ වාගේ සුවතා මධ්‍යස්ථාන 1,000ක් පිහිටුවන්න අපි සැලසුම් කරනවා. ඒවායේදී අපි හඳුනා ගන්නා සැක සහිත රෝග තිබෙන අයගේ බර මනිනවා; උස මනිනවා; ඒගොල්ලන්ගේ Body Mass Index එක මනිනවා; waist circumference එක මනිනවා; oral examination එකක් කරනවා; ඒගොල්ලන්ගේ ඇස් පරීක්ෂාවක් - vision test - කරනවා; කාන්තාවන්ගේ breast examination එකක් කරනවා; ඒගොල්ලන්ගේ blood pressure මනිනවා; total cholesterol මනිනවා; random blood sugar test එකක් කරනවා; අපි CVD risk chart එකක් අරගෙන, ඒගොල්ලන්ගේ cardiovascular disease - CVD - risk එක බලනවා. ඒකෙන් අපි කරන්නේ, ලියාපදිංචි කර ගන්නා ලද ඒ කොට්ඨාසයේ ජීවත් වන පවුල්වල සෞඛ්‍ය අවශ්‍යතා සොයා බලමින්, ඒ අයට ඉතාම සමීප සේවාවක් සපයන එකයි. ඉතින්, ඇත්තටම මේක තමයි නිශ්චිත, නියමිත, ලෝකය පුරාම පිළිගත්ත ප්‍රාථමික සෞඛ්‍ය සේවාව. ඒ සේවාව තමයි, අපි මේ සුවතා මධ්‍යස්ථාන හරහා දෙන්නේ.

මේ ගැන ඊයේ නජිත් ඉන්දික මන්ත්‍රීතුමා කිව්වා. රෝහල් පද්ධතියක් අපට තිබෙනවා. හැබැයි, ඒ රෝහල් පද්ධතියට ඕනෑම කෙනෙකුට ඕනෑම වෙලාවක යන්න පුළුවන්. සමහරු රෝහල් කිහිපයකින්ම ප්‍රතිකාර ගන්නවා. ඒ නිසා තමයි මිලියන ගණනක්, අපේ ජනගහනය වාගේ පස්ගුණයක් විතර මේ රෝහල්වලින් ප්‍රතිකාර ගන්නේ. මේ සුවතා මධ්‍යස්ථාන හරහා අපි කරන්න සූදානම් වෙන්නේ, ඇත්තටම කරමින් ඉන්නේ, නිශ්චිත කොට්ඨාසයක - ඒ කියන්නේ තල්පිටිය නම් තල්පිටියට අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාස තුනේ - සියලුම පවුල් ලියාපදිංචි කරලා, ඒ ලියාපදිංචි කළ පවුල්වල රෝගීන් හඳුනා ගෙන, ඒ අය සුවතා මධ්‍යස්ථානයට ගෙන්වලා, ඒ අයගේ රෝග තත්ත්වය පිළිබඳව නිරන්තරයෙන් පසුවිපරමක් කරලා, ඒගොල්ලන්ට අවශ්‍ය කරන උපදේශන සේවා සපයලා, ඒගොල්ලන්ගේ ජීවිත සුවපත් කරන එකයි. ඇත්තටම මේ කාර්යය අපි හරියටම නිශ්චිත කාලසීමාව තුළ ඉටු කර ගත්තොත්, රෝහල්වලට යන සංඛ්‍යාව අවම කර ගන්න පුළුවන්. රෝහල්වල තදබදය අවම කර ගන්න පුළුවන්. ඒ සඳහා තමයි මේ ව්‍යායාමය කරන්නේ. ජාතික ජන බලවේගයේ, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, සෞඛ්‍ය ප්‍රතිපත්තිය නිශ්චිත වශයෙන්ම ඉටු කරන ප්‍රධානම අවස්ථාව තමයි, අපි මේ සුවතා මධ්‍යස්ථාන රට පුරා ක්‍රියාත්මක කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික ජන බලවේගයේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කාරණා එකින් එක අපි ඉතාම ක්‍රමානුකූලව මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු මොනවා කිව්වාත්, මේ වෙනකොට රටේ ජනතාව ඉතාම හොඳින් අපේ වැඩ පිළිවෙළ එක්ක අපි එකතු කර ගෙන තිබෙනවා. ඒක තමයි කළුතර දිස්ත්‍රික්කයේ පැවති රැලි දෙකකින් අපි පෙන්වූයේ. අපිට මැතිවරණ දෙකකින් ලබා දීපු ජයග්‍රහණයටත් වඩා විශාල ජයග්‍රහණයක් ලබා දෙන්න, මේ රටේ ජනතාව අපේ වැඩ පිළිවෙළ සමඟ එකතු වෙමින් ඉන්නවා කියමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam Presiding Member, I rise to a point of Order.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Parliament Standing Order No. 111 (7). මේක දහවැනි වතාවට මම අහන්නේ. මෙතුමා දැන් පැය ගණනක් කථා කළා. Sectoral Oversight Committee එකේදී Director, Teaching Hospital, Jaffna ගෙන්වලා අපි inquiry එකක් කළා. ඊට පස්සේ ඒ hospital එකට දීපු appointment letter එක අවුරුදු ගණනාවක් මම මෙතුමන්ලාගෙන් ඉල්ලනවා. හොරු රක්ෂාව කරගෙන ඇවිල්ලා, පැය ගණනක් උත්තර දෙනවා, රටට අරක කරනවා, මේක කරනවා කියලා. දැන් අවුරුද්දක් වෙනවා. ඒ appointment letter එක ගැන අහලා අවුරුද්දක්. මෙතුමාට පුළුවන් නම් උත්තර දෙන්න කියන්නකෝ, පැය ගණනක් health ගැන කථා කරන්නේ නැතුව. අවුරුද්දක් වෙනවා, මේක, violation of Standing Orders.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය කිහිප වරක් අපේ Sectoral Oversight Committee එකේදී නැඟුවා. නමුත්, අපි විමසලා බැලුවා, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්. මේ නිලධාරීන් පත් කරලා තිබෙන්නේ නීත්‍යනුකූලව. මේ අයට PSC approval එකක් තිබෙනවා. මම ඔබතුමාට පෙන්වූවා, ඒ අයගේ පත්වීම් ලිපි. ඔබතුමා තර්කයක් ගොඩනඟනවා, වෙනත් දිශාවකට. නමුත්, නීත්‍යනුකූලව මේ කටයුත්ත කරලා තිබෙනවා කියලා මට කරුණු තිබෙනවා ඉදිරිපත් කරන්න. මම ඒක ඉදිරිපත් කළා, Sectoral Oversight Committee එකේදී. හෙට අපි නැවත මුණ ගැහෙමු. හෙට Sectoral Oversight Committee එකේදී මම ඔබතුමාට ඒ ලියකියවිලි පෙන්වන්නම්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තත්පර 10ක් දෙන්න.

ඔබතුමාට බොහොම ස්තුතියි. මට කිසිම ලිපියක් අද වෙනතුරු පෙන්වලා තිබුණේ නැහැ. ඒක නීත්‍යනුකූල නම්, මේ Medical Ordinance එක තිබෙනවා. දහහත, දහනවය amendments තිබෙනවා. මම Secretaryගෙනුයි, මෙතුමාගෙනුයි ඇහුවා, කොහේද එහෙම නීතියක් තිබෙන්නේ කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට දැන් ඒකට පිළිතුරක් ලැබුණා නේ.

මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.20]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ වන තීරණය පිළිබඳ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ මම ප්‍රථමයෙන්ම ශෝක පණිවුඩයක් ඉදිරිපත් කරමින් අපගේ ශෝකය පළ කරනවා, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ භෝජනාගාරයේ කළමනාකරු හැටියට සේවය කරපු බන්දුල පත්මසිරි මහතාගේ අභාවය වෙනුවෙන්. වසර 33ක් පාර්ලිමේන්තුවේ සේවය කළ එතුමා හදිසියේ ඇති වුණු හෘදයාබාධයක් නිසා රෝගාතුර වෙලා ඉඳලා සැප්තැම්බර් 03වන දින අභාවප්‍රාප්ත වුණා. එතුමාගේ අභාවය වෙනුවෙන් විශේෂයෙන්ම එතුමාගේ භාර්යාව ඇතුළු දූ දරුවන්ට සමස්ත විපක්ෂයේ ශෝකය මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ආණ්ඩු පක්ෂයෙනුත් ගරු සභානායකතුමා ශෝකය ප්‍රකාශ කරනවා මම දැක්කා. ඒක අප කළ යුතු දෙයක්. අවුරුදු 33ක් එතුමා මේ පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් භෝජනාගාරයේ සේවය කළා; එහි කළමනාකරු හැටියට කටයුතු කළා. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ අයට මේ අවස්ථාවේ අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව ක්‍රියාත්මක කිරීම ගැන කථා කරද්දී මම පැහැදිලිව මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. පසුගිය පාර්ලිමේන්තු කිහිපයකම හිටපු මන්ත්‍රීතුමියලා මේ කාරණය සම්බන්ධයෙන් විශාල උනන්දුවකින් කටයුතු කළා. ඒ වාගේම අද වන කොට මේ සම්බන්ධයෙන් වන තීරණය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, අනුමත කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා.

කාන්තාව අනිවාර්යයෙන්ම සවිබල ගැන්විය යුතුයි. මොකද, අපේ සමාජයේ කාන්තාව ඇත්තටම විශාල කාර්යභාරයක් ඉෂ්ට කරනවා. මව්වරුන් හැටියටත්, සහෝදරියන් හැටියටත් ඒ අයගෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට වෙනවා. අපි මුලින්ම කියන්න ඕනෑ මෙය කාන්තාව අභියෝග ගණනාවකට මුහුණ දෙන වෙලාවක් බව. ඇය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් තමයි, තමන්ගේ පවුලේ දුර්වල ආර්ථික තත්ත්වය. අද අප දකින විධියට, තමන්ගේ දරුවන්ගේ පෝෂණය සම්බන්ධයෙන් මූලික කටයුතු ගණනාවක්ම කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ කාන්තාවන්ටයි. තමන්ගේ දරුවන්ට නියමිත පෝෂණයක් දෙන්න බැරිව අපේ රටේ කාන්තාවන්, අම්මලා විශාල ප්‍රමාණයක් දුක් විඳින වෙලාවක්, මෙය. මේක තමයි ඇත්ත.

මට පෙර කථා කළ කළුතර දිස්ත්‍රික්කයේ අපේ වෛද්‍යතුමා කිව්වා "අපි බලයට ඇවිල්ලා තවම අවුරුදු 2යි. අපේ ආණ්ඩුවට තව අවුරුදු 3ක කාලයක් තිබෙනවා" කියලා. අපේ රටේ කාන්තාවට තිබෙන ඒ බර අඩු කරන්න මේ වසර 2 තුළ ඔබතුමන්ලා කරලා තිබෙන්නේ මොනවාද කියා පැහැදිලි කළා නම් බොහෝ සෙයින්ම වැදගත් වනවා. මොකද, තමන්ගේ දරුවා ඉපදුණු වෙලාවේ ඉඳලා එයාව හොඳ පෝෂණ තත්ත්වයක තියා ගැනීම සම්බන්ධයෙන් ලොකුම බරක් කාන්තාවට තිබෙනවා. කාන්තාවන්ට තිබෙන ඒ බර අඩු කිරීම සඳහා ඔබතුමන්ලාට මේ වසර දෙක තුළ කරන්න පුළුවන් වුණු කාර්යය මොකක්ද? අන්න ඒක තමයි විපක්ෂය හැටියට අප අහන්නේ. මොකද, අද අපේ අම්මලාට තමන්ගේ දරුවන්ට තුන්වේල හරියට කන්න දෙන්න බැරි වෙලා තිබෙනවා; ඒ සම්බන්ධව ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා.

මම ගිය සතියේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටියේ ගමකට ගිය වෙලාවේ, ඒ ගමේ පිරිස එක්ක සාකච්ඡා කළා. එහිදී ඒ අය ප්‍රකාශ කළා, ගොවීන් හැටියට ඒ අයගේ ආර්ථිකයට අද ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන. ඒ අය කිව්වා, "අපිට වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 110ක් විතර යනවා, නමුත් අද අපේ නාඩු වී කිලෝ එකක් ගන්නේ රුපියල් 80ට, සම්බා වී කිලෝ එකක් ගන්නේ රුපියල් 90ට. ඉතින් අපිට ඒවා විකුණා ගන්න බැහැ" කියලා. ආණ්ඩුව මොනවා කථා කළත් ඒක තමයි ඇත්ත. එයින් එහා මිලක් නැහැ. මේ තත්ත්වය හමුවේ ඒ අය වී ටික තමන්ගේ ගෙදර ඉඩ තිබෙන ප්‍රමාණයෙන් අඩුක් කරගෙන ඉන්නවා. එහෙම නම්, දැන් ගමේ ආර්ථිකයට වෙලා තිබෙන්නේ මොකක්ද? මේ වෙලාවේ ගිහිල්ලා ඉතා දුෂ්කර ප්‍රදේශයක තිබෙන ගමේ කඩේක මුදලාලි කෙනෙකු එක්ක කථා කරලා බලන්න. දැන් සමහර අම්මලා කඩේට ඇවිල්ලා ගෙදරට පරිප්පු ග්‍රෑම් 50ක් අරගෙන යන බව ඒ අය කියනවා. එහෙම ආර්ථික තත්ත්වයක් තිබෙන අම්මලා ගොඩක් අපේ රටේ ඉන්නවා. ග්‍රෑම් 50ක් කියන්නේ කොච්චර නම් අඩු ප්‍රමාණයක්ද? වේලකට තමන්ගේ දරුවන්ට හොද්දක්වත් හදලා දෙන්නයි අම්මලා අද උත්සාහ කරන්නේ. ඉතින්, මේක තමයි ඇත්ත. අප මේවාටයි පිළියම් යොදන්න ඕනෑ. අද මේ රටේ තුන් වේලක් තියා තමන්ගේ දරුවන්ට දෙවේලක්වත් දෙන්න බැරි අම්මලා ගණනාවක් ඉන්නවා.

කාන්තාවන් සම්බන්ධයෙන් ගත්තාම, එක පැත්තකින් ඒ වාගේ අසරණ වෙච්ච කණ්ඩායමක් ඉන්නවා වාගේම අද මේ රටේ මධ්‍යම හා සුළු පරිමාණ කර්මාන්ත ගණනාවක් ක්‍රියාත්මක කරන ධෛර්යවන්ත කාන්තාවනුත් ඉන්න බව විශේෂයෙන්ම කියන්න ඕනෑ. එයාලාට ප්‍රශ්න ගණනාවක් ආවා, කොරෝනා වසංගතය සහ පසුගිය කාලයේ රට බංකොලොත්භාවයට පත් වීමත් එක්ක. හැබැයි, මේ ආණ්ඩුවට අවුරුදු 2ක් ගත වෙලාත් ඒවාට විසඳුම් ලබා දෙන්න මේ රජයට තවම පුළුවන් වෙලා නැහැ. එතැනත් ප්‍රශ්න ගණනාවක් ඇවිල්ලා තිබෙනවා, කාන්තාවන්ගේ පැත්තෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව පොඩි වෙලාවක් දෙන්න. කාන්තාවන් විශාල සංඛ්‍යාවක් වැඩ කරන, කාන්තාවන්ට මේ වන කොට විශාල වශයෙන් ආදායමක් ලැබෙන ක්ෂේත්‍රයක් තමයි ඇඟලුම් ක්ෂේත්‍රය. ඇඟලුම් කර්මාන්තශාලාවක් ගත්තොත්, එහි සියයට 90ක් වැඩ කරන්නේ කාන්තාවෝ. නමුත්, අද ඇඟලුම් කර්මාන්තශාලා ගණනාවක් වැසී ගෙන යනවා. එතකොට කාන්තාවට ලැබුණු ඒ ආර්ථික අවස්ථාවත් අද අහිමි වෙලා තිබෙනවා. ගරු සභානායකතුමාත් මෙහි සිටින නිසා මම මතක් කරනවා, මේ වන කොට අපේ කාන්තාවන්ගේ විරැකියාව, රැකියා කළ යුතු කාන්තාවන්ගේ විරැකියාව සියයට 26.2ක් දක්වා ඉහළට ගිහින් තිබෙන බව. ඒවාට ප්‍රතිකර්ම ලබා දෙන වැඩ පිළිවෙළක් තමයි අප හදන්න ඕනෑ. ආණ්ඩුවට වසර 2ක් බව කිව්වා. වසර 2 යන කොට කාන්තාව සවිබල ගන්වා, කාන්තාව ශක්තිමත් කරලා එයාලාගේ ආර්ථිකය ශක්තිමත් කරලා තිබෙන්න ඕනෑ. මොකද, කාන්තාව ශක්තිමක් කරනවා කියන්නේ පවුල ශක්තිමත් වෙනවා කියන එකයි. ඒත් එක්කම එම පවුලේ මන්දපෝෂණ තත්ත්වය නැති වෙලා ඒ අයට හොඳ අවස්ථාවක් ලැබෙනවා, මේ රටට හොඳ පුරවැසියන් බිහි කරන්න. මම පැහැදිලිව කියනවා,

මව්වරුන් ගත්තත්, උපදින්න ඉන්න දරුවන් ගත්තත්, කොයි පැත්තෙන් ගත්තත් ඒ හැම අංශයකම අද ප්‍රශ්න ගණනාවක් ඇවිත් තිබෙන බව. ඒවාට ඔබතුමන්ලා ලබා දෙන විසඳුම් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් යම් පිළිතුරක් ලැබෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. මොකද, කාන්තාව ශක්තිමත් කරනවා නම් සැබෑවටම මේ කියන කාරණා ඉෂ්ට කළ යුතුයි.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.27]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2024ஆம் ஆண்டின் 37ஆம் இலக்க, பெண்களின் வலுவூட்டல் சட்டத்தின் 13ஆம் பிரிவுக்கு இணங்கவும், 2026 ஓகஸ்ட் 10ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்துக்கு ஏற்பவும், இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள பெண்களின் வலுவூட்டல் தொடர்பான பிரேரணை குறித்து உரையாற்றுவதற்கு முன்னர், பெண்களின் பெருமை தொடர்பாக மகாகவி பாரதி அவர்கள் குறிப்பிட்ட சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன்.

> " பட்டங்கள் ஆள்வதும் சட்டங்கள் செய்வதும் பாரினில் பெண்கள் நடத்த வந்தோம்"
>
> " பெண்ணுக்கு விடுதலை நீரிலும் இல்லை, நிலத்திலும் இல்லை, பெண்ணின் மனத்திலே இருக்கிறது"
>
> " ஆணும் பெண்ணும் நிகரெனக் கொள்வதால் அறிவிலோங்கி இவ்வையகம் தழைக்குமாம்"

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பெண்ணின் பெருமை, பெண்ணுக்குச் சம உரிமை, பெண்ணின் சமூகப் பாதுகாப்புத் தொடர்பாக உரையாற்றுகின்ற இவ் வேளையிலே, இந்தச் சபைக்குத் தலைமைதாங்குகின்ற நீங்களும் ஒரு பெண்ணாக இருக்கின்றீர்கள். இலங்கையின் பொருளாதாரத்தை தாங்கிநிற்கும் தூண்களாகப் பெண்களே இருக்கின்றார்கள் எனக் கூறினால் அது மிகையாகாது. காரணம், இலங்கைக்குக் கூடியளவு அந்நியச்செலாவணியைப் பெற்றுத்தரக்கூடிய வகையில், பெருந்தோட்டத்துறையில் மலையகப் பெண்கள் தங்களுடைய உழைப்பைத் தொடர்ச்சியாக வழங்கி வருகின்றார்கள். இதன்மூலம் கூடியளவு வருமானத்தை இலங்கை ஆண்டுதோறும் பெற்றுக்கொண்டு வருகின்றது. இலங்கைக்கு அந்நியச்செலாவணிமூலம் வருமானத்தை ஈட்டித்தரக்கூடிய இன்னுமொரு பிரதானமான துறையாகக் காணப்படுகின்ற ஆடைக் கைத்தொழில் துறையிலும் கூடுதலாகத் தொழில்புரிபவர்கள் அல்லது உற்பத்திகளில் ஈடுபடுபவர்கள் பெண்களாகத்தான் இருக்கின்றார்கள்.

இவ்வாறு கூடுதலான அந்நியச்செலாவணியை எமது நாட்டுக்கு ஈட்டிக்கொடுக்கின்றார்கள் இந்தப் பெண்கள்! அதேபோல, கடந்த காலங்களில் கூடுதலான பெண்கள் மத்திய கிழக்கு நாடுகளுக்கு வேலைக்குச் சென்றதால் எமது நாட்டுக்குக் கூடுதலான வருமானம் கிடைக்கப்பெற்றது. இப்பொழுதும் அவர்கள்மூலம் எமது நாட்டுக்கு வருமானம் கிடைக்கின்றது. எமது நாட்டின் வருமானத்துக்குக் கூடியளவு பங்களிப்பைச் செய்கின்ற இந்தப் பெண்கள் தொடர்பில் நாங்கள் கடந்த காலங்களில் எவ்வளவு அக்கறையுள்ளவர்களாக இருந்தோம் என்று பார்த்தால், அது கேள்விக்குரிய விடயமாகவே இருக்கின்றது.

இலங்கையினுடைய சனத்தொகையில் கிட்டத்தட்ட 52 சதவீதமானவர்கள் பெண்களாக இருந்தபோதிலும், தொழிற் படையில் அவர்களின் பங்களிப்பு வெறும் 33 சதவீதமாகும். அதாவது, 1/3 பங்கே காணப்படுகின்றது. இதனைப் பார்க்கும்பொழுது, சமத்துவம் என்று கூறுவது மிகவும் பிழையானதொரு கருத்தாகக் காணப்படுகின்றது. எனவே, எதிர்வரும் காலங்களில் தொழிற்படையில் பெண்களின் பங்களிப்பை அதிகரிக்க வேண்டுமென நான் இந்தச் சபையில் கூறிக்கொள்ள விரும்புகின்றேன். பெண்களுடைய சமூகப் பாதுகாப்பு, பொருளாதாரப் பாதுகாப்பு, குடும்ப வன்முறைகளிலிருந்து பாதுகாப்பு போன்ற விடயங்களில் நாங்கள் எவ்வளவு அக்கறையாக இருந்துள்ளோம் என்பதை கடந்த காலங்களில் அவர்களுக்கு எதிராக ஏற்படுத்தப்பட்ட வன்முறைகளினூடாக அறியக்கூடியதாக இருக்கின்றது. எனவே, பெண்களை வலுவூட்டுதல் என்பது மிகவும் பிரதானமானதாகக் கொள்ளப்படுகின்றது.

நாங்கள் பெண்களின் அரசியல் பிரதிநிதித்துவத்தில் வரலாற்றுச் சாதனை படைத்திருக்கிறோம். வரலாற்றில் முதல் தடவையாக 19க்கும் மேற்பட்ட பெண் பாராளுமன்ற உறுப்பினர்கள் இந்த உயரிய சபையில் அங்கம் வகிக்கின்றார்கள். இச்சாதனையை ஏற்படுத்தியது எமது அரசாங்கமே என்பதை இவ்விடத்தில் பெருமையாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன். அதுமட்டுமல்ல, மலையக சமூகத்திலிருந்து தமிழ் பெண் பாராளுமன்ற உறுப்பினர்களை இச்சபைக்குக் கொண்டுவந்த ஒரேயொரு கட்சி எங்களுடைய தேசிய மக்கள் சக்திதான் என்பதை நான் இங்கு பெருமையுடன் கூறிக்கொள்ள விரும்புகின்றேன். எங்களுடைய அரசாங்கத்தில் பெண்களுக்குப் போதுமான அளவு பிரதிநிதித்துவத்தை வழங்குவதற்கு நாங்கள் முழுமூச்சுடன் ஈடுபட்டு வருகின்றோம். எதிர்வரும் தேர்தல்களிலும் பெண்களுடைய பிரதிநிதித்து வத்தை அதிகரிப்பதற்கான வேலைத்திட்டங்களை நாங்கள் ஆரம்பித்து இருக்கின்றோம்.

பெண்களின் உரிமைகளைப் பாதுகாப்பதற்குப் பல்வேறு சட்டங்களை நாங்கள் கொண்டுவர வேண்டிய தேவை இருக்கின்றது. அதுமாத்திரமன்றி, சட்டங்களில் காணப்படுகின்ற ஓட்டைகளை அடைப்பதற்கான திருத்தங்களையும் கொண்டுவரவேண்டி இருக்கின்றது. சட்டம் இயற்றப்படுவது மட்டும் போதுமானதல்ல. அந்தச் சட்டத்தின் நன்மைகள் நாட்டின் ஒவ்வொரு கிராமத்தில் வாழ்கின்ற பெண்களையும் சென்றடைவதை உறுதிப்படுத்த வேண்டியது மிக முக்கியமானது. வெறுமனே உதட்டளவில் மட்டும் பெண்கள் உரிமைகள், பெண்களுக்கான சமத்துவம், பெண்களைப் பாதுகாக்க வேண்டும் என்று நாங்கள் கூறுகின்றோமே ஒழிய, அதை எவ்வளவு தூரம் நடைமுறையில் செய்து காட்டுகின்றோம் என்பது கேள்விக்குரிய விடயமாகவே இருக்கின்றது.

வடக்கு, கிழக்கைப் பொறுத்தவரையில், அங்கு வாழுகின்ற பெண்களுக்குப் பொருளாதார பாதுகாப்பின்மை காணப்படுகின்றது. அவர்களுக்கான பொருளாதாரப் பாதுகாப்பை ஏற்படுத்த வேண்டியது எங்களுடைய தலையாய கடமையாக இருக்கின்றது. அங்கு வாழுகின்ற அதிகமான பெண்கள் விவசாயம், மீன்பிடி, கால்நடை வளர்ப்பு, சிறு தொழில்கள்

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

மற்றும் முறைசாரா வேலைவாய்ப்புகளை நம்பியே இருக்கின்றார்கள். அவர்களுக்கு நிதி வசதி, தொழில்நுட்ப வசதி, சந்தை வாய்ப்பு மற்றும் தொழிற்பயிற்சி அணுகல் என்பன போதுமானதாகக் காணப்படவில்லை.

வடக்கு மாகாணத்தில் பெண் தலைமைத்துவக் குடும்பங்கள் கூடுதலாகக் காணப்படுகின்றன. குறிப்பாக, பொருளாதார ரீதியாகப் பாதிக்கப்பட்ட பெண்கள் மற்றும் விதவைகள் கூடுதலாக இருக்கின்றார்கள். இவர்களுக்கான சிறந்த வேலைத்திட்டங்களை நாங்கள் எமது அரசாங்க காலப்பகுதியில் நிச்சயமாக மேற்கொள்ளவேண்டிய தேவை இருக்கின்றது. குறிப்பாக, முப்பது வருடகால யுத்தம் காரணமாக கூடியளவு பாதிக்கப்பட்டவர்கள் வட, கிழக்கிலுள்ள பெண்கள்! இவர்களின் தலைமைத்துவத்தின்கீழ் ஆயிரக்கணக்கான குடும்பங்கள் இருக்கின்றன. இவர்கள் பொருளாதார ரீதியாகத் தங்களை உயர்த்திக்கொள்வதற்கும், குடும்பச் சுமையிலிருந்து மீள்வதற்கும் போராடி வருகின்றார்கள். எனவே, இவர்களைக் கைதூக்கிவிட வேண்டியது எங்களுடைய பொறுப்பாக இருக்கின்றது. இதற்கான வேலைத்திட்டங்களை நாங்கள் உரிய அமைச்சுக்கள் ஊடாக முன்னுரிமைப்படுத்திச் செய்ய வேண்டிய தேவை இருக்கின்றது.

அடுத்து, நாங்கள் பெண்களுக்கு எதிரான வன்முறைகள் தொடர்பில் பார்ப்போம். நாங்கள் பெண்களை எவ்வளவு தூரம் நேசிக்கிறோம் என்பது இந்த நாட்டில் நடைபெறுகின்ற பெண்களுக்கு எதிரான வன்முறைகளைப் பார்த்தால் தெரியும். இது மிகவும் மன வருத்தமான விடயமாக இருக்கின்றது. தொழில்புரிகின்ற இடங்களிலும் பொதுப் போக்குவரத்துகளில் பிரயாணம் செய்யும்போதும் பாலியல் தொல்லைகளுக்கும் துன்புறுத்தல்களுக்கும் ஆளாகின்ற பல பெண்களை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. எனவே, இவர்களுக்கான பாதுகாப்பை வழங்குவது நம் அனைவரினதும் பொறுப்பாகும். இது தொடர்பான சட்ட திட்டங்களில் மாற்றங்களை ஏற்படுத்தி, அதற்கான முன்னுரிமையை வழங்க வேண்டும். அதுமட்டுமல்ல, பெண்களுடைய பாதுகாப்பு எவ்வளவு தூரம் முக்கியமானது என்பதை அனைவருக்கும் தெளிவுபடுத்தக் கூடிய வேலைத்திட்டங்களை ஆரம்பிக்க வேண்டும்.

சாதாரணமாக எங்களுடைய குடும்பங்களில் அல்லது சமூகத்தில் பெண்கள் பல்வேறு பணிகளை ஆற்றுகின்றார்கள். அவர்கள் மனைவியாக, தாயாக, சகோதரியாக இன்னோரன்ன பங்கை வகிக்கின்றார்கள். அவர்கள் வீட்டுப் பணிகளை மேற்கொள்வது மட்டுமல்ல, தொழில் புரியவும் செல்கின்றார்கள். இவ்வாறு அவர்கள் இரண்டு விதமான வேலைப்பளுவுக்கு உள்ளாகிறார்கள். இவற்றிலிருந்து அவர்களுக்கு நிவாரணம் வழங்க வேண்டிய தேவை இருக்கின்றது. எனவே, இவர்களுக்கான நலன்புரி நடவடிக்கைகளை அல்லது நலன்சார்ந்த விடயங்களை அதிகரிக்க வேண்டிய தேவை இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள பெண்களுக்கு அனுதாபம் மட்டும் தேவையில்லை. அவர்களுக்கு வேலை வாய்ப்பு, திறன், நிதி, பாதுகாப்பு மற்றும் முடிவெடுப்பதில் சமத்துவம் என்பன மிகவும் தேவையான விடயங்களாகக் காணப்படுகின்றன. ஒரு பெண்ணை சுய வலிமைப்படுத்துவது ஒரு குடும்பத்தை வலுப்படுத்துவதாகும். ஒரு குடும்பத்தை வலுப்படுத்துவது ஒரு சமூகத்தை வலுப்படுத்துவதாகும். ஒரு சமூகத்தை வலுப்படுத்துவது இலங்கையின் பொருளாதாரத்தை வலுப்படுத்துவதாக அமைகின்றது. அந்த வகையில், எங்களுடைய அரசாங்கமானது பெண்களின் மதிப்பை உணர்ந்து, பல்வேறு விடயங்களில் அவர்களுக்கு முன்னுரிமை வழங்கியிருக்கிறது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒரு வலுவான, சுயாதீனமான தேசிய பெண்கள் ஆணைக்குழுவில் முதலீடு செய்வது நாட்டின் பொருளாதார உற்பத்தித்திறன், சமூக நீதி மற்றும் நல்லாட்சிக்கு அபரிமிதமான பலன்களைத் தரும். இலங்கைப் பெண்களின் உரிமைகளைப் பாதுகாக்கும் பொறுப்பை ஏற்றுள்ள இந்த ஆணைக்குழுவை முழுமையாகச் செயற்படுத்த வேண்டும் என்பது எனது பிரதான கோரிக்கையாக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பெண்களின் வலுவூட்டல் கொள்கைக்கு எங்களுடைய அரசாங்கம் எவ்வளவு முக்கியத்துவம் வழங்கியிருக்கின்றது என்பதைப் பார்ப்போம். எமது சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் மற்றும் பிரதமர் ஹரினி அமரசூரிய அவர்கள் தலைமையிலான தேசிய மக்கள் சக்தி அரசாங்கம், பெண்களின் சமூக, பொருளாதார நிலையை உயர்த்தவும் அரசியல் பிரதிநிதித்துவத்தை உறுதிப்படுத்தவும் சட்டபூர்வ மற்றும் கொள்கை ரீதியான மாற்றங்களை ஏற்படுத்த முன்வந்திருக்கின்றது.

தற்போது இலங்கையில் பெண்களின் தொழிலாளர் பங்களிப்பு 33.1 சதவீதமாக இருக்கின்றது. டிஜிட்டல் மற்றும் பசுமைப் பொருளாதாரத்தில் பெண்களை இணைத்து, அவர்களுக்கு உயர் மதிப்பு வேலைவாய்ப்புகளை வழங்கவேண்டிய தேவையிருக்கின்றது. பராமரிப்பு பொருளாதாரம், ஊதியமில்லாத வீட்டுப் பராமரிப்பு வேலைகள் என்பன பெண்களை வேலைக்குச் செல்வதிலிருந்து தடுக்கின்றன. எனவே, இவற்றிலிருந்து அவர்களுக்கு நிவாரணம் அளிக்கக்கூடிய வகையிலான திட்டங்களை வகுக்கவேண்டிய தேவையிருக்கின்றது. எதிர்காலத்தில் இதற்கான ஆக்கபூர்வமான நடவடிக்கைகளை நாம் அனைவரும் ஒன்றுசேர்ந்து மேற்கொள்வோமெனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி. வணக்கம்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[4.39 p.m.]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Presiding Member, I am happy to contribute to the Debate on the Determination relating to the National Commission on Women, which deals with its members' salary anomalies. I was happy to be the *pro tem* Chairman of the Committee on Public Finance when this matter came up.

I must say that the person who is heading the Commission worked at the Ministry of Foreign Affairs

when I was the Minister and she is certainly an able person. The Commission, I see, is very ebullient and ready to get things moving, which, I would say, is very good.

I would like to mention about the salary anomalies that take place. I know it is a problem in the entire country. However, when we have a new institution coming into operation, if we do not rectify that error at the very point of its birth, then, I guess we would not be able to motivate the rest of the country to move forward. And, I know that it was with a lot of passion that the Government and especially, the Prime Minister put this National Commission on Women into place, as much as I am trying to put the National Youth Commission into place because I think it is important.

The main thing that came up when this was discussed at the CoPF three days ago was that the Chairperson is getting Rs. 135,000 while the other members of the Commission are getting Rs. 90,000. That is, the three active members, out of the six and the balance three members are not specified. That was, certainly, an area of concern because as for them, there is no direction as to how to move forward even though they are expected to be active members all the way.

One of the key aspects handled by this particular Commission is women empowerment. Empowerment of a woman is one of the most important aspects in assisting her to become self-sufficient. But, I do not see anything relating to empowerment in the Act brought forward. And, I would greatly expect the Government to rectify that and ensure that it is done in this process itself because, otherwise, it would be just another talk-shop. Having commission upon commission to bring matters into litigation - I think we are highly litigated; this country has too many laws to go forward with - would not do and it would be just another thing done.

My initial expectation of speaking on this salary issue was to amplify it further to apply to the entire country and that is why I used it as the base. Achieving this country's revenue target of US Dollars 36 billion in exports by 2030 would only be a pipe dream, if you do not get your act together. What I can see is that it is heading in a direction rudderless. There has to be a direction and work done towards reaching that goal.

The economic adviser to the President, Mr. Duminda Hulangamuwa, quite rightly said that the Government service is far too top-heavy and that it lags at the bottom, carrying too much weight without any productivity coming out and that as a result, it needs rectification. So, while the statement seem to be absolutely spot on, that rectification needs to take place because we are spending Rs. 1.5 trillion as expenditure from Government revenue. Productivity is the main aspect, the bugbear in the system. So, I guess what has got to be done now is to ensure that we rectify that very aspect.

ඒ ගැන කියන අතරතුර මම නැවත එය මූලාශ්‍රය කර ගත්තේ, අද රටේ තිබෙන සැබෑ ආර්ථික ප්‍රශ්නත් සමඟ පඩි නඩිවලට යන ප්‍රමාණය ගැන සඳහන් කරන්නයි. ලක්ෂ 16ක්ව සිටි රාජ්‍ය සේවක පිරිසෙන් මේ මොහොත වන විට ලක්ෂ 15ක් පමණ සේවය කරනවා. මේ අවස්ථාවේදී රාජ්‍ය සේවක වේතන වෙනුවෙන් ට්‍රිලියන 1.35ක්, ඒ කියන්නේ බිලියන 1,350ක් වියදම් කරනවා. මේ ප්‍රමාණය මාස 12න් බෙදුවාම ලක්ෂ 15ක් වන සේවක පිරිසෙන් එක පුද්ගලයෙකුට දළ වශයෙන් 81,000ක විතර පඩියක් ලැබෙනවා. මේකේ කොතරම් වටිනාකමක් තිබෙනවාද, නැද්ද කියා සාපේක්ෂව බැලිය යුතුයි. මොකද, මෙය සාපේක්ෂව බැලිය යුතු දෙයක්. ජනාධිපතිට ලැබෙන ප්‍රමාණය, ඇමති කෙනෙකුට ලැබෙන ප්‍රමාණය, ඊට පසුව විගණකාධිපතිට ලැබෙන ප්‍රමාණය ආදි වශයෙන් අපි බලමු. රුපියල් 80,000ක average salary එකක් ලැබෙන කොට, විගණකාධිපතිතුමියට ලැබෙන්නේ රුපියල් 195,000යි. නමුත්, එතුමිය chartered accountant කෙනෙක්. එහෙම කෙනෙකුට ඒ වාගේ වැටුපක් ඇතිද? එතකොට කොහොමද brain drain නවත්වන්න පුළුවන් වන්නේ? දොස්තරවරුන්ට රුපියල් ලක්ෂ 4½ක්, ලක්ෂ 5ක් ලැබෙනවා කියනවා. නමුත් අප බැලිය යුත්තේ ලක්ෂ 4 ½ කියන ප්‍රමාණයේ විශාලත්වයද, එහෙම නැත්නම් දොස්තර කෙනෙකුට ඒ ගෙවන ප්‍රමාණය ඇතිද කියන එකයි. FUTA එකෙන් ඊයේ strike කළේ නිකරුණේ නොවෙයි. ඒගොල්ලන්ගේ professorsලාට රුපියල් 450,000-500,000 අතර ප්‍රමාණයක් ලැබෙනවා. ඒ ලැබෙන ප්‍රමාණය අසල්වැසි රටවල එවැනි professorsලාට ලැබෙන වැටුප් ප්‍රමාණයත් එක්ක සාපේක්ෂව බලන්න. ඒ රටවල අයට ලක්ෂ 12ක්, ලක්ෂ 15ක් ලැබෙන කොට, මෙහේ අයට මේ ලැබෙන රුපියල් ලක්ෂ 4 ½, ලක්ෂ 5 ප්‍රමාණවත්ද? FUTA එකේ අයට එහෙම වැටුපක් ලැබෙන කොට, මහ බැංකුවේ security officer කෙනෙකුට රුපියල් 150,000ක් ලැබෙනවා; එහේ driversලාට රුපියල් 200,000ක් ලැබෙනවා. මේ තුළ කිසිම සංසන්දනාත්මකභාවයක් නැහැ. ඒක තමයි නිවැරැදි කරන්න අවශ්‍ය වන්නේ. ලෝකයේ අවම වේතන ලබන රටවල් 225ක් අතුරින් ලංකාව මේ වන විට 130වන ස්ථානයේයි තිබෙන්නේ. බංග්ලාදේශයත් අපට වඩා ඉදිරියෙන් සිටින්නේ. මේවා දෙස බලන කොට අපි හිතන්න ඕනෑ, මේ වෙනස ඇති කරන්න පුළුවන් වන්නේ කොයි ආකාරයෙන්ද කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ලාල් කාන්ත ඇමතිතුමා කළ ප්‍රකාශයක් 2026.08.03 දින "The Leader" පුවත් පතේ පළ වී තිබුණා. මම මේ අවස්ථාවේදී එය quote කරනවා.

> "Minister Lal Kantha vows to expose state sector failures, whatever the cost"

I appreciate it and salute his courageousness, but do not just let it be. He has to walk the talk. ලාල් කාන්ත ඇමතිතුමා ඔබතුමන්ලා වෙනුවෙන් මෙහෙම කියනවා වෙන්න පුළුවන්. ඒක හරි. මම එය අනුමත කරනවා. ඒ නිසායි සාමාන්‍යයෙන් මම එතුමා කියන දේ සැලකිල්ලට ගන්නේ. නමුත් මේක පත්‍රිකාවකට සීමා කරලා කටයුතු කරලා වැඩක් නැහැ. රජයේ නිලධාරින්ට ප්‍රශ්න තිබෙනවා නම්, කොහේද ප්‍රශ්න තිබෙන්නේ කියා සොයා බලන්න. System change එකකට ආවා තමයි. මම කියන්නේ දැන් ඒ system එක maintain කර ගෙන යන්න කියලායි. ඒක නිවැරැදි කරන්නේ කොහොමද? ලාල් කාන්ත ඇමතිතුමා කර තිබෙන්නේ නිවැරැදි ප්‍රකාශයක්. එහෙම නම් එය නිවැරැදි කරන්න කටයුතු කරන්නේ කොයි ආකාරයෙන්ද කියන එක ගැන මේ අවස්ථාවේදී බලන්න අවශ්‍යයි.

අපේ නිහාල් අබේසිංහ මැතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. චතුරංග අබේසිංහ මැතිතුමා ප්‍රකාශයක් කර තිබෙනවා, පෞද්ගලික අංශය රාජ්‍ය අංශයට වඩා දූෂිතයි කියලා. ඒ වාගේ ප්‍රකාශයක් කරනවා නම් මොකක්ද තත්ත්වය? එහෙම නම් මේ මුළු රටේම ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නම්, රජයේ සේවයේ

[ගරු රවී කරුණානායක මහතා]

අය, දේශපාලනඥයන්, පෞද්ගලික අංශයේ අය කියන ඔක්කෝම ගැන ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නම්, කවුද එහෙම නැත්තේ කියන ප්‍රශ්නය තිබෙනවා. එතුමා කියන දේ එහෙම නොවෙයි කියා මා කියන්නේ නැහැ. මොකද, එතුමා සාමාන්‍යයෙන් සොයා බලා තමයි කථා කරන්නේ. නමුත් මේ වාගේ මුළු රටටම ප්‍රශ්න වුණාම පිටින් ඇවිල්ලා මේ රටේ ආයෝජනය කරන්නේ කවුද? මම මීට පෙරත් කිව්වා වාගේ, 2030දී අපනයනවලින් බිලියන 36ක් උපයා ගන්න අවශ්‍ය නම් කළ යුත්තේ කුමක්ද? අද උපයන්නේ බිලියන 18යි. මේ සම්බන්ධව හොයා ගෙන යන කොට පෙනී යනවා, එක අවුරුද්දකදී එහි සියයට 12ක වර්ධන වේගයක් අවශ්‍යයි කියන කාරණය.

මම මුල ඉඳලාම කියන විධියට මේ රටේ හැම ප්‍රශ්නයකටම මූලාශ්‍රය වෙලා තිබෙන්නේ ආර්ථික ප්‍රශ්නයයි. ආර්ථික ප්‍රශ්නය නිසා තමයි මේ රටේ අසමගිතාවක් තිබෙන්නේත්. ඩී.එස්. සේනානායක මහත්මයා එදා සුද්දන්ගෙන් නිදහස ලබා ගන්න කොට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන ඔක්කෝම එක හා සමානව ශ්‍රී ලාංකිකයන් කියලා හිතාගෙන හිටියා. ඊට පසුව මේ ආර්ථිකයේ තිබෙන විෂමතාව නිසා තමයි ජාතිවාදී ප්‍රශ්න තිබෙනවා, ආගම්වාදී ප්‍රශ්න තිබෙනවා කියලා පළාත් විධියට කෑලි කඩලා මේ දක්වා ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා ඒක නිවැරදි කිරීම අත්‍යවශ්‍යයි. අපි කොහොමද ඒක කරන්නේ කියා කල්පනා කරලා සාමූහිකව වැඩ කරන එක තමයි අත්‍යවශ්‍ය වන්නේ.

ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ADB එක කියා තිබෙනවා, "Sri Lanka faces structural reform reckoning that is required" යනුවෙන්. ව්‍යුහාත්මක වෙනසක් - structural reform - ඇති කරන්න අවශ්‍යයි. මේක තමයි අත්‍යවශ්‍ය වන්නේ. මේ තුළින් තමයි අපට ඉදිරියට ගමන් කරන්න තිබෙන්නේ.

මේ අවස්ථාවේදී අපට කරන්න තිබෙන මූලික දේ මා කියන්නම්. අපි කොහොමද මේ පඩි නඩිවල ගැටලුව විසඳන්නේ? අපි අද කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාපති සහ අනෙකුත් සාමාජිකයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමික සහ දීමනා පිළිබඳ තීරණය විවාදයට ගන්නවා. මීට පෙර විගණකාධිපතිගේ වැටුප පිළිබඳ යෝජනාවක් ගෙනාවා. මේ රටේ රාජ්‍ය සේවයේ වැඩ කරන ලක්ෂ 15ක ජනතාවගේ වැටුප් ගෙවීමට දළ වශයෙන් ට්‍රිලියන 1.5ක් පමණ වැය කරනවා. ඒ තුළ එක පුද්ගලයෙකුට රුපියල් 80,000ක වාගේ වැටුපක් ලැබෙන්නේ. ඒකෙන් ජීවත් වෙන්න පුළුවන්ද? ඒක කිව්වාම සමස්තයක් වශයෙන් නේ ගන්නේ. එහෙම නම්, මෙය නිවැරදි කිරීමේ වැඩ පිළිවෙළ අප අද පටන් ගත්තේ නැත්නම් මේ රට ඉතාම අමාරු තත්ත්වයකට ගමන් කරනවා. 2015දී මම මුදල් ඇමති වශයෙන් සිටි කාලයේදීත් රජයේ සේවකයන්ගේ වැටුප සියයට 30කින් වැඩි කළේ ඔන්න ඔය නිසායි. අපි එදා මේ කරුණු දැනගෙන රට ඉදිරියට ගෙන ගියා.

තවත් ප්‍රශ්නයක් ඇති වෙනවා, pension එක සම්බන්ධව. Pension ගෙවීමට යන මුදල තවත් අවුරුදු 6ක්, 8ක් විතර යන කොට බිලියන 550ක් පමණ වෙනවා. මේක සාමාන්‍යයෙන් වැයෙන් තමයි ගන්නේ. එහෙම නැතුව මේක වෙනම අරමුදලක දමා තියා ගන්න එකක් නොවෙයි. ඉතින් pension ගෙවීමේත් ගැටලු ඇති වුණොත්, ඒක ඉතාම භයානකකාරී දෙයක් වේවි.

Hon. Presiding Member, while I mention that, I also want to reflect on another matter and another problem which is very apparent and which would be a major catalyst to go forward or if you do not go forward, would retard it. I was at the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education chaired by the Hon. Prime Minister, yesterday. With regard to education, there was a critical factor that was referred to. While being in the Prime Minister's Office yesterday, we had a meeting with the officials of the Population Control office of the United Nations. The Hon. Member (Dr.) Nihal Abeysinghe was there. At that meeting, we were discussing something. The population growth rate of 1.3 per cent ten years ago has now reduced to 0.5 per cent! That is the growth rate we are reflecting while our peer countries are having almost a 1.5 per cent growth rate . Fertility rate is 1.3 children per woman. Eighteen per cent of the population is above the age of 60. Now, that is a significant factor we have to take note of. That means, we have the earlier population of 22.3 million coming down to 21.8 million and of that, 18 per cent is above the age of 60. They need care and that does not contribute to the well-being of the country. But, they are people who have helped this country. So, we have got to look after them.

Then, the other matter that was looked into was with regard to the school children. That is what I referred to when I met the Hon. Prime Minister at the Ministerial Consultative Committee. Almost 45 per cent of the children who go to school, after 16 years, do not continue their school education. Even though there is a 13-year mandatory school education period, most of the children, specially male children, drop out of school. The intake of children to the first grade was 375,000 in 2015 and it has reduced to 224,000 in the year 2025, a drastic and almost a one lakh reduction. They are the future of our country; they are our future workforce. So, if our workforce reduces and if we do not have labour to go forward with the investments that come in, it would be the biggest problem we would face.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තු දෙකක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ කාලය අපේ පැත්තෙන් ගන්න.

So, when the National Chamber of Exporters projected an export earning of US Dollars 36 billion by 2030, I immediately said that it would be a pipe dream because a growth rate of 12 per cent cannot be achieved without making the necessary input. I can see some Cabinet Ministers present here. Please ensure that these matters are taken up and that you put flesh on the bones. The figures are nice, but in order to have a realistic approach, you would have to ensure that this situation is corrected.

The worst case is, 61.3 per cent of the population is in the age group of 15-59. So, these are the areas that will have to be looked into as a Government, as to where we need to have corrective action. India, which is going to become the third biggest economy by next year, is having

a young population and they are able to contribute to their economy. We, Sri Lanka, being next to India, have a best opportunity to easily carve out two to three per cent of their market and have a vibrant growth rate of about 10 to 12 per cent, if we embrace India. There is no point in engaging with them just for the sake of satisfaction, but we must also achieve economic growth through that same process. I only reflected on that particular matter because it is necessary.

Now, we are talking about the remunerations of the members of the National Commission on Women.

I made a general comparison with the country's situation and referred to that particular matter because I saw the yawning gap between the ability and the inability to deliver, with the necessary capacity not being there to deliver that projection.

Madam, I know that time is a factor and I thank you very much for the time given. And, I hope these matters are taken into consideration. Do not let Parliament be just another talk shop. Let this be the place where vibrant policy decisions are taken for the future and that is the way to take the country forward.

Thank you.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய பேச்சைத் தொடங்குங்கள்!

[பி.ப. 4.53]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழுவின் தவிசாளர் மற்றும் உறுப்பினர்களுக்கான சம்பளத்தை திரட்டுநிதியத்திலிருந்து வழங்குவதற்கு அனுமதி கோருகின்ற பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு முக்கியமான தொரு விடயத்தைப் பதிவுசெய்ய விரும்புகின்றேன்.

கிளிநொச்சி மாவட்டத்தின் பூநகரி பிரதேச செயலாளர் பிரிவில் கிராஞ்சி பகுதியிலுள்ள சிவபுரம் என்ற கிராமத்தில் வசிக்கின்ற ஓய்வுபெற்ற ஆசிரியர் சங்கரப்பிள்ளை ஆனந்த நடராஜன் அவர்கள் 39 வருட காலமாகத் தனது காணியில் தென்னம்பிள்ளைகளை நட்டு பயிர்செய்து வருகின்றார். அவருடைய காணிக்குள் 2026.09.07ஆம் திகதி திங்கட்கிழமை மாலை 5.30 - 6.00 மணியளவில் வனவளத் திணைக்களத்தைச் சேர்ந்த சிலர் கும்பலாகச் சென்று, அவரைத் தாக்கி துன்புறுத்தி, சித்திரவதை செய்துள்ளார்கள். இந்த நாட்டில் சட்டம் இருக்கின்றது; நீதிமன்றங்கள் இருக்கின்றன; பொலிஸ் நிலையங்கள் இருக்கின்றன. அவர்கள் அதனைப் பொலிஸுக்கு ஊடாக அல்லது நீதிமன்றத்துக்கு ஊடாக அணுகியிருக்கலாம். இந்த நாட்டில் பொலிஸ், நீதிமன்றங்கள் இருக்கையில், இவ்வாறான அடாவடித்தனங்களைப் புரிவதற்கான சட்ட அங்கீகாரம் வனவளத் திணைக்களத்துக்கு வழங்கப்பட்டு இருக்கின்றதா என்ற சந்தேகம் எங்களுக்குத் தோன்றியிருக்கின்றது. வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டு இருந்த சங்கரப்பிள்ளை ஆனந்த நடராஜன் அவர்கள் இப்போதுதான் வீடு திரும்பியிருக்கிறார் என்பதை நான் இந்தச் சபையில் பதிவு செய்கின்றேன்.

மிக முக்கியமாக, மன்னார் மாவட்டத்துக்கும் வவுனியா மாவட்டத்துக்கும் இடைப்பட்ட செட்டிகுளம் பிரதேச செயலாளர் பிரிவில் அநுராதபுரம் மாவட்டத்திலிருந்து வரப்போகின்ற 400 சிங்கள மக்களுக்குக் காணிகளை வழங்குவதற்காக கீழ்மல்வத்து ஓயா என்ற திட்டத்தை உருவாக்கி, 1,500 ஏக்கருக்கும் மேற்பட்ட காணிகளை வழங்குவதற்கு அரசாங்கம் முயற்சி செய்கின்றது. இந்த முயற்சிக்காக வனவளத் திணைக்களம் 1,500 ஏக்கர் அளவுடைய காட்டை விடுவித்திருக்கின்றது. ஆனால், சில இடங்களில் வனவளத் திணைக்களம் தன்னுடைய காணியென்று 5, 10 ஏக்கரை விடுவிக்கத் தயங்குகின்றது. அநுராதபுரத்தில் இருக்கின்ற சிங்கள மக்களை தமிழர் பிரதேசமான செட்டிகுளம் பகுதியில் குடியேற்றுவதற்கும் அவர்களுக்குக் காணி கொடுப்பதற்கும் -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කිරීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய உரையைத் தொடருங்கள்!

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அமர்வு நேரத்தை நீடித்திருப்பதால் எனக்கு இன்னும் 2 நிமிடங்களை அதிகமாகத் தாருங்கள்!

இந்த அடிப்படையில்தான் அங்கு மிகப் பெரிய அநியாயங்கள் நடந்துகொண்டு இருக்கின்றன. வனவளத் திணைக்களம் அங்கே ஒரு திட்டத்தை உருவாக்குகின்றது. அதேநேரம், இங்கே ஒருவரைப் பிடித்து அடிக்கிறது; சித்திரவதை செய்கிறது. இவ்வாறு மிக மோசமான சம்பவங்கள் இந்த நாட்டில் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. அதுவும் உங்களுடைய NPP அரசாங்க காலத்தில் நடக்கிறது. NPPஇன் உறுப்பினர் ஒருவரும் ஆனந்த நடராஜனைத் தாக்குவதற்குச் சென்றிருக்கிறார். "அவருக்கு நல்ல போடு போட்டிருக்கிறேன்; சென்று பாருங்கள்!" என்று சிலருக்குத் தொலைபேசியில் சொல்லியிருக்கிறார். அந்தளவுக்கு சில NPP உறுப்பினர்கள் காட்டுச் சட்டத்தைக் கைகளில் எடுக்கிறார்கள். இதனைக் கவனத்தில் எடுக்குமாறு நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

பெண்களின் வாழ்வாதாரம், அவர்களுக்குரிய வாழ்வியல் அணுகுமுறைகள் என்பன முக்கியத்துவம் வாய்ந்தவை. இங்கு பேசிய கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்கள்கூட, மஹிந்த ராஜபக்ஷவின் அரசாங்கத்தில் பிரதி அமைச்சராக இருந்தபொழுது, வடக்கு, கிழக்கில் 90,000 யுத்த விதவைகள் இருப்பதாக இதே சபையில் கூறியிருந்தார். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கு, கிழக்கில் இருக்கின்ற யுத்த விதவைகள் விடயம் என்பது சாதாரணமான ஒரு விடயமல்ல. இன்று தமிழ் மக்களுடைய குழந்தை பிறப்பு வீதம் மிகப் பெரியளவில் வீழ்ச்சியடைந்து இருக்கின்றது. கடந்த ஐந்தாண்டுகளில் முன்பள்ளிக்குச் சென்ற குழந்தைகளின் வரவை வைத்து நீங்கள் மதிப்பீடு செய்தாலே தெரியும், தமிழ் மக்களுடைய இனப்பெருக்கம் எவ்வளவு தூரம் வீழ்ச்சிகண்டு இருக்கின்றது என்று. இந்த யுத்த விதவைகள் என்பது எங்களுடைய மண்ணில் எவ்வளவு பெரிய பாதிப்பு என்பதையும் அது சொல்லும்.

இந்த நாட்டில் இவ்வளவு காலமும் இல்லாத புதியதோர் ஆரோக்கியமான விடயம்தான் பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழு நியமிக்கப்பட்டு இருப்பது. இது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். இந்த ஆணைக்குழுவின் தவிசாளர் மற்றும் உறுப்பினர்களுக்கு சம்பளம், allowance - போக்குவரத்துக் கொடுப்பனவு, எரிபொருள் கொடுப்பனவு - வழங்கப்படுவது நல்ல விடயம்! ஆனால், இவர்கள் என்ன விடயத்தைக் கையாளப் போகின்றார்கள்? எவ்வாறு நடந்துகொள்ளப் போகிறார்கள்? யுத்த விதவைகள் மற்றும் பாதிக்கப்பட்டவர் களுக்கான செயற்றிட்டங்களில் இவர்களுடைய பங்கு எவ்வாறு இருக்கப் போகின்றது? தன்னுடைய கணவனை கண்கண்ட சாட்சியாக ஒப்படைத்த பெண்கள் இருக்கிறார்கள். கௌரவ அமைச்சர் சாவித்திரி அம்மையார் அவர்கள் தற்பொழுது சபையில் இருக்கிறார். நான் சென்ற கிழமையும் அவரோடு பேசியிருந்தேன். அவர் சென்ற வாரம் முல்லைத்தீவு, கிளிநொச்சி மாவட்டங்களுக்கு வந்திருந்தார். நான் நினைக்கிறேன், அவர் இது பற்றி அறிந்தும் இருப்பார் என்று.

பெண் தலைமைத்துவக் குடும்பங்களின் தலைவிகளாக பல பெண்கள் இருக்கிறார்கள். அவர்கள் பிள்ளைகளைப் படிக்கவைத்து இருக்கிறார்கள்; வளர்த்திருக்கிறார்கள். இன்றும் நீங்கள் Grade Five Scholarship Exam resultsஇல் பார்க்கலாம். அப்பா இல்லாமல் அம்மா வளர்த்த பிள்ளை இப்படி, இப்படி pass பண்ணி இருக்கிறார் என்பதை. அதேபோல், O/Level results வந்தாலும் அப்படியான செய்திகளைப் பார்க்கலாம்; க.பொ.த. உயர்தரப் பரீட்சைப் பெறுபேறுகள் வரும்போதும் பார்க்கலாம். 2009ஆம் ஆண்டு யுத்தம் நிறைவுக்கு வரும்போது பல நூற்றுக்கணக்கான இளைஞர்கள் கொல்லப்பட்டார்கள். பலர் இறந்த நிலையில், குடும்பத்தின் தலைமைத்துவத்தை பெண்கள் ஏற்று வாழ்க்கையைக் கொண்டுசென்றார்கள். எனினும், இன்றுவரை அவர்களுக்கான வாழ்வாதார உதவி சரியான முறையில் வழங்கப்படவில்லை என்பதைத்தான் நாங்கள் இந்த இடத்தில் மீண்டும் மீண்டும் வலியுறுத்து கிறோம். எனவே, மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சராக இருக்கின்ற நீங்கள், உங்களுடைய காலத்திலாவது ஏதாவதொரு மாற்றத்தைக் கொண்டுவர வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ சாவித்திரி அம்மையார் அவர்களே, நீங்கள் இந்தப் பெண்களுடைய விவகாரம் தொடர்பில் அதிகமாகக் கவனம் செலுத்த வேண்டியது வடக்கு, கிழக்கில். அங்கு இருக்கின்ற பாதிக்கப்பட்டவர்களுக்கென ஒரு செயற்றிட்டத்தை முன்னெடுக்க வேண்டும். இப்பொழுதுதான் பாராளுமன்றத் துக்கு முதன்முதலாக பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழு சார்ந்த விடயம் வருகிறது. இந்த ஆணைக்குழுவில் தவிசாளருடன் மூன்று முழுநேர உறுப்பினர்கள் இருப்பார்கள். இந்தத் தேசிய ஆணைக்குழு ஊடாகச் செய்யப்போகின்ற பணிகள் என்ன? குங்குமப்பொட்டு என்பது தமிழர்களுடைய கலாசாரத்தின் ஓர் அடையாளம் என்பது உங்களுக்குத் தெரியும். எத்தனையோ தமிழ் பெண்கள் இப்போதும் தன்னுடைய கணவன் வருவான் என்ற ஏக்கத்தோடும் கனவோடும் தன்னுடைய குங்குமப்பொட்டை அழிக்காமல் இருக்கிறார்கள். அதேபோல், எத்தனையோ தமிழ் சகோதரிகள் தன்னுடைய கணவன் வருவான் என்று தாலியைக் கழற்றாமல் இருக்கிறார்கள். அதேபோல், தங்களுடைய அப்பா, அம்மா வருவார் என்று பிள்ளைகள் இருக்கிறார்கள். இந்த நிலைமை இலங்கையின் தென்பகுதியைவிட வடக்கு, கிழக்குப் பகுதியிலே மிக அதிகமாகும். இந்த ஆணைக்குழுவின் ஊடாகச் செய்யப் போகின்ற பணிகள் முக்கியமானவை. சாதாரணமாக இலங்கையில் இருக்கின்ற பல ஆணைக்குழுக்களில் இதுவும் ஒன்றாக இருக்குமாகவிருந்தால், இது இலங்கையிலுள்ள நடைமுறையில் எவ்வாறு வெற்றி அளிக்கப் போகின்றது என்பதை நாங்கள் பொறுத்திருந்துதான் பார்க்க வேண்டும். இந்த ஆணைக்குழுவின் ஊடாக எங்களுடைய பெண்களுக்கான ஒரு மாற்றம் கிடைக்க வேண்டும்; நீதி கிடைக்க வேண்டும்

2017ஆம் ஆண்டு மாசி மாதம் 20ஆம் திகதி கிளிநொச்சியில் வலிந்து காணாமலாக்கப்பட்டவர்களின் உறவினர்கள் தொடர் போராட்டம் ஒன்றை ஆரம்பித்தார்கள். எதிர்வரும் மாசி மாதத்துடன் 10 ஆண்டுகள் நிறைவடையப் போகின்றது. இந்தத் தொடர்போராட்டத்தின்போது 420க்கும் மேற்பட்ட அம்மாரும் அப்பாமாரும் இறந்திருக்கிறார்கள்.

எனினும், அவர்களுக்கு இன்னும் நீதி கிடைக்கவில்லை. நீதி கிடைக்காத நிலையில் குறித்த தாய்மார் இறந்து போகிறார்கள்; தந்தைமார் இறந்து போகிறார்கள். வலிந்து காணாமலாக்கப் பட்டவர்களின் உறவினர்கள் தொடர்ந்தும் போராடிக்கொண்டு இருக்கிறார்கள். இவர்களுக்கான நீதியை எவ்வாறு உங்களால் வழங்க முடியும்?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் முடிவடைகின்றது.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒரு நிமிடம் தாருங்கள்!

நேற்று முன்தினம் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் ஆணையாளரின் பணியகத்தால் வெளியிடப்பட்ட அறிக்கையில், நல்லிணக்கம், பொறுப்புக்கூறல் போன்ற விடயங்களில் இலங்கை இரட்டிப்பாக வரவேண்டிய தேவையிருக்கிறது எனச் சொல்லப்பட்டு இருக்கிறது. அதாவது, நல்லிணக்கம், பொறுப்புக்கூறலில் இலங்கை இன்னும் சரியான இடத்துக்குப் போகவில்லை. அதனால் இன்னும் இரட்டிப்பாக வரவேண்டிய சூழலுக்குள் இலங்கை தள்ளப்பட்டிருக்கிறது. இன்றும்கூட Amnesty International, வெளிநாட்டுத் தூதரகங்கள் கேட்கின்றன, "பாதிக்கப்பட்ட இந்த மக்களுக்கான நீதியை நீங்கள் எவ்வாறு வழங்கப் போகின்றீர்கள்?" என்று.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இதனை கவனத்திற்கொள்ளுங்கள்! பாதிக்கப்பட்டவர்கள் நாங்கள்! நீதி கிடைக்கவேண்டிய பெண்களுக்கு இன்னும் நீதி கிடைக்கவில்லை. எனவே, உண்மையைக் கண்டறிந்து, நீதிக்காகப் போராடுகின்றவர்களுக்கு நீதியை நிலைநாட்டுவதற்கு இந்த ஆணைக்குழு நேர்மையாகத் தன்னுடைய பணிகளை ஆற்ற வேண்டும். இந்த ஆணைக்குழுவானது, 7 பேரைக் கொண்டதாக இருக்குமென நான் நினைக்கின்றேன். தவிசாளர் உட்பட குறைந்தபட்சம் மூன்று பேரை முழுநேர உறுப்பினர்களாகக் கொண்ட இந்த ஆணைக்குழுவானது, இனங்களை ஒற்றுமைப்படுத்தக்கூடிய வகையிலும் உண்மையைக் கண்டறியக்கூடிய வகையிலும் தன்னுடைய செயற்பாட்டை நேர்மையாகச் செய்ய வேண்டுமென மீண்டும் வலியுறுத்தி நிறைவுசெய்கின்றேன்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.03]

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතට අදාළව පත් කරන ලද කොමිෂන් සභාවේ නියෝජිතයන්ට පාරිශ්‍රමික සහ දීමනා ලබා දීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ලබා ගන්න තමයි අපි අද මේ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එම කොමිෂන් සභාව සම්බන්ධයෙන් ටිකක් විස්තර කළොත් හොඳයි කියලා මම හිතුවා. මේ පිළිබඳව විවිධ අදහස් මතු වුණා. මීට පෙර කථා කළ මන්ත්‍රීතුමාගෙනුත් මතු වුණු කාරණා පිළිබඳව මම කියන්නම්.

අපි දන්නවා, කාන්තාවන් සම්බන්ධයෙන්, ව්‍යවසායකත්වය පැත්තෙන් උතුරේත් ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙන බව. ඒත් එක්කම, වැන්දඹුභාවයට පත් වුණු කාන්තාවන් සම්බන්ධයෙනුත් ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම ඉඩම් සම්බන්ධ ගැටලු තිබෙනවා. ඒ සියලු ගැටලු සම්බන්ධයෙන් යම් ප්‍රවේශයක් ගනිමින් සිටින මොහොතක තමයි අපි මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙන්නේ.

ඊළඟට, මේ සාකච්ඡාව තුළ මතු වුණු කාරණයක් තමයි, වැටුප් සම්බන්ධ ප්‍රශ්නය. වැටුප් සීමා ප්‍රමාණවත්ද කියන එක සම්බන්ධයෙනුත් යම් සාකච්ඡාවක් ගොඩනඟන්න උත්සාහ කළා. හැබැයි අපි දන්නවා, අප භාර ගත්තේ ආර්ථික වශයෙන් විශාල ලෙස බිඳ වැටුණු රටක් බව. එවැනි රටක් තමයි භාරගෙන ඉස්සරහට අරගෙන යන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ. මේ රට ආර්ථික වශයෙන් බංකොලොත්භාවයට පත් කරන්න උදවු වුණු පිරිසක් දැන් ඇවිල්ලා අපෙන් අහනවා, වැටුප් සඳහා වැඩි කළ ප්‍රමාණය මදි කියලා. එක පැත්තකින් ඒක හාස්‍යයට කාරණයක්. මහ බැංකු මංකොල්ලයත් සිද්ධ වෙලා, ආර්ථික වශයෙන් බිඳ වට්ටලා තිබුණු රටක අපි බලය අත්පත් කරගෙන ඉතා කෙටි කාලයක් තමයි වෙන්නේ. අපි වැටුප් වැඩි කිරීම් කිහිප වරක්ම කරලා තිබෙනවා. නමුත්, එවැනි මොහොතක වුණත් වැටුප් තවත් වැඩි වෙන්න ඕනෑ කියන එක අප දන්නවා. රාජ්‍ය සේවකයන්ගේ, පෞද්ගලික අංශයේ - ඒ සියලුදෙනාගේම - වැටුප් තව වැඩි කරන්නට අවශ්‍යයි. හැබැයි, අපි තේරුම් ගන්න ඕනෑ කාරණය තමයි, අපි පටන් ගත්තේ කොතැනින්ද කියන එක. ඒ කාරණයත් පොඩ්ඩක් මතක් කරමින්, අමාත්‍යාංශයක් විධියට අපි සුවිශේෂී ජයග්‍රහණයක් අත්පත් කරගෙන තිබෙනවා කියන කාරණයත් මතක් කළ යුතුයි. ඒ සුවිශේෂී ජයග්‍රහණය තමයි, කාන්තාවන් සම්බන්ධයෙන් වන මෙම කොමිසම පත්කර ගැනීම සාර්ථකව අවසන් කරන්නට අපට අවස්ථාව ලැබීම. මේක ලොකු ඉතිහාසයක් තිබෙන කාරණයක්. පසුගිය පාර්ලිමේන්තුව තුළත් - 2021දී පමණ - යෝජනා වෙමින් මෙවැනි කොමිසමක් අපේ රටට අවශ්‍යයි කියන සාකච්ඡාව ගොඩනැඟිලා තිබුණා.

ඇත්තටම අපට මේ අවස්ථාවේදී අමතක කරන්න බැහැ, විශේෂයෙන්ම මීට ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවේ Women Parliamentarians' Caucus එකේ සභාපති වශයෙන් කටයුතු කළ ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය සහ අපේ ගරු අගමැතිතුමිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් විධියට ඒ මොහොතේදී මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා දක්වපු දායකත්වය. ඒක තමයි මෙහි මූලාරම්භය. ඒ අනුව තමයි 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත වෙන්නේ. අපි පාර්ලිමේන්තුවට එනකොටත් ඒ පනත තිබුණා. හැබැයි, ඒ පනතේ බලතල ක්‍රියාත්මක කරන්න නම් කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම ගොඩනැඟිය යුතුව තිබුණා. නමුත් ඒ කොමිසම ගොඩනැඟිලා තිබුණේ නැහැ. හැබැයි, ගරු ජනාධිපතිතුමාගේත් මැදිහත්වීම සහිතව ඉතා කෙටි කාලයක් තුළ අපට හැකියාව ලැබුණා, සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම පත් කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ සහිතව පස්දෙනෙකු සහ

[ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා]

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය - Women Parliamentarians' Caucus එක - හරහා දෙදෙනෙකු වශයෙන් හත්දෙනෙකුගෙන් සමන්විතව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම අපි ගොඩනඟලා තිබෙනවා. මේක අලුතින්ම ගොඩනැඟෙන කොමිසමක්. මේ කොමිසම වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉදිරියට කරගෙන යන්න තිබෙනවා. එක පැත්තකින්, ඔවුන්ගේ වැටුප් සහ දීමනා සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න තිබෙනවා. අනෙක් පැත්තෙන්, අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කරගන්න තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය භෞතික සම්පත් ටික ලබා දෙන්න තිබෙනවා. කාර්යාලය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් ටික සපයා දෙන්න තිබෙනවා. ඒ සියල්ලම මේ වනකොට අපි සිදු කරමින් පවතිනවා.

මෙතැනදී අපට ආපු තවත් ගැටලුවක් තමයි, මේ කොමිසම කොතැනද පවත්වන්නේ කියන එක. කොමිසමේ වැඩ කටයුතු ස්වාධීනව කරගෙන යන්න පරිශ්‍රයක් අවශ්‍ය වුණා. අපි මේ ඇමතිවරුන් වෙනුවෙන් වෙන් කරලා තිබුණු, නිල නිවාස විධියට ඉතිහාසයේ පාවිච්චි කරපු විජේරාම පාරේ තිබෙන නිල නිවාසයක් මේ කොමිසම පවත්වාගෙන යන පරිශ්‍රය විධියට තෝරාගෙන, අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු මේ වනකොට සිදු කරමින් යනවා. ඒවා ජනතාවගේ දේපළ, ජනතාවට අයිති දේවල්. ඒ නිසා අපේ වරප්‍රසාද අපි ඉවත් කරමින්, මේ කොමිසම පවත්වාගෙන යාම සඳහා ඉතිහාසයේ ඇමතිවරුන් වෙනුවෙන් පාවිච්චි කළ නිල නිවසක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් යනවා. ඒ අනුව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම විධිමත්ව පවත්වාගෙන යන්නට අවශ්‍ය සියලු කාරණා සම්බන්ධයෙන් අපි අවශ්‍ය මැදිහත්වීම කරමින් යනවා.

කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම කියන්නේ විශාල බලතල ප්‍රමාණයක් තිබෙන කොමිසමක්. ප්‍රධානම කාරණය තමයි, අපේ රටේ කාන්තාවන් සවිබල ගැන්වීම වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් ගොඩනඟන්නට අවශ්‍ය mandate එක මේ පනත තුළින් ඔවුන්ට ලැබී තිබීම. ඒ සඳහා ඇත්තටම ප්‍රාමාණික හැකියාවන් තිබෙන, විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පිරිසක් පත් වෙලා ඉන්නවා. ඔවුන්ට භාරදූර කාර්යභාරයක් පැවරී තිබෙනවා, මේ පනත ප්‍රකාරව ලැබෙන බලතල අනුව අපේ රටේ කාන්තාවන් සවිබල ගැන්වීම වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් ගොඩනඟන්න සහ විවිධ කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම කරන්න.

ආණ්ඩුවක් විධියට, අමාත්‍යාංශ විධියට අපි පොදුවේ මේ මොහොතේදී කරන්නේ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන චිත්‍රය කොටස් වශයෙන් භාර අරගෙන පින්තාරු කරන එකයි. අමාත්‍යාංශ විවිධ වෙන්න පුළුවන්. විවිධ කාර්යයන් සඳහා මැදිහත් වෙනවා වෙන්න පුළුවන්. හැබැයි, අපට තිබෙන එකම ඉලක්කය තමයි, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් නිර්මාණය කිරීම. ඒ නිසා අපේ අමාත්‍යාංශය විධියට විතරක් නොවෙයි, සියලුම අමාත්‍යාංශ මැදිහත් වෙලා අපේ රටේ කාන්තාව සවිබලගන්වන්නට මේ වනවිට කර තිබෙන කාර්යයන් පිළිබඳව, ආණ්ඩුවක් විධියට මේ කෙටි කාලය තුළ අපි කොතරම් දේවල් කරලා තිබෙනවාද කියන එක පිළිබඳව මම පොඩි අදහසක් කියන්න කැමැතියි.

පළමුවෙන්ම, අපේ රටේ සියලු පුරවැසියන්ට වාතාශ්‍රය සහිත හොඳ නිවසක් ලැබෙන්න ඕනෑය කියලා අපි හිතනවා. නිවසක් අහිමි නිසා, අනාරක්ෂිත නිවසක ජීවත් වීම නිසා වැඩිපුරම පීඩාවට පත් වන්නේ කාන්තාවන්. මවක් විධියට, දියණියක් විධියට සහ බිරිඳක් විධියට වැඩිපුරම පීඩාවට පත් වන්නේ කාන්තාව. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය "තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක්" ව්‍යාපෘතිය හරහා 2025දී නිවාස 3,000ක් - රුපියල් ලක්ෂ 10 ගණනේ - සහ 2026දී නිවාස 9,700ක් වශයෙන් නිවාස විශාල සංඛ්‍යාවක් හදන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම උතුර, නැඟෙනහිර පළාත් සඳහා නිවාස 2,500ක් වාගේ විශාල ප්‍රමාණයක් හදන්නත් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා, ඒ නිවාස ගොඩනඟමින් යනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන් ගත්තාම, මලෙයගම් ජනතාව වෙනුවෙනුත් මේ වනවිට නිවාස 2,500ක් හදලා ඉවරයි.

විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, එක නිවසකට රුපියල් ලක්ෂ 20ක් බැගින් නිවාස 1,000ක් ගොඩනඟන්නට අපේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට රුපියල් මිලියන 2,000ක ප්‍රතිපාදන වෙන් වුණු බව. කාටද, අපි නිවාස හදන්නේ? අපි අමතක කළේ නැහැ, කාත් කවුරුවත් නැතුව අසරණභාවයට පත් වෙලා, අනාථභාවයට පත් වෙලා, ළමා නිවාසවල ඉඳලා සමාජගත වුණු තරුණ තරුණියන්; අනාරක්ෂිත නිවාසවල ඉන්න දුවලා පුතාලා. එවැනි ස්ථානවල ඉන්න, නිවාස අහිමි පිරිසට නිවාස 1,000ක් ලබා දෙන්නත් අවශ්‍ය ප්‍රතිපාදන අපට ලැබී තිබෙනවා. මේ වනවිට අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු කරමින් සිටිනවා. "දිවියට සවියක්" නිවාස ව්‍යාපෘතිය, "යතිවර මාපිය නිවහන" ව්‍යාපෘතිය වාගේම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය කියන ආයතනත් අවශ්‍ය නිවාස ගොඩ නඟමින් යනවා.

ඊළඟට, අධ්‍යාපනය සම්බන්ධව අපේ මැදිහත්වීම ගනිමු. පවුලක් මත ලොකු බරක් පැටවෙනවා, අධ්‍යාපනයට වියදම් කිරීම නිසා. ගෙදර මුදල් ටික කළමනාකරණය කරන්නේ කාන්තාව; මව, බිරිඳ. ඇය තමයි මූල්‍ය කළමනාකරණය කරන්නේ. ඇයට තමයි පීඩාව දැනෙන්නේ. ඒ නිසා අපි මහපොළ ශිෂ්‍යත්ව දීමනාව වැඩි කිරීමටත්, අපේ දිළිඳු පවුල්වල දරුවන්ට ලිපි ද්‍රව්‍ය හා පාසල් උපකරණ සඳහා රුපියල් 6,000ක දීමනාවක් ලබා දීමටත්, පාවහන් මිලදී ගැනීම සඳහා වවුචර්පත් ලබා දීමටත් මුදල් වෙන් කර තිබෙනවා. මේ ආකාරයෙන්, අපි අධ්‍යාපනය සඳහා විශාල මැදිහත්වීමක් කර තිබෙනවා, පවුල මත පැටවෙන බර අඩු කරන්න. ඒ තුළින් කාන්තාව මත පැටවී තිබෙන බර අඩු වෙනවා.

ප්‍රජා සවිබල ගැන්වීම් පිළිබඳ අමාත්‍යාංශයෙන් කරගෙන යන "ප්‍රජා ශක්ති" වැඩසටහන ඇතුළේ ප්‍රජා සංවර්ධන සභා තුළ අනිවාර්යයෙන්ම කාන්තාවන් 5දෙනෙකු නියෝජනය වෙන්න ඕනෑ කියලා අපි ඒ නියෝජිත අවස්ථාව කාන්තාවන්ට ලබා දී තිබෙනවා. ප්‍රජා සවිබලගැන්වීම තුළිනුත් අපි බලාපොරොත්තු වෙන්නේ, දිළිඳු පවුල්වල ආර්ථික මට්ටම ගොඩ නඟා ගැනීමට යම් ශක්තියක් ලබා දෙන්න. ඒ තුළිනුත්, පවුලේ බර දරන කාන්තාවන්ට වක්‍රව ප්‍රතිලාභයක් ලැබෙනවා.

අනෙක් පැත්තෙන්, මත්ද්‍රව්‍ය තුරන් කිරීම සඳහා වූ "රටම එකට" වැඩසටහන ක්‍රියාත්මක වනවා. යම් පවුලක දරුවෙකු මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වෙලා ඉන්නවා නම්, මව තමයි වැඩිපුර වේදනාවට පත් වෙන්නේ. තමන්ගේ ස්වාමි පුරුෂයා මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වෙලා ඉන්නවා නම්, බිරිඳ තමයි මේ වේදනාව දරන්නේ. ගෙදර කටයුතු කළමනාකරණය කරන්නේ කොහොමද, බඩු ටික ගෙදරට ගන්නේ කොහොමද, කෑම ටික හදාගන්නේ කොහොමද කියන ප්‍රශ්න ඔක්කොටම මුහුණ දෙන්නේ කාන්තාව. අනෙක් පැත්තෙන් බැලුවාම, "රටම එකට" වැඩසටහනත් වක්‍රව කාන්තාව සවිබලගන්වන්න මැදිහත් වනවා. ඒ සඳහා අවශ්‍ය වටපිටාව ගොඩ නැඟෙනවා. ඒ සම්බන්ධයෙනුත් අපි අවශ්‍ය,-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன)
(The Hon. (Dr.) Namal Sudarshana)
හොඳයි.

මේ සියලු වැඩසටහන් අපි පොදුවේ අමාත්‍යාංශ විධියට දියත් කරලා තිබෙනවා. අපට ඕනෑ තරම් කාරණා කියන්න පුළුවන්. මේ රටේ කාන්තාව වෙනුවෙන්, කාන්තාව සවිබලගන්වන්නට, ඔවුන්ගේ ආරක්ෂාව සඳහා, ඔවුන්ට රැකවරණය සලසා දීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නට අපි කටයුතු සංවිධානය කර තිබෙනවා. සමහර පනත් - ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වන පනත වැනි ඒවා - සංශෝධනය කරන්නට අපි අමාත්‍යාංශයක් විධියට සමාලෝචනය කරමින් ඉන්නවා.

අනෙක් පැත්තෙන්, අමාත්‍යාංශයක් විධියට අපි කාන්තා ව්‍යවසායකත්වය සංවර්ධනය කරන්නට 2025 වසරට සාපේක්ෂව විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. අපට පසුගිය වසරේ රුපියල් මිලියන 100ක වාගේ ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබුණේ. නමුත්, මේ වසරේදී අපි රුපියල් මිලියන 437ක වාගේ විශාල මුදලක් වෙන් කර තිබෙනවා, කාන්තා කාර්ය සංවිධාන හරහා කාන්තා ව්‍යවසායකත්වය සංවර්ධනය කරන්න. මේ වාගේ විශාල වැඩ කොටසක් අපි කරමින් ඉන්නවා.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ "ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන" වැඩසටහන ගැන අපේ නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා කිව්වා. ඒ තුළිනුත් ඇත්තටම කාන්තාවට විශේෂ අවස්ථාවක් ලැබෙනවා, තමන්ගේ රෝගී අවස්ථා හඳුනා ගන්නට; ඒ මූලික හඳුනා ගැනීම් කරලා අවශ්‍ය ප්‍රතිකාර ලබා ගනිමින් ඉදිරියට යන්න.

ඒත් එක්කම, සුරැකුම් ශ්‍රමයේ බර අඩු කිරීමට ජාතික සුරැකුම් ශ්‍රම ප්‍රතිපත්තියක් ගොඩ නඟන්නට අවශ්‍ය සාකච්ඡා කරමින් ඉන්නවා. අපි දන්නවා, සුරැකුම් ශ්‍රමය නිසා කාන්තාව විශාල පීඩාවකට පත් වෙලා තිබෙන බව. ආර්ථිකයට තමන්ගේ දායකත්වය ලබා දෙන්න බැරි තත්ත්වයක ඇය හිර වෙලා ඉන්නවා. මේ සඳහාත් අපි උත්තරයක් හොයන්න ඕනෑ. ඒ සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන, ඔටිසම් දරුවන් සම්බන්ධයෙන් අවශ්‍ය මධ්‍යස්ථාන - මේ සියල්ලම - ඉදිකරන්නට අවශ්‍ය මූලික වටපිටාව අපි ගොඩ නඟා තිබෙනවා. මේ වාගේ කාර්යයන් විශාල ප්‍රමාණයක් අපි ඉටු කරනවා. ඒත් එක්කම පොදුවේ වැටුප් වැඩි කිරීම ගත්තත්, කාන්තාවන්ට දායකත්වයක් ලැබෙනවා. ඇයට සවියක් ලැබෙනවා, තමන්ගේ පවුලේ ආර්ථික මට්ටම වැඩිවීමත් එක්ක පවුලේ කටයුතු කරගෙන යන්න. මේ වාගේ ගොඩක් කාරණා තිබෙනවා.

මට ලැබී තිබෙන කාල වේලාවත් අවසන් නිසා විශේෂයෙන්ම මා මෙය අවස්ථාවක් කර ගන්නවා, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම ගොඩ නඟන්නට විශාල මැදිහත් වීමක් කළ අපේ ගරු ජනාධිපතිතුමාට ස්තුති කරන්නට. මේ සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම කරමින්, ඒ අයදුම්පත් කැඳවලා සුදුසු අය පත් කරලා, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම ගොඩ නඟන්න සහ ඒ කොමිසමට අදාළ පහසුකම් සපයන්නට ගරු ජනාධිපතිතුමාගේ පැත්තෙන් ලබා දුන් දායකත්වය සම්බන්ධයෙන් අපගේ විශේෂ ස්තුතිය එතුමාට පළ කරනවා.

ඒ වාගේම, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමිය සහ වර්තමාන ලේකම්තුමිය ඇතුළු අපේ කාර්ය මණ්ඩලයට විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම ගොඩ නඟන්නට සහ එය ක්‍රියාකාරී තැනකට ගෙන ඒම සඳහා ලබා දුන් දායකත්වය සම්බන්ධයෙන්. මම ඔවුන්ට සුබ පතනවා.

කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට පත් වෙලා ඉන්න අපේ නියෝජිතයන් සියලුදෙනාටම මම මේ කාරණය මතක් කරනවා. ඔබට එකතු වෙලා විශාල කාර්යභාරයක් කරන්න තිබෙනවා, මේ රටේ කාන්තාවන්ගේ අනාගතය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපත්ති ටික සම්පාදනය කරන්න සහ ඒ අවශ්‍ය මැදිහත් වීම කරන්නට. ඒ සියලුදෙනාටම සුබ පතමින්, මට වේලාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, අද දවසේ අදහස් ප්‍රකාශ කරපු සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

## විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා රැකවරණ ගම්මාන පිහිටුවීම
### விசேட தேவையுடைய பிள்ளைகளுக்காக பாதுகாப்புடன் கூடிய கிராமங்களை நிறுவுதல்
### ESTABLISHMENT OF SAFETY VILLAGES FOR CHILDREN WITH SPECIAL NEEDS

[අ.භා. 5.17]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති දරුවන් නොහොත් ආබාධ සහිත දරුවන් ලෙස හඳුනා ගන්නා ලද බුද්ධිමය, ශාරීරික ආබාධ සහ ඔටිසම් රෝගී තත්ත්වයන් සහිත දරුවන්ගේ දෙමව්පියන් එම දරුවන්ගේ අනාගතය පිළිබඳව, ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව තීරණාත්මක අභියෝගයකට මුහුණ දේ. දෙමව්පියන් මිය යාමෙන් පසු තම දරුවන්ට අත්වන ඉරණම පිළිබඳව සැමවිටම කම්පනයකින් යුතුව ජීවත් වීමට සිදුව තිබේ. එලෙසම එම දරුවන් සඳහා ජීවත්වීමට සුදුසු ආරක්ෂිත පරිසරයක් ඔවුන්ට ලබා දීමට සුදුසු අධ්‍යාපනය ඇතුළු වෙනත් සමාජයීය ජීවිතයක් ලබා දීම තනි තනි දෙමව්පියන්ගේ වගකීමක් බවට පත්ව තිබේ.

මෙම තත්ත්වය අවබෝධ කරගනිමින් 2026 වර්ෂයේදී අය වැය මඟින් එම දරුවන් වෙනුවෙන් විශේෂිත ඉදිරි පියවර ගණනාවක් තබා ඇත. එතැනින් නොනැවතී එම දරුවන් වෙනුවෙන් අධ්‍යාපන, වෘත්තීය පුහුණු, කලා, සෞන්දර්ය ක්‍රියාකාරකම් විධිමත් ක්‍රමවේදයකට ක්‍රියාත්මක වන, රැකවරණ ලබා දෙන්නන්ගේ, වෛද්‍ය වෘත්තිකයන්ගේ, මනෝ වෛද්‍යවරුන්ගේ සහ විශේෂිත ගුරුවරුන්ගේ දායකත්වය තුළ හා රජයේ අරමුදල්, දේශීය පෞද්ගලික ධන පරිත්‍යාග, විදේශ ජාත්‍යන්තර සංවිධානවල සහාය සහිතව වඩා විධිමත් ආරක්ෂිත රැකවරණ ගම්මාන පිහිටුවීම සඳහා මැදිහත්ව කටයුතු කළ යුතු බවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් හෝ පුද්ගලයන් ලෙස අපි හඳුනා ගන්නේ ශාරීරික, මානසික සංජානන හෝ සංවේදී ආබාධ හේතුවෙන් සාමාන්‍ය දෛනික කටයුතු සිදු කර ගැනීමට අමතර සහාය සහ සත්කාරය අවශ්‍ය වන පුද්ගලයන්. සමාජයේ අනෙකුත් පුරවැසියන්ට හා සමානව එම පුරවැසියන්ටත් ආරක්ෂිත පරිසරයක්, ආදරයක්, ගෞරවයක් ලැබිය යුතුයි කියන විශ්වාසය ඇතුවයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කටයුතු කරන්නේ. ඔවුන්ට ඒ අදාළ කරන සමාජ පිළිගැනීම ලබා දිය යුතුයි.

පසුගිය අය වැය ලේඛනය මඟින් විශේෂයෙන් ඔටිසම් රෝගී තත්ත්වයන්හි පසුවන දරුවන්, ඒ වාගේම රැකවරණ මධ්‍යස්ථානවල ජීවත් වන දරුවන්, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා විශේෂ අවධානයක් යොමු කරලා, ඔවුන් වෙනුවෙන් මුදල් වෙන් කිරීම් සහ යෝජනා ගණනාවක් වර්තමානයේ මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ වාගේම ප්‍රවාහන පද්ධතිය තුළ විශේෂ වෙනස්කම් ගණනාවක් ඇති කරමින් මෙට්‍රෝ බස් ව්‍යාපෘතිය වැනි වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් තිබෙන වේලාවක් මේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවදුරටත් මේ තත්ත්වයන් මත පදනම් වෙලා ඉදිරි පියවරක් අප තැබිය යුතුයි කියන කාරණය තමයි මා මේ යෝජනාවෙන් ඉදිරිපත් කරන්නේ.

විශේෂයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ වාර්තාව අනුව, අපේ රටේ වයස අවුරුදු 5ට වැඩි ජනගහනය 20,566,680ක් විධියට වාර්තා වෙනවා. එම ජනගහනයෙන් අවම වශයෙන් එක් ආබාධයක් හෝ පවතින පුරවැසියන් ගණන 727,293ක් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක ජනගහනයෙන් සියයකට 0.72ක් පමණ වන අගයක්. ඊට අමතරව විශේෂ අවශ්‍යතා ඇති අය ලෙස හඳුනා ගන්නා පුද්ගලයන් සංඛ්‍යාව, පුද්ගලයන් සියයකට 3.5ක් බවට පත් වෙනවා. ඒ කියන්නේ අපි සමාජයේ ඉන්න පුද්ගලයන් 100ක් ගත්තොත්, තුන්දෙනෙකු, හතරදෙනෙකු වාගේ ප්‍රමාණයක් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් ලෙස හඳුනා ගන්නවා. ඒ වාගේම එක් ආබාධයක් හෝ පවතින පුරවැසියන් ප්‍රමාණය ප්‍රතිශතාත්මකව ගත්තොත්, 1.3ක අගයක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය වයස් කාණ්ඩ අනුව ගත්තොත්, සාමාන්‍යයෙන් පාසල් යන වයසේ අවුරුදු 5ත්, 19ත් අතර කාලය ගත්තොත් අපට ඒ සංඛ්‍යාලේඛන ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් මේ කියන පුරවැසියන් වෙනුවෙන්, විශේෂයෙන්ම මේ දරුවන් වෙනුවෙන් අපේ වගකීම මොකක්ද? එවැනි දරුවන් උපදින අවස්ථාවේ ඉඳලා ඒ දෙමව්පියන්ට ඒ දරුවන් විශාල බරක්, වේදනාවක් බවට පත් වෙච්ච සමාජයකයි අප ඉන්නේ. එවැනි දරුවෙකු ඉපදුණාට පස්සේ ඒ දරුවා දිහා බලාගෙන සුසුම් හෙළීම හැරෙන්නට වෙනත් රැකවරණයක් අහිමි වෙච්ච තත්ත්වයකයි ඒ දෙමව්පියන් තවමත් ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මගේ යෝජනාව, මේ විශේෂ රැකවරණ මධ්‍යස්ථාන ගම්මාන පිහිටුවීම කියන එක ඇතුළේ ඒ දරුවාගේ වගකීම එම පවුලේ සීමාවේ ඉඳලා එම පවුලේ සීමාවෙන් එළියට ගෙන ගිහින් පොදු සමාජ වගකීමක් බවට පත් කරන යෝජනාවක්.

වර්තමානයේදී ඒ දරුවන්ගේ රැකවරණය සම්පූර්ණයෙන් පවුල මතයි තිබෙන්නේ, වැය බර සම්පූර්ණයෙන් පවුල මතයි තිබෙන්නේ. ඔවුන්ගේ සමාජීය තත්ත්වය ගත්තොත්, හුදෙකලාව සහ කොන් වීම එහි ලක්ෂණ විධියට අපට දකින්න පුළුවන්. ඒ නිසා නියාමනය ගත්තොත්, ඔවුන්ගේ නියාමනය ඉතාම අවමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යෝජිත විශේෂ රැකවරණ ගම්මාන වැඩ පිළිවෙළ යටතේ ජීවිත කාලය පුරාම ඔවුන් සුරක්ෂිත කරන මධ්‍යස්ථාන සහිත ගම්මාන පිහිටුවීම තුළ ජීවිත කාලය පුරාම ඔවුන් ආරක්ෂිත වෙනවා. අපට ඒ වැය බර බාහිර පුද්ගල කණ්ඩායම්වලින්, ඒ වාගේම විශේෂ සංවිධානවලින් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා වාගේම එම විශේෂ ගම්මාන තුළ විශේෂයෙන්ම කෘෂි කර්මාන්තය මත පදනම් වෙච්ච ක්‍රියාකාරකම් ගොඩනඟලා ඔවුනුත් සම්බන්ධ කර ගත්තු ආදායම් මාර්ගයක් එම මධ්‍යස්ථාන තුළින් ගොඩ නඟන්න පුළුවන්. ඒ වාගේම, සමාජයීය තත්ත්වය ගත්තොත්, පොදු සමාජයේම ආකර්ෂණය එම විශේෂිත ගම්මානවලට ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. ඔවුන් හුදෙකලා පුරවැසියන්ගේ ඉඳලා සමාජ ජීවිතයක් සහිත ආකර්ෂණීය පුරවැසි කණ්ඩායම් බවට පත් කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම, ඒ විශේෂ රැකවරණ සහිත ගම්මාන රජයේ නියාමනයක් සහිතව පවත්වාගෙන යන්න අපට පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි එම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන රැකවරණය කියන එක, ඔවුන්ට ජීවිත කාලය පුරාම ලැබෙනවා. ඒ මව් දෙමව්පියන්ගේ මිය යෑමෙන් පසුව එම දරුවන්ට අත් වන ඉරණම පිළිබඳව සුසුම් හෙළන පවුල් ඒකකවලට; එම දෙමව්පියන්ට තමන්ගේ දරුවන් ආරක්ෂිතයි කියන හැඟීම ඔවුන් මිය යද්දී ඔවුන්ට ඇති වනවා. ජීවිත කාලය පුරාම වෛද්‍යවරුන්ගේ, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සහ පුහුණු නිලධාරින්ගේ රැකවරණය එම විශේෂිත මධ්‍යස්ථානවලින් ලබා දෙන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම තමයි, ඒ තැන්වල කෘෂි කර්මාන්තය, වෘත්තීය පුහුණුව සහිත පරිශ්‍රයක් ගොඩනඟලා මූල්‍ය තිරසරභාවය ඇති කර ගන්නත්

අපට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම, සමාජ ඒකාබද්ධතාව ගොඩනැඟීමත් මෙහි මූලික අරමුණක් වනවා. රජය, පෞද්ගලික අංශය සහ විවිධ සමාජ කණ්ඩායම් සම්බන්ධ කර ගනිමින් ඒකට අවශ්‍ය කරන මූල්‍ය වැය බර දරන්න අපට පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ වැඩ පිළිවෙළ මෙතෙක් පීඩාවට පත් වෙලා ඉන්න සියලු ජන කණ්ඩායම්වලට විශේෂ අවස්ථාවක්, ඔවුන්ගේ පීඩාව මඳකට බිම්න් තබන අවස්ථාවක් බවට පත් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අප යෝජනා කරන්නේ එවැනි සමාජ සාධාරණත්වයක් නම් මේ යෝජනාව හරහා ඒ සමාජ සාධාරණත්වය යම් ප්‍රමාණයකට ගොඩනඟන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා අප මෙතෙක් අනුගමනය කරපු ක්‍රියාමාර්ග තවදුරටත් ඉදිරියට ගෙන යමින්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා විශේෂ රැකවරණ ගම්මාන පිහිටුවීම කළ යුතුය කියා මම යෝජනා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එම යෝජනාව ස්ථිර කිරීම, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ අතිශය වැදගත් යෝජනාවක් ගෙන ආවා. මා එම යෝජනාව ස්ථිර කරනවා. එතුමා යෝජනා කරනවා, සුරක්ෂිත ගම්මාන ආකෘතියක සිට ආබාධ සහිත ප්‍රජාව සුරක්ෂිතව ජීවත් කරවීමේ අවශ්‍යතාව. ඇත්තෙන්ම එතුමා මතු කරපු විධියටම මේක සමාජ වගකීමක්. අනෙක් පැත්තෙන්, මේක පවුලේ තිබෙන බර හැල්ලු කිරීමක්. තමන්ගේ ආබාධ සහිත දරුවාගේ හෙට දවස පිළිබඳව පිච්චි පිච්චී ඉන්න, විශාල බරකින් ඉන්න, විශාල වේදනාවකින් ඉන්න දෙමව්පියෝ අපට නොයෙක් වර හමු වෙනවා. ඔවුන් අහන ප්‍රශ්නය තමයි, ඔවුන්ගේ මිය යෑමෙන් ඉක්බිතිව මේ දරුවන්ගේ අනාගතය කොතැනටද, මේ දරුවන් සුරක්ෂිත වෙන්නේ කොහොමද කියන එක. මේක ඒ පවුලේ බරක් විතරක් නොව, සමාජ වගකීමක් විධියටත් අපි සලකන්න ඕනෑ. මේක සමාජ වගකීමක් විධියට ගත්තේ නැත්නම් හුදෙකලා පවුල් ඇතුළේ ඒ දෙමව්පියන් විශාල පීඩනයකින්, විශාල වේදනාවකින් තමන්ගේ දරුවන් සමඟ කල් ගෙවනවා.

මේ දරුවන්ගේ බිහි වීම අනිවාර්යයෙන්ම කාගේවත් වරදක් නොවෙයි; එය ඒ දරුවන්ගේවත්, ඒ දෙමව්පියන්ගේවත් වරදක් නොවෙයි. මේකට සමාජ වගකීමක්, සමාජ බරක් තිබිය යුතුයි කියලා අපි යෝජනා කරන්නේ ඒ නිසායි. මේක සමාජ බරක් නම්, සමාජ වගකීමක් නම් අනිවාර්යයෙන්ම රජයත් මේ වගකීම් භාරයට කර උර දෙන්න ඕනෑ. ඒ සඳහා සූදානම් රජයක් තමයි දැන් බලයට පත් වෙලා ඉන්නේ.

අප යෝජනා කළේ, අප ජනතාව ඉදිරියේ තැබුවේ පොහොසත් රටක් නිර්මාණය කරන බලාපොරොත්තුවයි. ඒ පොහොසත් රට අනිවාර්යයෙන්ම මනුෂ්‍යත්වයෙන් පොහොසත් රටක් විය යුතුයි. මනුෂ්‍යත්වයෙන් පොහොසත් රටක් නම් ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා සඳහන් කළ සමාජ සුරක්ෂිතභාවය ආබාධ සහිත දූවා දරුවන්ටත් තිබිය යුතු වෙනවා. අනෙක් පැත්තෙන්, ඔවුන්ට ලස්සන ජීවිතයක් සඳහා උරුමයක් තිබිය යුතු වෙනවා. ඒ සඳහා තමයි අපි "එක්ව අත් නොහැර" ප්‍රතිපත්තිය සමාජගත කළේ. "එක්ව අත් නොහැර" ප්‍රතිපත්තියට තමයි සමාජයේ ලොකු පිළිගැනීමක්, ලොකු අනුමැතියක් හම්බ වෙලා 159දෙනෙකුගෙන් සමන්විත පාලන බලයක් අපට පැවරුණේ. ඒ නිසා රජය විධියට මේ වගකීම, මේ සමාජ බර කරට ගන්න අපි සූදානම්. ඒ සඳහා ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා යෝජනා කරන විධියටම රජයේ මැදිහත්වීමෙන් යුක්තව, ස්වාධීන නියාමනයක් ක්‍රියාත්මක වන ක්‍රියාකාරි සැලැස්මක් එක්ක ආබාධ සහිත දූවා දරුවන්ගේ, ආබාධ සහිත පුද්ගලයන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම අත්‍යවශ්‍යයි.

එතුමා යෝජනා කරන ආකෘතිය හරිම වැදගත්. එතුමා යෝජනා කරන ආකෘතිය තුළ ඒ සුරක්ෂිත ගම්මාන ස්වයංපෝෂිතව ආදායම් උත්පාදනය කරන ධාරාවට ඒ ආබාධ සහිත පුද්ගලයනුත් හවුල් කර ගනිමින් ශක්තිමත්, සවිබල ගැන්වුණු සමාජ වටපිටාවක්, පවුල් පරිසරයක් ගොඩ නැඟිය යුතුයි. එවැනි සුරක්ෂිත ගම්මාන ක්‍රමයක් නිර්මාණය කිරීම අතිශයින්ම වැදගත්. මෙහි නියමු බල ඇණිය බවට, මෙහි නියාමක බලවේගය බවට, මෙය ක්‍රියාත්මක කිරීමේ බලවේගය බවට පත් විය යුත්තේ කවුද? කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු සියලු අමාත්‍යාංශ මේකට දායක විය යුතුයි. විශේෂයෙන්ම කෘෂිකර්මය, කර්මාන්ත ක්ෂේත්‍රය මෙහිදී වැදගත් වනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ආබාධ සහිත වුවත් සුරක්ෂිත කිරීම කියන්නේ එක අමාත්‍යාංශයක වගකීමක් නොවෙයි. එය සියලුම අමාත්‍යාංශ හරහා යන වගකීමක්. එම නිසා ඒ සියලුම අමාත්‍යාංශවල වගකීම මේ සුරක්ෂිත ගම්මානවලට යොමු කරමින්, ආබාධ සහිත ප්‍රජාවගේ උරුමය තහවුරු කරමින්, ඔවුන්ට සුරක්ෂිත ජීවිතයක් අත්පත් කර දීම හරහා මේ සමාජයේ පීඩාවට පත් වෙලා ඉන්න, මේ ආබාධ සහිත දූවා දරුවන්ගේ දෙමාපියන්ගේ බර සැහැල්ලු කිරීම සඳහා ඔවුන්ට අපේක්ෂාවේ බලාපොරොත්තු දල්වාලන වගකීමක් අපි දැරිය යුතුයි. ඒ සඳහා ගරු ජනාධිපතිතුමා සෑම අය වැය ලේඛනයකින්ම විශාල ප්‍රතිපාදනයක් මේ උත්තුංග කාර්යයට වෙන් කරනවා. ඊළඟ අය වැය ලේඛනයේදීත් මේ වාගේම විශාල ප්‍රතිපාදනයක් මේ සඳහා යොමු වෙයි කියන බලාපොරොත්තුවෙන්, අපේක්ෂාවෙන් අපි ඉන්නවා. ඒ නිසා තමයි අප මේ යෝජනාව ගෙනැවිත්, ස්ථිර කරමින් ඒ පිළිබඳව කථා කරන්නේ. අපේ බලාපොරොත්තුව, ආබාධ සහිත දූවා දරුවන්ගේ දෙමාපියන්ගේ බර රජය අතට ගැනීමත්, ඔවුන්ට සැනසිල්ලේ ස්වකීය ජීවන ගමන අවසන් කිරීමේදී තමන්ගේ දරුවා පිළිබඳ බරෙන් මිදිලා මේ සම්බන්ධයෙන් ඔවුන්ට බලාපොරොත්තු තහවුරු වෙච්ච සමාජ වට පිටාවක් ගොඩ නැඟීමයි. එය සමාජයේ රාජ්‍ය නොවන සංවිධානවලත්, සියලුම අංශවලත් වගකීමක් බව සඳහන් කරමින්, මෙබඳු හෘදය සංවේදී සහ සමාජ සංවේදී යෝජනාවක් ගෙන ආ ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்கள். உங்களுக்கு ஏழு நிமிடங்கள் இருக்கின்றன. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.30]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ Adjournment Motion එක ඉදිරිපත් කර තිබෙන්නේ අපේ අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා. එතුමා මාත් එක්ක හැමදාම වාද විවාද ඇති කර ගන්නා මන්ත්‍රීතුමා. එතුමා අද ගෙනැල්ලා තිබෙනවා හොඳ යෝජනාවක්. හැම එකකටම විරුද්ධව කථා කරන්න බැහැ නේද, ගරු මන්ත්‍රීතුමා? ඇත්තටම මේක හොඳ යෝජනාවක්. Doctor කෙනෙක් විධියට මේක හොඳ යෝජනාවක් විධියට තමයි මම බලන්නේ. ඇත්තටම අපේ රට ගත්තාම, මේ කියන ළමයින් හඳුන්වන්නේ ඔටිසම් ළමයි කියලා වෙන්න පුළුවන්. එහෙම නැත්නම්, ඒ අයට කියනවා differently-abled children කියලා. අපි කවදාවත් ඒ අයට කියන්නේ නැහැ, disabled children කියලා. අපි ඒ අයට කියන්නේ differently-abled children කියලා. මම paediatrician කෙනෙක් නිසා මට මේක ගැන අත්දැකීම් පොඩ්ඩක් තිබෙනවා.

ඇත්තටම බැලුවාම, අපේ රටෙන් ඔටිසම් සම්බන්ධයෙන් treatmentsවලට අරගෙන යන්නේ ඉන්දියාවට. ඉන්දියාවේ වෙල්ලෝර්වල Christian Medical College - CMC - තමයි ප්‍රසිද්ධ autism treatment centre එක. මම දන්නා තරමට නම් අපේ රටේ ඔටිසම් treatmentsවලට වෙනම centre එකක් නැහැ.

දෙවැනි කාරණය මේකයි. මම "disabled" කියන වචනය පාවිච්චි කරන්න කැමැති නැහැ. මොකද, "disabled" කියලා වචනයක් නැහැ. ඒක WHO එකෙනුත් අයින් කළා. ඒකට කියන්නේ, "differently-abled" කියලා. මම දන්න සිංහලෙන්, මට පුළුවන් සිංහලෙන් මම මේ කථා කරන්නේ. ඔබතුමා යෝජනා කරලා තිබුණා හැම Grama Niladhari Division එකකටම, එහෙම නැත්නම් හැම දිස්ත්‍රික්කයකටම මේ වාගේ special area එකක් හදන්න ඕනෑ කියලා. ඇත්තටම මම ඒ දිහා හොඳ විධියට බලනවා. ගිය සැරේ අය වැයෙන් ඔටිසම් දරුවන් වෙනුවෙන් රුපියල් මිලියන 100ක් විතර වෙන් කරලා තිබුණා කියලා මට මතකයි; ඒ වාගේ ලොකු ගණනක් වෙන් කරලා තිබුණා කියලා මතකයි. මම විශ්වාස කරනවා, මේකටත් ඒ වාගේ ලොකු ගණනක් වෙන් කරාවි කියලා.

එදා අපේ ජනාධිපතිතුමා කිව්වා, කොත්තමල්ලි කථාවක්. ජනාධිපතිතුමා doctor කෙනෙක් නොවෙන හින්දා එයාට කියන්න පුළුවන්, සාමාන්‍ය ලෙඩකට කොත්තමල්ලි බිව්වාම හරි යනවා කියලා. හැබැයි, doctor කෙනෙක් විධියට මට එහෙම කියන්න බැහැ. මොකද, කොත්තමල්ලි බිව්වාම හොඳ වෙනවා කියලා scientifically prove කරලා නැහැ. අපි උදාහරණයක් ගනිමු. ඔටිසම් දරුවන්ට, එහෙම නැත්නම් differently-abled දරුවන්ට ප්‍රතිකාර ගන්න National Hospital එකේ OPD එකට ගියාම, ඒගොල්ලන්ට වෙනම තැනක් නැහැ. හැබැයි, පිටරටවල එහෙම තිබෙනවා. ජනාධිපතිතුමාගේ අදහස තිබෙන්නේ family medicine ඇති කරන්න; ඒ කියන්නේ, GP system එක ශ්‍රී ලංකාවටත් ගේන්න. හැබැයි, මම දන්නේ නැහැ ඒ GP system එක අපේ රටට කොච්චර දුරට ගැළපෙනවාද කියලා, ඉන්න doctorsලා දිහා බලන කොට. හැබැයි එක දෙයක් කියන්න ඕනෑ. මේ කියන differently-abled children වෙනුවෙන්, එහෙම නැත්නම් differently-abled patients වෙනුවෙන් ප්‍රතිකාර කරන්න hospitalsවල වෙනම තැන් වෙන් කරන්න ඕනෑ. එහෙම තැන් දැනටමත් තිබෙනවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ලොකු මුදලක් වෙන් කරලා ඒ කටයුත්ත base hospitalsවල, divisional hospitalsවල කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. මොකද, මේවා National Hospital එකේ කරන්න පුළුවන් වැඩක් නෙවෙයි. අපි maximum try කරන්න ඕනෑ, National Hospital එකට හරි district general hospitalsවලට හරි එන මිනිස්සු ප්‍රමාණය අඩු කරන්න. ඒක කරන්න නම් අපට කරන්න තිබෙන්නේ එවැනි තැන් base hospitalsවල හදන එකයි. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හැමදාම Athurugiriya Divisional Hospital එකට ඇවිල්ලා යනවා කියලාත් මට ආරංචියි. අපි බලන්න ඕනෑ, divisional hospitalsවලට ඒ වාගේ facilities ටිකක් ලබා දෙන්නයි. 2022දී මගේ research topic එක මේකයි. සාමාන්‍යයෙන් hospital එකට වැඩිහිටි ලෙඩ්ඩු අරගෙන ඇවිල්ලා එහි දමලා එයාලගේ ළමයි දුවනවා. ඒ කියන්නේ, වයසක ලෙඩ්ඩු හරි, bed-ridden ලෙඩ්ඩු හරි ගෙනැල්ලා දමලා යනවා. 2022 කොවිඩ් වසංගතය කාලයේ Peradeniya, Teaching Hospital එකේ වැඩ කරද්දී අපි කල්පනා කළා, කවුරු හරි patientsලා එහේ දාලා යනවා නම්, පොඩි base hospital එකක් අරගෙන, patientsලා රැක බලා ගන්න පුළුවන් විධියට ඒක හදන්න. මම විශ්වාස කරනවා, අපට එක පාරටම ලොකු මුදලක් වියදම් කරලා ඒ වාගේ දෙයක් කර ගෙන යන්න බැහැ කියලා. හැබැයි, hospitalsවල තිබෙන facilities ටික අනුව වෙන් කිරීමක් කරලා palliative care හරි, එහෙම නැත්නම් මේ කියන තැන් හරි පවත්වා ගෙන යනවා නම් හොඳයි කියලා මම හිතනවා. මේක ඔයගොල්ලන්ගේ ආණ්ඩුව නේ, අපේ ආණ්ඩුව නෙවෙයි නේ. ඒ නිසා ඔයගොල්ලෝ මේ ගැන කල්පනා කරලා මේ කියන වෙනස කරනවා නම්, ඒක ඒ ළමයින් වෙනුවෙන් කරන ලොකු දෙයක්.

ඔයගොල්ලෝ දන්නවා සාමාන්‍යයෙන් ඔටිසම් එන්නේ ඇයි කියලා. අම්මා තාත්තා හොඳටම උගත් නම්, ළමයින්ට ඔටිසම් එනවා. ඒකට ප්‍රධානම හේතුව ඒකයි. අම්මාගෙයි තාත්තාගෙයි IQ level එක 80ට වැඩි වුණාම, most likely, their children would get autism. ලංකාවේ ඔටිසම්වලට treat කරන specialized centre එකක් LRH එකේත් නැහැ, වෙන කොහේවත් නැහැ. ඒ නිසා මම ඇත්තටම මේ යෝජනාව ගැන සතුටු වෙනවා. ඇත්තටම අපි ගිහිල්ලා මේවා කරන්න ඕනෑ ගම්වලයි. National Hospital එකේ හරි, LRH එකේ හරි මේකට ward එකක් දමලා හරියන්නේ නැහැ. අපි ඇත්තටම කරන්න ඕනෑ, Athurugiriya Divisional Hospital වාගේ hospitalsවල ඒ කටයුත්තට චූටි කාමරයක් හරි වෙනම දෙන එකයි. අනෙක් අතට, childcare සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, childcare centres නීත්‍යානුකූල විධියට, හරි විධියට හදලා නැහැ. එතකොට ඕනෑම කෙනෙකුට ඇවිල්ලා, "මම අම්මා තාත්තා නැති ළමයින්ව බලා ගන්නවා" කියලා childcare centre එකක් හදා ගන්න පුළුවන්. මම විශ්වාස කරනවා, childcare centres, differently-abled childcare centres, අම්මා තාත්තා නැති ළමයි බලා ගන්නා තැන් ආදිය ගැන රජය සොයා බලන්න ඕනෑ කියලා; ඒවා regularize කරන්න ඕනෑ කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் மாத்திரம் இருக்கின்றது.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඉක්මනින් කථාව ඉවර කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට අසිත නිරෝෂණ අයියාට කියන්න දේවල් තිබෙනවා. ඒවා එළියේ කියන්න බැහැ නේ. මොකද, ඊට පස්සේ නඩුවක් දැම්මොත් එහෙම, මම බැන්නා කියලා? අපි මෙතැන රණ්ඩු වෙමු හැමදාම. මම කාරණය කෙළින්ම කියන්නම්.

Athurugiriya Divisional Hospital එකේ ප්‍රශ්නයක් තිබෙනවා. එහේට ambulance එකයි තිබෙන්නේ. එක driver කෙනෙක් විතරයි ඉන්නේ. ඒ driver, Homagama Base Hospital එකට ලෙඩ්ඩු අරගෙන ගියාම ඒ driverට සහ minor staff එකේ තුන්දෙනාට පැය 3ක් විතර Homagama Base Hospital එක ඇතුළේ ඉන්න වෙනවා. එතකොට, Athurugiriya Divisional Hospital එකට අනෙක් ලෙඩ්ඩු අරගෙන යන්න driver කෙනෙක් නැහැ. එහෙම සිද්ධි ගොඩක් වෙලා තිබෙනවා. ඔබතුමා ඒ area එක ගැන බලා ගනියි කියලා මම හිතනවා. මම මේක නලින්ද අයියටත් කියන්න හිටියේ, මේකට motion එකක් දාන්න ඕනෑ කියලා. වෙන hospital එකකට නම් ලෙඩ්ඩු අරගෙන ගිහිල්ලා බැස්සුවාම එතැනින් ඒ අයගේ වැඩේ ඉවරයි. නමුත් දැන් වෙන දේ හිතලා බලන්නකෝ. Athurugiriya Divisional Hospital එකේ minor staff එකේ තුන්හතර දෙනෙක් තමයි ඉන්නේ. Homagama Base Hospital එකට ලෙඩ්ඩු අරගෙන ගියාම CT scan එක ගන්න කල්, X-ray එක ගන්න කල් - ඒ ඔක්කොම කරන කල් - driver පැය 4ක් විතර තියා ගත්තොත්, Athurugiriya Divisional Hospital එකේ වැඩ කරන්නේ කොහොමද?

ඔයා නේ කිව්වේ, විපක්ෂ නායකතුමාගේ අර රජීව් අමරසූරිය කථාව. මම විශ්වාස කරනවා, ඔයා එළියට ගිහිල්ලාත් ඒක කියයි කියලා. හැබැයි, ඔය වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ වාගේ යෝජනා ගෙනෙනකොට අපට ඇත්තටම විරුද්ධ වෙන්න බැහැ. මේක ඇත්තටම හොඳ යෝජනාවක්. මම විපක්ෂයේ ඉඳන් හැම දාම, හැම එකකටම පොල්ල දමන කෙනෙක් නොවෙයි. මේක ඇත්තටම හොඳ යෝජනාවක්.

ඊට අමතරව මේ ගැනත් පොඩ්ඩක් හිතලා බලන්න. පොඩි පොඩි hospitalsවලට,- මම නලින්ද අයියාටත් මේක කියන්නම්. හංසක අයියාටත් කියන්නම්. මම ආදරෙන් කියන්නේ, "අයියලා" කියලා. කාටවත් මම විරුද්ධ නැහැ. මෙතැන කථා කරලා මට බැණපු තුන්දෙනාම කැන්ටිමට ඇවිල්ලා මාත් එක්ක කථා කරලා ගියා. ඔබතුමන්ලා අය වැයෙන් ලොකු ගණනක් වෙන් කරලා, රටට හොඳ දෙයක් කරනවා නම් ඒවාට අපි අනිවාර්යයෙන් සහයෝගය දෙනවා.

Thank you.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ (வைத்தியர்) இளையதம்பி சிறிநாத் அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு.

[பி.ப. 5.37]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு வணக்கத்தை தெரிவித்துக்கொண்டு, மாற்றுத்திறன் உள்ளவர்களுக்காக நாடெங்கிலும் சிறப்பு பராமரிப்புக் கிராமங்களை நிறுவுதல் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ அசித நிரோஷண எகொட விதான அவர்களுக்கு நன்றியையும் தெரிவித்துக் கொள்கின்றேன்.

உண்மையிலேயே மாற்றுத்திறன் உள்ளவர்களிடம் - differently-abled person - வித்தியாசமான திறமைகள் இருக்கின்றன. சமகால சூழலில் அவர்கள் எதிர்நோக்குகின்ற பல்வேறு நடைமுறைசார்ந்த பிரச்சினைகளைக் கருத்திற்கொண்டு, அவர்களையும் சமூகத்துக்கு ஏற்றவாறு, போட்டிபோடக்கூடிய ஆளுமையுள்ள மனிதர்களாக மாற்றக்கூடிய இந்தத் திட்டத்தை நாங்கள் உண்மையிலேயே வரவேற்கவேண்டிய தேவையிருக்கின்றது. ஏனெனில், அவர்கள் பல இடங்களில் பல்வேறு நெருக்கடிகளை எதிர்நோக்கிக்கொண்டு இருக்கின்றார்கள். Autism என்றாலும் சரிதான், பார்வைத்திறன் குறைபாடுடையவர்கள் என்றாலும் சரிதான், கேட்டல் குறைபாடுடையவர்கள் என்றாலும் சரிதான், அவர்களுக்கென தனித்துவமான மருத்துவ சேவை, கல்வி வசதிகள், உட்கட்டமைப்பு வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்படல் வேண்டும். அவர்களும் இந்த நாட்டின் பிரஜைகள் என்ற அடிப்படையில், எதிர்கால சமூகத்தில் முழுமையான மனிதர்களாக மாறுவதற்கு இந்தத் திட்டம் மிகவும் சிறந்தது.

இந்தத் திட்டம் ஒரு முன்மொழிவாக முன்வைக்கப்பட்டு இருந்தாலும், இந்தத் திட்டத்தை முன்கொண்டு செல்லும்போது, பல விடயங்களை சமாந்தரமாகக் திட்டமிடவேண்டிய பொறுப்பு இருக்கின்றது. குறிப்பாக, இந்தத் திட்டத்தை ஆரம்பித்து, அதனூடாக அவர்கள் முழுமையான வசதிகளைப் பெற்றுக்கொள்வதற்கான திட்ட முகாமைத்துவம் மிகச் சரியான முறையில் மேற்கொள்ளப்படல் வேண்டும். இல்லாவிட்டால், அவர்கள் இந்தத் திட்டத்தில் உள்வாங்கப்பட்டாலும், அவர்களுக்குரிய வசதிகள் ஏற்படுத்தப்படாமல் போகலாம். இந்தத் திட்டமானது, எல்லா இடங்களிலும் சமச்சீரான முறையில் மேற்கொள்ளப்படல் வேண்டும் என்பதுடன், சமமான வளப் பங்கீட்டின்மூலம் அவர்களுக்கான வசதிகளும் ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டும். கடந்த காலங்களில் வளங்கள் சமமாகக் கொடுக்கப்படாததால், வளப் பற்றாக்குறை காரணமாக சில பிரதேசங்கள் பின்தங்கியிருப்பதை நாம் காணக்கூடியதாக இருக்கின்றது.

இந்த நாட்டில் கல்வி இலவசமாகக் கொடுக்கப்படுகின்ற பொழுதிலும், பல பிரதேசங்களுக்கு அதிகமான வளங்களும் சலுகைகளும் வழங்கப்பட்டுள்ளன. இதனால் வட, கிழக்கு பிரதேசம் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றன. யுத்தத்தால் வட, கிழக்குப் பகுதிகளில் பலர் அங்கவீனமாகி இருக்கிறார்கள். அதாவது, disabilityஉம் இருக்கின்றது; differently-abledஆன நிலையிலும் இருக்கிறார்கள். இந்தத் திட்டமானது என்றோ கொண்டுவரப்பட்டு இருக்க வேண்டும். யுத்தம் மௌனிக்கப்பட்ட பின்னர், இதனை முன்னுதாரணமான திட்டமாகக் கொண்டுவந்திருக்க வேண்டும். அந்தக் காலத்தில் பாதிக்கப்பட்டவர்கள் பாதிக்கப்பட்டவர்களாகவே பல ஆண்டுகளை - 17 ஆண்டுகளை - கடந்திருக்கிறார்கள். பல்வேறு காரணங்களால்

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

differently-abled personsஆக அவர்கள் மாறியிருக்கின்றார்கள். எனவே, இந்தத் திட்டத்தைச் சிறப்பான முறையில் மேற்கொள்வதற்கு திட்ட முகாமைத்துவ அறிக்கையொன்று சமர்ப்பிக்கப்பட வேண்டும். அது ஒரு சட்டமாக அல்லது நடைமுறையாக மாற்றப்பட்டு, நாடு பூராவும் சமச்சீரான வளப்பங்கீட்டுடன் அவர்களுடைய கல்வித் தேவையையும் சுகாதாரத் தேவையையும் முழுமையாக நிவர்த்தி செய்து, அவர்களை இந்த நாட்டில் எல்லா வசதிகளையும் அனுபவிக்கக்கூடிய பிரஜைகளாக மாற்றி, நிறைவுள்ள மனிதர்களாக வாழவைக்க வேண்டும். அந்த அடிப்படையில் இந்தத் திட்டத்தை நாம் உண்மையிலேயே வரவேற்கின்றோம்.

நாம் பல இடங்களில் காண்பதுபோன்று, ஆரம்பிக்கப்படும்பொழுது இதற்கென பல திட்டங்கள் முன்வைக்கப்பட்டு, இடைநடுவில் கைவிடப்படாது, அவற்றைச் சிறப்பான முறையில் கொண்டுசெல்வதற்காக ஒரு committee அல்லது ஒரு caucus அல்லது ஓர் அமைப்பை உருவாக்கி, கலந்தாலோசனைகள்மூலம் இந்த விடயங்களில் எவ்வகையான பின்தங்கிய நடைமுறைகள் இருக்கின்றன? என்பதைக் கண்டுபிடிக்க வேண்டும். இந்த நடைமுறைகளைக் கொண்டுசெல்லும்பொழுது, அவர்கள் தனித்துவமான விடயங்களால் தங்களுடைய உறவுகளை இழந்துவிடாமல், அவர்களுக்குரிய வசதிகள் ஏற்படுத்தப்பட்டு, சமாந்தரமான சூழலில் ஏனைய சாதாரண மனிதர்கள் பெறுகின்ற வசதிகளைப் பெற்று, நிர்க்கதியற்ற நிலையில் வாழ்வதற்கு வசதிகளை ஏற்படுத்திக்கொடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இன்றும் differently-abled persons மருத்துவ வசதிகளைப் பெற வருகின்றபோது, அவர்களுக்கான வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதில் பாரிய நெருக்கடிகள் இருக்கின்றன. Disabilityயாக இருக்கின்றவர்களுக்கென - இயங்கு நிலையில் இல்லாதவர்களுக்கென - இந்த அரசாங்கம் பல திட்டங்களை முன்வைத்திருக்கின்றது; நடைமுறைப்படுத்துகின்றது. அதனை வெற்றிகரமானதாக மாற்றுவதற்கு அரசின் ஊடாக முன்னெடுக்கப்படுகின்ற திட்டங்களை அந்த மக்களிடம் கொண்டுசெல்வதற்கான பொறிமுறையும், அதனைக் கண்காணிப்பதற்குரிய செயற்றிட்டமும் வகுக்கப்பட வேண்டும். இந்தத் திட்டங்களின் பயன் முழுமையாக அந்த மக்களைச் சென்றடைவதற்கான பொறிமுறை வகுக்கப்பட்டு, அது நாடு முழுவதும் சமச்சீராகக் கிடைக்கப் பெறுவதற்கு வழிவகுக்க வேண்டுமெனக் கேட்டுக்கொண்டு, இந்தப் பிரேரணையை முன்வைத்த எமது சக பாராளுமன்ற உறுப்பினருக்கு மீண்டும் நன்றி கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்களுடைய point of Order என்ன?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ point of Order එක ගේන්නේ ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ. මගේ කථාවේදී මම confuse වුණා, "differently-abled" සහ "disabled" කියන වචන ගැන. ඇත්තටම මම හරියටම කියන්න ඕනෑ, "disabled" කියන වචනය තමයි පාවිච්චි කරන්න ඕනෑ. ඒ නිසා මම සමාව ඉල්ලනවා.

Thank you.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.43]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා විසින් ආබාධ සහිත දරුවන් වෙනුවෙන් රැකවරණ ගම්මාන පිහිටුවීම සම්බන්ධයෙන් වූ ඉතා වැදගත් කරුණක් මේ සභාව හමුවේ අවධානයට යොමු කර තිබෙනවා. ඒ පිළිබඳව මම පළමුවෙන්ම එතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම මම හිතුවා, මේ සාකච්ඡාවේ මගේ කථාව ආරම්භ කරනකොටම terminology ගැන යම් පැහැදිලි කිරීමක් කිරීම අවශ්‍යයි කියලා. මොකද, අපේ සමාජයේ ආබාධ සහිත පුද්ගලයින් විවිධාකාරයෙන් හඳුන්වන ආකාරය අපට දැකගන්න ලැබුණා. විශේෂයෙන්ම මේ සභාවේත් එවැනි යෙදුම් භාවිත කළා. මේ පිළිබඳ සාකච්ඡාවක් වසර ගණනාවක් තිස්සේ සමාජයේ තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුල් කාලීන අදහස තමයි, මෙවැනි අය පිළිබඳව වෛද්‍ය විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් බැලිය යුතුයි කියන එක. අපි ඒකට කියනවා, "medical model" එක කියලා. නමුත්, ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳව වෛද්‍ය විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් පමණක් බලා තේරුම් ගත නොහැකියි කියන එක පසුකාලීනව විශේෂයෙන්ම සමාජ විද්‍යා ක්ෂේත්‍රයේදීත්, ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි සංවිධානවලත් අවධානයට යොමු වුණා.

ඒ අනුව 2006දී "Convention on the Rights of Persons with Disabilities" කියන එක්සත් ජාතීන්ගේ සම්මුතියෙන් - convention - මේ terminology එක ඉතා පැහැදිලිව විස්තරකොට තහවුරු කර තිබෙනවා. මේ 2006 එක්සත් ජාතීන්ගේ CRPD එකට අපි 2016දී අත්සන් කර තිබෙනවා. ඒ අනුව අපි මේ වනකොට භාවිත කළ යුතු terminology එක තමයි, “Persons with disabilities” කියන එක. ඔවුන්ට විශේෂ අවශ්‍යතාවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි; “Persons with special needs” කියලා එකක් නැහැ. ඔවුන්ටත් තිබෙන්නේ සමාජයේ අනෙක් අයට තිබෙන අවශ්‍යතාම තමයි. ඔවුන්ටත් මූලික අවශ්‍යතා තිබෙනවා. ඔවුන්ට ආහාර අවශ්‍යයි, වාතාශ්‍රය අවශ්‍යයි, ජලය අවශ්‍යයි, නිවාස අවශ්‍යයි. ඒ වාගේම සේවාත් අවශ්‍යයි. අධ්‍යාපනය අවශ්‍යයි, ප්‍රවාහන සේවා අවශ්‍යයි. ඒ වාගේම ඔවුන්ටත් ආදරය අවශ්‍යයි, රැකවරණය අවශ්‍යයි. සමාජයේ අනෙක් සාමාන්‍ය අයට තිබෙන අවශ්‍යතාම තමයි ඔවුන්ටත් තිබෙන්නේ. ඒ නිසා ඔවුන් විශේෂ අවශ්‍යතා තිබෙන අයත්

නොවෙයි, differently-abled අයත් නොවෙයි, handicapped අයත් නොවෙයි, ඔවුන් persons with disabilities. එක්සත් ජාතීන්ගේ සංවිධානය 2006දී මේ terminology එක තහවුරු කර තිබෙනවා. ඒ නිසා මම මේ පාර්ලිමේන්තුවේදී ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, නිවැරදි terminology පාවිච්චි කරන්න කියලා. මම ඔවුන් සමඟ අවුරුදු ගණනාවක් වැඩ කර තිබෙනවා. අද මම ඊට අදාළ අමාත්‍යාංශයේ වගකීම දරන නිසා දන්නවා, ඔවුන්ගේ සිතුම් පැතුම් පිළිබඳව. ඔවුන් ඉතාම සංවේදීයි, මේ terminology භාවිතය සම්බන්ධයෙන්.

ඒ වාගේම ඔටිසම් ඇතුළු බුද්ධිමය ආබාධ සහිත, ඒ වාගේම ශාරීරික ආබාධ සහිත දරුවන්ගේ දෙමව්පියන්ට ඔවුන්ගේ රැකවරණය පිළිබඳව ඉතාම බරපතළ ගැටලුවක් අපේ සමාජය තුළ තිබෙනවා. මේ වෙනුවෙන් ගත වූ වසර දෙකකට ආසන්න කාලය පුරා අපේ රජය විශේෂ මැදිහත්වීමක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2026 අය වැයෙන් ආබාධිත දරුවන් වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා රුපියල් මිලියන 100ක්, ඒ වාගේම අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා රුපියල් මිලියන 447ක් වෙන් කළා. එතැනින් නතර වෙන්නේ නැතුව ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා විධියට අය වැය කථාව ඉදිරිපත් කරන අවස්ථාවේදී ඊට අමතරව තවත් රුපියල් මිලියන 500ක් වෙන් කළා, ආබාධ සහිත දරුවන්ගේ රැකවරණය සහ සුරැකුම වෙනුවෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න.

ඒ අනුව මේ වන විට ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ තිබෙන සමාජ සේවා දෙපාර්තමේන්තුව මාස 06ත්, අවුරුදු 18ත් අතර සිටින ඔටිසම් ඇතුළු ආබාධ සහිත දරුවන්ගේ රැකවරණය සහ කුසලතාව වර්ධනය කිරීම සඳහා රැකවරණ මධ්‍යස්ථාන 25ක් ලංකාවේ ආරම්භ කිරීම සඳහා මේ වන විට සැලසුම් කරලා තිබෙනවා. අපි මෙම වසරේ එවැනි රැකවරණ මධ්‍යස්ථාන 10ක් ආරම්භ කරනවා. එම පළමු මධ්‍යස්ථානය අපි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේදී පසුගිය ජූලි මාසයේදී ආරම්භ කළා. අපි දෙවන මධ්‍යස්ථානය මෙම මස 29වන දා කෑගල්ලේදී ආරම්භ කරනවා. ඉතිරි මධ්‍යස්ථාන අටත් මෙම වර්ෂයේදී ආරම්භ කරනවා. ඒ වාගේම තවත් මෙවැනි මධ්‍යස්ථාන 15ක් අපි ලබන වර්ෂයේදී ආරම්භ කරනවා. මේ ඔස්සේ අපි ආබාධ සහිත දරුවන්ට අවශ්‍ය රැකවරණය ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව, ඔවුන්ට අවශ්‍ය ආදරය, අධ්‍යාපනය සහ කුසලතාව ලබා දීම සඳහා විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරනවා. නමුත් මෙහිදී විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, සුරැකුම හා ආරක්ෂාව ලබා දීම කියන එකෙන් ජාතික ජන බලවේගය රජය විධියට අපි දකින්නේ, ඔවුන් සමාජයේ හුදෙකලා කරලා, ආයතනගත කිරීම නොවෙයි කියන එක. මොකද, care කියන එක ගත්තාම, individual care, family and community-based care සහ institutional care වශයෙන් තිබෙනවා. ආයතනික රැකවරණය කියන එක එන්නේ අවසාන අදියර විධියට. ඔවුන් කිසියම් ආයතනයකට එකතු කරලා ආයතනය තුළ ඔවුන්ට විතරක් වෙනම ආරක්ෂාව ලබා දෙන්න බැහැ; රැකවරණය ලබා දෙන්න බැහැ. අපේ සමාජ සංස්කෘතියත් එක්ක ඔවුන්ට වඩාත් හොඳින් ආදරය ලැබෙන්නේ, අධ්‍යාපනය ලැබෙන්නේ, සමාජානුයෝජනය ලැබෙන්නේ පවුල තුළින්. ඒ වාගේම ඥාතිත්වය තුළින්. ඒ වාගේම සමාජයේ ඇති අධ්‍යාපනික, ආගමික වැනි අනෙකුත් සමාජ ආයතන තුළින්. එම සමාජ ආයතන තුළ ප්‍රජා පාදක සුරැකුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තමයි අපේ රජයේ අරමුණ වන්නේ.

ගරු මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කළ යෝජනාව එම වැඩසටහන සඳහා ඉතා වැදගත්, ඉදිරිගාමී යෝජනාවක් විධියට අපි සලකනවා. එහි තිබෙන ශක්‍යතාව පිළිබඳව සොයා බැලීම සඳහා විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත්, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයත් මැදිහත් වෙලා අදාළ කටයුතු කළ යුතුයි කියන යෝජනාව ඉදිරිපත් කරමින්, මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

*එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.49ට, 2026 සැප්තැම්බර් 11වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.49க்கு, பாராளுமன்றம் 2026 செப்ரெம்பர் 11, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.49 p.m. until 9.30 a.m. on Friday, 11th September, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### පාරම්පරික වෛද්‍යවරුන්ගේ වෙද පරම්පරා පිළිබඳ පර්යේෂණ කිරීමේ විශේෂ ව්‍යාපෘතිය: ප්‍රගතිය
### பாரம்பரிய மருத்துவர்களின் மருத்துவப் பரம்பரைகள் குறித்து ஆய்வு செய்வதற்கான விசேட கருத்திட்டம்: முன்னேற்றம்
### SPECIAL PROJECT TO RESEARCH MEDICAL LINEAGES OF TRADITIONAL MEDICAL PRACTITIONERS: PROGRESS

2253/2026

**1. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෛද්‍යවරුන් අතරින් පාරම්පරික, විශේෂ සහ සර්වාංග වෛද්‍යවරුන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පාරම්පරික වෛද්‍යවරුන්ගේ නිශ්චිත වෙද පරම්පරා වෛද්‍ය සභාව විසින් හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, හඳුනාගෙන ඇති වෙද පරම්පරා සංඛ්‍යාව කොපමණද;

(v) පසුගිය රජයන් යටතේ වෙද පරම්පරා පිළිබඳ සොයා බැලීම සඳහා ආයුර්වේද පර්යේෂණ ආයතනය වෙත විශේෂ ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(vi) එසේ නම්, ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(vii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(viii) එම ව්‍යාපෘතියෙන් ප්‍රගතියක් නොමැති නම්, ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை ஆயுர்வேத மருத்துவ சபையில் பதிவு செய்யப்பட்டுள்ள வைத்தியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி வைத்தியர்களுள், பாரம்பரிய வைத்தியர்கள், விசேட வைத்திய நிபுணர்கள் மற்றும் பொது மருத்துவ நிபுணர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) பாரம்பரிய மருத்துவர்களின் குறிப்பிட்ட மருத்துவப் பரம்பரைகள் பற்றிய தகவல்களை மருத்துவ சபை அடையாளம் கண்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அடையாளம் காணப்பட்டுள்ள மருத்துவப் பாரம்பரைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) கடந்த அரசாங்கங்களின்கீழ், மருத்துவப் பரம்பரைகள் குறித்து ஆய்வு செய்வதற்காக ஆயுர்வேத ஆராய்ச்சி நிறுவனத்திற்கு விசேட கருத்திட்டமொன்றுக்காக நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அக்கருத்திட்டத்திற்கு ஒதுக்கீடு செய்யப்பட்ட நிதித்தொகை எவ்வளவு என்பதையும்;

(vii) மேற்படி கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

(viii) அக்கருத்திட்டத்தில் எவ்வித முன்னேற்றமும் இல்லையெனில், அதற்காக ஒதுக்கீடு செய்யப் பட்ட ஒதுக்கீடுகளின் நிலை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the number of medical practitioners who are registered with the Sri Lanka Ayurveda Medical Council;

(ii) the number of traditional, specialist and general physicians who are among them, separately;

(iii) whether the specific medical lineages of traditional medical practitioners have been identified by the Medical Council;

(iv) if so, the number of medical lineages so identified;

(v) whether financial provisions were allocated to the Ayurveda Research Institute under previous governments for a special project to research medical lineages;

(vi) if so, the amount of financial provisions that were allocated therefor;

(vii) the current progress of the said project; and

(viii) if no progress has been made in the said project, the status of the financial provisions that were allocated therefor?

(b) If not, why

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) 2026.08.15 දින වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව 28,151ක් වන අතර, ඉන් 4,286දෙනෙක් මිය ගොස් ඇති බවට වාර්තා වී ඇත.

(ii) පාරම්පරික - විශේෂ - 10,518

සාමාන්‍ය (සර්වාංග) - 17,633

(iii) පාරම්පරික වෛද්‍යවරුන්ගේ වෙද පරම්පරා වෛද්‍ය සභාව විසින් නිශ්චිතව හඳුනා ගෙන නොමැත.

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55(1) හා 55(2) වගන්ති යටතේ පාරම්පරික වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචි කරනු ලබන තැනැත්තන් පරම්පරා හිමි වෛද්‍යවරුන් වශයෙන් සලකනු ලැබේ.

(iv) නිශ්චිතව හඳුනා ගෙන නොමැති බැවින් සංඛ්‍යාත්මකව ඉදිරිපත් කළ නොහැක.

(v) පසුගිය රජයන් යටතේ වෙද පරම්පරා පිළිබඳව සොයා බැලීම සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය වෙත විශේෂ ව්‍යාපෘතියක් යටතේ වෙද පරම්පරා පිළිබඳ සොයා බැලීම පමණක් නොව, පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ දෙවන අදියරේ ව්‍යාපෘතිය යටතේ අරමුණු 08ක් සපුරාලීම සඳහා වසර 04ක කාලයක් තුළ ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ප්‍රතිපාදන වෙන් කර ඇත.

(vi) පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ දෙවන අදියර ව්‍යාපෘතිය යටතේ සඳහන් අරමුණු 08ක් සපුරාලීම සඳහා රුපියල් මිලියන 350ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත.

2019 වර්ෂයෙන් ආරම්භ වී 2022 වර්ෂයෙන් අවසන් කිරීමට නියමිතව තිබූ නමුත්, අවසන් කිරීමට නොහැකි වූ ක්‍රියාකාරකම් 2024 හා 2025 වසරවලදී ඉටු කර ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන ඇති අතර, ඒ සඳහා අවශ්‍ය මුදල වාර්ෂික අය වැය ප්‍රතිපාදන තුළින් 2024 වසරට රුපියල් මිලියන 10ක් සහ 2025 වසරට රුපියල් මිලියන 25ක් වශයෙන් වෙන් කර දී ඇත.

(vii) TMK පරිගණක මෘදුකාංගය මඟින් වෛද්‍ය පරම්පරා හඳුනා ගැනීම වෛද්‍යවරුන්ගේ සියලු දත්ත ඇතුළත් තොරතුරු සහිත දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම යන අරමුණෙන් මෙය

නිර්මාණය කරන ලදී. පළාත් මට්ටමින් ලැබුණු වෛද්‍යවරුන් 6,000කගේ තොරතුරු අතරින් T.M.K.___පරිගණක මෘදුකාංගය 2,000කට ආසන්නව ඇතුළත් කර අවසන් කර ඇත. පරිගණකගත කරන ලද තොරතුරු ඇසුරින් දත්ත විශ්ලේෂණය කර නිවැරදි පරම්පරා හඳුනා ගැනීමට සැලසුම් කර ඇත. එසේම පාරම්පරික දේශීය වෛද්‍යවරුන් සතු වෛද්‍ය වටිනාකමක් ඇති වෛද්‍ය ග්‍රන්ථ, උපකරණ සහ වෙනත් අදාළ ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම සඳහා,

- තහවුරු කර ගත් පාරම්පරික වෛද්‍ය ගුරු කුලවල දේශීය වෛද්‍යවරුන්ගේ චිකිත්සාව පිළිබඳ ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් නිර්මාණය කර ඒවා සංරක්ෂණය කර ඇත.

- බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතන භූමියේ කෞතුකාගාරයක් පිහිටුවා ඇත.

- දුර්ලභ වෛද්‍ය වටිනාකමින් යුතු අභාවයට යමින් පැවති පුස්කොළ පොත් කළු මැද, භෞතික හානි ප්‍රතිසංස්කරණය කර, කම්බා සහ නූල් යොදා, වර්ගීකරණය කර, දත්ත ගබඩා කර ලේඛනගත කර ඇත.

- ඉහත සංරක්ෂණය කරන ලද පුස්කොළ පොත් 816ක් පරිලෝකනය කර - scan - ඩිජිටල් තාක්ෂණය ඔස්සේ විද්‍යුත් සංරක්ෂණය කර ඇත.

- කළු මැදීමෙන්, භෞතික හානි ප්‍රතිසංස්කරණය කරන ලද දුර්ලභ පුස්කොළ පොත් අතරින් තෝරා ගත් පුස්කොළ පොත් 10ක් අනුලේඛනය කර එක් පොතකින් පොත් 100 බැගින් මුද්‍රණය කර, ඒවා මධ්‍යම රජයේ රෝහල් සහ පළාත් ආයුර්වේද පුස්තකාල වෙත ලබා දී ඇත.

TMK ව්‍යාපෘතිය

| වර්ෂය | ප්‍රතිපාදන (රුපියල්) | වියදම් කළ මුදල (රුපියල්) | ඉතිරි මුදල (රුපියල්) |
|---|---|---|---|
| 2020 | - | - | - |
| 2021 | 10,000,000.00 | 1,759,664.00 | 8,240,336.00 |
| 2022 | 1,500,000.00 | 697,407.95 | 802,592.05 |
| 2023 | 3,000,000.00 | 2,939,423.40 | 60,576.60 |
| 2024 | 10,000,000.00 | 4,896,114.38 | 5,103,885.62 |
| 2025 | 25,000,000.00 | 8,847,828.93 | 16,152,171.07 |

(viii) මූල්‍ය ප්‍රගතිය ඉහත (vii)හි දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

(அ) (i) 2026.08.15இல் உள்ளவாறு ஆயுர்வேத மருத்துவ சபையில் பதிவு செய்யப்பட்ட மருத்துவர்களின் மொத்த எண்ணிக்கை 28,151ஆக இருந்ததுடன், அவர்களில் 4,286 பேர் இறந்துவிட்டதாக அறிவிக்கப்பட்டுள்ளது.

(ii) பாரம்பரிய - சிறப்பு - 10,518
பொது (பொது) - 17,633 (அனைத்து)

(iii) பாரம்பரிய மருத்துவர்களின் குறிப்பிட்ட மருத்துவப் பரம்பரைகள் மருத்துவ சபையால் அடையாளம் காணப்படவில்லை.

1 9 6 1இன் 31ஆம் இலக்க ஆயுர்வேதச் சட்டத்தின் 55(1) மற்றும் 55(2) பிரிவுகளின்கீழ் பாரம்பரிய மருத்துவர்களாகப் பதிவு செய்யப்பட்ட நபர்கள் பரம்பரை மருத்துவர்களாகக் கருதப்படுகின் றார்கள்.

(iv) அவை குறிப்பாக அடையாளம் காணப் படாததால், அந்த எண்ணிக்கையை இலக்கத்தில் வழங்குவது சாத்தியமில்லை.

(v) முன்னைய அரசாங்கங்களின் கீழ் மருத்துவர் களின் பரம்பரையை ஆய்வு செய்வதற்கான பண்டாரநாயக்க ஞாபகார்த்த ஆயுர்வேத ஆராய்ச்சி நிறுவனத்திற்கு ஒரு விசேட திட்டத்தின்கீழ் மருத்துவர்களின் பரம்பரையை ஆய்வு செய்வதோடு மட்டுமல்லாமல், பாரம்பரிய வைத்திய அறிவினைப் பாதுகாப் பதன் 2ஆம் கட்டத்தின் கீழ் 8 நோக்கங்களைச் செயல்படுத்துவதற்காக 4 ஆண்டு காலத்திற்குள் செயற்படுத்துவதற்கு அமைச்சரவை தீர்மானத் தின் பேரில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது.

(vi) பாரம்பரிய மருத்துவ அறிவைப் பாதுகாக்கும் இரண்டாம் கட்டத் திட்டத்தின்கீழ் குறிப்பிடப் பட்டுள்ள 8 நோக்கங்களை நிறைவேற்று வதற்காக ரூபாய் 350 மில்லியன் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது.

2019இல் ஆரம்பிக்கப்பட்டு 2022 முடிக்கத் திட்டமிடப்பட்டிருந்தபோதும், பூர்த்தி செய்ய முடியாமல் போன செயற்பாடுகளை 2024 மற்றும் 2025ஆம் ஆண்டுகளில் மேற்கொள்வ தற்கு அங்கீகாரம் பெற்றுக்கொள்ளப்பட்டுள்ள துடன், மேலும், அதற்குத் தேவையான பணத்தை வருடாந்த வரவு செலவுத்திட்ட நிதி ஏற்பாடு களின் மூலம் 2024ஆம் ஆண்டிற்கு ரூபாய் 10 மில்லியனும் 2025ஆம் ஆண்டிற்கு ரூபாய் 25 மில்லியனும் ஒதுக்கீட்டின் மூலம் ஒதுக்கப் பட்டுள்ளது.

(vii) மருத்துவப் பரம்பரைகளை அடையாளம் காண்பதற்காக, மருத்துவர்களின் அனைத்துத் தரவுகளையும் கொண்ட ஒரு தரவுத்தள முறைமையை உருவாக்கும் நோக்கத்துடன் TMK கணினி மென்பொருள் உருவாக்கப்பட்டது. மாகாண அளவில் பெறப்பட்ட 6,000 மருத்துவர்களின் தகவல்களில் TMK கணினி மென்பொருள் ஏறக்குறைய 2,000 பேரின் பதிவுகளை நிறைவு செய்துள்ளது. கணினி மயமாக்கப்பட்ட தகவல்களைப் பயன்படுத்தி தரவுகளைப் பகுப்பாய்வு செய்து சரியான பரம் பரைகளை அடையாளம் காணத்திட்டமிடப் பட்டுள்ளது. மேலும், பாரம்பரிய உள்ளூர் மருத்துவர்களுக்குச் சொந்தமான மருத்துவ பெறுமதி வாய்ந்த மருத்துவப் புத்தகங்கள், உபகரணங்கள் மற்றும் ஏனைய தொடர்புடைய பொருட்களைப் பாதுகாப்பதற்காக

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

- புகழ்பெற்ற பாரம்பரிய மருத்துவப் பள்ளிகளைச் சேர்ந்த சுதேச மருத்துவர் களின் சிகிச்சை முறைகள் குறித்த ஒலி, ஒளிக் காட்சிகள் உருவாக்கப்பட்டுப் பாதுகாக்கப்பட்டுள்ளன.
- பண்டாரநாயக்க ஞாபகார்த்த ஆயர்வேத ஆராய்ச்சி நிறுவன வளாகத்தில் ஓர் அருங் காட்சியகம் (நூதனசாலை) நிறுவப் பட்டுள்ளது.
- மருத்துவ பெறுமதி வாய்ந்த அரிதான மற்றும் அருகிவரும் பனை ஓலைச் சுவடி, மூங்கல் மற்றும் நூலைப் பயன்படுத்தி பௌதிக சேதனங்களிலிருந்து மீட்கப்பட்டு, வகைப் படுத்தப்பட்டு, சேமிக்கப்பட்டு, தரவு களஞ்சியப் படுத்தப்பட்டு ஆவணப்படுத்தப் பட்டுள்ளன.
- மேலே பாதுகாக்கப்பட்டுள்ள 816 பனை ஓலைச் சுவடிகள், டிஜிட்டல் தொழில்நுட்பத் தைப் பயன்படுத்தி ஸ்கேன் (Scan) செய்யப் பட்டு, மின்னணு முறையில் பாதுகாக்கப் பட்டுள்ளன.
- கறுத்துப் போனதால் ஏற்பட்ட பௌதிக சேதங்களிலிருந்து சரிசெய்யப்பட்ட, தேர்ந் தெடுக்கப்பட்ட 10 பனை ஓலை நூல்கள் படியெடுக்கப்பட்டு, ஒவ்வொரு நூலிலும் 100 பிரதிகள் அச்சிடப்பட்டு, அவை மத்திய அரசின் மருத்துவமனைகளுக்கும் மாகாண ஆயுர்வேத நூலகங்களுக்கும் வழங்கப் பட்டுள்ளன.

TMK செயற்றிட்டம்

| ஆண்டு | நிதி ஏற்பாடு (ரூபாய்) | செலவிடப் பட்ட தொகை (ரூபாய்) | எஞ்சிய தொகை (ரூபாய்) |
|---|---|---|---|
| 2020 | - | - | - |
| 2021 | 10,000,000.00 | 1,759,664.00 | 8,240,336.00 |
| 2022 | 1,500,000.00 | 697,407.95 | 802,592.05 |
| 2023 | 3,000,000.00 | 2,939,423.40 | 60,576.60 |
| 2024 | 10,000,000.00 | 4,896,114.38 | 5,103,885.62 |
| 2025 | 25,000,000.00 | 8,847,828.93 | 16,152,171.07 |

(viii) நிதி முன்னேற்றம் மேலே (vii) இல் கொடுக்கப் பட்டுள்ளது.

(ஆ) பொருந்தாது.

(a) (i) As at 15.08.2026, the total number of medical practitioners registered with the Ayurveda Medical Council was 28,151 and 4,286 were reported to have died.

(ii) Traditional Specialists - 10,518
General Physicians - 17,633

(iii) The Ayurveda Medical Council has not specifically identified the medical lineages of traditional medical practitioners.

Persons registered as traditional practitioners under Sections 55(1) and 55 (2) of the Ayurveda Act, No. 31 of 1961 are considered to be medical practitioners belonging to hereditary medical lineages.

(iv) Since they have not been specifically identified, a numerical figure cannot be provided.

(v) Under the previous governments, a special project to research the lineage of medical practitioners was set up at the Bandaranaike Memorial Ayurveda Research Institute and under the second phase of the project to preserve traditional medical knowledge, provisions had been allocated to implement it within a period of four years to fulfil eight objectives.

(vi) A sum of Rs. 350 million had been allocated for the implementation of the eight objectives specified under the Second Phase Project for the Preservation of Traditional Medical Knowledge.

Approval had been obtained to carry out the activities in 2024 and 2025, which were scheduled to commence in 2019 and be completed in 2022, but could not be completed during that period and the necessary funds have been allocated through the annual Budget allocations as Rs. 10 million for 2024 and Rs. 25 million for 2025.

(vii) The TMK computer software was developed with the objective of identifying medical lineages and establishing an information database containing comprehensive data on medical practitioners. Of the information relating to approximately 6,000 medical practitioners received at the provincial level, the details of nearly 2,000 practitioners have been entered into the TMK computer software to date. It is planned to analyse the data based on the information entered into the system in order to accurately identify the respective medical lineages. Furthermore, in order to preserve medical books, equipment and other relevant materials of medical value possessed by traditional indigenous medical practitioners,

- Audio-visual programmes documenting the medical treatments provided by traditional medical practitioners belonging to the verified traditional medical lineages have been produced and preserved.
- A museum has been established on the premises of the Bandaranaike Memorial Ayurveda Research Institute.

- Rare palm-leaf manuscripts of significant medical value that were in a state of deterioration have been physically restored, re-bound using cords and threads, classified, entered into a database and documented.

- Eight hundred and sixteen palm-leaf manuscripts so preserved have been scanned and preserved using digital technology.

- Of the rare palm-leaf manuscripts that had undergone treatment with natural colouring materials and physical restoration, 10 manuscripts were selected and transcribed and 100 copies of each manuscript were printed and distributed among Central Government hospitals and provincial Ayurveda libraries.

TMK Project

| Year | Allocation (Rs) | Amount Expended (Rs.) | Balance (Rs.) |
|---|---|---|---|
| 2020 | - | - | - |
| 2021 | 10,000,000.00 | 1,759,664.00 | 8,240,336.00 |
| 2022 | 1,500,000.00 | 697,407.95 | 802,592.05 |
| 2023 | 3,000,000.00 | 2,939,423.40 | 60,576.60 |
| 2024 | 10,000,000.00 | 4,896,114.38 | 5,103,885.62 |
| 2025 | 25,000,000.00 | 8,847,828.93 | 16,152,171.07 |

(viii) The financial progress is set out in (vii) above.

(b) Does not arise.

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 2254/2026 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මාසයක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 2254/2026 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் ஒரு மாத கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education, has requested for one month's time to reply to Question No. 02 - 2254/2026 - raised by the Hon. Ajith P. Perera, appearing in today's Order Paper.

## ත්‍රිකුණාමලය බලශක්ති මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වන ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම: විස්තර
## திருகோணமலையை வலுசக்தி மையமாக அபிவிருத்தி செய்வதற்கான இலங்கைக்கும் இந்தியாவிற்கும் இடையிலான புரிந்துணர்வு ஒப்பந்தம்: விபரம்
## MOU BETWEEN SRI LANKA AND INDIA FOR DEVELOPMENT OF TRINCOMALEE AS AN ENERGY HUB: DETAILS

2255/2026

**3.** ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය, බලශක්ති මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුමේ පාර්ශ්වකරුවන් කවුරුන්ද;

(iii) එම ගිවිසුම මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන මූලික අරමුණු කවරේද;

(iv) එම අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරන කාලරාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත සඳහන් ගිවිසුම ප්‍රකාරව -

(i) ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර බහුනිෂ්පාදන ඉන්ධන නළ පද්ධතිය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් මේ දක්වා ලබා ඇති ප්‍රගතිය කවරේද;

(ii) ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණ සංවර්ධනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුම අනුව මේ දක්වා ගෙන ඇති පියවර කවරේද;

(iii) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ තෙල් පිරිපහදුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් මේ දක්වා ලබා ඇති ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலையை வலுசக்தி மையமாக அபிவிருத்தி செய்வதற்காக இலங்கைக்கும் இந்தியாவிற்கும் இடையில் புரிந்துணர்வு ஒப்பந்தமொன்று கைச்சாத்திடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி ஒப்பந்தத்தின் தரப்பினர்கள் யாவர் என்பதையும்;

(iii) மேற்படி ஒப்பந்தத்தின் மூலம் ஈடேற்றிக் கொள்வதற்கு உத்தேசிக்கும் அடிப்படை நோக்கங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி நோக்கங்களை ஈடேற்றிக் கொள்வதற்கு உத்தேசிக்கப்பட்டுள்ள கால வரையறை யாதென் பதையும்; அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(ஆ) மேற்படி ஒப்பந்தத்தின் பிரகாரம் -

(i) இலங்கைக்கும் இந்தியாவுக்கும் இடையில் பல்வேறு உற்பத்தி சார்ந்த எரிபொருள் குழாய்த் தொகுதியை நிறுவுவது குறித்து இதுவரையில் அடைந்துள்ள முன்னேற்றம் யாதென்பதையும்;

(ii) திருகோணமலை எண்ணெய் குதங்கள் வளாகங்களை அபிவிருத்தி செய்வதற்கு புரிந் துணர்வு ஒப்பந்தத்தின் பிரகாரம் இதுவரையில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) திருகோணமலை பிரதேசத்தில் எண்ணெய் சுத்திகரிப்பு நிலையமொன்றை அமைப்பது தொடர்பாக இதுவரையில் அடைந்துள்ள முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether a Memorandum of Understanding (MoU) has been signed between Sri Lanka and India for the development of Trincomalee as an energy hub;

(ii) if so, the parties to the said MoU;

(iii) the primary objectives sought to be achieved through the said MoU; and

(iv) the expected timeline for achieving those objectives?

(b) Will he also inform this House, with respect to the above-mentioned MoU, the -

(i) progress that has been made to date in establishment of the multiproduct pipeline between Sri Lanka and India;

(ii) steps that have been taken to date in accordance with the said MoU for the development of the Trincomalee Tank Farms; and

(iii) progress that has been made to date in establishment of an Oil Refinery in the Trincomalee area?

(c) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**

(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)

(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

(අ) (i) ඔව්.

(ii) 1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය නියෝජනය කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශය

2. ඉන්දීය ජනරජය නියෝජනය කිරීම සඳහා ඉන්දියානු ඛනිජ තෙල් හා ස්වභාවික වායු අමාත්‍යාංශය

3. එක්සත් අරාබි එමීර් රාජ්‍යය නියෝජනය සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආයෝජන අමාත්‍යාංශය

(iii)
- ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සහ ත්‍රිකුණාමලය බලශක්ති කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් පාර්ශ්ව අතර විවිධ ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කිරීම.
- ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාව දක්වා ඉදිකිරීමට යෝජිත ඛනිජ තෙල් නළ මාර්ගය හරහා ඛනිජ තෙල් නිෂ්පාදන බෙදා හැරීම පිළිබඳ සාකච්ඡා කිරීම.
- කලාපීය බලශක්ති කේන්ද්‍රස්ථානයක් නිර්මාණය කිරීම සඳහා ත්‍රිකුණාමලය ඉහළ ටැංකි සංකීර්ණයේ (ටැංකි 85) යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය විටක සංවර්ධනය කිරීමට පාර්ශ්ව අතර එකඟතාව.
- බෙදාහැරීමේ ගබඩාවල සිට ඉල්ලුම් වෙළෙඳ පොළවල් දක්වා බංකර් ඉන්ධන සැපයීමේ විභවතාව පිළිබඳ පාර්ශ්ව විසින් පරීක්ෂා කිරීම.
- පිරිපහදුවක් සංවර්ධනය කිරීමේ විභවය ගවේෂණය කිරීම පිළිබඳව පාර්ශ්ව සාකච්ඡාවල නිරත වීම.

(iv) සියලුම ව්‍යවස්ථාපිත සහ අනෙකුත් අදාළ අනුමැතීන් ලැබුණු දින සිට මාස 36ක් ඇතුළත ව්‍යාපෘති ඉදිකිරීමට සහ සම්පූර්ණ කිරීමට.

(ආ) (i) ත්‍රිකුණාමලය, චීන වරාය ආශ්‍රිත ප්‍රදේශය කලාපීය තෙල් ආනයනය කර ගබඩා කර බෙදාහැරීමේ කේන්ද්‍රස්ථානයක් (Energy Hub) බවට පත් කිරීම රජයේ අරමුණයි. එම - Energy Hub - ස්ථාපිත කිරීමෙන් පසු එම යටිතල පහසුකම්වල අවශ්‍යතාව මත ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර බහු නිෂ්පාදන නළ පද්ධති ස්ථාපිත කිරීම සම්බන්ධව තීරණයක් ගැනීමට නියමිතයි.

(ii) Trinco Petroleum Terminal Limited (TPTL) ආයතනය සඳහා වෙන් කර ඇති ටැංකි 61න් ටැංකි 29ක් සංවර්ධනය කර, භාවිත කිරීම සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම සඳහා අභිලාෂ කැඳවීමේ කටයුතු සිදු කරමින් පවතී.

අවශ්‍ය නළ මාර්ග ඉදිකිරීම්, අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියා කිරීම, ජැටි පහසුකම් සකස් කිරීමේ ආදී කටයුතු සිදු වෙමින් පවතී.

(iii) මෙම ප්‍රදේශයේ තෙල් පිරිපහදුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් මේ දක්වා තීරණයක් ගෙන නොමැත.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) 1. இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசைப் பிரதிநிதித்துவப்படுத்தும் வலுசக்தி அமைச்சு

2. இந்தியக் குடியரசைப் பிரதிநிதித்துவப் படுத்தும் இந்தியாவின் பெற்றோலியம் மற்றும் இயற்கை வாயு அமைச்சு

3 ஐக்கிய அரபு அமீரகத்தைப் பிரதிநிதித்து வப்படுத்தும் ஐக்கிய அரபு அமீரகத்தின் முதலீட்டு அமைச்சு

(iii) • இலங்கையின் வலுசக்தி பாதுகாப்பை வலுப்படுத்துதல் மற்றும் திருகோண மலையை ஒரு வலுசக்தி மையமாக மேம்படுத்துதல் ஆகிய நோக்கங்களுடன், தரப்பினரிடையே பல்வேறு திட்டங்கள் குறித்து விவாதித்தல்.

• இந்தியாவிலிருந்து இலங்கைக்கு அமைக்கப் படவுள்ள முன்மொழியப்பட்ட பெற்றோலி யக் குழாய்வழி மூலம் பெற்றோலியப் பொருட்களை விநியோகிப்பது குறித்து விவாதித்தல்.

• பிராந்திய வலுசக்தி மையத்தை நிறுவும் நோக்குடன், திருகோணமலை மேல்நிலை தாங்கிப் பண்ணையின் (85 தாங்கிகள்) உட் கட்டமைப்பைப் புதுப்பித்து, தேவைக்கேற்ப மேம்படுத்துவதற்கான உடன்படிக்கை தரப்பினரிடையே எட்டப்பட்டது.

• விநியோக களஞ்சியசாலைகளில் இருந்து தேவைப்படும் சந்தைகளுக்கு கப்பல் எண்ணெயை வழங்குவதற்கான சாத்தியக் கூறுகளை தரப்பினர் ஆராய்தல்.

• சுத்திகரிப்பு நிலையத்தை மேம்படுத்து வதற்கான சாத்தியக்கூறுகளை ஆராய்வது குறித்து தரப்பினர் கலந்துரையாடல்களில் ஈடுபடுதல்.

(iv) அனைத்து சட்டபூர்வ மற்றும் இதர தொடர் புடைய ஒப்புதல்களைப் பெற்ற நாளிலிருந்து 36 மாதங்களுக்குள் திட்டங்களைப் பூர்த்திசெய்ய வேண்டும்.

(ஆ) (i) திருகோணமலையில் உள்ள சீனக்குடா பகுதியை, பெற்றோலியப் பொருட்களின் இறக்குமதி, களஞ்சியம் மற்றும் விநியோகத் துக்கான ஒரு பிராந்திய மையமாக (எரிசக்தி மையம்) அபிவிருத்தி செய்வதே அரசாங்கத்தின் நோக்கமாகும். இந்த எரிசக்தி மையம் நிறுவப்பட்டதைத் தொடர்ந்து, அதன் உட்கட்டமைப்புத் தேவைகளின் அடிப்படையில், இலங்கைக்கும் இந்தியாவுக்கும் இடையே பல்வகைப்பட்ட குழாய்வழி அமைப்புகளை நிறுவுவது குறித்து தீர்மானம் எடுக்கப்படும்.

(ii) Trinco Petroleum Terminal Limited (TPTL) நிறுவனத்துக்கு ஒதுக்கப்பட்ட 61 தாங்கிகளில், 29 தாங்கிகளின் அபிவிருத்தி மற்றும் பயன் பாட்டிற்காக பொருத்தமான முதலீட்டாளர் களைத் தேர்ந்தெடுப்பதற்கு, ஆர்வங்களிற்கான வெளிப்பாடுகளை (EOIs) கோருவதற்கான நடவடிக்கைகள் தற்போது மேற்கொள்ளப்பட்டு வருகின்றன.

தேவையான குழாய்களை அமைத்தல், உள்ளக வீதிகளை புனரமைத்தல், இறங்குதுறை வசதிகளை மேம்படுத்துதல் மற்றும் அது தொடர்பான பிற பணிகளும் தற்போது நடைபெற்று வருகின்றன.

(iii) இப்பகுதியில் எண்ணெய் சுத்திகரிப்பு நிலையம் அமைப்பது தொடர்பாக இன்று வரை எந்த தீர்மானமும் எடுக்கப்படவில்லை.

(இ) பொருத்தமற்றது.

(a) (i) Yes.

(ii) 1. The Ministry of Energy to represent the Democratic Socialist Republic of Sri Lanka

2. The Ministry of Petroleum and Natural Gas of India representing the Republic of India

3. The Ministry of Investment of the United Arab Emirates to represent the United Arab Emirates.

(iii) • The parties will engage in discussion on various projects for the purpose of developing Trincomalee as an Energy Hub and with a view to strengthening energy security for Sri Lanka.

• The parties will continue discussions on delivery of petroleum products via a petroleum pipeline to be constructed from India to Sri Lanka.

• The parties also agree to refurbish and where required, to develop allied infrastructure for the Trincomalee Tank Farm (85 tanks - Upper Tank Farm) to create a regional Energy Hub.

• The parties will also examine the potential to supply bunker fuel from storage for distribution to demand markets.

• The parties will also engage in discussions on exploring the potential of development of a refinery (hereinafter collectively referred to as "Project").

(iv) To construct and complete the projects within 36 months from the date of obtaining all statutory and other relevant approvals.

(b) (i) The Government's objective is to develop the China Bay area in Trincomalee into a regional hub for the import, storage and distribution of petroleum products (Energy Hub). Following the establishment of the Energy Hub, a decision will be made on the establishment of multi-product pipeline systems between Sri Lanka and India, based on the infrastructure requirements of the Energy Hub.

[ගරු අනුර කරුණාතිලක මහතා]

(ii) Of the 61 tanks allocated to the Trinco Petroleum Terminal Limited (TPTL), steps are currently being taken to invite Expressions of Interest (EOIs) to select suitable investors for the development and utilization of 29 tanks.

Work is currently underway for the construction of the required pipelines, rehabilitation of internal roads, development of jetty facilities and other related activities.

(iii) No decision has been made to date regarding the establishment of an oil refinery in this area.

(c) Not applicable.

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 4වන ප්‍රශ්නයට - 2258/2026 - පිළිතුර දීමට ආරක්ෂ අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මහතා මාසයක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப்பத்திரத்திலுள்ள 4ஆம் இலக்க வினாவுக்கு - 2258/2026 - விடையளிப்பதற்கு, பாதுகாப்பு அமைச்சர் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் ஒரு மாத கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Anura Kumara Dissanayake, Minister of Defence, has requested for one month's time to reply to Question No. 04 - 2258/2026- raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.